87 වන කාණ්ඩය සඳුදා

19 වන කලාපය 1969 සැප්තැම්බර් 29

පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

නිල වාර්තාව

අන්තර්ගත ප්‍රධාන කරුණු

පරිපූරක මුදල් [නී. 4430]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 87
இல. 19

திங்கட்கிழமை
29 செப்ரெம்பர் 1969

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

பிரதான உள்ளடக்கம்

குறைநிரப்புத் தொகை [ப. 4430]

Volume 87
No. 19

Monday
29th September 1969

PARLIAMENTARY DEBATES

(HANSARD)

HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

SUPPLEMENTARY SUPPLY [Col. 4430]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මන්ත්‍රී මණ්ඩලයේ කටයුතු

නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

பிரதிநிதிகள் சபை

House of Representatives

1969 සැප්තැම්බර් 29 වන සඳුදා

திங்கட்கிழமை, 29 செப்ரெம்பர் 1969

Monday, 29th September 1969

ප. භා. 10 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. නියෝජ්‍ය කථානායකතුමා [එම්. සිවසිතම්පරම් මයා.] මූලාසන රූඪ විය.

சபை, மு. ப. 10 மணிக்குக் கூடியது. உப சபாநாயகர் அவர்கள் [திரு. எம். சிவசிதம்பரம்] தலைமை தாங்கினார்கள்.

The House met at 10 A.M., MR. DEPUTY SPEAKER [MR. M. SIVASITHAMPARAM] in the Chair.

මන්ත්‍රී මණ්ඩලයේ කටයුතු

சபை அலுவல்

BUSINESS OF THE HOUSE

ගරු ජේ. ආර්. ජයවර්ධන (රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍යතුමාගේත් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම්)

(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியும்)

(The Hon. J. R. Jayewardene—Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs)

I move,

"That the proceedings on items 1 to 28 of Public Business appearing on the Paper be exempted at this Day's sitting from the provisions of Standing Order No. 8."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

පරිපූරක මුදල්

මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම්

சபை அமர்வு

SITTINGS OF THE HOUSE

ගරු ජේ. ආර්. ජයවර්ධන

(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)

(The Hon. J. R. Jayewardene)

I move,

"That this House at its rising this day do adjourn until 2 P.M. on Tuesday, 21st October 1969."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

පරිපූරක මුදල්: කුඩා හෝටල් පිහිටුවීම සඳහා සංචාරක මණ්ඩලයට ණයක්

குறைநிரப்புத் தொகை: சிறு ஹோட்டல் திட்டங்களுக்கு உல்லாசப் பிரயாணச் சபைக்குக் கடன்

SUPPLEMENTARY SUPPLY: LOAN TO TOURIST BOARD FOR SMALL HOTEL PROJECTS

ගරු එන්. විමලසේන (වැඩ බලන මුදල් ඇමති)

(கௌரவ என். விமலசேன—பதில் நிதி அமைச்சர்)

(The Hon. N. Wimalasena—Acting Minister of Finance)

I move,

"That a supplementary sum not exceeding Rupees Three million five hundred thousand (Rs. 3,500,000) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year beginning on October 1, 1968, and ending on September 30, 1969, and that the said sum may be expended as specified in the Schedule hereto:

Schedule

	Rs.
Head 47 —Miscellaneous Services.	
Vote No. 5—Services provided by the Department —Capital Expenditure ..	3,500,000 "

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු විමලසේන]

While the major hotel projects are now ready for construction, the smaller units necessary throughout the Island and the modernization programme envisaged for the older hotels have been held up due to a lack of funds. Existing and prospective hoteliers have indicated that the terms on which credit is presently available to them from commercial banks and other institutions are too stiff for embarking on new ventures and for refurbishing existing units. Therefore it is considered necessary to set up a special fund under the control of the Tourist Board to provide financial assistance on soft terms for small and medium size hotel projects.

The proposal is for the Government to provide a loan of Rs. 10 million to the Tourist Board for the establishment of this fund, of which only Rs. 3.5 million will be required in the first year of operation. The Tourist Board will pay the Treasury interest at the rate of $4\frac{1}{4}$ per cent in the first year of operation, and the rate of interest every year thereafter will be determined by the Treasury in consultation with the Tourist Board. Repayments will commence five years after each drawing from the Treasury on terms to be determined by the Treasury in each case, taking into account the requirements of further financial assistance through the fund.

This loan will be granted in terms of Section 34 of the Ceylon Tourist Board Act, No. 10 of 1966, and the board in turn will make disbursements from the Tourist Development Fund in terms of Section 27 (1) (*b*) of the same Act. The terms of such disbursements will be determined by the Tourist Board in consultation with the Treasury. It is expected to grant loans for periods extending up to 20 years carrying a rate of interest not exceeding $6\frac{1}{2}$ per cent depending on the merits of each case. The Development Finance Corporation of Ceylon will act as the agency for administering this loan scheme.

The Agricultural and Industrial Credit Corporation Ordinance will be amended to enable that institution to extend its loan facilities to small and medium size tourist undertakings, and when these amendments become law and the A.I.C.C. is in a position to give direct assistance to such tourist projects the need to continue the Tourist Development Fund will be reconsidered.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

விஞ எடுத்தியம்பப்பெற்றது.

Question proposed.

පූ. භා. 10.05

ලෙස්ලි ගුණවර්ධන මයා. (පානදුර)

(திரு. லெஸ்லி குணவர்தன—பாணந்துறை)

(Mr. Leslie Goonewardene—Panadura)

First of all, I must thank the Hon. Acting Minister of Finance for having read out the explanation attached to copies of the Supplementary Estimates supplied to hon. Members, which all hon. Members interested in this matter would have read earlier. What the Hon. Acting Minister just said does not throw any fresh light on the matter of the utilization of the moneys that we are going to vote. But I think the Hon. Minister of State, who is in charge of these hotels and tourism, should, in his reply, be able to furnish us with some information that we would like to have.

In the first place, may I say this ? There were plans for the starting of big hotels with participation of foreign capital. I myself thought that the participation of foreign capital would help us to solve the question of covering the foreign exchange component of the capital that is required for such ventures, but I find on investigation that the foreign contribution in the case of practically all these proposed hotels covers only a part of the foreign exchange component of the expenditure involved. That seems to be a little unfortunate, particularly because we are not certain of the success of some of these ventures. I believe the main purpose of this entire tourist industry is to earn foreign exchange, but if we are

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

going to start off by spending the scarce foreign exchange that we already have, or a portion of it, to start these hotels, the question arises whether we shall be able, even after several years, to get back the foreign exchange that we have spent leave alone the question of earning fresh foreign exchange. In the first place, that is not a very satisfactory position. But even assuming that the optimistic perspectives of the Tourist Board and of the Hon. Minister and of the Hon. Prime Minister a couple of years ago are to be realized, if they are to be realized these hotel projects must get going.

There were, I believe, about four large hotel projects. There were the Hilton Hotel project, the Intercontinential Hotel project, the Pegasus Reef Hotel project and the project of the UTA for a big hotel in Negombo. As far as I can see, at the moment there is only one that shows signs of being realized and that is the Pegasus Reef Hotel, where the ground is being cleared and I believe the foundation stone has been laid, and certainly before the end of next year the hotel should be in a functioning condition.

The Hilton Hotel project has completely vanished. It has been abandoned. In regard to the Intercontinental Hotel project, which is supposed to be taking place opposite the House of Representatives, the buildings have been broken down, the ground has been cleared, but I do not think that plans are complete for putting up a new buliding, so that that is still in the offing. Then, the UTA Hotel project in Negombo I think has been abandoned.

It is true that some local projects have been started, especially in Bentota where buildings are coming up and will be completed soon. So it does seem as though the effort to start large hotels with the participation of foreign capital and expertise has so far succeeded only in one case. I should like to know whether that is the reason why this proposal is now being brought to provide financial assistance on soft terms, that is, at low rates of interest and repayable after 20 years, not for big hotels but for medium size and smaller units. I wish to know whether the perspective of starting modern hotels of a large scale with foreign capital participation and making use of their expertise has now been abandoned —abandoned in the sense that the Tourist Board and the Hon. Minister have decided that these things are not coming to fruition now and an effort is being made to develop the tourist industry on the basis of medium size hotels without participation of foreign capital and so on.

There is one matter which I should like you to clarify and that is whether these loans on easy terms are to be made available only to Ceylonese. This point is not clear in the note. I did not read it so very carefully—

ගරු විමලසේන
(கௌரவ விமலசேன)
(The Hon. Wimalasena)

Only to Ceylonese.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

Only to Ceylonese !

Has there been a certain change in the policy ? Have you found that you are not getting the participation of foreign capital in the starting of these projects in the way you expected ? Is it that the promises you had of foreign participation are not coming to fruition, the hotels are not coming up, and, therefore, you have changed your emphasis from large hotels with foreign capital participation to small hotels run by Ceylonese. We should like to know the position in regard to this matter because we also like to co-operate with the Government in a reasonable way and the Hon. Minister should take this House into his confidence and let us know if there is a major shift or change in the Government's policy in this respect.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

I would ask the Hon. Minister to give an answer to the points that I have raised when he makes his reply.

පූ. හා. 10.12

එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා. (මිනුවන්ගොඩ)

(திரு. எம். பீ. டி சொய்சா சிறிவர்தன—மினுவாங்கொட)

(Mr. M. P. de Zoysa Siriwardena—Minuwangoda)

නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේදී මා විශේෂයෙන් නැඟී සිටියේ කරුණු දෙකක් දැන ගන්නටයි. හෝටල් තැනීම සඳහා මේ මුදල වියදම් කිරීම ගැන අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. සමාජවාදී රටක් වන රුමේනියාවේ ආධාර ඇතිව නුවර වැව ළඟ විශාල හෝටලයක් හැදීමේ සැලැස්මක් තිබුණා. ඒ සඳහා විශාල මුදලක් දැනටමත් වියදම් කර තිබෙනවා. සෞඛ්‍ය ඇමතිතුමාගේ ඉඩමක් පවා ඒ සඳහා අරගෙන තිබුණා. රුමේනියාවේ රජයත්, ලාංකිකයන් කීප දෙනකුත් එකතු වී හදන්නට ගිය ඒ හෝටලය අතරමඟ ඇණහිට තිබෙන්නේ රජයේ අනුමැතිය ඒ සඳහා ලැබී නැති නිසා යයි මට දැන ගන්නට ලැබී තිබෙනවා. නොයෙකුත් ධනවාදී රටවල හා සමාජවාදී රටවල ආධාරය ඇතිව සියයට 51 :49 ක්‍රමය යටතේ ලංකාවේ විශාල හෝටල් තැනීමට රජය තීරණය කර තිබෙනවා නම්, රුමේනියා රජයේ ආධාරය ඇතිව ඉදි කරන්නට යන මේ හෝටලය සඳහා අනුමැතිය නොදෙන්නේ ඇයි? ධනවාදී රටවල් පමණක් නොව සමාජවාදී රටවල් පවා මෙවැනි හෝටල් පවත්වාගෙන යාමෙන් විශාල ලාභ ගන්නා බව මා දන්නවා. එක්සත් අරාබි ජනරජය අවුරුදු 3 ක් ඇතුළත මෙවැනි විශාල හෝටල් 300 ක් පමණ අළුතින් ඉදි කර තිබෙනවා. එහෙත් පසුගිය අවුරුදු $3\frac{1}{2}$ ඇතුළත අපේ රටේ නම්—බේරුවල තනා ගෙන යන හෝටලය හැරුණු කොට—සිදු වුණේ, හෝටල් තැනීම සඳහා පොළොව සකස් කිරීම විතරයි. එවැනි තත්ත්වයක් තිබේදීත්, රුමේනියා රජයේ ආධාරයෙන් ඉදි වන්නට ගිය අර හෝටලය සඳහා අනුමැතිය නොදුන්නේ ඇයි? විශේෂයෙන් මා ඒ ගැන අහන්නේ, මා ලංකා-රුමේනියා මිත්‍ර සංගමයේ සභාපති නිසායි.

හෝටල් තැනීම සඳහා සංචාරක මණ්ඩලයට රුපියල් කෝටි 3 ක ණය මුදලක් දීම සඳහායි, මේ පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කර තිබෙන්නේ.

ගරු ජේ. ආර්. ජයවර්ධන

(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)

(The Hon. J. R. Jayewardene)

කෝටි 3 ක් නොවෙයි. ලක්ෂ 35 ක්.

ද සොයිසා සිරිවර්ධන මයා.

(திரு. டி சொய்சா சிறிவர்தன)

(Mr. de Zoysa Siriwardena)

හෝටල් තැනීම සඳහා සංචාරක මණ්ඩලයට මෙවැනි ණය මුදල් දෙන්නට අදහස් කරන්නේ, මෙවැනි හෝටල් තැනීම පිණිස ණය මුදල් දීමට Agricultural and Industrial Credit Corporation නමැති ආයතනයට පුළුවන් වන අන්දමට එම පනත සංශෝධනය කරන තුරු පමණයි. එම පනත ඉක්මනින් සංශෝධනය කරනවා නම් සංචාරක මණ්ඩලය යටතේ විශේෂ අරමුදල් පිහිටුවන්නටත්, සංචාරක මණ්ඩලයට මෙසේ ණය මුදල් දීමටවත් වුවමනා වන්නේ නැහැ. එම පනත ඉක්මනින් සංශෝධනය කරනවා නම් මෙවැනි ප්‍රශ්න පැන නඟින්නේ නැහැ. මා සඳහන් කළ කාරණා දෙක ඇමතිතුමාගේ විශේෂ අවධානයට යොමු වේ යයි මා බලාපොරොත්තු වෙනවා.

පූ. හා. 10.15

එම්. තෙන්නකෝන් මයා. (නිකවැරටිය)

(திரு. எம். தென்னக்கோன்—நிக்கவெரட்டிய)

(Mr. M. Tennakoon—Nikaweratiya)

නියෝජ්‍ය කථානායකතුමනි, වැඩබලන මුදල් ඇමතිතුමා මේ අතිරේක වැය ශීර්ෂය ඉදිරිපත් කළේ, රාජ්‍ය ඇමතිතුමා ඉතා ප්‍රිය කරන විෂයයට උපකාර කිරීම පිණිසයි. මේ රජයේ පළමුවැනි රාජාසන කථාවෙන් කියවුණා, විදේශ විනිමය අපහසුකම් මඟහරවා ගන්නට බලාපොරොත්තු වන්නේ රාජ්‍ය ඇමතිතුමා ඉතා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආදරය කරන—මොන කාරණයක් නිසාදැයි මා දන්නේ නැහැ—දේශ සංචාරක ව්‍යාපාරයෙන්ය කියා. විදේශ ධනවතුන් ගේ මුදල් යොදවා මේ රටේ විශාල හෝටල් ඉදි කොට දේශ සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමේ හේතුවෙන් මේ රටට ඇදී එන දේශ සංචාරකයන් මාර්ගයෙන් විදේශ විනිමය උපයා ගන්නට රාජ්‍ය ඇමතිතුමා බලාපොරොත්තු වුණා. ඒ වාගේම ඒ අවධියේදී නෝ යෙක් නොයෙක් සමාගම් සමග සාකච්ඡා හා සම්බන්ධකම් ඇති කර ගෙන කටයුතු කිරීමේ ලැස්තියකුත් තිබුණා. මේ රටේ ඉතිහාසයේ කවදාවත් ඇති නොවුණු තරම් විශාල අන්දමේ ඉඩම් විකිණීමක් ඒ කාලයේ දී සිදු වුණු බවත් ප්‍රවෘත්ති පත්‍රවල පළ වී තිබෙනු අපට දකින්නට ලැබුණා. ගාලු මුවදොර අසළත් ඉඩමක් ගත් බව පළ වුණා. "යෝජිත හිල්ටන් හෝටලය සඳහා වූ බිම් කොටස" යන දැන්වීම් ඇළවූ තැනුත් අපට දකින්නට ලැබුණා. එහෙත්, ක්‍රම ක්‍රමයෙන් ඒ සියල්ලක්ම ඉවත් වෙමින් ගොස් දැන් මේ දේශ සංචාරක ව්‍යාපාරය අමුතු මුහුණුවරක් ගන්නා බවයි අපට පෙනී යන්නේ.

දේශ සංචාරක ව්‍යාපාරයට උදව් උපකාර කරන්නට ලැස්තිව සිටින අයට පොදු මහජන මුදලින් උදව් කරන්නට දැන් ඇමතිතුමාට සිදුවී තිබෙනවා. එම නිසා, 1965 සිට මේ වන තුරු දේශ සංචාරක ව්‍යාපාරයෙන් මේ රටේ ආර්ථිකයට ලැබී තිබෙන ප්‍රයෝජන මොනවාද යන්න ගැන මේ ගරු සභාවටත් රටටත් ප්‍රකාශ කිරීමේ යුතුකමක් ඇමතිතුමා වෙත පැවරී තිබෙනවා. මුලදී ඇමතිතුමා මෙයින් බලාපොරොත්තු වුණේ, විදේශික මුදල් යොදා ආරම්භ කෙරෙන දේශ සංචාරක ව්‍යාපාරයෙන් විදේශික ධනස්කන්ධයක් මේ රටට එක් රැස් කරගෙන එමඟින් අපේ ජාතික සංවර්ධනය ඇති කිරීමයි. දේශ සංචාරක ව්‍යාපාරයෙන් ලබා ගන්නා වූ විශාල මුදල් කොටසක් අපේ භාණ්ඩාගාරයට එකතු කොට ඒවා කෘෂි කාර්මික, කාර්මික හා වෙනත් සමාජ කටයුතු සඳහා යෙදවීමයි මෙම ව්‍යාපාරයේ මුල් අදහස වූයේ. එහෙත්, අවුරුදු හතරහමාරක් ගත වුණාට පසු දැන්, දේශ සංචාරක ව්‍යාපාරය නඟා සිටුවීම සඳහා ගරු ඇමතිතුමා මේ රටේ මහජන මුදල් ඉල්ලා සිටිනවා. එම නිසා, මේ පමණ කාලයක් තුළ දේශ සංචාරක ව්‍යාපාරයෙන් අපේ ආර්ථිකයට මෙපමණ ප්‍රයෝජන ලැබී තිබෙනවාය, විදේශික රටවලින් මෙතරම් මුදල් ප්‍රමාණයක් මේ රටට ඇදී තිබෙනවාය, පසුගිය කාල පරිච්ඡේදය තුළ දේශ සංචාරකයන් මෙපමණ ගණනක් මේ රටට පැමිණ තිබෙනවාය, ඒ අයගෙන් අපට මෙපමණ ආදායමක් ලැබී තිබෙනවාය යනාදී විස්තර මෙම ගරු සභාව හමුවෙහි තැබීම ඇමතිතුමාගේ යුතුකමක්. අවුරුදු හතරහමාරක් තිස්සේ මෙම ව්‍යාපාරයෙන් හොඳ ප්‍රතිඵල දැක තිබෙන නිසාත්, භාණ්ඩාගාරයට විශාල මුදලක් මේ මඟින් එකතු කර ගැනීමට පුළුවන් වී තිබෙන නිසාත් මෙම ව්‍යාපාරය තවතවත් පුළුල් කිරීමෙන් අපේ ජාතික ආදායමට ආර්ථිකයට විශාල උපකාරයක් සැලසිය හැකි නිසාත්, මෙම ව්‍යාපාරය සඳහා ජාතික මුදල් යෙදීම සුදුසු යයි කියන්නට ඇමතිතුමාට පුළුවන් නම් විරුද්ධ පාර්ශ්වය වුවත් මීට එකඟ වීමේ වරදක් නැතැයි මා විශ්වාස කරනවා. එහෙත්, ඊට ප්‍රති විරුද්ධ කරුණු සම්පාදනය වී තිබේ නම්, විශාල විදේශීය හෝටල් සමාගම් ඇමතිතුමා බලාපොරොත්තු වූ විධියට අපට සහයෝගය නොදීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇමතිතුමා බලාපොරොත්තු වූ ඉලක්කය කරා යාමට නොහැකි වී තිබේ නම්, දේශ සංචාරකයන් සඳහා මේ රටේ අලුත් හෝටල් ඇති කිරීමේ අවශ්‍යතාව සැලසී නැත්නම්, මෙයට සම්බන්ධ වී මෙයින් යම් යම් ලාභ ප්‍රයෝජන බිලි ගැනීමේ බලාපොරොත්තුවෙන් සිටි ධනපති කොටස් අතරමං කිරීමට පුළුවන්කමක් නැති නිසාම, පටන්ගත් කට යුත්ත කෙසේ හෝ කරගෙන යා යුතුයයි ඇමතිතුමා අදහස් කරනවා නම්, ඒ අයටත් උදව් උපකාර කරන්නට ඕනෑය යන හැඟීමෙන් ඒ අයටත් ණය සහන ආදිය ලබා දෙන්නට ඇමතිතුමා බලාපොරොත්තු වෙනවා නම්, මේ වැය ශීර්ෂයට එකඟ වීමට අපට පුළුවන්කමක් නැති බව මා ප්‍රකාශ කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දේශ සංචාරක ව්‍යාපාරය ගැන කල්පනා කරන විට මීටත් වඩා පළල් වශයෙන් විස්තර යක් කරන්නට ගරු ඇමතුමාට යුතු කමක් තිබෙනවා. මක්නිසාද? දේශ සංචාරක ව්‍යාපාරය බොහොම ප්‍රවේසමින් කළයුතු දෙයක් නිසයි. මුල් අවස්ථාවේදි අප ඒ ගැන දීර්ඝ වශයෙන් සාකච්ඡා කළා. මේ රටට එන දේශ සංචාරකයන්ගෙන් මේ රටේ ස්වාභාවික සෞන්දර්යය නරඹන්නට එන්නේ කී දෙනාද? ලෝකයේ විනෝදවීමට මුදල් තිබෙන අය බොහොම ටිකයි. ඇමතිතුමා ඒ බව දන්නවා. බඩ පුරවා ගන්නට විශාල වැයමක් දරනා මේ ලෝකයේ බඩ පුරවා ගෙන විනෝදය සොයන්නේ බොහොම ටික දෙනයි. ඒ මුදල් තිබෙන කොටසත් තමන්ගේ බඩ හොඳටම පුරවා ගෙන අනෙකුත් සැපපහසු කම් සියල්ලමත් සම්පාදනය කරගෙන ඊළඟට බලාපොරොත්තු වන්නේ සංස්කෘතිය ගැනවත් එසේ නැත්නම් දේශීය ලක්ෂණයන් ගැන හෝ සෞන්දර්යය ගැන හෝ කලාව ගැන හෝ ශිෂ්ටාචාරය ගැන හෝ පාඩම් ඉගෙන ගනනට නොවෙයි. ඊට වඩා පහත් හැඟීම්වලින් යුක්තවයි අද ලෝකයේ දේශ සංචාරක ව්‍යාපාරය ගෙන යන්නේ වැඩියෙන් මුදල් තිබෙන අය දේශ සංචාරයෙන් බලාපොරොත්තු වන්නේ අර මා මුලින් සඳහන් කළ කරුණුවලින් තෘප්තියට පත්වීමට නොවෙයි; ඊට වඩා පහත් කරුණුවලින් විනෝදය සෙවීමටයි.

තමන් රැස් කර ගත් ධනස්කන්ධයේ ප්‍රතිඵලයක් වශයෙන් අතෘප්තිකර ආශාවලින් පෙළෙන අය අද බොහෝ සිටිනවා. ඒ විධියේ ඉතා පහත් විධියට විනෝදය සොයන දේශ සංචාරකයින් තමයි අපට වැඩි වශයෙන් දක්නට ලැබෙන්නෙ. යම් රටක දේශ සංචාරක ව්‍යාපාරය සාර්ථක වී තිබෙනවා නම් ඒ රටේ ශිෂ්ටාචාරය, ඒ රටේ ගති පැවතුම්, සිරිත් විරිත් සහ ශීලාචාරකම ආරක්ෂා කර ගැනීම ඉතාම අසීරු වී තිබෙන බව අපට පෙනෙනවා. විශේෂයෙන්ම විදේශීය රටවලින් ගෙනෙන යහපත් දේවල් අපේ රටේ සිරිත් විරිත්වලට, අපේ ගති පැවතුම්වලට අපේ සිතුවිලිවලට ඇතුළු කර නො ගැනීමේ සිරිතක් තිබෙනවා. ඒ වෙනුවට විදේශ රටවලින් ගෙනෙන නරක දේවල් බොහොම ඉක්මනට භාර ගැනීමේ සිරිතක් තිබෙනවා. අපේ උදවිය විදේශ රටවලින් ගෙනෙන අශීලාචාර දේවලට බොහොම ඉක්මනින් ඇබ්බැහිවීමේ සිරිතක් තිබෙනවා. ඒ අනුව බලන විට දේශ සංචාරක ව්‍යාපාරය භාර ගරු ඇමතිතුමාට විශාල වගකීම් භාරයක් පැවරී තිබෙනවා. දේශ සංචාරක ව්‍යාපාරය කර ගෙන යාමේ ප්‍රතිඵලයක් වශයෙන් අපේ රටේ හොඳ ගති පැවතුම්වලටත් ශීලාචාර කමටත් සිරිත් විරිත්වලටත් හානියක් වෙනවා නම් ඒ ගැනත් පරීක්ෂා කර ඇමතිතුමා යම් පියවරක් ගතයුතුව තිබෙනවා. අවුරුදු හතරහමාරක් තුළ මෙම වැඩ පිළිවෙළ අනුව අපට ලැබී තිබෙන ප්‍රයෝජන මොනවාදැයි සිතා බලන්නට එතුමාට පුළුවන්කම තිබෙන්නට ඕනෑ. ඒ කියන්නේ මා මුලින් සඳහන් කළාක් මෙන් ආර්ථික වශයෙනුත් අධ්‍යාත්මික වශයෙනුත් මේ ව්‍යාපාරය පිළිබඳව යම්කිසි මැනීමක් කරන්නට එතුමාට පුළුවන්කම තිබෙන්නට ඕනෑ. එම මැනීම අනුව "මෙහි තත්ත්වය මේකයි; මෙය ඉදිරියටත් කර ගෙන යාම පිණිස ඒ ඒ ආයතනවලට වේවා ඒ ඒ පුද්ගලයන්ට වේවා අපේ භාණ්ඩාගාරයේ මුදල් පහසු පොලියට දීමේ සාධාරණ ක්‍රමයක් තිබෙනවා" යනුවෙන් කියන්නට පුළුවන්කමක් ගරු ඇමතිතුමාට තිබෙනවා නම් එය ඉතා ප්‍රයෝජනවත් වේයයි මා සිතනවා.

තවත් කාරණයක් කියන්නට තිබෙනවා. එනම් දේශ සංචාරක ව්‍යාපාරයේත් එම ව්‍යාපාරයට සම්බන්ධ වී කටයුතු කරන හෝටල් සංස්ථාවේත් පරිපාලන කටයුතු ක්‍රියාත්මක කිරීමේදී නොයෙකුත් කොටස්වලට නොයෙකුත් අවහිරතාවන් ඇති වී තිබෙන බව ගරු ඇමතිතුමා දන්නවා ඇති. පසුගිය කාලයේදී හෝටල් සංස්ථාවේ සභාපතිතුමාට විරුද්ධවද කෙහේද නඩුවක් තිබුණායයි මා විශ්වාස කරනවා. ඒක නානායම් පාලකවරුන් කීප දෙනෙක් එකතු වී පවරන ලද නඩුවක්. ඒකට මොකක් වුණාද යන්නා මට දැන් හරියටම මතක නැහැ. තාවකාලික බලයක්ද කොහේද උසාවියෙන් ඉල්ලුවා වැනි දෙයක් තමයි එතන තිබුණේ. ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

ගැන මට හරියටම සඳහන් කරන්න අප හසුයි. ඒ කෙසේ වෙතත් මා ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වන්නේ මෙයයි: රජය මගින් පාලනය කර ගෙන ගිය තානායම් මේ රටේ නොයෙකුත් ස්ථාන වල තිබුණා. ඊළඟට තිබුණා සංචාරක කාර්යාංශයෙන්—Tourist Bureau එකෙන්—පාලනය කරගෙන ගිය තානායම්. ඒවායෙහි සේවයේ යෙදී සිටි තානායම් පාලකයන් බොහෝ දෙනෙක් තමන්ට අයත් යුතුකම් රාශියක් හරියාකාර ඉටු කරන ක්‍රියා ශූරත්වයෙන් යුක්ත උදවිය බව ඔප්පු කර තිබෙනවායයි මා විශ්වාස කරනවා. අමුත්තන්ට දක්විය යුතු සෑම සැළකිල්ලක්ම සතුටුදායක අන්දමින් දක්වන්නට එම උදවියට පුළුවන් බව ඔප්පු කර තිබෙනවා.

මෙම අළුත් හෝටල් සංස්ථාව පිහිටුවූවායින් පසු ඒ කියන තානායම් සියල්ලක්ම තමන්ගේ පාලනය යටතට ගැනීම නිසා, තානායම් පාලකයන් බොහෝ දෙනෙකුට අසාධාරණයක් සිදු වී තිබෙනවා. එයින් පෙනෙන්නේ ඔවුන්ගේ සේවය නියම අන්දමට ඉටු කළත් ඔවුන්ගේ අයිතිවාසිකම්—ඔවුන්ට ලැබිය යුතු නියම ප්‍රයෝජනය—ලැබී නැති බවයි. පාලනයේ වෙනසක් ඇති වීම නිසා මෙම තත්ත්වයට මුහුණ පාන්නට සිදුවී තිබෙන බවයි පෙනෙන්නේ. ඇතැම් තානායම් පාලකවරුන් යම් යම් ස්ථානවලින් ඉවත් කිරීමේ බලය පවා මෙම සංස්ථාව ඉල්ලුම් කිරීම නිසා නොයෙකුත් අන්දමේ කරදර රාශියකට ඔවුන්ට මුහුණ දෙන්නට සිදු වී තිබෙනවා. ඒ නිසා තමන්ගේ යුතුකම් හරියාකාර ඉටු කර ඇති තානායම් පාලකවරුන්ට නියම අන්දමේ සැළකිල්ලක් දක්වන්නට හෝටල් සංස්ථාවේ යුතුකමක් තිබුණා. එහෙත් එම යුතුකම ඉටු වී තිබෙන බවක් පෙනෙන්නට නැහැ. විදේශීය සංචාරකයන්ගේ සතුට, විනෝදය සැලසීම ගැන සිත් යොමු කරන අතරම, ඔවුන්ට වඩා අනුකම්පාවක් දයාවක් ආදරයක් දැක්විය යුතු තත්ත්වයක සිටින අපේ රටේ අසරණ තානායම් පාලකවරුන් ගැනත් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කළ යුතු බව මා නැවත වරක් කියනවා. ඒ සමගම මතක් කළ යුතු තවත් කාරණයක් තියෙනවා. හෝටල් සංස්ථාව යටතේ තානායම් රාශියක්—

පරිපූරක මුදල්

නියෝජ්‍ය කථානායකතුමා

(உப-சபாநாயகர் அவர்கள்)

(Mr. Deputy Speaker)

Order, please! That is not relevant to the question under discussion. There is nothing about the Hotels Corporation in the Supplementary Estimate. This deals only with the giving of loans to the Tourist Board to provide financial assistance to new hotels.

එම්. තෙන්නකෝන් මයා.

(திரு. எம். தென்னக்கோன்)

(Mr. M. Tennakoon)

This has something to do with tourists.

නියෝජ්‍ය කථානායකතුමා

(உப சபாநாயகர் அவர்கள்)

(Mr. Deputy Speaker)

This has nothing to do with tourists. When discussing a Supplementary Estimate the hon. Member must keep to the subject as far as possible.

එම්. තෙන්නකෝන් මයා.

(திரு. எம். தென்னக்கோன்)

(Mr. M. Tennakoon)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දේශ සංචාරකයන්ගේ යහපත පිණිස මේ රටේ ඇති කර තිබෙන යම් යම් ස්ථානවලින් ස්වදේශිකයන්ටත් ප්‍රයෝජන ගැනීමට අවස්ථාව සැලසී තිබෙන්නට ඕනෑ. දේශ සංචාරකයන්ට ආහාර පාන සැපසීම පිණිස හෝ නවාතැන් පහසුව සැපසීම පිණිස හෝ ඔවුන්ගේ විනෝදය පිණිස හෝ ඇති කර තිබෙන ස්ථානවලට ස්වදේශිකයන්ටත් යන්නට සිදු වෙනවා. ඒ නිසා සංචාරකයන් ගැනම කල්පනා කර ස්වදේශිකයන්ගේ වුවමනා එපාකම් ගැන අමතක කිරීම සුදුසු නැහැ. එමනිසා විශේෂයෙන් සංචාරකයන් සඳහා හෝටල් වේවා, වෙනත් ආයතන වේවා පවත්වා ගෙන යාමේදී ඒවායේ අය කිරීම් සම්බන්ධයෙන් සාධාරණත්වයක් තියෙන්නට ඕනෑ.

විදේශ රටකින් විනෝදය සඳහා මෙහි පැමිණෙන, මුදල් හුඟක් තිබෙන කෙනකු ගෙන් වැඩිපුර අය කරගෙන ඒ මුදල් මේ රටේ රැස්කර ගැනීම ගැන අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. එහෙත් අත්‍යවශ්‍ය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

අවස්ථාවලදී ඒ තැන්වලට යන ස්වදේශිකයන්ට ඒ විධියට මුදල් ගෙවන්නට පුළුවන්කමක් නැහැ. ඒ නිසා ඒ හෝටල් වල හෝ වේවා, වෙනත් ආයතනවල හෝ වේවා මුදල් අය කිරීමේදී මේ රටේ රජයේ නිලධාරීන්ට හා පොදු මහජනයාට විශේෂ සහනයක් සැලසෙන්නට ඕනෑ. දෙගොල්ලන්ගෙන්ම එක විධියට අය කරන්නට ගියොත් ස්වදේශිකයන්ට අයුක්තියක් සිදු වන්නට ඉඩ තිබෙනවා. ඇත්ත වශයෙන්ම දැනට අයුක්තියක් සිදු වෙනවා. ඒ ගැන ගරු ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කර විනෝදය සඳහා එන, වියදම් කිරීම සඳහා වැඩිපුර මුදල් තිබෙන විදේශිකයන්ගෙන් වැඩි පුර අය කර ගන්නා අතර අත්‍යවශ්‍යකම නිසා ඒ තැන්වලට එන ස්වදේශිකයන්ට සහනයක් සලසන ලෙස මා ඉල්ලා සිටිනවා.

පසුගිය අවුරුදු හතරේ, හතර හමාරේ කාලය තුළ දේශ සංචාරක ව්‍යාපාරය මගින් ආර්ථික වශයෙන් හා ආධ්‍යාත්මික වශයෙන් මේ රටට කොයි විධියේ සහනයක් සැලසී තිබෙනවාද කියාත් ගරු ඇමතිතුමා මේ සභාවට දන්වනවා නම් අප සතුටු වෙනවා.

පූ. භා. 10.37

එච්. ජී. ඒ. කාරියවසම් මයා. (බෙන්තර-ඇල්පිටිය)

(திரு. எச். ஜீ. ஏ. காரியவசம்—பெந்தர எல் பிற்றிய)

(Mr. H. G. A. Kariyawasam—Bentara-Elpitiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේදී මා නැඟී සිටියේ ගරු රාජ්‍ය ඇමතිතුමාට ඉතා වැදගත් කරුණු කිහිපයක් මතක් කරන්නට අවශ්‍යම නිසයි. එයින් පළමුවෙනි කාරණය මෙයයි. මේ රටේ පළමුවෙනි වරට හෝටල් සංසථාව මගින් හෝටල් පාඨශාලාවක් පවත්වා හෝටල් පාලනය පිළිබඳව තරුණයන් පිරිසකට පුහුණුවක් ලබා දුන්නා. මේ පුහුණුව අවසාන කළ පිරිසක් දැනට රටේ සිටිනවා. ඒ තරුණයන්ගේ අනාගතය පිළිබඳව කුමන ක්‍රියා මාර්ගයක් යොදනවාද කියන කාරණය පිළිබඳව ගරු රාජ්‍ය ඇමතිතුමාගේ අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා. ඒ අයගෙන් සමහරුන් අද ගෙවල්බලල වී සිටිනවා. සමහරුන්ට සමහර හෝටල් වල අතිරේක වැඩ කරන්නට අවස්ථාව ලැබී තිබෙනවා. ඒ අළුතෙන් පුරුදු පුහුණු වී එළියට ආ උදවියගේ අනාගතය තවදුරටත් සරු කිරීම සඳහා ඔවුන්ට වැඩිදුර පුහුණුවක් ලබා දී ඔවුන් ඒ පිළිබඳ විශේෂඥයන් බවට පත් කරන ලෙස මා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා.

දෙවෙනි කාරණය: හෝටල් සංස්ථාව මගින් පවත්වාගෙන යන හෝටලයක් බෙන්තරත් තිබෙනවා. එය පිහිටුවීම සඳහා ගැමියන්ගේ ඉඩම් අත්පත් කර ගත්තා. විදේශිකයන් මේ රටට ගෙන්වා ගෙන මේ රටට විශාල ආදායමක් ලබා ගැනීමේ ලොකු බලාපොරොත්තුවකින් හෝටල් තැනීම සඳහා ගැමියන්ගේ ඉඩ කඩම් හා ගෙවල් දොරවල් අත්පත් කර ගත්තා. මේ නිසා ඒ මිනිසුන්ට වෙන තැන්වල පදිංචිවන්නට සිද්ධ වුණා. ඒ අතර හෝටල් සංස්ථාව සඳහා පවරා ගත් ඉඩම්වල ගෙවල් දොරවල් තිබුණ උදවියට හෝටල් සංස්ථාව මගින් ගෙවල් සාදා දෙන බවට පොරොන්දුවක් දී තිබුණා. ඒ පොරොන්දුව අනුව ඔවුන්ට ගෙවල් සාදා දී තිබෙනවා. එහෙත් ඒ ගෙවල් සඳහා ඔවුන්ගෙන් බදු අය කරන්නට යනවා. ඔවුන්ට අයිතිව තිබුණු වස්තුවක් වන නිවාසය සම්පූර්ණයෙන් අපි අත්පත් කරගෙන ඔවුන්ට බද්දට ගෙයක් දීම විටිනා වැඩක් නොවෙයි. ඒ අත්පත් කර ගත් ඉඩම් වෙනුවෙන් මුදල් ගෙවන්නට දිසාපතිතුමා දැන් සූදානම්ව සිටිනවා. ඒ මුදල් ඔවුන් භාරගත්තත් ඔවුන්ට ගෙවල් සඳහා බදු ගෙවන්නට සිදුවන නිසා මුදල් භාර ගැනීම ඔවුන් ප්‍රතික්ෂේප කරනවා. ඒ නිසා ඒ මුදල් ගෙවීම වහාම නවත්වන ලෙස දිසාපතිතුමාට දන්වන ලෙස මා ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මා තමුන්නාන්සේගෙන් දිනයක් ඉල්ලා සිටියේ ඒ පිළිබඳව සාකච්ඡා කිරීමටයි. මෙය ඉතා යුක්තිසහගත ඉල්ලීමක් සමහරුන්ට අයිතිව තිබුණු විශාල ගෙවල් අපි කඩා දමා ඒ ඉඩම් සංස්ථාවේ ප්‍රයෝජනය සඳහා ලබා ගත්තා. ඔවුන් සතුව තිබුණු එකම වස්තුව වන ගෙවල් අපි කඩා බිඳ දමා, ඒ වෙනුවෙන් අපි ඔවුන්ට සදා දෙන ගෙවල් වලින් බදු අය කිරීම සුදුසු නැහැ. ඒ ගෙවල් ඔවුන්ට උරුම ගෙවල් හැටියට සින්නකර හැටියට දෙන ලෙසයි මා ඉල්ලා සිටින්නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුන්වෙනි කාරණය: හෝටල් සංස්ථාවේ බෙන්තර ආයතනයට සේවකයන් බඳවා ගැනීමේදී, කර්මාන්තශාලා ආදිය පිහිටු වීමේදී පිළිගත් ප්‍රතිපත්තිය අනුව බෙන්තර කොට්ඨාශයට අයත් උදවියට සැහෙන අන්දමට රැකීරක්ෂා සැපයීමට ක්‍රියා කරන ලෙසත් මා ඉල්ලා සිටිනවා.

විදේශිකයන්ගේ මනස යොමුවන අන්දමට මේ ස්ථානයේ අවට පරිසරය සකස් කිරීම සඳහා අනෙකුත් දෙපාර්තමේන්තු වලත් සහයෝගය ලබාගෙන කටයුතු කරන ලෙස ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. මේ ස්ථානය මුහුදත් ගඟත් අතර පිහිටි දර්ශනීය ස්ථානයක් වුණත්, අවට පරිසරය සකස් නොකළොත් ඒ දර්ශනීයත්වය අංග සම්පූර්ණ වෙන්නෙ නැහැ. බෙන්තර අති පුරාණ නගරයක්. උසස් ලෙස දියුණු වී පැවති නගරයක්. ශාස්ත්‍රාලෝකය පැවති නගරයක්. බොහොම ලස්සන පන්සල් තිබුණු නගරයක්. ඒ වගේම බොහොම දර්ශනීය ආකාරයට පිළිවෙළ කළ හැකි නගරයක්. ඒ නිසා විදේශවලින් එන උදවියට පිටිසර ගම්බද ගම්මානයක සිරියාව පෙනී යන ආකාරයට එහි පැවති ඒ පැරණි සිරියාව නැවත ඇති කිරීම සඳහා අනිකුත් දෙපාර්තමේන්තුවලත් ආධාර ඇතිව වැඩ පිළිවෙලක් සකස් කළොත්, එය විදේශිකයන් එහි අද්දවා ගැනීමට විශාල උපකාරයක් වෙනවා ඇති. මා මීට වඩා යමක් කියන්නට යන්නෙ නැහැ. මා මේ සඳහන් කරන ලද කරුණු තුන-හතර ගැන කල්පනා කර සුදුසු පියවර ගන්නා හැටියට ඉල්ලා සිටිනවා.

පූ. භා. 10.42

ලීලාරත්න විජේසිංහ මයා. (පොළොන්නරුව)

(திரு. லீலாரத்ன விஜேசிங்க—பொலன்னறுவை)

(Mr. Leelaratne Wijesinghe—Polonnaruwa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංචාරක මණ්ඩලයක් පිහිටුවීම සඳහා අවශ්‍ය මුදල් ඉල්ලා ඉදිරිපත් කරන ලද පරිපූරක ඇස්තමේන්තුව අපේ සාකච්ඡාවට භාජන වන මේ අවස්ථාවේ මාත් වචන ස්වල්පයක් කථා කරන්න බලාපොරොත්තු වෙනවා. ඈත අතීතයේ සිටම මේ රමණීය දිවයින විදේශ සංචාරකයන්ගෙන් නම් කොයි හැටියෙන්වත් හිස් වූ තැනක් නොවෙයි. ඒ බව අපට අපේ ඉතිහාසය පිළිබිඹු කරන පොත පතින් සහ වෙනත් ලිපිලේඛන අනුව කියන්නට පුළුවනි. පුරාතන කාලයේ සිටම අපේ මේ ලංකා ද්වීපයට ලෝකයේ නානා රටවලින් නානා මාදිලියේ පුද්ගලයන් වරින් වර පැමිණ තිබෙන බව සියලු දෙනාම පාහේ හොඳාකාර දන්නවා. ඉබන් බතූතා, මාර්කෝපෝලෝ, පාහියන්, ඇන්ටන් චෙකොව් ආදීන් පමණක් නොව මෑත අතීතයේ පෘතුගීසීන් සහ ඕලන්දකාරයන් මෙන්ම ඉංග්‍රීසිනුත් මේ රටට ඇවිත් තිබෙනවා. සුප්‍රසිද්ධ ගත්කරුවන් මෙන්ම ධර්ම ගවේශකයන්ද, වෙනත් නොයෙක් විශිෂ්ට පුද්ගලයන් මෙන්ම රටවල් අල්ලා ගැනීමේ යෙදුණු අධිරාජ්‍යවාදීනුත් මේ රටට වරින් වර පැමිණ තිබෙනවා. ඔය හැම දෙනාම ලංකාවේ කාලයක් ගත කර ලංකාව ගැන හොඳ විස්තර ලියා තිබෙනවා. ඒ අතර, ලංකාවට නුදුරින් පිහිටි රටවලින් මේ රටට කල්ලතෝනින් වැනි උදවියත් පැමිණ ලංකාවේ ස්වාභාවික සුන්දරත්වය ගැන සිත් සතන් පැහැදී ඒවාට වශී වී අන්ති මේදී මේ රටේම පැලපදියම් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් දැන් අපට නොයෙක් විධියේ හිරිහැර කරදරවලටත් මුහුණ පාන්නට සිදු වී තිබෙන බව තමුන්නාන්සේ හොඳාකාරවම දන්නවා.

ඈත අතීතයේ මෙන්ම මෑත අතීතයේත් කොයි තරම් ජන කායක් මේ රටේ සුන්දරත්වය, රමනීයත්වය දැක බලා ගැනීමට පැමිණ ඇතත් මේ රටේ රමණීයත්වයෙන් සහ සුන්දරත්වයෙන් නිසි විධියට අපේ ලංකාවට තවමත් හරියාකාර ඵල ප්‍රයෝජන ලබා ගන්නට පුළුවන්කමක් ඇතිවීයයි මට නම් කිසි සේත් සන්තෝෂ වන්නට පුළුවන්කමක් නැති බව ප්‍රකාශ කරන්නට සිදු වී තිබෙන බව කියන්නට ඕනෑ. අපේ ගරු රාජ්‍ය ඇමතිතුමා නම් මෑත කාලයක සිට අපේ රටට විදේශ සංචාරකයන් ගෙන්වා ගැනීමටත්, ඒ මගින් අපේ රටට විදේශ ධනය ලබා ගැනීමටත් උනන්දුවක් දක්වා බලවත් වෑයමක් කරන බව පෙනෙන්නට තිබෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලීලාරත්න විජේසිංහ මයා.]

නිසා ඒ ගැන අපේ සතුට පළ කර සිටින අතර එතුමාට ස්තුති කරන්නටත් කැමතියි. ඒ කොයි හැටි වෙතත් මෑත කාලයකසිට අපේ රටට ඇත පුරාණයේ මෙන් ඉහළ පෙළේ ධර්ම ගවේශකයන්, ග්‍රන්ථ කර්තෘවරුන් වැනි ශ්‍රේෂ්ඨ පුද්ගලයන් ඒ තරම් විශාල වශයෙන් පැමිණෙන පාටක් මට නම් දකින්නට ලැබී නැහැ. අපට නම් වැඩි වශයෙන්ම මෑත කාලයක දකින්නට ලැබී තිබෙන්නේ සුදු අහිකුණ්ඨකයන් වැනි අය තමයි. ගමක් ගමක් ගානේ ඇවිදින අහිගුණ්ඨකයන් වැනි හිපියන්ද මොකුන්ද වැනි උදවිය නම් මේ රටට දැන් වැඩි වැඩියෙන් එන බව අසන්නට ලැබෙනවා. හිපියන් දැන් එංගලන්තයෙත් ඉන්නවායයි ගරු ඇමතිතුමාම කියනවා අපට අහන්නට ලැබුණා. මේ උදවිය දැන් ගමක් ගමක් පාසා ගිහිල්ලා අපේ සංස්කෘතිය කැබැසිනියා කර දමන වැඩ පිළිවෙළක යෙදෙන බව දැනගන්නට ලැබී තිබෙනවා. අපේ සංචාරක ව්‍යාපාරය ගැන දැන්නම් අපට ඔය විධියේ තත්ත්වයක් ගැන තමයි කියන්නට තිබෙන්නේ.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

ඇයි, සීගිරියේ චිත්‍ර එහෙමත් බලන්න පුළුවනි නේද ඒ අයට?

ලීලාරත්න විජේසිංහ මයා.
(திரு. லீலாரத்ன விஜேசிங்க)
(Mr. Leelaratne Wijesinghe)

ඒවාත් බලන්න නම් පුළුවනි තමයි. එහෙත් දැන් එසිනුත් ඒ තරම් ප්‍රයෝජනයක් නැහැ. ඒවාත් දැන් නැති නාස්ති කරලයි තියෙන්නේ.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

බොහොම නවීන ඇදුම් එහෙමත් තියෙන්නේ.

ලීලාරත්න විජේසිංහ මයා.
(திரு. லீலாரத்ன விஜேசிங்க)
(Mr. Leelaratne Wijesinghe)

විදේශ සංචාරය වැඩි දියුණු කරන්නට උත්සාහ කරන බවත්, ඒ මගින් මේ රටට විශාල වශයෙන් විදේශ විනිමය ලබා ගන්නට පුළුවන් වන බවත් ගරු රාජ්‍ය ඇමතිතුමා ප්‍රකාශ කළා. සියේට විස්සක්ද කොහෙද ලාභ වශයෙන් ගන්නට බලාපොරොත්තු වන බවත් කියා තිබුණා. එහෙත් දැන් නම් අපේ තානායම්වල ඉන්නේ නිකම් කුදිරකාරයන් වැනි රෙස්ට්හවුස් කිපර්ලායයිද, ඒ උදවියගෙන් වැඩි ප්‍රයෝජනයක් නැතැයිද කියනවා ඇහුණා. නිසි දැනුමක් නැති උදවිය ඒවායේ සිටින බවත් කියනවා ඇහුණා. එපමණක් නොව පසුගිය දිනක ගරු රාජ්‍ය ඇමතිතුමා වරකාපොළ රෙස්ට්හවුස් එකට ගිය අවස්ථාවේ කෑම වේලක් කන්නට පවා පුළුවන්කමක් එහි නොතිබුණු බව එතුමාම ප්‍රකාශ කළා මට මතකයි.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

වරකාපොළ ගැන මම කවදද කිව්වෙ? මම කිව්වෙ නැහැ.

ලීලාරත්න විජේසිංහ මයා.
(திரு. லீலாரத்ன விஜேசிங்க)
(Mr. Leelaratne Wijesinghe)

ගරු ඇමතිතුමා ගිය වේලාවෙ කෑම ටිකක් කන්න තිබුණෙ නැතෙයි කිව්වෙ. කුල්පෙට්ටිය තිබුණෙ නැහැ. කෝකියන් හිටියේ නැහැ, කියලා ඇයි ගරු ඇමතිතුමා කිව්වා නේද?

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

වරකාපොළ?

ලීලාරත්න විජේසිංහ මයා.
(திரு. லீலாரத்ன விஜேசிங்க)
(Mr. Leelaratne Wijesinghe)

මට වැරදුණා. වරකාපොළ නොවෙයි, අඹේපුස්ස රෙස්ට්හවුසිය ගැනයි ගරු රාජ්‍ය ඇමතිතුමා සඳහන් කෙළේ. ඒ විධියේ තත්ත්වයකට ඇවිත් තියෙනවා නම් එය නැති කරන්නට ඕනෑ. සාමාන්‍ය තත්වයේ තානායම් තවත් වැඩි දියුණු කරන්නට ඕනෑ. ගරු රාජ්‍ය ඇමතිතුමාගේ හෝටල් සංස්ථාවට අපේ සාමාන්‍ය පෙළේ තානායම් ගැනීමෙන් පසු දැන් ඒවා බොහොමයක්ම ධනපතියන්ගේ පාරාදීස

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යන් බවට පත් වෙලා තිබෙනවා. කොළඹ සිට පොළොන්නරුවට ගිය කෙනෙකුට පහසුවෙන් කෑම වේලක් ගන්නට පුළුවන් කමක් නැහැ. වෙන එකක් තබා අපේ ගරු ඇමතිවරයෙකුට වුවත් කෑම වේලක් ගන්නට පුළුවන්කමක් නැති තරමයි. අපේ අමුත්තකුට කෑම වේලක් දෙන්නට එවැනි තැනකින් කොහොමත් බැහැ. හොඳට සාක්කුව පිරිලා තියෙන්න ඕනෑ එවැනි තැනකින් කෑම වේලක් කන්න. සල්ලි පසුම්බිය පිරිලා තියෙන්න ඕනෑ. අපට පෙනෙන හැටියට නම් මේ රටේ ජනතාව සූරා කන්නට මඟ බලාගෙනයි මේවා තිබෙන්නේ. ඒ විධියටයි වැඩ පිළිවෙළ සකස් වෙලා තියෙන්නේ. මේ රටේ ජනතාව සූරා කන්නේ නැතිව පිටරටින් එන ධනපති සංචාරකයන්ගේ මුදලින්, මේ රට බලන්නට එන උදවියගේ මුදලින් අපේ රටට විදේශ ධනය ලබා ගන්නට පුළුවන් වැඩ පිළිවෙළක් යොදන්නැයි මා ගරු ඇමතිතුමාට මතක් කරන්නට කැමතියි.

නිකවැරටියේ ගරු මන්ත්‍රීතුමා (එම්. තෙන්නකෝන් මයා.) සඳහන් කළ කරුණු මාත් අනුමත කරනවා. ලංකාවේ දැකුම්කලු ස්ථාන අති විශාල සංඛ්‍යාවක් තිබෙන බව පිළිගන්නට ඕනෑ. ඒවා බොහොමයක් ස්වභාවයෙන්ම ඇති වූ ස්ථාන බව අපි දන්නවා. ස්වභාව ධර්මයේ සෞන්දර්යවත් නිර්මාණයන් අපේ රටේ හැම තැනම පාහේ විසිර ගොස් තිබෙනවා. ඒවා ධන නිධානයන් හැටියටත් සලකන්නට පුළුවනි. අපේ සුන්දර වෙරළවල් බලන්නට විදේශීන් විශාල වශයෙන් එන්නට පුළුවනි. විශේෂයෙන්ම අපේ දැකුම්කලු දිය ඇලි බලන්නට මා කල්පනා කරන හැටියට අති විශාල සෙනඟක් ඇදෙන්නට ඉඩ තිබෙනවා. ඒ නිසා හිල්ටන් වාගේ මහා විශාල හෝටල් ඇති කරන්නට වුවමනාවක් නැහැ. අපේ රටේ තිබෙන වෙනත් අංශවලින් විදේශීන්ට විනෝදය ලබා ගත හැකියි. ඒ සඳහා වැඩ පිළිවෙළක් ඇති කරන හැටියට මතක් කරන්නට කැමතියි.

අපේ රටේ නැගෙනහිර වෙරළේ පාසිකුඩාව නම් ස්ථානය ගැන තමුන්නාන්සේ දන්නවා. එය ඉතාමත් දැකුම්කලුයි. පොඩි ළමයින්ට වුවත් නාන්නට පුළුවනි, එතන එහි රෙස්ට් හවුස් එකක් තිබෙනවා. එය ආදි කාලයේ නැත්නම් පරංගි කාලයේ එකක් වෙන්න ඇති. මේ පාසිකුඩාවේ වෙරළ ඉතා සුළු මුදලක් වියදම් කර දියුණු කළොත් අර යුගෝස්ලාවියාවේ ඕපාතියා වෙරළ වගේ තත්ත්වයකට ගෙනෙන්නට පුළුවන්. ඒ ඕපාතියා වෙරළට මුළු යුරෝපයේම ජනතාව එනවා, විනෝද වීම සඳහා එහෙත් එහි තට්ටු බිල්ඩිං නැහැ. සංචාරකයින් කුඩාරම් ආදිය අරගෙන ඇවිත් නොයෙක් විධියට එහි විනෝද වී යනවා. ඒ විධියට මේ රටේ ස්වාභාවික සෞන්දර්යය ගැන ගරු ඇමතිතුමා කල්පනා කළොත් මේ විධියට ලක්ෂ කෝටි ගණන් වියදම් නොකර සාමාන්‍ය මුදලක් වියදම් කිරීමෙන් මේ රටේම දේශ සංචාරකයින් වුවත් එහි ගෙන්වා ගන්නට පුළුවන් වෙනවා. අද ලක්ෂ ගණන් ජනතාව යන කතරගම අනුරාධපුරය, පොළොන්නරුව, මුන්නේස්වරම, මඩු ආදී තැන්වල දේශ සංචාරක ව්‍යාපාරය මගින් එක්තරා තත්ත්වයක් ඇතිව ජීවත් වන්නට කෑම වේලක් ගන්නට වැඩ පිළිවෙළක් හැදුවා නම් ඒ ඒ කාලවලදී කොපමණ ආදායමක් ලබා ගන්නට තිබුණාද? එහෙත් එවැනි තත්ත්වයන් ගැන කල්පනා නොකර පිටරටින් එන හිපියන් ගැන පමණක් කල්පනා කර දේශ සංචාරයේ මුවාවෙන් මේ රටේ සංස්කෘතිය කාබාසිනියා කරන්නට වුවමනාවක් නැහැ. "මසාජ් ක්ලිනික්" ආදිය ගැන පසුගිය දවස්වල කීවා. ඕනෑ නම් ඒවා ගෝල්ෆේස් එකේ වැනි කිපපොළක හදා ගත්තාට කමක් නැහැ. ඒවා ගැන ඒ තරම් දුරට කල්පනා කරන්න වුවමනාවක් නැහැ. එහෙත් මේ රටේ නොයෙක් තැන්වල තිබෙන සෞන්දර්යය නැරඹීමේ වැඩ පිළිවෙළක් ඇති කරන්නට ගරු රාජ්‍ය ඇමතිතුමාට පුළුවන්. ඒ ගැන ගරු ඇමතිතුමාට බුද්ධිය පහළ වේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

பி. ப. 10.49

එම්. ඊ. එච්. මොහමඩ් අලි මයා. (මුතූර් පළමුවන මන්ත්‍රී)

(ஐ.ப எம். ஈ. எச். முகம்மது அலி—மூதூர் முதல் அங்கத்தவர்)

(Mr. M. E. H. Mohamed Ali—First Mutur)

கௌரவ உப சபாநாயகர் அவர்களே, உல்லாசப் பிரயாணிகளை ஊக்குவிக்கும் நோக்கமாக இங்கு எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகளுக்கு முதலில் எனது பாராட்டுதல்களைத் தெரிவித்துக் கொள்ள விரும்புகிறேன். உல்லாசப் பிரயாணிகளை ஊக்குவிக்கும் பொருட்டு அதனுடன் சம்பந்தப்பட்ட இலாகாவுக்காக இங்கு முப்பத்தைந்து இலட்சம் ரூபா கோரப்பட்டுள்ளது. உல்லாசப் பிரயாணிகளை ஊக்குவிக்கும் நோக்கமாக இந்த நாட்டிலே பல ஹோட்டல்கள் ஆரம்பிக்கப்பட்டுள்ளன. ஆனால், தனிப்பட்டவர்களும் நல்ல விதத்தில் உல்லாசப் பிரயாண விடுதிகளை அமைக்க அரசாங்கம் குறைந்த வட்டிவிகிதத்தில் கடன் உதவிகளை அளிக்க வேண்டும் என்று நான் அரசாங்கத்தைக் கேட்டுக்கொள்கிறேன்.

என்னுடைய மாவட்டத்தைப் பற்றி நான் இங்கு பேச விரும்புகிறேன். திருமலை மாவட்டத்தில் வர்ணனைக்கு அப்பாற்பட்ட அழகிய இயற்கைக் காட்சிகள் பல உள்ளன. அழகிய கடற்கரை ஓரங்களும் திருமலை மாவட்டத்தில் இருக்கின்றன. உல்லாசப் பிரயாணிகளைக் கவரக்கூடிய ஏராளமான இடங்கள் திருமலை மாவட்டத்தில் உள்ளன. கௌரவ இராஜாங்க அமைச்சர் (கௌரவ ஜே. ஆர். ஜயவர்தன) அவர்கள் சில நாட்களுக்கு முன்னர் திருமலை மாவட்டத்திற்கு விஜயஞ் செய்த போது அவர் சென்ற இடங்களுக்கெல்லாம் நானும் அவருடன் செல்ல எனக்குச் சந்தர்ப்பம் கிடைத்தது. சீனக்குடா, குச்சவெளி, நிலாவெளி உட்பட அழகிய காட்சிகள் நிரம்பிய பல இடங்களை அமைச்சரும் அவருடன் வந்த உல்லாசப் பிரயாண இலாகாவினரும் பார்வையிட்டார்கள். இத்தகைய இடங்களில் உல்லாசப் பிரயாணிகளைக் கவர என்ன என்ன வழிவகைகளைக் கையாளவேண்டுமென்று அப்பொழுது ஆராயப்பட்டது. நம் நாட்டில் எங்கெங்கு அரசாங்கத்தினர் உல்லாசப் பிரயாண விடுதிகளை அமைக்க விரும்புகிறார்களோ ஆங்காங்கெல்லாம் தனிப்பட்டவர்களும் உல்லாசப் பிரயாண விடுதிகளை அமைக்க அரசாங்கம் தன்னால் இயன்ற அளவு உதவிகளைச் செய்ய வேண்டும். திருமலையில் சில தனிப்பட்டவர்கள் உல்லாசப்பிரயாண விடுதிகளை அமைக்க விரும்பு கிறார்கள். அவர்களுடைய கோரிக்கைகளுக்குத் திருப்தியான முறையில் இதுவரை பதிலளிக்கப்படவில்லை என்பதை நான் சுட்டிக் காட்ட விரும்புகிறேன்.

எங்கள் நாட்டின் கலை, கலாசார அடிப்படைகளுக்கேற்ப உல்லாசப் பிரயாணிகளைக் கவரும் வழிவகைகள் மேற்கொள்ளப்பட வேண்டும். பிறநாடுகள் இத்துறையில் எவ்விதம் முன்னேறி உள்ளன என்பதை அறிந்து நாமும் நமது கலாசாரம் பாதிக்கப்படாத முறையில் இத்துறையில் முன்னேற வேண்டும். பலர் இங்கு வெளிநாடுகளின் ஆபாசப் பிரச்சினைகளைக் குறிப்பிட்டுப் பேசினார்கள். வெளிநாடுகளில் நிர்வாண நடனங்களும் குடிப் பழக்கவழக்கங்களும் இருந்தால் அவற்றை நாமும் பின்பற்ற வேண்டும் என்பதில்லை. அத்தகைய நடை முறைகளை நாம் பின்பற்றி மேலும் நமது கலை, கலாசாரத்திற்கு ஏற்ற முறையில் உல்லாசப் பிரயாணிகளை திருப்திப் படுத்தக் கூடிய முறையிலும் திட்டங்களை வகுத்தால் அதனால் நாட்டிற்கு நன்மையாக இருக்கும். சிலர் இது விடயத்தில் விஷயங்களை விளங்கிக் கொள்ளாமல் வெளிநாட்டு உல்லாசப் பிரயாணிகள் மேற் குற்றம் சுமத்துவது வருந்தத் தக்கது. உதாரணமாகச் சிலர் 'ஹிப்பீஸ்' களைப் பற்றிக் குறைகூறினார்கள். அவர்கள் விபசாரத் தொழிலில் ஈடுபட்டுக் கொண்டிருக்கின்றார்கள் என்றும் சிலர் கூறினார்கள். உண்மையை உணராமல், எதையும் நேரில் ஆராயாது நம் நாட்டைக் காண வருபவர்கள் மீது குற்றம் காண்பது மிகவும் கண்டிக்கத் தக்கது. அவர்கள் அவ்விதமான தொழிலிலே ஈடுபடுகிறார்களோ என்பது தெரியாது. அத்துடன் அப்படிக் கூறுபவர்கள் தங்கள் சொந்த அனுபவத்தைத்தான் இங்கு கூறினார்களோ என்பதும் தெரியாது. ஆகவே, நேர்முகமாக செயல்களைக் காணாது மற்றவர்கள் மீது குற்றம் கூறுவது நல்லதல்ல என்பதே எனது அபிப்பிராயம். [குறுக்கீடு]

பத்திரிகைகளைக் கவனத்துக்கு எடுக்க வேண்டாம். கௌரவ மிகிந்தலைப் பிரதிநிதி (திரு. பீ. எம். கே. தென்னகோன்) தமது அனுபவத்தைத்தான் எடுத்துக் கூறுவதாக

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

இருந்தால் இப்படிக் கூறலாம். பத்திரிகைகளில் எழுதியிருப்பதைப் பார்த்து குற்றம் சுமத்துவது நல்லதல்ல.

நான் அரசாங்கத்தைக் கேட்டுக் கொள்வது என்னவென்றால், உல்லாசப் பிரயாணம் சம்பந்தமாக எங்கள் நாட்டுக்கு உகந்தவாறு திட்டங்களைத் திருத்தியமைத்து, திருப்தியான முறையிலே அவற்றை அமுல் நடத்த வேண்டுமென்பதே. அவ்விதம் செய்ய வேண்டுமென்று கேட்டு எனது பேச்சை முடித்துக் கொள்கிறேன்.

பி. ப. 10.55

බී. වයි. තුඩාවේ මයා. (මාතර)
(திரு. பி. வை. துடாவ—மாத்தறை)
(Mr. B. Y. Tudawe—Matara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා බලාපොරොත්තු වන්නේ නැහැ දීර්ඝ කථාවක් කරන්නට. එක කරුණක් පමණයි මතක් කරන්නට බලාපොරොත්තු වන්නේ. දේශ සංචාරකයින් මේ රටට ගෙන්වා ගැනීම ගැන ඇත්ත වශයෙන්ම රටේ ලොකු විරුද්ධත්වයක් තිබෙනවා. ආදායම් ලබා ගැනීම පිණිස රජය එම ව්‍යාපාරය දියුණු කිරීමට උත්සාහ කළත් මේ රටේ සංස්කෘතිය ආරක්ෂා කර ගැනීමට කැමති මහජනයා ගෙන් ඒ සඳහා සෑහෙන විරෝධයක් එන බව ගරු ඇමතිතුමා පිළිගන්නවා ඇති. එහෙත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කොපමණ කීවත් එම ව්‍යාපාරය නවත්වන්නට රජයවත් ඇමතිතුමාවත් බලාපොරොත්තු වන්නේ නැහැ.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
මොන ව්‍යාපාරයද?

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
දේශ සංචාරකයින් ගෙන්වා ගැනීමේ හා ඔවුන් සඳහා හෝටල් ආදිය දියුණු කිරීමේ ව්‍යාපාරය.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
එය නවත්වන්න කියලද කියන්නේ? එය නවත්වන්න කියනවාද, පවත්වාගෙන යන්න කියනවාද? කෙලින්ම කියන්න.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
පෙනෙන විධියට සැලකිය යුතු ආදායමක් නැත්නම්, සංස්කෘතියටත් පහර වදිනවා නම් ගරු ඇමතිතුමාගේ යුතුකම එය නවත්වන එකයි.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
එහෙනම් පොල්හේනේ හෝටලයක් ඇති කරන්නය කියා යෝජනාවක් ගෙනාවේ? මතක නැත්නම් හැන්සාඩ් වාර්තාව බලන්නකෝ.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
ගරු රාජ්‍ය ඇමතිතුමා කලිනුත් ඔක කිව්වා. සුළු දෙයක් අල්ලා ගෙන එයින් උත්සාහ කරන්නේ කථාව නවත්වන්නටයි. ප්‍රශ්නය මතු වූ නිසා ඒ ගැන සඳහන් කරන්නට කැමතියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මාතර පොල්හේනේ ස්වභාවික සමුද්‍ර තටාකයක් තිබෙනවා. ලංකාවේ කිසිම තැනක එබඳු තටාකයක් නැත කියන එකයි එහි ජලස්නානය කළ අයගේ අදහස. එය ලක්ෂණ තටාකයක්. කිසිම බියක් නැතිව එහි නාන්නට පුළුවන්. එවැනි ස්වාභාවික තටාකයක් ලංකාවේ වෙන කොහේවත් නැහැ. එම තටාකය දියුණු කරන්නය කියා මා යෝජනාවක් ඉදිරිපත් කළා. එයින් මා අදහස් කළේ විදේශිකයින් සඳහා එය දියුණු කරන්නය කියන එක නොවෙයි. ලංකාවේ අය්ටත් මුහුදු වතුර ටිකක් නා ගැනීමට පහසුකම් සැලැස්වීමේ ඇති වරද කුමක්ද? ඒ නිසා එම සමුද්‍ර තටාකය දියුණු කරන්නය කියා මා යෝජනාවක් ඉදිරිපත් කළා. ඇඳුම් ගැලවීමට ස්ථානයක්, වෙනත් වෙනත් ශාරීරික වුවමනා ඉෂ්ට කර ගැනීමට සථානයක් ආදිය ඇති කරමින් පහසුකම් සලස්වන ලෙස මා කියා සිටියා. හෝටලයක් විවෘත කරන්නට නම් මා කීවේ නැහැ. මා මේ යෝජනාව ඉදිරිපත් කළ විට ගරු රාජ්‍ය ඇමතිතුමා එය හෝටල් සංසථාවට ඉදිරිපත් කළා. එවිට හෝටල් සංසථාව ඒ කිට්ටුව ඉඩමක පදිංචිව සිටින ඕනිසුන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

ටික පන්නා දමා එතැන හෝටලයක් හදන්නට ලෑස්ති වුණා. ඒ වැඩ පිළිවෙල ගෙන යන කොට මා මගේ යෝජනාව ඉල්ලා අස් කර ගත්තා. හෝටලයක් සෑදීමට මා යෝජනා කෙළේ නැහැ. විදේශවලින් එන සංචාරකයන්ට එතැන පහසුකම් ඇති කරන්නට නොවෙයි, මා කිවේ. ලංකාවේ මහජනයාට මුහුදු වතුර නාන්නට හොඳ නැද්ද? මා කීවේ ලංකාවේ ජනතාව ගැන මිස, දේශීය සංචාරකයන් ගැන මිස විදේශීය සංචාරකයන් ගැන නොවෙයි.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

මම උත්තර දෙන්නම්.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

එසේ කීවාට රාජ්‍ය ඇමතිතුමාට ඒක අමතක වෙනවා. පසුගිය වාරයේත් උත්තර දුන්නේ නැහැ. මේ සමුද්‍ර තටාකය දියුණු කිරීම ඉතාමත්ම වැදගත් බව මා මතක් කරන අතර එතැන හෝටලයක් විවෘත කරනවාට මා විරුද්ධ බවද මතක් කරනවා. මා ඊට විරුද්ධයි; මහජනයාත් ඊට විරුද්ධයි. ඒ අසල ආරාම දෙකක් තිබෙනවා. ඒ ආරාම දෙකේ හාමුදුරුවරුන්ගේ අත්සන් සහිතව ගරු රාජ්‍ය ඇමතිතුමාටත් පළාත් පාලන ඇමතිතුමාටත් පෙත්සම් එවා තිබෙනවා. එතැන හෝටලයක් සෑදීම ගැන විරුද්ධත්වය ප්‍රකාශ කිරීම සඳහා ඒ ආරාමවල රැස්වීම් කීපයක්ම පවත්වන්නට යෙදුණා. මේ හෝටලය විවෘත කළහොත් පළාතේ තරුණ තරුණියන්ගේ හැදිච්චකම නැති වන බව ඒ රැස්වීම්වලදී ප්‍රකාශ කර තිබෙනවා. රාජ්‍ය ඇමතිතුමා ඒ අදහස පිළිගත්තත් නොගත්තත් සිදු වන්නේ ඒකයි. නික්කඩුවේ තානායම වැඩි දියුණු කිරීම නිසා ඒ ප්‍රදේශයේ තරුණ තරුණියන්ගේ හැදිච්චකම නැති වී තිබෙන බව ඒ ප්‍රදේශයේ මහජනයා කියනවා. මුදල් ටිකක් නම් ලැබෙනවා ඇති. එහෙත් ඒ හෝටලය නිසා සංස්කෘතිය, හැදිච්චකම නැති වෙනොත් ඒ ලැබෙන මුදලෙන් වැඩක් නැහැ. ආණ්ඩුව මුදල් හම්බ කර ගත්තාට අපට කමක් නැහැ. එහෙත් මේ රටේ හැදිච්චකම නැති කරන්නට ඉඩ දෙන්නට බැහැ.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

මාතරත් එහෙම නොවැ? හොඳ දේවලුත් තිබෙනවා; නරක දේවලුත් තිබෙනවා.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

මාතර විතරක් නොවෙයි, ලංකාවේ හැම තැනමත් ලෝකයේ හැම තැනමත් ඒක එහෙම වන්නට පුළුවනි. ඔය විධියට උත්තර දී ගැලවෙන්නටද රාජ්‍ය ඇමතිතුමා කල්පනා කරන්නේ? අප කොපමණ කීවත් රාජ්‍ය ඇමතිතුමා හෝටල් සෑදීම නතර කරන එකක් නැහැ. එතුමාට තිබෙන එකම ව්‍යාපාරය ඕකයි. දුම්රියේ ගමන් කරන විට බෙන්තොට සෑදන හෝටලය පේනවා. එය හෝටලයක් නොව යුද කඳවුරකැයි මහජනයා කියනවා. එය කළු ගල්වලින් බොහොම ශක්තිමත් විධියට හදනවා. ඒ වාගේම ඒය මුහුදු වෙරළට කිට්ටු සථානයක්. මොනවා කීරීමේ බලාපොරොත්තුවෙන් මෙය හදනවාදැයි දන්නේ නැහැ. මෙහි අමෙරිකන්කාරයන් තුන් හාර සීයකට බොහොම පහසුවෙන් හැංගි සිටින්නට පුළුවනි. ඔවුන් මොන මොන දේවල් ගෙනැවිත් හැංගි සිටින්දැයි දන්නේ නැහැ. මේ ආණ්ඩුවට විරුද්ධව මේ රටේ ජනතාව නැගී සිටින විට ඒ ජනතාවට විරුද්ධව පහර එල්ල කරන උදව්යගේ බලකොටුව මේක විය හැකියි. ඒ අතින් කල්පනා කළත් මෙහි ලොකු අන්තරායක් තිබෙනවා. මෙය විශාල බලකොටුවක් මිස හෝටලයකැයි දුම්රියේ ගමන් කරන මහජනයාට නම් කියන්නට පුළුවන්කමක් නැහැ.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

රුසියන් ආක්‍රමණයට විරුද්ධ බලකොටුවක්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

මොන පැත්තෙන් ආක්‍රමණය ආවත් අප විරුද්ධයි. අප ඇමෙරිකන් ආක්‍රමණයටත් විරුද්ධයි; රුසියන් ආක්‍රමණයටත් විරුද්ධයි. ඒ ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ.

විදේශවලින් එන සංචාරකයන්ගේ පහසුව සඳහා හෝටල් සෑදීමට ආණ්ඩුව විශාල උත්සාහයක් ගත්තත් දේශීය වශයෙන් මේ රටේ සංචාරය කරන උදවියට සෑහෙන පහසුකම් සලස්වා නැතැයි කියන්නට සිදු වී තිබෙනවා. ලංකාවේ තිබෙන තානායම් දිහා බලන්න. දේශ සංචාරකයන්ගේ පහසුව සඳහායි, තානායම් ඇති කොට තිබෙන්නේ. එහෙත් ලංකාවේ තිබෙන තානායම් පාලනය වන්නේ එක එක විධියටයි. ඒවාසින් සමහරක් පළාත් පාලන ආයතන මගිනුත්, තවත් සමහරක් ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය මගිනුත්, තවත් කොටසක් දිසාපති මගිනුත්, තවත් ඒවා සංචාරක මණ්ඩලය මගිනුත් පාලනය වෙනවා. දේශ සංචාරකයෙක් මාතරට ගියොත් නවතින්නට තිබෙන්නේ මාතර තානායම පමණයි. එහෙත් මාතර තානායම ගව මඩුවක් වාගේයි. වාඩි වන්න තරම් සුදුසු පුටුවක්වත් එහි නැහැ. එක්කෝ පුටු කැඩිලා, නැත්නම් අපිරිසිදුයි. මාතර තානායමේදී පාවිච්චි කරන්නට සිදු වන උපකරණවල තත්ත්වය සාමාන්‍ය හෝටලයක තත්ත්වයටත් වඩා අඩුයි. මේ අසතුටුදායක තත්ත්වය වෙනස් නොකරන්නේ ඇයි?

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

කරන්න එපාය කීවේ?

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

තමුන්නාන්සේ ප්‍රශ්නය කණපිට පෙරළන්නට හදනවා. මාතරට තානායමක් එපා යයි කියන්නට බැහැ. තමුන්නාන්සේ මාතර තානායමට ගිහින් බලන්න අඩු තරමින් වාඩි වන්න පුළුවන් පුටුවක්වත් තිබෙනවාද කියා. ඒවා ඒ තරම් අපිරිසිදුයි.

පරිපූරක මුදල්

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

ඒකයි, ලාභ.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

හෝටල්වල පිරිසිදුකම තිබෙන්න එපායැ?

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

පිරිසිදුකමට ඉඩන්න ඕනෑ.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

තමුන්නාන්සේගේ කථාව මට නම් තේරෙන්නේ නැහැ. විදේශීය සංචාරකයන්ට කලින් දේශීය සංචාරකයන්ට පහසුකම් සලස්වන්න ඕනෑ. තිස්සමහාරාමය, කතරගම, ආදී තැන්වලට යන කෙනෙකුට අතරමග නවතින්නට තිබෙන්නේ මාතර තානායමයි. එහෙත් මාතර තානායමේ අවශ්‍ය තරම් පහසුකම් නැති නිසා එහි නවාතැන් ගන්නන් අමාරුකම්වලට මුහුණ පානවා.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

මම උත්තර දෙන්නම්.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

උත්තර දුන්නාට පසුව කථා කරන්නද? ඒ, කොහොම වුණත්, දේශ සංචාරකයන්ට නවාතැන් ගන්නට තිබෙන තානායම්වල පාලනය තමුන්නාන්සේ යටතට ගෙන, ඒවා දියුණු කරන ලෙස මා ඉල්ලා සිටිනවා. විදේශීය සංචාරකයන්ය, දේශීය සංචාරකයන්ය කියා වෙනසක් කරන්නේ නැතිව කාටත් නවාතැන් ගන්නට පුළුවන් විධියට ඒ තානායම් දියුණු කිරීම තමුන්නාන්සේගේ යුතුකමක්. මාතර තානායමේ වැහි දිනක ඉන්නවත් බැරි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

තරම්. රාජ්‍ය ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්තුමා මගේ අදහස අනුමත කර නවා ඇති. එම තානායම පාලනය වන්නේ මාතර නගර සභාවෙනුයි. රාජ්‍ය ඇමතිතුමාට නම් මාතර ගියාම තානායමේ නවාතැන් නොගත්තාට නවාතැන් ගන්න වෙනත් තැන් ඇති. එහෙත් දේශ සංචාරකයන්ගේ පහසුව තකා, මේ තානායම් තමුන්නාන්සේ යටතට ගෙන එය දියුණු කිරීමට අවශ්‍ය විධිවිධාන යොදන ලෙස මා ඉල්ලා සිටිනවා.

පූ. භා. 11.09

පර්සි වික්‍රමසිංහ මයා. (කඹුරුපිටිය)
(திரு. பேர்சி விக்கிரமசிங்ஹ—கம்புறுப்பிட்டியா)
(Mr. Percy Wickremasinghe—Kamburupitiya)

නියෝජ්‍ය කථානායකතුමනි, මේ ණය මුදල දෙන්නට යන්නේ මධ්‍යම පාන්තික කුඩා හෝටල් ඇති කිරීම සඳහායි. විදේශීය සංචාරකයන්ට හෝ වේවා දේශීය සංචාරකයන්ට හෝ වේවා එවැනි හෝටල් අවශ්‍යයි. එම නිසා මේ වැය ශීර්ෂයට අපේ විරුද්ධත්වයක් නැහැ. මාතර තානායමේ තත්ත්වය කවුරුනුත් දන්නවා. එය සංචාරක මණ්ඩලය යටතට ගන්නට බැරි නම්, මාතරත් කුඩා හෝටලයක් ඉදි කරන්න. එවිට ප්‍රශ්නය විසඳෙනවා. එක්කෝ එය දියුණු කළ යුතුයි. එසේ නැත්නම්, මේ මුදලින් කුඩා හෝටල් පිහිටුවිය යුතුයි. රාජ්‍ය ඇමතිතුමාට වුවමනා කර තිබෙන්නේ, හැමදෙනාටම හොඳ හෝටලයකින් කන්න දීමටයි. අද නොයෙක් තැන්වල ලොකු හෝටල් තිබෙනවා. එහෙත්, ඒවාට යන අය රුපියල් සියයේ නෝට්ටු ගණනාවක් අතේ ඇතිව යා යුතුයි. අප වැනි අයට ඒවාට ගොස් පිරිමහන්න බැහැ. පිටස්තරින් එන ධනවත් අයට නම් ඒවා හොඳයි. මැල්ලුම් ආදිය අනුභව කරන ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා වැනි අයටත් පොඩි හෝටල් තිබෙන්නට එපායැ. ගද ගහන තානායම් වෙනුවට මේ විධියේ කුඩා හෝටල් කතරගම වුවත් ඇති කිරීම ඉතාමත් හොඳයි. එම නිසා අපි දීර්ඝ වශයෙන් කතා කරන්නේ නැතිව ඇමතිතුමාට මේ මුදල සම්මත කර දෙමු. හැබැයි මෙය ප්‍රමාද නොකර ඉක්මණින්ම ක්‍රියාවේ යෙදවීමට එතුමා කටයුතු කරන්නට ඕනෑ. මෙයින් රැකි රක්ෂා ප්‍රශ්නයත් බොහෝ දුරට විසඳෙනවා.

පූ. භා. 11.09

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නය සම්බන්ධව විරුද්ධ පාර්ශ්වයෙන් දිවවල් දෙක තුනකින් කතා කෙරුණා. මිනුවන්ගොඩ ගරු මන්ත්‍රීතුමා (ද සොයිසා සිරිවර්ධන මයා.) මේ යෝජනාවටත් දේශ සංචාරක ව්‍යාපාරයටත් සම්පූර්ණ සහයෝගය දෙන බව කිව්වා. එතුමා එසේ කිව්වේ බණ්ඩාරනායක මැතිණියගේ ප්‍රතිපත්ති හොඳින් දන්නා නිසයි. තවත් සමහර මන්ත්‍රීවරුන් තමන්ගේ එකම කතාවේදී මීට පක්ෂවත් විපක්ෂවත් කරුණු දැක්වූවා. විශේෂයෙන් මාතර ගරු මන්ත්‍රීතුමා (තුඩාවේ මයා.) පොල්ගේ නේ ඇඳුම් ගළවන ස්ථානයක් ඇති කරන්නට ඕනෑයයි කිව්වා.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

මා එහෙම කිව්වෙ නෑ.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

එතුමා ඒ ප්‍රශ්නය මටම ඉදිරිපත් කෙළේ මොන හේතුවක් නිසා දැයි මා දන්නේ නෑ. ඇඳුම් අදින ගළවන ස්ථානයක් පොල් හේනෙහි හැදීමට අපගේ බලාපොරොත්තුවක් නැහැ.

මාතර තානායම මා අතට ගෙන දියුණු කරන ලෙස එතුමා මගෙන් ඉල්ලීමක් කළා. ඒ ඉල්ලීම ඉෂ්ට කරන්නට පුළුවනි. එහෙත්, එසේ කරන විට එතැන අය කෙරෙන ගාස්තු වැඩි වෙනවා. තානායමේ වහළය කැඩී ගොස් තිබෙන බව එතුමා කිව්වා. වහළය හදන්න නිකම් බෑ. ඊට මුදල් ඕනෑ. කෑම හොඳ නෑ කිව්වා. හොඳ කෑම දෙන්නත් මුදල් වැඩිපුර ඕනෑ. පුටුවල මකුණන් සිටින බව කිව්වා. මකුණන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වද කරන්නත් නිකම් බෑ. උන්ට බෙහෙත් විදින්නට මුදල් ඕනෑ. හොඳ සේවයක් ලබා ගැනීමට නම් සේවකයන්ට හොඳට පඩි ගෙවන්න ඕනෑ. මේ හැම දෙයක්ම නිසි විධියට සකස් කර දියුණු කරන විට එහි අය කෙරෙන ගාස්තුත් වැඩි කරන්න වෙනවා. කෑම බීම් ඉඳුම් හිටුම් නොමිළයේ දෙන්න බෑ. දිනපතාම ජීවන වියදම ඉහළ යන බව කියමින් තමුන්නාන්සේලා කෑ ගහනවා. ඒ ඉහළ යාම හෝටල් සංස්ථාවට බල පාන්නේ නැද්ද? හොඳ සේවයක් බලාපොරොත්තු වෙනවා නම් ඊට සැහෙන ගාස්තු අය කරන්නට වෙනවා. ලංකාවේ සංචාරකයන්ට වුවත් පිට සංචාරකයන්ට වුවත් ඒ සඳහා වැඩිපුර ගෙවන්නට සිදු වෙනවා. හික්කඩුවේ තානායමේ දිනපතා සේවකයන් 90 ක් නැවති සිටින බව තමුන්නාන්සේලා දන්නවා ඇති.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
නැවතීමට සහ කෑමට දවසකට එක් කෙනකුගෙන් කියක් අය කරනවාද?

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
තමුන්නාන්සේලාගේ වෘත්තිය සමිති දන්නවා ඇති ඒවා. මා කිව්වේ හෝටලයේ සේවකයන් 90 ක් පමණ එහිම පදිංචි වී සිටින බවයි. ඒ අයට කෑම බීම, හා නවාතැන් සපයන්න ඕනෑ. ඒ අයට හොඳ සත්කාර නොලැබෙන බවට කිසිම පැමිණිල්ලක් මට අද වනතුරු ලැබී නැහැ. එතැන සේවයට අනුවක් පමණ දෙනා එහි පදිංචි ව සිටිනවා. මාස්පතා නඩත්තුවට රුපියල් විසි දාහක් වියදම් කරනවා.

කේ. බී. රත්නායක මයා. (අනුරාධපුර)
(திரு. கே. பி. ரத்னயக்க—அனுராதபுரம்)
(Mr. K. B. Ratnayake—Anuradhapura)
ආදායම කොපමණද?

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
ආදායම ගැන මා දන්නේ නැහැ. සම්භර විට ආදායම් පාලක කොමසාරිස් දන්නවා ඇති. අවුරුදු දෙකක් තිස්සේ අලාභ තිබුණා. නමුත් දැන් අලාභ නැත කියා මා සිතනවා. ඒක ප්‍රසිද්ධ සමාගමක්. අවුරුදුපතා ඒ සමාගමේ අයවැය ලේඛන ඉදිරිපත් කරනවා. තමුන්නාන්සේටත් කොට සක් අරගෙන ඒ අයවැය ලේඛනයේ පිට පතක් ලබා ගන්නට පුළුවනි. කැටත් පුළුවනි. අනික් වාරයේ අයවැය ලේඛනය එව්වාම මා තමුන්නාන්සේට පෙන්වන්නම්. දැනට ලාභද නැද්ද කියා මා දන්නේ නැහැ. ඒක සම්පූර්ණයෙන්ම පෞද්ගලික සමාගමක්. රජයෙන් කිසිම ආධාරයක් දී නැහැ.

හෝටල් සංස්ථාව හෝ සංචාරක මණ්ඩලය හෝ පෞද්ගලික අය හෝ තානායමක් භාර ගත්තාම නියම සේවයක් බලාපොරොත්තු වෙනවා නම් ගාස්තු වැඩිවීම කිසිවකුට නවත්වන්නට බැහැ. තානායම සංචාරක මණ්ඩලයට දුන්නේ මා නොවෙයි; තමුන්නාන්සේලාගේ පක්ෂයේ හිටපු අපේ පක්ෂයේත් හිටපු ආර්. ජී. සේනානායක වෙළඳ ඇමතිතුමායි. සංචාරක ව්‍යාපාරය අද ඊයේ ඇති වූ ව්‍යාපාරයක් නොවෙයි. මාකෝ පෝලෝ, fපාහියන්, ඉබන් බතූතා යනාදීන් ලංකාවට ප්‍රථමයෙන්ම පැමිණි සංචාරකයන්ය කියා පොලොන්නරුවේ මන්ත්‍රීතුමා (විජේසිංහ මයා.) කිව්වා. නමුත් ඊටත් ප්‍රථමයෙන් ලංකාවට සංචාරකයන් පැමිණියා ය මා කියනවා. මා පටන් ගන්නවා සීතාගෙන්. ඇය කැමැත්තෙන් ආවාද නැද්ද යන කාරණය ගැන මා විවාදයකට බසින්නේ නැහැ. නමුත් ඇය රාවණාත් සමග මාස කීපයක් තිස්සේ ලංකාවේ සංචාරයක යෙදුණා. සීතාඑළිය, රාවණාඇල්ල ආදී නම් තවමත් භාවිතා වෙනවා. අපේ ඉතිහාසයේ පළමු වන වරට ලංකාවට පැමිණි සංචාරකයා සීතා තමයි. ඊට පසු විජය ආවා. විජය ඇවිත් මෙහෙ නැවතුණා.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
හෝටලයක නොවෙයි!

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
ඒ අනුව බලන විට මේක පුරාණ ව්‍යාපාරයක්. බොනමෝර් අණ්ඩු ක්‍රමය තිබෙන කාලයේ සංචාරක ව්‍යාපාරය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ජේ. ආර්. ජයවර්ධන]

තිබුණේ වෙළඳ ඇමතිවරයා යටතේයි. කොරෙයා, අමරසූරිය, සුන්දරලිංගම් යන අමාත්‍යවරුන් යටතේ සංචාරක ව්‍යාපාරය තිබුණා. ආර්. ජී. සේනානායක වෙළඳ ඇමතිතුමාට සංචාරක ව්‍යාපාරය භාරව තිබුණු කාලයේ එතුමා මේ ව්‍යාපාරය හුඟක් දියුණු කරන්නට ක්‍රියා කළා. දීර්ඝ කාලයක් තුළ මේ විෂය එතුමාට භාරව තිබුණා. ප්‍රථමයෙන්ම සංචාරක මණ්ඩලය ආරම්භ කළේ එතුමායි. එතුමා තානායම් කීපයක් ඒ සංචාරක මණ්ඩලයට දුන්නා. ඒවා දියුණු කළා. කෝවැච් නම් විශේෂඥයෙකු ගෙන්වා වාර්තාවක් ලබා ගත්තා. මේ ආදී කරුණු නිසා තමයි මා එතුමාට සංචාරක ව්‍යාපාරයේ පියාය කිව්වෙ.

ලංකාවට පමණක් නොවෙයි ලෝකයටම සංචාරක ව්‍යාපාරය ඉතාම වැදගත් ව්‍යාපාරයක් බව අවබෝධ වුණා. කිසිම වෙළඳාමකට වඩා, කිසිම කර්මාන්තයකට වඩා සංචාරක ව්‍යාපාරයෙන් විශාල ආදායමක් ලබා ගන්නට පුළුවන් බව ලෝකයේ බොහෝ රටවලට පෙනී ගියා. බණ්ඩාරනායක මැතිනිය අගමැතිනිය වශයෙන් කටයුතු කළ කාලයේ සංචාරක ව්‍යාපාරය වෙළඳ ඇමතිතුමාගෙන් ඉවත් කර එතුමියගේ පාලනයට සම්බන්ධ කර ගත්තා. සංචාරක ව්‍යාපාරය ගැන ඒ තරම් වැදගත් අන්දමින් එතුමිය කල්පනා කළා. එතුමියගේ කාලයේ අර කෝවැච් වාර්තාවේ නිර්දේශත් ක්‍රියාත්මක කිරීම ආරම්භ කළා. හෝටල් සංස්ථාව පිහිටුවන නීතිය පිළියෙළ කළා. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ නැහැ. හෝටල් පාඨශාලාව ආරම්භ කළා. අර විශාල ගොඩනැගිලි යනාදිය සංචාරක මණ්ඩලයට දුන්නේ ඒ අගමැතිනියයි. එමනිසා මේක අපේ ආණ්ඩුවේවත් තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේවත් ව්‍යාපාරයක් නොවෙයි. මේක ලංකාව පිළිගත් ව්‍යාපාරයක්. අගමැතිතුමාගෙන් රාජ්‍ය ඇමති වශයෙන් මට පැවැරුණු වැඩ කටයුතුවලට මේකත් ඇතුළු වී තිබුණා. එහෙමයි මේක මට ආවේ. මා මේ අංශය ඉල්ලුවෙ නැහැ. මේ ගැන කිසිම දෙයක් දන්නෙත් නැහැ. ලැබුණ දේ හොඳට ක්‍රියාත්මක කරන්නට මා බලාපොරොත්තු වෙනවා. එදා පටන් අළුත් මුහුණුවරක් අනුව මේ වැඩ කටයුතු කරන්නට අප බලාපොරොත්තු වෙනවා. අපි මොනවා කළත් නොකළත් ලංකාවට සංචාරකයන් පැමිණෙන බව ප්‍රථමයෙන් අපට පෙනුනා. වුවමනා නම් මේ රටට සංචාරකයින් පැමිණීම නවත්වන්නට පුළුවනි. ස්ටැලින්ගේ කාලයේ රුසියාවට එහෙම කළා. කිසිවකුට රුසියාවට ඇතුළුවන්නට ඉඩ දුන්නේ නැහැ. අපටත් එහෙම කරන්නට පුළුවනි. විදේශ සංචාරකයන් ලංකාවට පැමිණීම අපට වුවමනා නම් නවත්වන්නට පුළුවනි.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

කොතලාවල යුගයේදී නැවැත්තුවා.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

රුසියාවෙන් එන අය සවල්ප දෙනෙක් නැවැත්තුවා. විදේශිකයන් සියලුදෙනාම ලංකාවට පැමිණීම නවත්වන්නට පුළුවනි. එහෙත් එසේ නවත්වන එක හරි දැයි මා අහන්නට කැමතියි. යම්කිසි රටක සිට එන උදවිය නවත්වන එක හරි නැහැ. විදේශීන් එනවාය කියා අපට බිය වන්නට වුවමනාවක් නැහැ. අපි අපේ දොර ජනෙල් විවෘත කරන්නට ඕනෑ. අපට අන්ධකාරයේ ඉන්නට පුළුවන්කමක් නැහැ. "අපේ සංස්කෘතිය නැති වේවි; අපේ භාෂාව නැති වේවි; අපේ ආගම නැති වේවි; අපේ පුරුෂභාවය අඩු වේවි; අපේ ස්ත්‍රී පුරුෂයන්ගේ ශීලාචාර භාවයේ නොයෙකුත් වැරදි ඇති වේවි" යනුවෙන් කල්පනා කොට බිය වන්නට අපට පුළුවන්කමක් නැහැ. ඒ අන්දමට බිය වුණොත් කිසිම ජාතියක් දියුණු වන්නේ නැහැ. අවුරුදු 2,500ක ඉතිහාසයක් ඇති අපි සමහර කාලවලදී විදේශීන්ට යටත් වී සිටි බව තමුන්නාන්සේලා දන්නවා ඇති. එහෙත් අපි බිය නැතුව අපේ සංස්කෘතිය හා නිදහස යනාදිය ආරක්ෂා කරගෙන ආවා. මෙම සංචාරකයන්ගේ පැමිණීම නිසා, ඇතැම්විට හිපියන් වැනි උදවියගේ පැමිණීම නිසා, අපේ සංස්කෘතිය අපේ පුරුෂභාවය කිසිසේත් අඩු වේයයි සිතා විරුද්ධ පාර්ශ්වයේ නායිකාව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වත් එතුමියාගේ අඩි පාරේ ගමන් කරන මිනුවන්ගොඩ ගරු මන්ත්‍රීතුමාත් (ද සොයිසා සිරිවර්ධන මයා.) බිය වන්නේ නැහැ.

එම්. තෙන්නකෝන් මයා.
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennakoon)
ඒ අයට යට වන එක හොඳද?

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
අපේ ආණ්ඩුව බලයේ තිබෙන තුරුයට වන්නේ නැහැ. තමුන්නාන්සේලාගේ ආණ්ඩු කාලයේදී කෙසේ වෙතත්, අපේ ආණ්ඩුව තිබෙන කාලයේදී නම් යට වන්නේ නැහැ. විදේශීන් කොතරම් ප්‍රමාණයක් ආවත් අපි ඒ උදව්ය හදල යවනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදේශිකයන් ලංකාවට එනවා නම් එම උදව්යට ඉන්නට තැනක් තිබෙන්නට ඕනෑ. ඒ උදව්ය එනවා නම් අපි බලාපොරොත්තු වෙනවා ඒ උදව්යගෙන් මුදල් හම්බ කර ගන්නට. ඒ අය එන බව අප දන්නවා. ඔවුන්ගේ පැමිණීම නවත්වන එක හරි නැහැ. ඔවුන්ගේ පැමිණීම තවදුරටත් දියුණු කරන්නට අප බලාපොරොත්තු වෙනවා. ඔවුන් පැමිණෙනවා නම් ඔවුන්ට වාසය කරන්නට සුදුසු තැන් අපි සකස් කර දෙන්නට ඕනෑ. ඒ වාගේම ඒ අය ගෙන් පුළුවන් තරම් විදේශීය මුදල් හම්බ කර ගන්නට අප කල්පනා කරන්නට ඕනෑ.

මෙම ව්‍යාපාරය ලාංකිකයන්ට පමණක් සීමා කරමු යයි කවුද කිව්වා. ඒකත් හොඳයි. එහෙත් එතකොට විදේශීය මුදල් හම්බ වන්නේ නැහැ. ලංකාව, ඉන්දියාව, රුසියාව සහ යුගෝස්ලේවියාව යනාදි ලෝකයේ නොයෙකුත් රටවල් මෙම සංචාරක ව්‍යාපාරයෙහි නිරතව වැඩ කරන්නේ එම ප්‍රයෝජනය නිසයි. විදේශීය මුදල් හම්බ කරන්නට හැකි ලෙහෙසිම මාර්ගය එය නිසයි, මුළු ලෝකයේම රටවල් ඒ ගැන නිරතව වැඩ කරන්නේ. ස්පාඤ්ඤ රට මේ අවුරුද්දේ කෝටි දෙකක සංචාරක පිරිසක් බලාපොරොත්තු වෙනවා. බලන්න එය කොතරම් විශාල ප්‍රමාණයක්ද කියා. එංගලන්තයේ සංචාරක ව්‍යාපාරය විදේශීය මුදල් හම්බ කරන මාර්ග අතුරින් තුන්වන අංකයට නැග තිබෙනවා. ඉතින් අපි ඔය ව්‍යාපාරයෙන් අයින් වී ඉඳිමුද? අයින් වී සිටින්නැයි කිසිවෙක් කියන්නේ නැහැ. අයින් වී නොසිටිනවා නම් අපි භාරගෙන තිබෙන වැඩ කොටස නියම අන්දමට ඉටු කරන්නට ඕනෑ. මේ ගැන නොයෙකුත් අන්දමේ කරුණු ප්‍රකාශ කරන්නට පුළුවනි. එහෙත් ඒ තරම් දුරට කතා නොකර තමුන්නාන්සේලා ඉදිරිපත් කරන්නට යෙදුණු කරුණු ගැන පමණක් වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්නට මා බලාපොරොත්තු වෙනවා.

පොල්හේන ගැන උත්තර දෙන්නට පුළුවනි. එතන අර ඇඳුම් ලිහන ස්ථානය හදන්නේ නැහැ. බෙන්තර-ඇල්පිටියෙ ගරු මන්ත්‍රීමා (කාරියවසම් මයා.) ඉඩ කඩම් ලබාගත් උදව්ය සමග සාකච්ඡා කරනා ලෙස ඉල්ලා සිටියා. එය වහාම කරන්නට බලාපොරොත්තු වෙනවා. බෙන්තර හදන්නේ කොටුවක් නොවෙයි. හෝටලයක්. සමහර විට කොටුවක් වාගේ හෝටලයක් වන්නට පුළුවනි. එහෙත් හෝටලයක් වාගේ කොටුවක් නොවෙයි. සමහරවිට මේ මාස තුන ඇතුළත එය විවෘත කරන්නට අප බලාපොරොත්තු වෙනවා. එතකොට තමුන්නාන්සේලා සියලු දෙනාමත් එන්නට ඕනෑ. එම ගොඩනැගිලි සඳහා රජයෙන් කිසි වියදමක් දරන්නේ නැහැ. එහෙත් ගමක් නම් හදනවා. වෙළඳ මහත්වරුන්ට සිටින්න, බඩුමුට්ටු විකුණන්න, ඉඩකඩම් ලබාගත් ගම්වැසි උදව්යට පදිංචි වී සිටින්න, එම වැඩ පිළිවෙල ප්‍රයෝජනවත් වෙනවා. ඒ සඳහා රජයෙන් වියදම් කරනවා. අපි ඊට අවශ්‍ය පාරවල් සාදන්නටත්, විදුලි බලය ලබා දෙන්නටත්, වතුර පහසුව ලබා දෙනන්ටත් වියදම් කරනවා. එහෙත් අර හෝටල් ගොඩනැගිලිවලට රජයෙන් ශතයක්වත් වියදම් කරන්නේ නැහැ. ඒ සඳහා යම් යම් පුද්ගලයන් ලක්ෂ ගණනින් වියදම් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ජේ. ආර්. ජයවර්ධන]

හෝටල් ස්කෝල ගැන කිව්වා. එහි ඉගෙනගන්න කිසිවෙකුට රක්ෂාව දෙන වාය කියා අප පොරොන්දු වන්නේ නැහැ. එහෙම පොරොන්දු වන්නට අපට බැහැ. එම උදවිය එතැනට ඇවිත් නොයෙකුත් වැඩ කටයුතු ගැන ඉගෙන ගන්නවා. අවුරුදු දෙකක කාලයක් ඒ සඳහා ඔවුන් ගත කරනවා. ගරු නියෝජ්‍ය කථානායක තුමනි, මට දැනගන්නට ලැබුණා එහි ඉගෙන ගත් ප්‍රථම කණ්ඩායමේ සියලු දෙනාටම රක්ෂා ලැබී තිබෙනවාය. නැති නම් ලැබෙන්නට යනවාය කියා. එහෙත් මේ උදවියට රක්ෂා ලබා ගන්නටත් හෝටල් හැදෙන්නට ඕනෑ. එක්කෙනෙක් කියනවා හෝටල් වුවමනා කරන්නේ නැහැ යනුවෙන්. තවත් කෙනෙක් කියනවා සංචාරක ව්‍යාපාරය වුවමනා කරන්නේ නැහැ යනුවෙන්. තුන් වැනි කෙනෙක් කියනවා, මේ අයට රක්ෂා දෙන්නය කියා. ඒ අයව පුහුණු කරන්නේ සංචාරකයන්ට සත්කාර කරන්නයි. සත්කාර කරන්නට හෝටල් හදන්න ඕනෑ. ඒවාට වියදම් කරන්න ඕනෑ. මොන විදියේ තර්කයන්ද විරුද්ධ පාර්ශ්වයෙන් ඉදිරිපත් කරන්නේ? විරුද්ධ පාර්ශ්වයේ සංවිධායක හැටියට මිනුවන්ගොඩ ගරු මන්ත්‍රීතුමා (එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.) එක හඬින්, එක කටින්, එක මුහුණුවරක් ඇතිව විරුද්ධ පාර්ශ්වයේ තර්ක ඉදිරිපත් කරවන්න ඕනෑ. හෝටල් හදන්න එපා, හෝටල් ස්කෝලය වහන්න, සංචාරකයන්ට එන්න දෙන්න එපා, තානායම් නැවත ඒජන්ත වරුන්ට දෙන්න කියනවා නම්, එහෙම කියන්න. එසේ නැත්නම් සියලු දෙනාම එකතු වෙලා අපට සම්පූර්ණයෙන් ආධාර දෙන්න.

අද ගෙනෙන යෝජනාව විශාල හෝටල් සම්බන්ධයෙන්ද කියා තමුන්නාන්සේලා ප්‍රශ්න කළා. කඹුරුපිටියේ මන්ත්‍රීතුමා (පර්සි වික්‍රමසිංහ මයා.) කී හැටියට මේ ණය රුපියල් ණයයි; විදේශ ණය නොවෙයි. මේ මුදල් ණයට දෙනවා, මධ්‍යම ප්‍රමාණයේ හෝටල් සහ කුඩා හෝටල් තැනීමට. අප කොයි තරම් ආදායම් බදු සහන දුන්නත් ඒ විධියේ හෝටල් හදන අයට වැඩි වාසියක් ලැබෙන්නෙ නැහැ. ඒ අයට ලැබෙන්නෙ බොහොම සුළු ලාභයක් පමණයි. ඒ අය බැංකුවලින් ණයට මුදල් ගන්නවා නම් සියයට 9 ක හෝ 10 ක පොළියක් ගෙවන්නට සිදු වෙනවා. ඒ තරම් පොළියක් ගෙවා මුදල් ණයට ලබාගෙන මේ විධියේ ව්‍යාපාරයක් ලාභ ඇතිව පවත්වාගෙන යන්න ඒ අයට බැහැ. ඒ නිසා අප මේ මුදල් නයට දෙන්න බලාපොරොත්තු වන්නේ සියයට පහේ, හයේ හෝ හයා මාරේ පොළියටයි. පානදුරේ මන්ත්‍රීතුමා (ලෙස්ලි ගුණවර්ධන මයා.) ඇසුවා, අප මේ අනුගමනය කරන්නට යන්නේ අළුත් ක්‍රියා පටිපාටියක්ද කියා. නැහැ. 1967 සිටම සංචාරක මණ්ඩලය මේ මුදල් ලබා ගැනීමට උත්සාහ කළා. මේ විධියට හෝටල් සෑදීම සඳහා පුද්ගලයන්ට ණය දෙන්නට සංචාරක සංවර්ධන පනතේ 27 වැනි වගන්තියේ හැටියට සංචාරක මණ්ඩලයට ඉඩ තිබෙනවා. ඒ නිසා 1967 සිටම මධ්‍යම බැංකුව සමගත්, නොයෙක් නිලධාරීන් සමගත්, ගරු මුදල් ඇමතිතුමා සමගත් සාකච්ඡා කර දැන් තමයි, අවුරුදු දෙකහමාරකට පමණ පසුව තමයි, මේ මුදල ලබා ගැනීමට අපට අවස්ථාව සැලසී තිබෙන්නේ.

ලොකු හෝටල් ගැන ප්‍රශ්න කළා. විදේශික සම්බන්ධකම් ඇතිව ලොකු හෝටල් 3 ක් හැදීමට අප බලාපොරොත්තු වෙනවා. එකක් සම්පූර්ණයෙන්ම පෞද්ගලික එකක්. රජයෙන් ශතයක්වත් වියදම් කරන්නෙ නැහැ. පෙගසස් රීජ් නමැති ඒ හෝටලය ලංකාවේ පුද්ගලයන් කිප දෙනෙක් බී. ඕ. ඒ. සී. කොම්පැනියත් ෆේප්වේස් කොම්පැනියත් සමග එකතු වී හැදල පලාතේ හදාගෙන යනවා. දැන් අත්තිවාරම දමා තිබෙනවා. තව මාස 8 ක් 9 ක් යන විට එය විවෘත කරන්න පුළුවන් වෙයි. ඒක fපසිව් ස්ටාර්ස් හෝටලයක් හෙවත් තාරකා පහේ හෝටලයක් හැටියට අපට සලකන්නට පුළුවන්. ඒක ලෝකයේම හොඳ ලකුණු ලබාගන්න හෝටලයක්. ඒ හෝටලය සඳහා විදේශික මුදල් ලබා ගැනීමට අවසර දී තිබෙනවා. ඔය විධියේ ලොකු හෝටල් හැදීමට විදේශික මුදල් අවශ්‍යයි. ලිෆ්ට්ස් ආදී අවශ්‍ය විදේශික භාණ්ඩ ගෙන්වීමට විදේශික මුදල් අවශ්‍යයි. පුංචි හෝටල් හැදීමට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විදේශික මුදල් වුවමනා නැහැ. අපේ ගල් වලින්, අපේ සිමෙන්තිවලින්, අපේ උළු වලින්, අපේ තීන්තවලින් ඒවා හදන්න පුළුවන්.

දෙවැනි හෝටලය මේ ගොඩනැගිල්ලට පෙනෙන තෙක් මානයේ හදන ඉන්ටර් කොන්ටිනෙන්ටල් හෝටලයයි. පෞද්ගලික ආයතන කිපයකුත්, බැංකු කිපයකුත්, ලංකාවේ හෝටල් සංස්ථාවත් ඒකට මුදල් යොදවනවා. හෝටල් සංස්ථාවේ ආණ්ඩුවේ මුදල් තිබෙනවා. හෝටල් සංස්ථාව මාර්ගයෙන් වෙනම ජොයින්ට් ස්ටොක් කොම්පැනියක් හැදීමට අප බලාපොරොත්තු වෙනවා, පුද්ගලයන්ගේ මුදලුත්, විදේශික මුදලුත්, ආණ්ඩුවේ මුදලුත් ඇතිව. තාරකා පහේ හෝටලයක් හැටියටයි—ජාත්‍යන්තර හෝටලයක් හැටියටයි—ඒකත් හැදීමට බලාපොරොත්තු වන්නේ. හෙට අනිද්දා ගිවිසුම අත්සන් කර වැඩ පටන් ගැනීමට බලාපොරොත්තු වෙනවා. පටන් ගත්තාට පසුව ප්‍රමාදයක් නැහැ. එහෙත් පටන් ගැනීමට හුඟක් ප්‍රමාද වුණා. ඒ වරද අපෙයි. අපේ රුපියලේ වටිනාකම අඩු කළා. විවිහිස ක්‍රමය ආරම්භ කළා. පසුව විවිහිස මිළ වැඩි කළා. විදේශිකයන් මුදල් තැන්පත් කරන්නේ බොහොම පරිස්සමෙනුයි. ඔවුන් මේ සියල්ලම ගැන කල්පනා කරනවා. රුපියලේ වටිනාකම අඩු කළා, ඒගොල්ල කිව්වා, "අපට මේකට සම්බන්ධ වෙන්ට බැහැ" කියා. නොයෙක් සහන දෙන්න සිදු වුණා. විවිහිස ක්‍රමය ඇති කළාමත් කිව්වා, "අපට සම්බන්ධ වෙන්න බැහැ" කියා. ඒ අනුව ඔවුන්ට නොයෙක් සහන සලසා දෙන්නට රජයට සිදු වුණා. ඒ නිසා ප්‍රමාදයක් සිදු වුණා. දැන් ඒවා ඔක්කොම විසඳලා හෙට අනිද්දා හෝටල් සෑදීම පටන් ගන්න බලාපොරොත්තු වෙනවා.

තුන්වෙනි හෝටලය වන හිල්ටන් හෝටලය හදන්නට බලාපොරොත්තු වුණු ස්ථානයේ ඒ හෝටලය සාදන්නේ නැත කියා දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) මේ සභාවේ කරුණු ඉදිරිපත් කළ විට ඒ ඉඩම ආණ්ඩුවට ගත්තා. ඒ ඉඩම කොටස්වලට බෙදා එහි මුඩුක්කු හදනවා දකින්නට අපි කැමති වුණේ නැහැ. දැන් සතොස ඉන්දියාවේ ඔබෙරොයි කියන මණ්ඩලයත් සමග ඒ ස්ථානයේ හෝටලයක් හදන්නට ගිවිසුමක් අත්සන් කර ලෝකයේ හොඳම විශේෂඥයන් විසින් සකස් කළ සැලැස්මක් අනුව තාරකා 5 කින් පිළිගන්නට පුළුවන් හෝටලයක් සාදන්නට යනවා. තව මාස හය-හතකින් ඒ හෝටලය ඉදි කිරීමට අත්තිවාරම් දැමීමට බලාපොරොත්තු වෙනවා. මේ හෝටල් තුන් පමණයි, ජාත්‍යන්තර හෝටල් හැටියට රජය අද පිළිගෙන තිබෙන්නේ. රජයේ සම්බන්ධකම තිබෙන්නේ සතොස ඔබෙරොයි මණ්ඩලයත් සමඟ පිහිටුවන හෝටලයටත්, හෝටල් සංස්ථාව මගින් පාර්ලිමේන්තුව අසළ පිහිටුවන ඉන්ටර් කොන්ටිනෙන්ටල් හෝටලයටත් පමණයි. "පෙගසස් ට්‍රිප්" හෝටලය සම්පූර්ණයෙන්ම පෞද්ගලික හෝටලයක්. හිල්ටන් හෝටලය හැදෙයිද නැද්ද කියා මා දන්නෙ නැහැ. ඒක හදනවාට අපි විරුද්ධ නැහැ. අපේ විදේශ විනිමය වියදම් නොකර, විදේශිකයන්ගේ සම්බන්ධකම් ඇතිව හෝටල් හදන්නට කැමති තවත් පුද්ගලයන් සිටිනවා නම් ඊට අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ.

රුමේනියාව සමග සම්බන්ධකම් ඇතුව හෝටලයක් මේ රටේ තනන්නට ගියා. අපේ කැබිනට් මණ්ඩලය ඊට අවසර දුන්නා. එහෙත් රුමේනියානු ආණ්ඩුව සහ ආයතන ඒක වුවමනා නැහැ කියා අත්හැර දැම්මා. රුමේනියානු මිත්‍ර සංගමයේ සභාපති හැටියට මිනුවන්ගොඩ මන්ත්‍රීතුමාගෙන් (ද සොයිසා සිරිවර්ධන මයා.) මා ඉල්ලනවා, පුළුවන් නම් අප සමඟ එකතුව හෝටලයක් හදන්න ලැහැස්ති වෙන්න යයි රුමේනියානු ආණ්ඩුවට කියන්න කියා. අපි කැමතියි.

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி. சொய்ஸா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

මා ඒ ගැන ඇහැව්වෙ, මොන කරුණක් නිසා ඒක නැවතුනාද කියා නොදන්න නිසයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

අපේ සම්පූර්ණ ආධාරය දුන්නා. ඩුබ් ෂෙක් ගැන එහෙ තිබෙන කලබල නිසා දැයි මා දන්නෙ නැහැ. දැන් ඒ ගොල්ල ටිකක් අයින් වෙලා ඉන්නවා.

ඔබෙරොයි සමාගම ඉන්දියාවේ නවදිල්ලියේ තාරකා 5 ක හෝටලයක් හදා තිබෙනවා. ඉන්ටර්-කොන්ටිනන්ටල් සමාගම සමඟ කාශ්මීරයේත් තාරකා 5ක හෝටලයක් සදා තිබෙනවා. කල්කටාවේ තාරකා 4 ක හෝටලයක් හදා තිබෙනවා. බොම්බායේ ෂෙරටන් සමාගම සමඟ තට්ටු 30 ක තාරකා 5 ක හෝටලයක් දැන් හදාගෙන යනවා. ඒ නිසා ඒ උදවිය ජාත්‍යන්තර හෝටල් සමාගමක් හැටියට පිළිගන්නට පුළුවනි. අපි ගාලුපාරේ හදන හෝටලය හදන්නේ ඒ උදවිය සමඟයි. මේ දෙකතුන ඇති වුණාම, ලංකාවේ උදවියටත් පිට රටවලින් එන උදවියටත් හෝටල්වල නැවතීමට තිබෙන අපහසුකම් නැති වෙයි. අද විශාල අපහසුවක් තිබෙනවා. ඔක්තෝබර් මාසයේ සිට අප්‍රේල් මාසය දක්වා හැම හෝටලයකම හැම කාමරයක්ම පිරිල. හිස් එකක් නැහැ. බෙන්තර හදන්නටත් ඉස්සරවෙලා හැම කාමරයක්ම අරගෙන ඉවරයි. මිගමුවේ හෝටල් කීපයක්ම තිබෙනවා. යූ. ටී. ඒ., බිලු ලැගුන් ඔක්කොම පිරිලා. සංචාරකයන් කෙසේ වෙතත් ලංකාවට පිටරටින් හුඟක් සෙනඟ එනවා. නොයෙක් මණ්ඩලවලින්, ජාත්‍යන්තර බැංකුවෙන්, ජාත්‍යන්තර සමාගම්වලින් කර්මාන්ත කටයුතු සඳහා, වෙළඳ කටයුතු සඳහා ආදි නොයෙක් දේවලට අද බොහෝ දෙනෙකු ලංකාවට එනවා. නොයෙක් සම්මේලනවලට නියෝජිතයන් එනවා. ඔවුන්ට ඉන්නට තැන් නැහැ. ඒ නිසා හෝටල් හදන්නට ඕනෑ.

අද මේ විවාදයේදී පෙනී ගියා බොහෝ දෙනෙකු හෝටල් හදනවාට කැමති බව. එහෙත් කාරණා දෙකක් ගැන පමණයි, හුඟ දෙනෙකු විරුද්ධ වුණේ. ඉන් එකක් හෝටල්වල ගාස්තු වැඩිය කියන එකයි. කොහොමද අඩු කරන්නේ කියා මා අහන්නට කැමතියි.

පරිපූරක මුදල්

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

ඔක්කොම තාරකා පහේ ඒවා හදන්නෙ නැතුව තාරකා හතරේ ඒවාත් හදන වානෙ.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

ආණ ඩුවෙන් මේ කටයුතු කරනවා නම් අපට පුළුවනි එහෙම කරන්න. මේවා කරන්නේ ආණ්ඩුවෙන් නොවෙයි. ආණ්ඩුවෙන් මේවා කරනන්ට නම් මුදල් ඇමතිතුමාගෙන් මුදල් ලබා ගන්නට මට සිද්ධ වෙනවා. දෙන්නට උන්නැහේ ළඟ මුදල් නැහැ. පුද්ගලයන් විසින් මේවා කරගෙන යනවා නම් ඔවුන්ට වාසියක් වුවමනා කරනවා. සමහරවිට මේවා ක්‍රමයෙන් හැදෙන්න-හැදෙන්න, සංචාරකයන් වැඩි වෙන්න-වැඩි වෙන්න ගාස්තු බහින්නට පුළුවනි. අද අපේ රුපියලේ අගය අඩු කරලයි තිබෙන්නේ. තමුන්නාන්සේලා සොයා බැලුවොත් පෙනී යයි, ඇමෙරිකාවේ කොණ්ඩය කපන්නට ඩොලර් 3ක් අය කරන බව.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

ඒක තමයි, දැන් වවන්නේ.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

ඒ රටේ කොණ්ඩය කපන්නට අය කරන ගාස්තුව මෙහෙ අපට කැමකට දෙන්නට සිදු වී තිබෙනවා. රෑ කැමට බිලු ලැගුන් එකට ගියාම රු. 22 ක් අය කරනවා යයි බොහොම දෙනෙකු කියනවා. රුපියල් විසිදෙකකට කොණ්ඩෙ කපන්නත් බැහැ. අමෙරිකාවෙ. එතකොට, මිල අඩු කරන්නද කියන්නෙ? ඇතැම් හෝටල්වල අය කරන ගණන් වැඩියි. මාත් එය පිළිගන්නවා. එහෙත් මේවා කරන උදවියට වාසියක් නැතිව වැඩ කරන්න බැහැ. ලෝකයේ හැම තැනම තත්ත්වය එහෙමයි තියෙන්නෙ. මෙය ලංකාවේ පමණක් තිබෙන තත්ත්වයක් නොවෙයි. ලන්ඩන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නගරයේ අති විශාල හෝටල් තිබෙනවා, ඩෝවෙස්ටර්, ක්ලැරිජස් ආදි වශයෙන්. පානදුරේ ගරු මන්ත්‍රීතුමා ගිහින් තියෙනවා නේද?

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
මම ගිහිල්ලා නැහැ.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
මම කිව්වෙ ඒ ගරු මන්ත්‍රීතුමා ඔය හෝටල්වලට ගිහින් තියෙනවා කියලා නොවෙයි. එතුමා එංගලන්තයට ගිහිල්ලා තියෙනවා. එතුමා ඔය විශාල හෝටල්වලට ගිහිල්ලා නැතිව ඇති. අප වාගේ උදවියට ඒවාට යන්න බැහැ. එංගලන්තයේ වුණත් එසේ මෙසේ ධනපතියන්ට යන්න පුළුවන් තැන් නොවෙයි ඒවා. ඩෝවෙස්ටර් වැනි හෝටල්වලට නිකම් ගිහිල්ලා තේ කෝප්පයක් කාරිය එහෙම නම් බිලා එන්න බැරිකමක් නැහැ, අපට වුණත්. ඒ වුණාට අපට ඉන්න බැහැ. ඒ හෝටල්වල. එංගලන්තයේ පමණක් නොවෙයි, ඉන්දියාවෙත් එහෙමමයි. ඒ ඒ රට වල හැම දෙනාටම ඉන්න පුළුවන් තැන් නොවෙයි ඒවා. බොහොම ස්වල්ප දෙනකුට හැර—විශාල ධනපතියන්ට හැර—සාමාන්‍ය උදවියට නොවෙයි ඒ හෝටල් තිබෙන්නේ. පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේත් ආණ්ඩු පක්ෂයේත් දෙපැත්තේම ධනපතියන් ඉන්නවා. ඒ ධනපතියන් හැර, ධනපති නොවන අයට මේ හෝටල්වල ඉන්න බැහැ. හුඟ දෙනකුටම ඒවායේ ඉන්න එක බොහොම අමාරුයි. ඒ ගැන අපට කරන්න දෙයක් නැහැ. ඒක ලෝක ස්වභාවක්. යුගෝස්ලේවියාවේත්, රුසියාවේත්, ඇමෙරිකාවේත්, ජර්මනියේත්, ඉන්දියාවේ මෙන්ම වෙනත් බොහොමයක් රටවලත් තත්ත්වය ඔය විධියටයි තියෙන්නේ. ඒ ගැන කරන්න දෙයක් නැහැ. එය නවත්වන්න බැහැ. එහෙත් අපි පුළුවන් තරම් උත්සාහ ගන්නවා හෝටල් සංස්ථාව මගින් ලාභ සථාන හදන්නට. එහෙත් එය දැන්ම කරන්න බැහැ. අද ඉදිරිපත් කර තිබෙන යෝජනාවේ එක් ඉතා වැදගත් අදහසක් තමයි එය.

මාතර ගරු මන්ත්‍රීතුමා (තුඩාවේ මයා.) ප්‍රකාශ කළා වාගේ, අපට තාරකා තුනේ, තාරකා දෙකේ, තාරකා එකේ සහ තාරකා එකක්වත් නැති අපේ හෝටල් වලින් බලාපොරොත්තු වන්න බැහැ, තාරකා පහේ හෝටල් වලින් ලැබෙන සත්කාර ආදිය. ඒ සත්කාර මොනවාදැයි මේ අවස්ථාවේ විස්තර කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ.

කාරියවසම් මයා.
(திரு. காரியவசம்)
(Mr. Kariyawasam)
ඔය තාරකා කියන්නේ මොනවටද?

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
එය ලකුණක් පමණයි. ලෝකයේ ජාත්‍යන්තර වශයෙන් පාවිච්චි වන විශේෂ ලක්ෂණයක් පමණයි එය. තාරකා ගණන අනුව හෝටලයේ තත්ත්වය තේරුම් ගන්න පුළුවනි. හෝටලයේ කාමර කීයක් තිබෙනවාද, හැම කාමරයකටම සම්බන්ධ වූ නාන කාමරයක් බැගින් තිබෙනවාද, ටෙලිෆෝන් එකක් හැම කාමරයකම තිබෙනවාද, පොකුණක්, ඇඳුම් ලිහන, නැත්නම් මාරු කරන තැන් තිබෙනවාද, යන මේ ආදී කරුණු දැනගන්නට මේ තරු ලකුණු උපකාර වෙනවා. මාතර ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, නොයෙක් නොයෙක් අසිතිවාසිකම් සහ පහසුකම් සලසා ඇති ප්‍රමාණය තේරුම් ගැනීමට මෙයින් පුළුවන් වෙනවා. තරු පහක් තිබෙන්නේ බොහොම ඉහළ හෝටල්වලයි. මෙය ඇත්තෙන්ම ජාත්‍යන්තර මිම්මක් පමණයි.

පී. එම්. කේ. තෙන්නකෝන් මයා.
(මිහින්තලේ)
(திரு. பி. எம். கே தென்னக்கோன்—மிஹிந்தலை)
(Mr. P. M. K. Tennekoon—Mihintale)
සකලාංග සම්පූර්ණ හෝටල්?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

ගරු ජේ. ආර්. ජයවර්ධන

(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)

(The Hon. J. R. Jayewardene)

ලැබෙන සත්කාර මොනවාදැයි හෝටල් යේ තත්ත්වය අනුව හිතා ගන්නට පුළුවනි. තරු පහක් තිබෙනවා නම් ඒ සියල්ල ම ඇති. එහෙත් තරු හතරක් පමණක් තිබෙනවා නම්, සමහර විට, ටෙලිෆෝන් එකක් නැහැ; එහෙම නැත්නම් පිහිනන්න හැම කාමරයකම පොකුණක් නැතුවා වෙන්න පුළුවනි. හැම කාමරයටම සෘජු බන්ධ කළ නාන කාමරයක් නැතුවා වෙන්නටත් පුළුවනි. නොයෙක් නොයෙක් සත්කාර තිබෙනවා, ජාත්‍යන්තර මිම්ම අනුව. බොම්බායේ තාරකා පහේ හෝටල් යක් තිබෙනවා නම් ඒ බව දැනගෙන, මේ මේ සැප පහසුකම් එතන තියෙනවාය කියා හිතාගෙන කෙනෙකුට යන්න පුළුවනි. හැබැයි, තාරකා පහක් තිබෙනවා නම් වැඩි පුර ගෙවන්නත් ඕනෑ. අපේ රටේ තාරකා පහේ ඒවා එකක්වත් නැහැ. අපේ හොඳම හෝටලය තැප්‍රොබේන් හෝටලය යි. තාරකා හතරයි ඒකත්. අඩු මිලට සේවා වත් ඕනෑ නම් තාරකා අඩු හෝටල්, නැත්නම් තාරකා නැති හෝටල්, ඇති කරන්න ඕනෑ. එතකොට ටෙලිෆෝන් නැහැ, නාන කාමරයක් ඒ කාමරයට සම්බන්ධ වෙලා නැහැ, පිහිනන්න පොකුණක් නැහැ, ඔය වාගේ නොයෙක් නොයෙක් පහසුකම් නැහැ. හැමදාම තුවාය මාරු කරන ස්ථාන, හැමදාම ෂීට් මාරු කරන ස්ථාන, මේ තත්ත්වයේ හෝටල්වලින් බලාපොරොත්තු වන්න බැහැ. නොයෙක් පහසුකම් වුවමනා නම් වැඩිපුර ගෙවන්න වෙනවා. එහෙම නැත්නම් මිල අඩු වෙනවා. [බාධා කිරීම්] තාරකා හයේ ඒවා නැහැ.

ගරු මන්ත්‍රීතුමන්ලා නැගූ ප්‍රශ්න සියල්ලටම වාගේ මා පිළිතුරු දුන්නා. සංචාරක ව්‍යාපාරය ගැනත් මා වචන ස්වල්පයක් නමුත් කථා කළා. මෙය ඇත්ත වශයෙන් ම අපක්ෂපාත ව්‍යාපාරයක් බව මම පෙන්වා දුන්නා. එක පක්ෂයකට අයිති ව්‍යාපාරයක් නොවෙයි මෙය. හැම ආණ්ඩුවක්ම මේ ව්‍යාපාරය ගැන ක්‍රියා කර තිබෙනවා. දැන් අපි ජාත්‍යන්තර මැනීම් අනුව, ජාත්‍යන්තර සැලැස්මක් අනුව, ක්‍රියා කරන්නට බලාපොරොත්තු වී සිටිනවා, විශේෂයෙන්ම විදේශ මුදල් ලබා ගැනීම පිණිස.

පරිපූරක මුදල්

කාරියවසම් මයා.

(திரு. காரியவசம்)

(Mr. Kariyawasam)

ඕවායේ රක්ෂාවලට බදවා ගැනීමේදී එසේ බදවා ගනු ලබන්නේ විදේශිකයින් ද, ලංකාවේ අයද?

ගරු ජේ. ආර්. ජයවර්ධන

(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)

(The Hon. J. R. Jayewardene)

සියයට $99\frac{1}{2}$ ක්ම ලංකාවේ අය. සමහර විට බටහිර රටවල කෑම හදන පිළිවෙල ඇති කරන්න ටික කාලයකට මැනේජර් කෙනෙකුගේ සේවය ලබාගන්නට ආදී වශයෙන්, කාලයක් යන තුරු විදේශික අය බදවා ගන්න වෙන්න පුළුවන්. එහෙත් එසේ බදවා ගන්නට සිදු වන්නේ සියයට $\frac{1}{2}$ ක් පමණයි. සියයට $99\frac{1}{2}$ ක්ම ලාංකිකයෝ.

මේ සම්බන්ධව මීට වඩා කථා කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. හැම ප්‍රශ්නයකටම පිළිතුරු දුන්නා කියා මා හිතනවා. පිළිතුරු නොලැබුණු ප්‍රශ්නයක් තිබෙනවා නම් කරුණා කර කියන්න; පිළිතුරු දෙන්නම්.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

පරිපූරක මුදල: ආණ්ඩුවේ මුද්‍රණාලය: කඩදාසි, යන්ත්‍රාගාරය සහ ද්‍රව්‍ය

குறைநிரப்புத் தொகை: அரசாங்க அச்சகம்: கடதாசி, பொறித் தொகுதியும் பொருட்களும்

SUPPLEMENTARY SUPPLY: GOVERNMENT PRESS: PAPER, PLANT AND MATERIAL

ගරු ජේ. ආර්. ජයවර්ධන

(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)

(The Hon. J. R. Jayewardene)

I move,

"That a supplementary sum not exceeding Rupees One million one hundred thousand (Rs. 1,100,000) be payable out

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon, or from the proceeds of any loans obtained by the Government of Ceylon for the services of the financial year beginning on October 1, 1968, and ending on September 30, 1969, and that the said sum be expended as specified in the Schedule hereto :

Schedule

	Rs.
Head 31—Government Press.	
Vote No. 2—Administration Charges—Recurrent Expenditure	.. 1,100,000."

Sub-head 12—Paper Plant and Material.

This is to pay for increasing prices of paper, plant and material. It is nothing new, but the Government Press always gets into this difficulty because various departments want various things done which are not in the Estimates. We have to buy paper, plant and material, and this is for that purpose.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

கேள்வி எடுத்தியம்பப்பெற்றது.

Question proposed.

ප්‍රෑ. භා. 11.40 .

ප්‍රින්ස් ගුණසේකර මයා. (හබරාදුව)
(திரு. பிறின்ஸ் குணசேக்கர—ஹபரதுவ)
(Mr. Prins Gunasekera—Habaraduwa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රාජ්‍ය ඇමතිතුමාගේ තරු පෙනෙන පැය දෙකක කථාවෙන් පසු වැලිකඩ මුද්‍රණාලයේ වැය ශීර්ෂයක් ගැනයි අපි විවාද කරන්නට පටන් ගන්නේ. පසුගිය කාලයේ ගරු රාජ්‍ය ඇමතිතුමා මේ රටේ අගමැති ධුරයේ වැඩ බලන දවස්වල මේ මුද්‍රණාලයේ වැඩ වර්ජනයක් ඇති වුණා. ඒ කාලයේ දවසට විසි තිස් වරක් නැත්නම් පැයකට තුන් හතර වරක් මේ මුද්‍රණාලයේ ඇති වූ බර පතළ විනාශකාරී තත්ත්වයක් ගැන ගුවන් විදුලියෙන් ප්‍රචාරය වුණා. න්‍යාය පත්‍රය දෙස බලන විට මා දැක්කා ගරු රාජ්‍ය ඇමතිතුමා ඒ මුද්‍රණාලය සම්බන්ධව රුපියල් 11,00,000 ක් ඉල්ලා තිබෙනවා. එය දැක මා එය බියෙන් කියෙව්වා මේ මුදල ඉල්ලන්නේ අර ගුවන් විදුලියෙන් ප්‍රචාරය වූ පරිදි වැඩ වර්ජන කාලයේ කඩා බිඳ විනාශ කළ මැෂින් ආදිය අලුත්වැඩියා කරන්නද, එහෙම නැත්නම් ඒවා වෙනුවට අලුත් යන්ත්‍ර සූත්‍ර ආදිය ලබා ගන්නද කියා. ඒ නිසා මා බියෙනුයි කියෙව්වේ. එහෙත් කියවා බලන විට එවැනි දෙයක් නැහැ. ඒ දවස්වල ගුවන් විදුලියෙන් දවසට විසි තිස් වරක් කියා හිටියේ යන්ත්‍ර විනාශ කළා, මැෂින් විනාශ කළා, දුප්පත් ගම්බද දරුවන්ගේ පාසැල් පොත් ටික අච්චු ගහන්නට අකුරු අමුණා තිබුණු ඒවා විනාශ කළා, උපකරණ පොඩිපට්ටම් කර දැම්මා, ආදී වශයෙන් විශාල පාඩුවක් කර තිබෙනවාය කියලයි. එහෙත් මේ මුදල ඉල්ලා තිබෙන්නේ එවැනි දෙයක් සම්බන්ධව නොවෙයි. ඒ කාරණය පිළිබඳව මේ ගරු සභාවේදී ඇසූ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් ගරු රාජ්‍ය ඇමතිතුමා කීවා ඒ ගුවන් විදුලි ප්‍රචාරය සම්පූර්ණයෙන්ම අසත්‍ය එකක්ය කියා.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
එය පිළිගත්තනේ. කථාව නවත්වන්න.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

ගරු රාජ්‍ය ඇමතිතුමා රටේ නායකයා හැටියට වැඩ බලන දවස්වල එතුමා යටතේම තිබෙන ගුවන් විදුලියෙන් එවැනි බොරු ප්‍රචාර කරන්නට මින් පසුවවත් ඉඩ තබන්න එපාය කියා මා කියනවා. දැන් පවතින වැඩ වර්ජනය ගැනත් මේ දවස්වල ඊටත් අත්ත දේවල් කියනවා. මිනිසුන් මුළා කරන්න මේ වැය ශීර්ෂය පටන්ගෙන තිබෙන්නේ නීති විරෝධී කථාවක් කියාගෙනයි. මෙහෙමයි පටන් ගෙන තිබෙන්නේ :

" භාෂා තුනකින්ම පළ විය යුතු රජයේ වෙනත් දෙපාර්තමේන්තු වෙනුවෙන් කරනු ලබන මුද්‍රණ වැඩ අධික වීමත් හා ද්‍රව්‍ය මිල ඉහළ යාමත් හේතු කොටගෙන 12 වැනි උප ශීර්ෂයේ ඇති ප්‍රතිපාදන ඇනට ඇති බැරකම් සහ මුදල් වර්ෂයේ ඉතිරි කාලය සඳහා අපේක්ෂිත වියදම් දැරීමට ප්‍රමාණවත් නොවන නිසා වේ."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

ගරු රාජ්‍ය ඇමතිතුමා තාරුකා තුනේ හතරේ පහේ හෝටල් දෙන්නා වාගේ මේ රටේ පාලනයට භාෂා තුනක් දෙන්නේ කොහොමද? භාෂා ව්‍යාපාරයේ පිතෘවරයකු හැටියට රාජ්‍ය ඇමතිතුමා තමන් ගැනම සඳහන් කර ගන්නවා. එතුමා එක්දහස් නවසිය තිස් ගණන්වල රාජ්‍ය භාෂා ප්‍රශ්නය ඉදිරිපත් කළාලු.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
1943 දී.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

මේ 1969 සි. නීත්‍යානුකූලව භාෂා තුන කින් වැඩ කළ හැක්කේ මොන දෙපාර්තමේන්තුවටදැයි භාෂා ව්‍යාපාරයේ ආදි කර්තෘවර රාජ්‍ය ඇමතිතුමාගෙන් මා අහනවා. අද බල පවත්වන නීතිය අනුව මොන දෙපාර්තමේන්තුවටද භාෂා තුන කින් වැඩ කළ හැක්කේ? භාෂාව පිළිබඳව බල පවත්වන නීති තුනක් මේ රටේ තිබෙනවා. ඉන් එකක් 1956 අංක 33 දරන රාජ්‍යභාෂා පනතයි. දෙවැන්න 1958 අංක 28 දරන දෙමළ භාෂා විශේෂ විධි විධාන පනතයි. තුන්වැන්න 1960 නීතිගත කරන ලද අධිකරණයේ භාෂා පනතයි. මේ රටේ පාලන කටයුතු විෂයයෙහි බල පවත්වන්නේ ඔය භාෂා පනත් තුන පමණයි. රාජ්‍ය භාෂා පනතේ ඉංග්‍රීසි ගැන සඳහන් වන්නේ නැහැ. දෙමළ භාෂා විශේෂ විධිවිධාන පනතේත් ඉංග්‍රීසි ගැන සඳහන් වන්නේ නැහැ. 1960 දෙසැම්බර් 31 වැනිදා දක්වා නම් යම්කිසි සහනයක් දී තිබුණා. එහෙත් අප දැන් කථා කරන්නේ 1969 වර්ෂයේ සි. 1969 වර්ෂයේදී රාජ්‍ය ඇමතිතුමා වියදම් කරන්නට යන අධික මුදල වුවමනා කර තිබෙන්නේ භාෂා තුනකින් වැඩ කරන්නට වුවමනා නිසාලු. මේ වියදමෙන් තුනෙන් එකක් කපා ගන්නට මාර්ගයක් මම කියන්නම්. රාජ්‍ය ඇමතිතුමා නීත්‍යානුකූලව වැඩ කරනවා නම් මේ වියදමෙන් තුනෙන් එකක් කපා හරින්නට පුළුවනි. නීත්‍යානුකූලව වැඩ කර මේ වියදමෙන් තුනෙන් එකක් කපා දමන්නට රාජ්‍ය ඇමතිතුමා කැමතිද?

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

තුනම කපලා දැම්මාම කිසි වියදමක් නෑ.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

මා කථා කරන්නේ වියදමෙන් තුනෙන් එකක් කපා දැමීම ගැනයි. රාජ්‍ය ඇමතිතුමාට සිහිපත් වන්නේ වෙන මොන වාදෝ කපා දැමීම ගැනයි. සහජයෙන් එතුමාට ඒක සිහිපත් වෙනවා. මේ ලක්ෂ 11 න් තුනෙන් එකක් නීත්‍යානුකූලව කපා දමන්නට පුළුවනි. මේ රටේ කිසිම දෙපාර්තමේන්තුවක කටයුතු ඉංග්‍රීසි භාෂාවෙන් කිරීමට නීතියෙන් ඉඩක් නැහැ. සිංහල රාජ්‍යභාෂාව නිසා සිංහල භාෂාවෙන් වැඩ කරන්නට පුළුවනි. දෙමළ භාෂා විශේෂ විධිවිධාන පනත යටතේ, හාමුදුරු කෙනකුත් මරාගෙන සම්මත කර ගන්නා ලද රෙගුලාසි අනුව දෙමළ භාෂාවෙනුත් වැඩ කරන්නට ඉඩ තිබෙනවා. ඒ ගැන මගේ විරුද්ධත්වයක් නැහැ. ඉංග්‍රීසියෙන් වැඩ කරන්නට පුළුවන් මොන දෙපාර්තමේන්තුවටද? හොඳයි, රාජ්‍ය ඇමතිතුමා යටතේ නොවන යම්කිසි දෙපාර්තමේන්තුවක් ඉංග්‍රීසියෙන් වැඩ කරනවා නම් එසේ කර ගත්තාවේ. එහෙත් රාජ්‍ය ඇමතිතුමා යටතේ තිබෙන දෙපාර්තමේන්තුවලට ඒක කරන්නට ඉඩ දෙන්නට එපා. අර ඉංග්‍රීසි වැඩකටයුතුවලට අදාළ ලියකියවිලි රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති මුද්‍රණාලයෙන් මුද්‍රණය කරන්නට ඉඩ දෙන්නේ ඇයි? ඉංග්‍රීසිය බදාගෙන සිටින ඇමතිවරුන්ට කියන්න, ඒ ඉංග්‍රීසි ලියකියවිලි නීතිවිරෝධී ලෙස මුද්‍රණය කරන්නට ඉඩ දෙන්න බැහැ කියා. එම නිසා, මේ අවුරුද්දේ කෙසේ වෙතත් ලබන අවුරුද්දේවත් මේ වියදමෙන් කොටසක් කපා දමන්නට පියවර ගන්න.

මේ මුදල්වලින් කොටසක් වියදම් වන්නේ පිටරටින් කඩදාසි හා මුද්‍රණ යන්ත්‍ර ගෙන්වීම සඳහාලු. එසේ පිටරටින් කඩදාසි ගෙන්වීමේදී කොයි තරම් දූෂණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සිදු වෙනවාදැයි ඩිංගක් හොයා බලන්න. මේ රටේම කඩදාසි නිෂ්පාදනය කිරීම සඳහා වෙනම ආයතනයක් තිබෙනවා, නැගෙනහිර කඩදාසි සංයුක්ත මණ්ඩලය යනුවෙන්. ඒ සංයුක්ත මණ්ඩලයෙන් සෑහෙන කඩදාසි ප්‍රමාණයක් නිෂ්පාදනය වෙනවා. එසේ තිබියදීත්, තම තමන් කැමති විධියට පිටරටින් කඩදාසි ගෙන් වීමට පෞද්ගලික වෙළඳුන්ට හා ආයතන වලට ඉඩ දෙන්නේ ඇයි? රජයේ මුද්‍රණාලය සඳහා වෙනම කඩදාසි ගෙන්වනවා දැයි මා දන්නේ නැහැ. මුද්‍රණ කටයුතු සඳහා පිටරටිනුත් කඩදාසි ගෙන්වන්නට සිදු වී තිබෙනවා නම්, නැගෙනහිර කඩදාසි සංයුක්ත මණ්ඩලය මාර්ගයෙන් ඒවා ගෙන්වන්නේ නැත්තේ ඇයි? මෙහිදී ප්‍රතිපත්ති පිළිබඳ බරපතල ප්‍රශ්නයක් පැන නඟිනවා. තම තමන් කැමති විධියට පිටරටින් කඩදාසි ගෙන්වීමට ඒ ඒ මුද්‍රණාලයට ඉඩ දීම නිසා කොයි තරම් දූෂණ සිදු වෙනවා දැයි ඊයේ මුළු දවස තිස්සේම සාකච්ඡා වුණු "ලේක් හවුස්" පත්තර හොර ගුහාව පිළිබඳ විවාදයේදී පැහැදිලි වුණා. ලංකාණ්ඩුවේ මුද්‍රණාලයට වෙනම කඩදාසි ගෙන්වන්න වුවමනාවක් නැහැ. මේ රටට අවශ්‍ය කඩදාසි නැගෙනහිර කඩදාසි සංයුක්ත මණ්ඩලය මගින් නිපදවා ගත යුතුයි, නැත්නම් ඒ මණ්ඩලය මගින් ගෙන්වා ගත යුතුයි. මේ රටේ මොන මුද්‍රණාලයට වුවමනා කඩදාසි වුණත් රජය මගින් එකම තැනකින් බෙදා හැරීමට කටයුතු කරන ලෙස රාජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

රජයේ මුද්‍රණාලයේ වැඩ කටයුතු ගැන තවත් ප්‍රශ්නයක් අහන්නට ඕනෑ. ශ්‍රී ලංකා සමසමාජ සභාග රජය පැවති කාලයේදී අධ්‍යාපන දෙපාර්තමේන්තුව පාසල් පොත් මුද්‍රණය කරවා ගත්තේ රජයේ මුද්‍රණාලය මගිනුයි. එය දැන් කොයි තරම් දුරට දියුණු වී තිබෙනවාදැයි මා දැන ගන්නට කැමතියි. රජයේ පාසල්වල භාවිතයට නියමිත පොත් වර්ග කීයක් රජයේ මුද්‍රණාලය මගින් මුද්‍රණය වෙන වාද? රාජ්‍ය ඇමතිතුමා ඉදිරිපත් කළ එක්තරා කෙටුම්පත් පනතක් මන්ත්‍රී මණ්ඩලයෙන් සම්මත වීම නිසා, අළුත් මුද්‍රණ සංස්ථාවක් බිහි වුණා. කලින් රජයේ මුද්‍රණාලය මගින් මුද්‍රණය වුණු පොත් වර්ගීකීයක් දැන් ඒ අළුත් සංස්ථාවට පවරා තිබෙනවාද? එසේම, රජයේ මුද්‍රණාලයට භාර දී තිබුණු ඒ කටයුත්ත අර සංස්ථාවට පවරා දුන්නේ මොන හේතුවක් නිසා දැයි මා දැනගන්නට කැමතියි. රජයේ පාසල්වල භාවිතයට නියමිත පොත් පත් රජයේ මුද්‍රණාලය මගින් මුද්‍රණය වීම නතර කිරීමේ උත්සාහයක් එක්තරා අවධියකදී පැවතුණා නේද? රජයේ මුද්‍රණාලය මගින් පාසල් පොත් මුද්‍රණය කිරීම නතර කිරීම සඳහා පාසල් පොත් පත් මුද්‍රණය කර විකිණීමෙන් ලක්ෂපතියන්, කෝටිපතියන් බවට පත් වුණු, මේ රජයේ සමහර ආධාරකාරයන්ගේ බලපෑමක් තිබුණාදැයි මා දැන ගන්නට කැමතියි. දුප්පත් ශිෂ්‍යයන්ට අඩු මිළට පොත් සැපයීමේ මේ ව්‍යාපාරය නිසා, එක ගෙදරකින් ළමයින් හතර පස්දෙනා පාසල් යවන දෙමවුපියන්ට සෑහෙන සහනයක් ලැබුණා. රජයේ මුද්‍රණාලයෙහි මුද්‍රණය කොට අද ශත 25 කට විකුණන පොත, මේ ව්‍යාපාරය පටන් ගන්නට පෙර පෞද්ගලික වෙළෙන්දන් විසින් විකුණන ලද්දේ රු. 1.50, රු. 1.60ක් තරම් වූ අධික මිළකටයි. පාසල් පොත් මුද්‍රණය කළ සමහර පෞද්ගලික මුද්‍රණශිල්පීන් මෙයින් කොතරම් අසාධාරණ, අයුක්තිසහගත ලාභයක් ලැබුවාද යන වග මෙයින් පෙනෙනවා. ඒ අධික ලාභය කපා හැර ශිෂ්‍යයන්ට අඩු මිළට පොත් සැපයීම සඳහා රජයේ මුද්‍රණාලය ඇරඹූ වැඩ පිළිවෙළ අඩපණ කිරීමට පෞද්ගලික මුද්‍රණ ශිල්පීන්ගේ සංගම් මොන තරම් උත්සාහයක් කළාද යන වග අප රාජ්‍ය ඇමතිතුමාගෙන් දැනගන්ට කැමතියි. ගරු අධ්‍යාපන ඇමතිතුමා බොහෝ අවස්ථාවල මෙම මන්ත්‍රී මණ්ඩලයේ සිට, සමහර පෞද්ගලික මුද්‍රණ ශිල්පීන්ගේ සමාගම්වලට එරෙහිව තනි සටනක් ගෙන ගිය බව අප දන්නවා. පාසල් පොත් රජයේ මුද්‍රණාලයෙහි මුද්‍රණය කිරීමේ ව්‍යාපාරයේ තනි ආරක්ෂකයා වශයෙන් පෙනී සිටීමට අධ්‍යාපන ඇමතිතුමා උත්සාහ කෙළේ, එම ව්‍යාපාරයට හරස් කැපූ වෙනත් කවුරුන් හෝ කැබිනට් මණ්ඩලයෙහි සිටි නිසාදැයි අප රාජ්‍ය ඇමතිතුමාගෙන් දැනගන්නට කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

මුද්‍රණාලයට අවශ්‍ය යන්ත්‍රෝපකරණ ගෙන්වීමේදී, ආනයන හා අපනයන කට යුතු බාර ඇමති වශයෙන් එතුමා, පෞද්ගලික අංශයේ මුද්‍රණ ශිල්පීන් විසින් ගෙන්වනු ලබන යන්ත්‍ර ගැනද ටිකක් කල්පනාවෙන් සිටිය යුතුයි. ප්‍රවෘත්ති පත්‍ර ආයතන කඩදාසි රෝල් ගෙන්වා මෙහිදී ඒවා කපා අධික මිළට විකුණා අධික ලාභ උපදවන බව සුළු මුද්‍රණාල හිමි යන් කියනවා. මේ 11 ලක්ෂයෙන් එක්තරා කොටසක් වෙන් වන්නේත් කඩදාසි කපන යන්ත්‍ර ගෙන්වීම සඳහායි. පෞද්ගලික අංශයට මෙවැනි යන්ත්‍ර ගෙන් වීමට බලපත්‍ර නොදීමෙන්, පෞද්ගලික අංශය රජයේ මුද්‍රණාලය සමග තරඟ කාරී තත්ත්වයකට ඒමට ඉඩ නොතැබීමට රාජ්‍ය ඇමතිතුමා වග බලා ගත යුතුයි. පත්තර මුද්‍රණය කෙරෙන්නේ කපන ලද කඩදාසිවලින් නොව කඩදාසි රෝල්වලිනුයි. රෝල්පිටින් ගෙන්වනු ලබන එම කඩදාසි, කපන යන්ත්‍ර මගින් මෙහිදී පැතලි කඩදාසි හැටියට කපනවා. ඒවා පොත් පත් මුද්‍රණය කරන සාමාන්‍ය මුද්‍රණ ශිල්පින්ට විකුණා අධික ලාභයක් ලබා ගන්නවාය කියා චෝදනාවක් තිබෙනවා. විශේෂයෙන්ම මේ ප්‍රබල ප්‍රවෘත්ති පත්‍ර ආයතන සමඟරක් එසේ කරනවාය කියා පැමිණිල්ලක් තිබෙනවා. මෙවැනි යන්ත්‍රවලට ආනයන බලපත්‍ර දීමේදී ගරු රාජ්‍ය ඇමතිතුමා අන්න ඒ කාරණය ගැනත් කල්පනාකාරී වෙනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

ගරු ජේ. ආර්. ජයවර්ධන

(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)

(The Hon. J. R. Jayewardene)

පොත් පත් සම්බන්ධව මට මේ අවස්ථාවේදී උත්තරයක් දෙන්නට බැහැ. ඒක ඇසිය යුත්තේ අධ්‍යාපන ඇමතිතුමාගෙන් නමුත් කලින් දැන්නුවා නම් මා උත්තරයක් දෙන්නට සූදානම් වී පැමිණෙනවා. මේ අවස්ථාවේදී උත්තරයක් දෙන්නට මා සූදානම් නැහැ.

අනික් කාරණය ගැන කල්පනා කර බලන්නම්.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

පරිපූරක මුදල්

නියෝජ්‍ය කථානායකතුමා

(உப சபாநாயகர் அவர்கள்)

(Mr. Deputy Speaker)

Order, please! The Sitting is suspended till 2 P.M.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ. භා. 2 ට නැවත පවත්වන ලදී.

அதன்படி அமர்வு இடை நிறுத்தப்பட்டு, மீண்டும் பி. ப. 2 மணிக்கு ஆரம்பமாயிற்று.

Sitting accordingly suspended till 2 P.M. and then resumed.

කාරියවසම් මයා.

(திரு. காரியவசம்)

(Mr. Kariyawasam)

There is no Quorum, Sir.

මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට ගණපූරණයක් නොතිබියෙන්, බෙදුම් ඕනු හඬ කිරීමට නියෝග කරන ලදී.

පසුව ගණපූරණයක් තුබූයෙන්—

சபை எண்ணப்பட்டு நிறைவெண் இல்லாததால் பிரிவு மணி அடிக்கப்பட வேண்டுமென ஆணையிடப் பட்டது.

பிறகு நிறைவெண் இருந்ததனால்—

House counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.

Later, a Quorum being present—

පරිපූරක මුදල: විදුලි බල දෙපාර්තමේන්තුව: රජයේ ගොඩනැගිලිවල විදුලි ස්ථාපන ආදිය

குறை நிரப்புத் தொகை; மின்சாரத்திணைக் களம்: அரசாங்கக் கட்டடங்களில் மின் னிணைப்புக்கள் ஆகியன

SUPPLEMENTARY SUPPLY: ELECTRICAL DEPARTMENT: ELECTRICAL INSTALLATIONS IN GOVERNMENT BUILDINGS, ETC.

ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන (කර්මාන්ත හා ධීවර ඇමති)

(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன—கைத் தொழில், கடற்றொழில் அமைச்சர்)

(The Hon. D. P. R. Gunawardena—Minister of Industries and Fisheries)

On behalf of the Hon. Minister of Land, Irrigation and Power, I move,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

"That a suplementary sum not exceeding Rupees One million (Rs. 1,000,000) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the services of the financial year beginning on October 1, 1968, and ending on September 30, 1969, and that the said sum be expended as specified in the Schedule hereto :

Schedule

	Rs.
Head 64—Electrical Department (Non-Commercialised Activities).	
Vote No. 2—Administration Charges—Recurrent Expenditure ..	1,000,000 "

The voted provision under subheads 12 and 13 of Head 64 was Rs. 3,933,000 for 1968-69. This sum has now been found inadequate. It is anticipated that the revised estimate will amount to Rs. 4,993,000 and an additional sum of Rs. 1,000,000 is required as follows :

Electrical installations in Government Buildings ..	Rs. 900,000
Minneriya Town Electricity Supply Scheme ..	Rs. 100,000.

ප්‍රශ්නය සභාභිමුඛ කරණ ලදී.

வினா எடுத்தியம்பப்பெற்றது.

Question proposed.

කාරියවසම් මයා.

(திரு. காரியவசம்)

(Mr. Kariyawasam)

මේ වැය ශීර්ෂය ගැන පැහැදිලි විස්තරයක් ඉදිරිපත් කළේ නැහැ. ඒ කෙසේ වෙතත් මේ වැය ශීර්ෂය යටතේ කරුණු

පරිපූරක මුදල්

දෙක තුනක් ඉදිරිපත් කරන්නට තිබෙනවා. අද ගම්බද ප්‍රදේශවලට විදුලි බලය ලබා දීම සඳහා ඇමතිතුමා විශේෂ වැඩපිළිවෙළක් සකස් කර තිබෙනවා. ගරු ඇමතිතුමා පැමිණි නිසා මේ වැය ශීර්ෂය සම්බන්ධව වඩාත් පැහැදිලි විස්තරයක් කරාවි යයි මා බලාපොරොත්තු වෙනවා.

නියෝජ්‍ය කථානායකතුමා

(உப சபாநாயகர் அவர்கள்)

(Mr. Deputy-Speaker)

Now that the Hon. Minister is here, would he like to explain the reasons for this Supplementary Estimate ?

ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)

(கௌரவ சி. பீ. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல் வரும்)

(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

Yes, Sir. This money is required to meet the increased cost of maintenance of government installations as a result of taking over additional installations for maintenance by the department. The department, at the beginning of the financial year, estimated for this expenditure, but the estimate was reduced by the Treasury to the figure which they said was the expenditure of the department on this item in the previous year. During the year a number of new buildings had to be given connections.

The other item under this Supplementary Estimate is what is called the Minneriya Town Electricity Supply Scheme which serves both the Minneriya District and the Polonnaruwa District. As a result of the very successful food drive in the Polonnaruwa District the number of rice mills in the area has increased. A large number of mills which were in the Southern Province have moved to the Polonnaruwa District. As you may be aware, there were a large number of rice mills in the Southern Province to which for many

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු සී. පී. ද සිල්වා]

years the Government was transporting paddy from the N. C. P. and from the Batticaloa District. Somewhere in 1956 or so, those mills had to close down as the then Minister of Agriculture and Food felt that the Government should not be called upon to meet the expenditure in connection with the transporting of paddy. With the aid of the Government, some of the mills which had to be closed down, have now been set up in the Polonnaruwa and Amparai Districts. It is only this year that those mills have been given electricity connections. About 95 rice mills are now working in the Polonnaruwa District most of which are supplied with electricity. This expenditure has been incurred in supplying those mills with electricity.

In fact, the department asked for this amount in the Draft Estimates, but the estimate was cut down by the Treasury. The estimate of the department has now been found to be correct. The mills are working to their full capacity, and 30 to 40 people are employed in each mill.

කාරියවසම් මයා.
(திரு. காரியவசம்)
(Mr. Kariyawasam)

අද ගම්බද ප්‍රදේශවලට ශීඝ්‍රකාරයෙන් විදුලි බලය අවශ්‍ය වේගෙන යනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy-Speaker)

ඒ ගැන අනික් යෝජනාව යටතේ කථා කරන්නට පුළුවනි. This Supplementary Estimate is regarding the maintenance of Government installations in Minneriya.

කාරියවසම් මයා.
(திரு. காரியவசம்)
(Mr. Kariyawasam)

මේ වැය ශීර්ෂයෙන් මුදල් ඉල්ලන්නේ රජයේ ගොඩනැගිලිවලට විදුලි බලය සැපයීමටයි. මටත් වුවමනා කරන්නේ ඒ ගැන කථා කිරීමට තමයි.

අද ගම්බද ප්‍රදේශ ශීඝ්‍රකාරයෙන් දියුණු වේගෙන යනවා. [බාධා කිරීමක්] එසේ දියුණු වේගෙන යන්නේ තමුන්නාන්සේලා කළ හපන්කමක් නිසා නොවෙයි. ලංකාවේ පමණක් නොවෙයි. මුළු ලෝකයේ ම ඒ දියුණුව තිබෙනවා. ලෝකයේ සෑම රටක්ම ශීඝ්‍රකාරයෙන් දියුණු වෙමින් ඉදිරියට යනවා. ඒ දියුණුවට අත්‍යවශ්‍ය දෙයක් තමයි විදුලි බලය. ඒ තත්ත්වය ගැන නොදන්නා උදවිය අනන් මනන් කියන්නට පටන් ගන්නවා. එසේ නැති නම් මහජන මන්ත්‍රීතුමන්ලා මේ අන්දමට කෑ ගහන්නේ නැහැ. අද ලෝකය ශීඝ්‍රකාරයෙන් දියුණු වන බව අප දන්නවා. එම නිසා මේ රටේ මහජනතාවගේ ඕනෑ එපාකම් සඳහා පමණක් නොව රජයේ ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහාත් විදුලි බලය වැනි දේ අපට අවශ්‍ය වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බෙත්තර-ඇල්පිටිය කොට්ඨාශයේ පිහිටි ඇල්පිටිය ආරෝග්‍යශාලාවේ විදුලි බලය පිළිබඳ තත්ත්වය ගැන මා කියන්නට කැමතියි. එම ආරෝග්‍යශාලාවේ හෙදි නිවාසයකුත් තිබෙනවා. එම ප්‍රදේශය ගැන කල්පනා කර බලන විට, එතැනට හෙදි නිවාසයක ඇති අවශ්‍යතාව ඉතා වැදගත් වන බව කිව යුතුයි. හෙදියන්ට නවතින්නට තැනක් එම පළාතේ ඇත්තේ නැහැ. එම නිසා හෙදි නිවාසයක අවශ්‍යතාව වඩාත් කැපී පෙනෙනවා. රජයේ වැඩ දෙපාර්තමේන්තුව මගින් තමයි ගොඩනැගිලි පිළිබඳ වැඩ කටයුතු කරන්නේ. දැන් එම ස්ථානයට රජයේ වැඩ දෙපාර්තමේන්තුව මගින් කළ යුතු කටයුතු නිම කර අවසානයි. විදුලිය සැපයීමයි වුවමනා කර තිබෙන්නේ. විදුලි දෙපාර්තමේන්තුව මගින් ඒ සඳහා අවශ්‍ය කරන උපකරණ යනාදිය සවි කොට හැකි තරම් ඉක්මණින් ආලෝකය ලබා දිය යුතුව තිබෙනවා. රජයේ වැඩ දෙපාර්තමේන්තුව මගින් කළ යුතුව තිබුණු කටයුතු නිමාවට පත් වී දැන් අවුරුද්දක් පමණ වෙනවා. සෞඛ්‍ය ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමිය මීට වසරකට පමණ පෙර එහි ගොස් වහාම විදුලි බලය සපයන්නැයි පොතක ලියා ඇවිත් තිබෙනවා. එවැනි නියෝගයක් කළත්, තවම නිසි පරිදි ක්‍රියා කර නැහැ. මේ වර අයවැය විවාදයෙහිදී සෞඛ්‍ය ඇමතිතුමාගේ වැය ශීර්ෂය යටතේ සාකච්ඡා කරද්දී මා දෙවරක්ම මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තත්ත්වය පිළිබඳව පෙන්නුම් කර දුන්නා. එහෙත් මේ දක්වා ඒ ගැන විදුලි දෙපාර්තමේන්තුව කටයුතු කර නැති බවයි කියන්නට තිබෙන්නේ.

අපේ ගම්බද ගොවි ජනතාවගේ අවශ්‍යතාවන් සපුරාලීම පිණිස තමන් ඉතා උනන්දුවෙන් ක්‍රියා කරන බව මෙම ජාතික රජය නිතරම කියනවා. එහෙත් අපේ ගම්බද ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය රැක දීම පිණිස තිබෙන ඇල්පිටිය ආරෝග්‍යශාලාව වැනි ගම්බද පරිසරයක පිහිටි ආරෝග්‍යශාලාවකට අවශ්‍ය විදුලි බලය නැති වීම සුළුපටු කරුණක් නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වුවමනාව තිබෙනවා නම්, මාසයකින් නොවෙයි එක දවසකින් වුවත් එම ස්ථානයට විදුලිය ලබා දෙන්නට පුළුවනි. එහෙත් එවැනි වුවමනාවක් නැති නිසයි අවුරුද්දක් ගත වන තුරුත් විදුලි බලය ලබා නොදී තිබේන්නේ. නිතරම කුඩම්මාගේ සැලකිලි ලබන මගේ කොට්ඨාශයට මෙවැනි අතවරවලට මුහුණ පාන්නට සිදු වීම වරදක් හැටියටයි පෙනී යන්නේ. විරුද්ධ පාර්ශ්වයේය, ආණ්ඩු පක්ෂයේය, කියා වෙන් වෙන්ව නොසලකන අපේ ඉඩම් ඇමතිතුමා අතින් සිදු වී තිබෙන මෙම අතපසුවීම ගැන අප කනගාටු වෙනවා.

සමාජවාදය කරා අප ගෙන යන මූලික රථය විය යුත්තේ එහෙම නැති නම් මූලික මාර්ගය විය යුත්තේ විදුලි බලයයි. විදුලිය දියුණු තත්ත්වය කරා ගෙන යනවා නම් සමාජවාදය කරා අපට ඉක්මණින් ගමන් කරන්නට පුළුවනි. එදා බණ්ඩාරනායක අගමැතිතුමා මේ ගමන යාම පිණිස යම් අන්දමක පදනමක් දමා යම් ආකාරයක උත්සාහයක් කළා නම්, මධ්‍යම ප්‍රතිපදාව අනුව ඒ ගමනේ අවසානය කරා යාමට අපට තිබෙන මාවත සකස් කර ගැනීම අපේ යුතුකමයි. මෙම මාවත සකස් කරන්නට අප බාර දී තිබෙන්නේ හිටපු අගමැතිතුමාගේ අග්‍ර ශ්‍රාවකයා වශයෙන් සිටි අපේ ඉඩම් ඇමතිතුමාටයි. තත්ත්වය එසේ හෙයින්, එතුමා විදුලිය පිළිබඳව යම්කිසි දුර්වලතාවක් ඇති කරනවා නම් අපට ජාතියක් වශයෙන් ඉදිරියට ගමන් කරන්නට අමාරු බව කිව යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පෙන්වා දුන්නේ ඉතා සුළු කරුණක් පමණයි. මීට වඩා විශාල දුර්වලකම් තිබෙනවා. තමුන්නාන්සේ රජයේ නිවාසවලට, වී මෝල්වලට විදුලි බලය සපයන්නා වාගේම අනිකුත් අවශ්‍ය ස්ථානවලටත් විදුලි බලය සැපයීමට කටයුතු කරනවා නම් අප ස්තුතිවන්ත වෙනවා. ගිං ගඟ ජල විදුලි බල යෝජනා ක්‍රමයක් ආරම්භ කිරීමට තමුන්නාන්සේගේ අදහසක් තිබුණා. ඒ ක්‍රමය ඇති කළා නම් එයින් ගාලු දිස්ත්‍රික්කයට පමණක් නොව, ගාලු පළාතට පමණක් නොව, අසල පළාත්වලටත් විශාල ප්‍රයෝජනයක් සැලසෙනවා. මුළු ප්‍රදේශයම දියුණු කිරීමට එය ප්‍රයෝජනවත් වෙනවා. එහෙත් ගරු ඇමතිතුමා ඒ යෝජනා ක්‍රමය දැන් අත්හැර දමා තිබෙනවා. ඒ නිසා හිනිදුම් පත්තුවට විදුලි බලය ගෙන යාම ප්‍රමාද වන්න පුළුවන්; බෙන්තර වලල්ලාවිට කෝරළයේ එහා කෙළවරට, හිනිදුම් කන්දට විදුලි බලය ගෙන යාම ප්‍රමාද වන්නට පුළුවන්. ගඟ හරහා වේල්ලක් බැඳ විදුලි බලය නිපදවීමටයි, තමුන්නාන්සේ අදහස් කර තිබුනේ. දැන් ඒ අදහස අත්හැර දමා තිබෙනවා. දෙපැත්තේ වේලි බැඳ ගං වතුර බැස්සීමට ගියොත් ඒක සාර්ථක නොවන බවයි, අපේ හැඟීම. කලින් අදහස් කළ අන්දමට විදුලි බලය නිපදවනවා නම් ඒ පළාතේ පටන්ගෙන තිබෙන වැදගත් කම්මාන්ත ලක්ෂ ගණනක් දියුණු කිරීමට පුළුවන් වෙනවා.

ඒ පළාතේ ජල විදුලි බලය නිපදවන්නට පුළුවන් එකම ජල මාර්ගය ගිං ගඟයි; නිල්වලා ගඟ නොවෙයි. ඒ නිසා ඒ ක්‍රමය **අත්හැර දමනවා** නම් එය ජාතියටම කරන හතුරුකමක්. ඒ නිසා එම ක්‍රමය ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලමින් මගේ වචන සංක්ෂේපය අවසාන කරනවා.

අ. භා. 2.15

එම්. තෙන්නකෝන් මයා.
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennakoon)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර රජයේ දෙපාර්තමේන්තුවලට විදුලි බල දෙපාර්තමේන්තුවෙන් විදුලි බලය සැපයනවා. තවත් සමහර රජයේ දෙපාර්තමේන්තු තමන්ගේම යන්ත්‍ර මගින් විදුලි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

බලය නිපදවා ගන්නවා. මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු අතර සම්බන්ධතාවක් නැති නිසා—ඒකාබද්ධ වැඩ පිළිවෙළක් නැති නිසා—භාණ්ඩාගාරයට විශාල මුදලක් වියදම් කිරීමට සිදු වෙනවා. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමහර ආයතන විදුලි බල දෙපාර්තමේන්තුවෙන් විදුලි බලය ලබා ගන්න අතර සමහර ආයතන තමන්ගේම යන්ත්‍ර මගින් විදුලි බලය ලබා ගන්නවා. ගොවිකම් දෙපාර්තමේන්තුවත්, වාරිමාර්ග දෙපාර්තමේන්තුවත් තමන්ගේම යන්ත්‍ර තබාගෙන විදුලි බලය ලබා ගන්නවා. මේ අන්දමට කිරීම නිසා මහජන මුදල් විශාල අන්දමින් අපතේ යනවා. ගරු ඇමතිතුමාට ඒ ගැන අත්දැකීමක් ඇති. විදුලිබල දෙපාර්තමේන්තුවට මේ කටයුත්ත කිරීම ඒ තරම් අපහසු නැහැ. ඇමතිතුමා ඒ වගකීම භාර ගන්නටත් ඕනෑ. එක දෙපාර්තමේන්තුවකින් තවත් දෙපාර්තමේන්තුවකට සිදු විය යුතු සේවයක් ඉටු කිරීමේදී ලොකු නොසැලකිල්ලක් තිබෙනවා. අපේ ලංකාවේ තිබෙන ලොකු දෝෂයක් තමයි, එක දෙපාර්තමේන්තුවක් තමන්ගේ වැඩ කොටස කරගෙන යාමේදී අනෙක් දෙපාර්තමේන්තුවකින් කරන වැඩ කොටස ගැන සැලකිල්ලක් නොදැක්වීම. එහෙත් ඔය කොයි දෙපාර්තමේන්තුවේ හෝ වේවා එහි හොඳ හෝ නරක බුක්ති විඳින්නේ පොදු මහජනයායි. එම නිසා අපට වුවමනා කර නවා, විවිධ දෙපාර්තමේන්තුවල වගකීම් හැකිතරම් පොදු මහජනයාගේ යහපත පිණිස අවංකව ඉෂ්ට කරවා ගන්න. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නොයෙක් සේවාවල යොදවා තිබෙන විදුලි දෙපාර්තමේන්තුවේ යන්ත්‍ර හරියාකාර ක්‍රියාවේ යෙදෙන්නෙ නැහැ. ඒවා පිළිබඳ තද වගකීමක් විදුලි දෙපාර්තමේන්තුවට නැති නිසා බොහෝ විට සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් රෝහල්වල සවි කර තිබෙන ක්‍රියා විරහිත වූ විදුලිබල නිපදවීමේ යන්ත්‍රයක් හරි ගස්සා ගැනීමට සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට සිදු වෙනවා, ලියුම් විශාල ගණනක් විදුලි දෙපාර්තමේන්තුව සමග ගනුදෙනු කරන්න. මේ ලියුම් ගනුදෙනු කිරීම නිසා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට විශාල වෙහෙසක් මහන්සියක් දරන්නට සිදු වෙනවා. ඒ නිසා දෙපාර්තමේන්තු අතර තිබෙන ඔය හේදකාරී වැඩ පිළිවෙල සමථයකට පත් කිරීම පිණිස දෙපාර්තමේන්තු අතර යම්කිසි සම්බන්ධතාවක් ඇති කළයුතුයි. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට ඒ අන්දමින් ඇතිවන අවහිර මග හැරවීමට යම් සාධාරණ සාර්ථක වැඩ පිළිවෙලක් ක්‍රියාවේ යොදන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

නිකවැරටියේ රෝහලටත් අවුරුදු ගණනාවක සිටම යන්ත්‍රයක් මාර්ගයෙන් විදුලි බලය සපයනවා. ඒ යන්ත්‍රය මගින් දවස් 5 ක් සාර්ථක අන්දමින් විදුලි බලය සැපයුවොත් තවත් මාස 5 ක් වත් විදුලි බලය සැපයීම අසාර්ථකයි. නොයෙක් තැන්වල ක්‍රියා කරවල සාර්ථක ප්‍රතිඵල ලබා ගන්නට බැරි වුණු යන්ත්‍ර රාශියක් නොයෙක් විට මේ ස්ථානයට ගෙනැවිත් ක්‍රියා කරවා එළිය ලබා ගන්නට මහන්සිගෙන තිබෙන බව මට දැනගන්නට ලැබී තිබෙනවා. ඒ සඳහා වැය වී තිබෙන මුදල තක්සේරු කර බැලුවොත්, ඒ මුදල කුඩා රෝහලකට අළුත් යන්ත්‍රයක් ගෙන්වා ගන්න ප්‍රමාණවත් වේ යයි මා විශ්වාස කරනවා. මෙවැනි කරුණු සම්බන්ධයෙන් සාර්ථක වැඩ පිළිවෙලක් සකස් වී නැති නිසා විශාල මුදල් අපතයකට රජය මුහුණ දෙනවා. නිලධාරීන්ගේ කාලයත්, කාර්මිකයන්ගේ කාලයත්, දෙපාර්තමේන්තුවේ වාහන සඳහා වන වියදමත් මේ වගේ අවස්ථාවල නිකරුණේ නාස්ති වෙනවා. ඒ නිසා කොයෙක් දෙපාර්තමේන්තුවල මේ අන්දමට විදුලි බලය සැපයීමේදී හැකි තරම් අපතයන් අඩුවන විධියට කටයුතු කරන්නට ක්‍රියා කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් අපි ඉල්ලා සිටින්නට කැමතියි. ඒ අතරම නිකවැරටියේ රෝහලේ විදුලි බලය නැතිකමේ අවහිරය මග හැරවීම සඳහා දෙපාර්තමේන්තුව ලවා හදිසි යම් ක්‍රියාමාර්ගයක් ගන්න ලෙසත් මා ඉල්ලා සිටිනවා.

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி சொய்சா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

විගොඩ, බෙම්මුල්ල කොට්ඨාශයට විදුලි බලය සැපයීමට තීරණය කර දැන් අවුරුදු ගණනාවක් ගත වී තිබෙන නමුත් ඒ තීරණය තවම ක්‍රියාත්මක වී නැති බව කන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගාටුවෙන් මතක් කරනවා. විදුලි බලය සැපයීමට කර තිබෙන ඒ තීරණය පුළුවන් තරම් ඉක්මණින් ක්‍රියාවේ යොදවන ලෙස මා ඉල්ලා සිටිනවා.

අ. භා. 2.23

ටී. බී. ඉලංගරත්න මයා. (කොලොන්නාව)

(திரு. ரீ. பி. இலங்கரத்ன—கொலொன்ஞவ)

(Mr. T. B. Ilangaratne—Kolonnawa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කරුණු දෙක-තුනක් මතක් කර දෙන්නට කැමතියි. මේ වැය ශීර්ෂය දෙස බැලුවාම පෙනී යනවා, අපට කලින් ඉදිරිපත් කළ වැයට වඩා වැඩියෙන් වැය කිරීමට දැන් අතිරේක මුදල් ඉල්ලා සිටින බව. 1968-69 ඇස්තමේන්තු ඉදිරිපත් කරන විට ගරු මුදල් ඇමතිතුමා ඇති තතු හරියාකාර පැහැදිලි කර නැති බව මෙයින් පෙනෙනවා. හැම ශීර්ෂයක් යටතේම ඉල්ලුම් කර තිබෙන්නේ එක්තරා ගණනක්. වැය කරන්නට යන්නේ තවත් ගණනක්. කලින් කපා දමා දැන් නැවත අඩුව පිරි මසා ගන්නටයි, මේ ඉදිරිපත් වී සිටින්නේ. ඒ නිසා, මෙය එක්තරා විධියකින් මේ ගරු සභාව මුළා කිරීමේ පියවරක් හැටියටත් පෙන්වා දෙන්නට පුළුවන්කම තිබෙනවා. අයවැය පරතරය පුරවන්නේ මෙන්න මේ ආකාරයටයි කියන නමුත් ඊට හාත්පසින්ම වෙනස් තත්ත්වයක් පසුව ඇති කරන බවයි, අපට පැහැදිලිවම පෙනී යන්නේ. පළමුවෙන් කපා හරින ලද මුදල් මේ ක්‍රමයෙන් නැවත ඉල්ලනවා. මේ වැඩ පිළිවෙළ ගැන අපේ විරෝධය මීට පෙර නොයෙකුත් අවස්ථාවල අප විසින් ප්‍රකාශ කර තිබෙනවා. ඒ කොයි හැටි වෙතත් තවමත් ඔය ක්‍රමයටම ගරු ඇමතිතුමා වැඩ කරගෙන යන බවයි දකින්නට ලැබෙන්නේ.

පසුගිය කාලයේ හිටි හැටියේම වාගේ විදුලි එලිය නැතිව ගියා. ඒ නිසා අපට අන්ධකාරයේ සිටින්න සිදු වුණා. එහෙත් පැය ගණනකින් නැවතත් එලිය ලැබුණා. වැඩ වර්ජනය සම්බන්ධයෙන් අපට තොරතුරු දෙන්නේ නැහැ. වැඩ වර්ජනය මොන තත්ත්වයකින් ඇති වුණාද, එය ඉවත් කරන්නට ගත් පියවර මොනවාද, එය සමථයකට පත් වුණේ මොන ක්‍රමය කින්ද යනාදි තොරතුරු දැනගන්නට අපි බලාපොරොත්තු වෙනවා. මොන මොන සහනයක් දී තිබෙනවාද යනාදී කරුණු ඉදිරිපත් කරනු ඇතැයි අප ඉතා ඕනෑ කමින් බලාපොරොත්තු වන බව සඳහන් කරන්නට කැමතියි. ඒ ගැන අපි දන්නේ නැහැ. ඒ නිසා ගරු ඇමතිතුමා ඒ ගැනත් යම්කිසි ප්‍රකාශයක් කළොත් හොඳයි.

පළාත් පාලන ආයතනත් විදුලි බල දෙපාර්තමේන්තුවත් අතර ඇති සහයෝගය මදි බව අපට පෙනී ගොස් තිබෙනවා. ජනතාවට විදුලි බලය ලබා දීමේ වැඩ කටයුතු ව්‍යාප්ත කරන්නට කොයි තරම් උනන්දුවක් දැක්වූවත් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සහයෝගය නියම අන්දමට විදුලි බල දෙපාර්තමේන්තුවෙන් ඒ ආයතනවලට ලැබෙන්නේ නැහැ. පළාත් පාලන ආයතන විදුලි බලය බෙදා හැරීමේ වැඩ කටයුතු සම්බන්ධයෙන් සැහෙන මුදලක් වැය කරන්නට ඉදිරිපත් වන අවස්ථාවල පවා ඊට අනුබලයක් දෙපාර්තමේන්තුවෙන් නොලැබෙන බව අපට දැනගන්නට ලැබී තිබෙනවා. පළාත් පාලන ආයතන ඉදිරිපත් වන අවස්ථාවකදී පවා අවශ්‍ය අනුබල නොලැබෙන නොයෙක් වතාවල් ගැන වරින් වර අහන්නට ලැබෙනවා. කොලොන්නාව කොට්ඨාශය ගැන මට මෙවැනි අවස්ථා ඉදිරිපත් කරන්නට ඕනෑ තරම් තිබෙනවා. විශේෂයෙන්ම නිවාස ක්‍රමවලට අයිති හුඟ දෙනකුට මේ නිසා හිරිහැර කරදර විඳින්නට සිදු වෙනවා. විශේෂයෙන්ම රජයේ නිවාස ක්‍රමවලට විදුලි බලය ඉතා මත් අවශ්‍ය බව කියා දෙපාර්තමේන්තුවේ අනුග්‍රහය ඉල්ලා තිබෙනවා. ඒ වාගේම විදුලි බලය අපේක්ෂා කරන සැලකිය යුතු පිරිස් සංඛ්‍යාවක් ඒ සඳහා අවශ්‍ය මුදල් බැඳ—කාර්යාලයේ තැන්පත් කර—ඉල්ලා තිබෙනවා. අවුරුදු දෙකක් හෝ ඊටත් වැඩි කාලයක් එසේ මුදල් බැඳ විදුලි බලය ලැබෙන තුරු බලාගෙන සිටින අය ඉන්නවා යයි මා හිතනවා. තවමත් ඒ සම්බන්ධයෙන් කිසිම දෙයක් කර නැහැ. ඒ නිසා කරුණාකර ඒ සම්බන්ධයෙනුත් හැකිතාක් ඉක්මනින් නිසි පියවර ගන්නා ලෙස නිලධාරීන් ටිකක් උනන්දු කරවන මෙන් මා ඉල්ලා සිටිනවා.

උපකරණ ලබා ගැනීමට මධ්‍යස්ථානයක් අපේ රටේ නැහැ. තමන්ට අවශ්‍ය උපකරණ ගැනීමට නොයෙක් තැන්වලට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

යෑමට පළාත් පාලන ආයතනවලට සිදු වන බව මා දන්නවා. විදුලි බල මධ්‍යස්ථානයට වුවමනා කරන උපකරණ ආදිය ලබා ගැනීමට විදුලි බල සංස්ථාව මගින් හෝ විදුලි දෙපාර්තමේන්තුව මගින් හෝ ක්‍රම වත් වැඩ පිළිවෙළක් ඇති කළොත් සුදුසු බව මතක් කරන්නට කැමතියි. බඩු හුවමාරු කර ගැනීමේ ක්‍රමය යටතේ හෝ ද්‍රව්‍ය ආධාර ක්‍රමය යටතේ මේ භාණ්ඩ ලබා ගන්නට පුළුවන්කම් නැයි මා විශ්වාස කරනවා. එසේ කළොත් වැය වන මුදලත් අඩු කර ගන්නට පුළුවන් වෙනවා. මා සඳහන් කළ ඒ කරුණු කීපය කෙරෙහි ගරු ඇමතිතුමාගේ සැලකිල්ල යොමු වනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා රුපියල් දශ ලක්ෂයක පරිපූරක ඇස්තමේන්තුවකට මේ ගරු සභාවේ අනුමැතිය අපේක්ෂා කරනවා. එයින් ලක්ෂ නවයක් වුවමනා කරන්නේ රජයේ ගොඩනැගිලිවල විදුලි ස්ථාපනයන් සඳහා බව සඳහන් වෙනවා. ඉතිරි රුපියල් ලක්ෂය වුවමනා කර තිබෙන්නේ මින්නේරිය නගරයේ විදුලිය සැපයීමේ යෝජනා ක්‍රමයටයි. ඒ අතර, ගරු ඇමතිතුමා සඳහන් කළා මින්නේරිය නගරයේ දැන් වී මෝල් සංඛ්‍යාව වැඩි වී තිබෙන බව. ඒවාටත් විදුලි බලය අවශ්‍යයි. ඒ නිසා මින්නේරිය නගරයට විදුලි බලය සැපයීමට රුපියල් ලක්ෂයක් වුවමනායයි ගරු ඇමතිතුමා කියනවා. මින්නේරිය නගරයට විදුලිය සැපයීම ගැන අප කිසිම විධියකින් විරුද්ධ වන්නේ නැහැ.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

නගරයට නොවෙයි, මුළු ප්‍රදේශයටම.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

එහෙම නම් වඩාත් හොඳයි. ඒ ගැන අපි කිසිසේත් විරුද්ධ වන්නේ නැහැ. අප කියන්නේ අනෙක් ප්‍රදේශවලටත් විදුලි බලය අවශ්‍ය බවයි. අපේ ගරු ඇමතිතුමා මින්නේරියට විශේෂ කාරුණික භාවයක් දක්වන බව අපි දන්නවා. ඒ ගැන කිසිම විරුද්ධත්වයක් නැහැ. අපේ ප්‍රදේශය වන මාතර ගැන මාත් විශේෂයෙන් සඳහන් කරන්නට ඕනෑ. මාතර මා නියෝජනය කරන ඡන්දදායක කොට්ඨාශයයි. එහි සමහර ගම් උඩින් විදුලි කම්බි සවි කර තිබෙනවා. එහෙත් ඒ ප්‍රදේශවල ඉන්න උදවියට විදුලි බලය ලබා ගන්නට පුළුවන්කමක් නැහැ. මේ උදවියටත් විදුලි බලය ලබා දෙන්නට ගරු ඇමතිතුමා ක්‍රියා නොකරන්නේ මන්දැයි අහන්නට ඕනෑ. අද තිබෙන තත්ත්වයේ හැටියට තවමත් මාතර නගරය අවට බොහෝ ප්‍රදේශවලට විදුලි බලය සපයන්නට පුළුවන්කමක් ඇත්තේ නැහැ. කරුණාකර බලන්න. කණු සවි කෙළේ 1964 දී, නමුත් තවම විදුලි බලය සපයා නැහැ. මේ ආණ්ඩුව බලයට පත් වී දැනට අවුරුදු හතරකුත් මාස ගණනක් වෙනවා. තවම මෙය සම්පූර්ණ කරන්නට බැරි වුණා. අපේ විදුලි දෙපාර්තමේන්තුව කොතරම් කාර්යක්ෂමද කියා එයින්ම පැහැදිලි වෙනවා. විදුලි දෙපාර්තමේන්තුව විදුලිය වගේ වැඩ කරන්නයි ඕනෑ. එහෙම නැත්නම් ඒ දෙපාර්තමේන්තුවෙන් කිසි වැඩක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ විදුලි බලය තිබෙනවා. එය වැඩි කර ගන්නටත් ක්‍රම තිබෙනවා. එහෙත් ප්‍රදේශ හුඟකටම තවමත් විදුලිය සපයන්නට බැරි වී තිබෙනවා. ඒ ගැන ගරු ඇමතිතුමා කියන්නේ මොනවාද කියා මා දන්නේ නැහැ. අවුරුදු 4½ ක් තිස්සේ මඩිහ ගොඩගමටත්, මාතර සිට ගොඩගම දක්වා හා මාතර සිට ගල්ගම දක්වාත් විදුලිය සපයන්නට බැරි වුණා. විරුඬ පාර්ශ්වයේ මන්ත්‍රී වරයෙකුගේ ආසනයක් නිසාද මෙය කරන්නට බැරි වී තිබෙන්නේ කියා මා අහනවා. තමුන්නාන්සේලා ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා. තමුන්නාන්සේලා රැස්වීම්වල කියන්නේ දේශපාලන පක්ෂ ගැන සලකන්නේ නැත, ආණ්ඩු පක්ෂයේය විරුද්ධ පාර්ශ්වය කියා සලකන්නේ නැත, සර්ව සාධාරණ ලෙස ක්‍රියා කරනවාය කියලයි. එහෙත් තමුන්නාන්සේලා අපේ කොට්ඨාශවලට වැඩ කරන්නේ ඇලිමැලි දුබල ගතියෙනුයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
පැනෝපැප්ටන් ටිකක් දෙන්න.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
දැන් පැනෝපැප්ටන් දෙන්නට සිදු වී තිබෙන්නේ ඇමතිතුමාටයි, එතුමාගේ දුර්වලකම නැති කරන්නට. ඔය ඇළිමැලි දුබල ගතිය නැති කර අපේ කොට්ඨාශවලටත් වැඩ කරන්නය කියා මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලනවා. අපේ ප්‍රදේශයේ ඇති ඔය අවශ්‍යතාවන් කාලයක් තිස්සේ තිබෙන ඒවා. ඒවා නොසලකන්නේ ඇයි? අපට ඒ අඩුපාඩු සම්පූර්ණ කර ගන්නට සිදු වී තිබෙන්නේ ලබන අවුරුද්දේයි. මේ විධියට වැඩ කළොත් නම් කවදාවත් මේ රටේ ජනතාව තමුන්නාන්සේලාට නැවත බලය දෙන්නේ නැහැ. තමුන්නාන්සේලා බොහොම මහන්සි ගන්නවා දකුණු පළාතේ ආසන දිනා ගන්නට. සාකච්ඡා පිට සාකච්ඡා කරනවා. ඔය විධියට වැඩ කළොත් නම් ඒ පරමාර්ථය කවදාවත් ඉටු කර ගන්නට පුළුවන් වන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක කරුණක් මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරවන්නට කැමතියි. මාතර නගරයට විදුලිය ලැබෙන්නේ බටදූව මධ්‍යස්ථානය හරහායි. එහි පාලනයේ තිබෙන දුර්වලකම නිසා වරින් වර නගරයේ විදුලි බලය බිඳ වැටෙනවා. ගරු අධ්‍යාපන ඇමතිතුමා ළඟදී මාතර රාහුල විද්‍යාලයේ අධ්‍යාපන සියවස ප්‍රදර්ශනය විවෘත කළා. ඒ ප්‍රදර්ශනය රාත්‍රී 10 පමණ වන තුරු තබා ගන්නටයි බලා පොරොත්තු වුණේ. එය පළමු වැනි දවසත් වුණා; ගරු ඇමතිතුමා ගොස් විවෘත කළ දවසත් වුණා. එහෙත් මොකක්ද වුණේ? අවාසනාවකට මෙන් ආණ්ඩුවේ ඉදිරිය පිළිබඳ පෙරනිමිති දක්වන්නාක් මෙන්, විදුලිය නැතිව ගොස් රාහුල විද්‍යාලයත් මාතර නගරයත් අඳුරේ ගිලුණා. අධ්‍යාපන ඇමතිතුමාගෙන් අහන්න බොරුද කියා. මොකක්ද එයට හේතුව? බටදූව මධ්‍යස්ථානයේ තිබෙන දුර්වලකමයි. බටදූව නිසා මාතර ජනතාවට මේ කරදර විඳින්නට පුළුවන්කමක් නැහැ. ඒ

නිසා මේ නිරන්තරයෙන් ඇති වන විදුලිය බලය ඇනහිටීම වළක්වන්නය කියා ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. විදුලිය බිඳ වැටුනාම ජලය නැහැ. විදුලිය පාවිච්චි කරලයි ජලය ලබා ගන්නේ. විදුලිය නැත්නම් ජලයත් නැහැ. ඔය නිසා මුළු නගරයේම ජනතාවට ලොකු අමාරුවකට මුහුණ පාන්නට සිදු වෙනවා. ඒ තත්ත්වයට හේතුව බටදූව මධ්‍යස්ථානයේ ඇති වරදයි. යන්ත්‍ර සවි කිරීමේ හා ඒවා ආරක්ෂා කිරීමේ නියම විධිවිධාන යොදා නැති නිසා මෙවැනි තත්ත්වයක් පැනනැගී තිබෙනවා කියන එකයි මාතර නගරාධිපතිතුමාගේ ප්‍රකාශය. එය මගේ ප්‍රකාශයක් නොවෙයි; විදුලි ඉංජිනේරුතුමාගේ උපදෙස් පිට මාතර නගරාධිපතිතුමා කළ ප්‍රකාශයක්. එම ප්‍රකාශයෙන් කියන්නේ බටදූව මධ්‍යස්ථානයේ පාලනයේ දුර්වලකම නිසා මේ තත්ත්වය ඇති වී තිබෙනවා කියන එකයි. මාතර නගරයේ නිරන්තරයෙන් විදුලිය ඇනහිටීමටත් ඒ අනුව ජලය ඇනහිටීමටත් හේතුව ඒ කයි.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
ජල විදුලිය?

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
විදුලිය නැති වන විට ජලයත් නෑ.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
ජල විදුලිය නිසා ජලය නැති වන විට විදුලියත් නෑ.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
ජලය නම් තිබෙනවා. හැබැයි, විදුලිය නැති නිසා ජලය බෙදා දෙන්නට විධියක් නෑ. වතුර පොම්ප කරන්නේ විදුලිය පාවිච්චි කරලා. මේක බරපතල ප්‍රශ්නයක්. එහෙයින් මේ ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

විදුලි කම්බි ගමන් කරන්නා වූ මාර්ග වල තිබෙන ගම්මානවලට විදුලි ආලෝකය ලබා දෙන ලෙසත් මා ඉල්ලා සිටිනවා. මෙය පහසුවෙන්ම කරන්නට පුළුවන් වැඩක්. මාතර නගරයේ සිට නිල්වලා ගඟේ ජලය පොම්ප කරන ස්ථානය දක්වා—නාදුගල දක්වා—විදුලි කම්බි ඇද තිබෙනවා. ඒ විදුලි කම්බි ගමන් කරන මාර්ගයේ පිහිටි ගම්මානවලට විදුලි බලය සැපයීම සඳහා විශේෂ වියදමක් දරන්නට සිදු වන්නේ නැහැ. දරන්නට සිදු වන්නේ සුළු වියදමක්. ඒ නිසා මාතර නගරයේ සිට නිල්වලා ගඟේ ජලය පොම්ප කරන නාදුගල දක්වා ඇද තිබෙන විදුලි කම්බි ප්‍රයෝජනයට ගනිමින් ඒ ගම්වලට විදුලිය සපයන ලෙස මා ඉල්ලා සිටිනවා.

නගරය අවට තිබෙන ගම්කාර්ය සභා ප්‍රදේශවලට විදුලිය සපයන්නේ මාතර නගර සභාවයි. මාතර නගර සභාවට විදුලි පරිවර්තකයන් ගෙන්වා ගැනීමට ඇති වූ ප්‍රමාදය නිසා මේ කටයුත්තට ටිකක් බාධා පැමුණුනා. එහෙත් දැන් විදුලි පරිවර්තකයන් ලැබිලා. ඒ නිසා මේ කටයුතු ඉක්මනින් කරගෙන යා යුතු බවට නගර සභාවට උපදෙස් දෙන්නට විදුලි දෙපාර්තමේන්තුවට යුතුකමක් තිබෙනවා. මහා මැතිවරණයකුත් ළඟම තිබෙනවා. මෙවැනි කටයුතුවත් නොකර මැතිවරණයකට මුහුණ දෙන්නේ කොහොමද? මොනවා කරන්නට හිතාගෙන සිටිනවාදැයි මට තේරෙන්නේ නැහැ. ඒ නිසා නගරය අවට තිබෙන ගම්වලට විදුලිය සපයා දී "මෙන්න අප විදුලියත් සපයා තිබෙනවා. ඒ නිසා අපේ නියෝජිතයාට ඡන්දය දෙන්න" යනුවෙන් කියන්නට පුළුවන් තත්ත්වයක් ඇති කර ගන්න.

මීට වඩා මා කථා කරන්නේ නැහැ. මා ඉදිරිපත් කළ කරුණු ගැන සැලකිල්ල යොමු කර ක්‍රියා කරනු ඇතැයි බලා පොරොත්තු වෙනවා.

අ. භා. 2.38

ප්‍රින්ස් ගුණසේකර මයා.

(திரு. பிறின்ஸ் குணசேக்கர)

(Mr. Prins Gunasekera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිතුමාටත් ඒ අමාත්‍යාංශයේ නිලධාරීන්ටත් අවුරුදු පතා මතක් කළ කාරණයක් අදත් මතක් කරන්නට මා බලාපොරොත්තු වෙනවා. පසුගිය අවුරුදු හතරහමාර තිස්සේ මේ කාරණය හතරහමාර වාරයක් මතක් කර තිබෙනවා. ගම් 500 කට විදුලි බලය සැපයීමේ යෝජනා ක්‍රමය යටතේ හබරාදූව කොට්ඨාශයේ ගම් 7 කට විදුලි බලය දීම අනුමත කර තිබෙනවා. එයින් නගර දෙකකට ප්‍රමුඛස්ථානය දී තිබෙනවා. අවුරුදු තුනහමාරකට පසුව කතලුවට සහ තල්පේ-මිහිරිපැන්නට විදුලි බලය සැපයීමට ප්‍රමුඛස්ථානය දී තිබෙනවා. මා දැන් මේ මා අතේ තිබෙන ලියමනේ පිටපතක් විදුලි අංශයේ ප්‍රධාන කළමනාකාර මහතාට යැව්වා. වාර්තා ගත වීම සඳහා මම එය කියවන්නම්. ගම් හතකින් කතලුව සහ තල්පේ මිහිරිපැන්න වෙන් කර ගෙන තිබෙනවා. එසේ වෙන් කළ ගම් වලින් වැඩිම ආදායමක් ලැබෙන ගම් දෙක කතළුව හා තල්පේ-මිහිරිපැන්නයි. එහෙත් ඒ ගම් දෙක අත්හැර පෞද්ගලික හා රහසිගත හේතු උඩ, අර ගම්දෙක තරම් වැදගත් නැති ස්ථාන දෙකකට විදුලි බලය ලබා දී තිබෙනවා. ඒවායින් සැහෙන ආදායමක් ලැබෙන්නේ නැහැ. සැහෙන ආදායමක් ලබා ගන්නට පුළුවන්, දෙපාර්තමේන්තුවට පාඩු නොවන, විදුලි බලය දෙන්නට ඇමතිතුමා මීට මාසයකට පමණ කලින් ප්‍රමුඛස්ථානය හිමි කළ ගම් දෙකට විදුලි බලය ලබා දෙන මෙන් දෙපාර්තමේන්තුවට උපදෙස් දෙන ලෙස ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මා මේ සම්බන්ධයෙන් එම දෙපාර්තමේන්තුවේ ජෙනරල් මැනේජර් මහත්මයාට හා දෙවැන්නාටත් ලිපියක් යැව්වා. ඒ ලිපිය යැවුවේ ඉංග්‍රීසියෙන්. ඒ ජෙනරල් මැනේජර් මහත්මයා සමග කටයුතු කරන්නට සිදු වී තිබෙන්නේ ඒ භාෂාවෙනුයි. වාර්තාගත වීම සඳහා ඒ ලිපිය කියවන්නම්:

"*Rural Electrification—Kataluwa-Talpe-Mihiripenna*

Further to my telephone conversation with you on 26.9.1969, I write to ask you to take some meaningful steps regarding the supply of electricity to these two areas. I have endeavoured to get your Department to commence this work for the last 4½ years without any success. I

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

hope you will appreciate that such delay does not speak well of any public institution.

Yours faithfully,
Sgd. Prins Gunasekera,
M. P. for Habaraduwa."

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
ඇයි, ඉංග්‍රීසියෙන් ලීවේ?

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
ජෙනරල් මැනේජර් මහත්මයාට තේරෙන්නේ ඒ භාෂාවයි.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
ඒ නිසා තමයි, මාත් ඉංග්‍රීසියෙන් මුද්‍රණය කරන්නේ.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
මා ඇමතිතුමා සමග ගනුදෙනු කරන්නේ සිංහලෙන්. ඒ මහත්මයා තමුන්නාන්සේලාගේ සේවකයෙක්. ඇයි, ඒ මහත්මයාම—

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
ඒ මහත්තයාට සිංහල උගන්වන්න.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
පළමු කොට අර ගම් දෙකට විදුලි බලය ලබා දෙන්න. ඉන් පසු ඒ මහත්මයාට නොමිළයේ සිංහල උගන්වන්න මා සූදානම්.

අ. භා. 2.40

දයා ටී. පස්කුවෙල් මයා. (මතුගම)
(திரு. தயா ரீ. பஸ்குவல்—மத்துகம)
(Mr. Daya T. Pasqual—Matugama)
නියෝජ්‍ය කථානායකතුමනි, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිතුමා විදුලි සැරය වැඩි කිරීම සඳහා අතිරේක වැය ශීර්ෂයක් ඉදිරිපත් කිරීම ගැන අප විරුද්ධ වන්නේ නැහැ. ඒ වැඩිවන විදුලි සැරයෙන් අපට කොටසක් ලැබේය යන බලාපොරොත්තුවෙන්.

මතුගමත් විදුලි බල ඩිපෝවක් නැත් නම් මධ්‍යස්ථානයක් තිබෙනවා. ඒ මධ්‍යස්ථානයට අයිති රුපියල් ලක්ෂ ගණන් වටිනා උපකරණ රජයේ හා වෙනත් අයගේ ඉඩම්වල එළිමහනේ දමා තිබෙනවා. එම විදුලි බල මධ්‍යස්ථානය සඳහා නගර සභාව සතු ඉඩමක ගොඩනැගිල්ලක් හදා තිබෙනවා, නගර සභාවට බිම් බද්දක් ගෙවන්නේවත්, ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරන්නේවත් නැතිව. එම නිසා නගරාධිපති වශයෙන් තර්ජනාත්මක ලිපියක් පවා යවන්නට මට සිදු වුණා, නීති විරෝධිව ගොඩනැගිලි සෑදීම ගැන නීත්‍යනුකූලව කටයුතු කරනවාය කියා. එහෙත් එහෙම කිරීමත් හොඳ නැතැයි මා පසුව කල්පනා කළා. අවුරුදු ගණන් ගත වුණත් පානදුරේ විදුලි ඉංජිනේරු මහත්මයාගෙන් පිළිතුරක් ලබා ගැනීම බොහොම අමාරු වැඩක්. මා කලින් සඳහන් කළ පරිදි, මතුගම විදුලි බල මධ්‍යස්ථානයේ උපකරණ එළිමහනේ දමා තිබෙන නිසා වරක් ඒවා හොරු ගත්තා. එහි වහළක් යට තිබෙන්නේ වර්ග අඩි විස්සක තිහක කාමරයක් පමණයි. අනෙක්වා තිබෙන්නේ පන්සල් වත්තෙයි, නගර සභා ඉඩමෙයි, පාර අයිනේ එළිමහනෙයි. අනන්තවත් රජයේ ඉඩම් තිබෙනවා. එසේම ඉඩම් රජයට අත්පත් කර ගැනීමටත් බලය තිබෙනවා. එහෙම නම් එම උපකරණ ආරක්ෂා සහිතව තබා ගැනීමටත්, සේවකයන්ට පහසුකම් ලැබෙන ආකාරයටත් ගොඩනැගිලි හදා නොදෙන්නේ ඇයි? අතිරේක වැය ශීර්ෂයක් ඉදිරිපත් කර ඇති මේ අවස්ථාවේදී ඒ අඩුපාඩුකම් තමුන්නාන්සේගේ අවධානයට යොමු කරන්නට කැමතියි.

මතුගම නගරයට ලැබෙන විදුලි බල ප්‍රමාණය මදි නිසා, දැනට තිබෙන විදුලි බල මධ්‍යස්ථානයට සැතපුම් $1\frac{1}{2}$ ක් පමණ ඈතින් කළුතර පාරටත්, නැබඩ පාරටත් මධ්‍යස්ථව අළුතින් උප මධ්‍යස්ථානයක් ඇති කරන ලෙස අප ඉල්ලුම් කර තිබෙනවා. මතුගම ඩිපෝව බාර නිලධාරි මහතා ඇස්තමේන්තු හදා පානදුරේට යවා තිබෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[දයා ටී. පස්කුවෙල් මයා.]

නවා. ඒ සම්බන්ධව ලියුම් ලිව්වත් විදුලි පණිවුඩ යැව්වත් ඒවාට උත්තර ලැබෙන්නේ නැහැ. එම නිසා, ඒ උප මධ්‍යස්ථානය පිළියෙළ කර ගන්නට තවමත් බැරි වුණා. එම පාර දිගේ ගමන් කරන්නාවූ විදුලි සැරය මධ්‍යස්ථානයෙන් ඈතට යන විට ක්‍රමයෙන් එහි බලය අඩු වී සමහර ප්‍රදේශවල ටියුබ් ලාම්පු පත්තු වන්නේ නැහැ; සමහර පළාත්වල වීදි ලාම්පු පවා පත්තු වන්නේ නැහැ. මේ සම්බන්ධව පානදුරේ විදුලි ඉංජිනේරු මහතා දක්වන සැලකිල්ල මද බව මා කියන්නට ඕනෑ. එතුමාට කොයි තරම් කිව්වත් කිසිම වැඩක් නැහැ. පසුගිය දවසක ගැමි විදුලි යන කටයුතු ඉක්මන් කිරීම සඳහා මතුගම ඩී. ආර්. ඕ. මහත්මයාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය මට්ටමේ සාකච්ඡා සභාවක් පැවැත්වුණා. ඉංජිනේරු මහත්මයා තබා එතුමා වෙනුවෙන් වෙනත් කිසිවකු හෝ දෙපාර්තමේන්තුවෙන් එම සාකච්ඡාවට සහභාගි වුණේ නැහැ. ඊට පසු ඉංජිනේරු මහත්මයාට මේ ගැන ලියා දැන්වූ විට එතුමා කියා තිබෙන්නේ, පස්දුන් කෝරළයේ එකම ගමක්වත් ගැමි විදුලි යන ක්‍රමය යටතට නොගැනෙන බවයි. මා ඒ කීමෙන් පුදුමයට පත් වුණා. වැලිපැන්න ගම්සභා ප්‍රදේශයේ එක් ගමකට පමණක් විදුලි බලය දී තිබෙනවා. වැලිපැන්නත් ගොඩපිටියත් අතර හැතැප්ම දෙකහමාරක තුනක පමණ කොටසක් හිස්ව තිබෙනවා. වැලිපැන්නත් මතුගම නගර සභාවත් අතර හැතැප්ම දෙකක් හිස්ව තිබෙනවා. බණ්ඩාරගම ප්‍රදේශයෙන් එන විදුලි මාර්ගයෙන් ගොඩපිටිය තෙබුවන ආදී ගම්වලට ඉතා පහසුවෙන් විදුලිය දෙන්නට පුළුවන්කම තිබෙනවා. එහෙත්, විදුලි ඉංජිනේරුතුමා කියන්නේ ඒ ප්‍රදේශ ගැමි විදුලියන ක්‍රමයට අයත් නැති බවයි. මේ ගැන ලියුම් ලිව්වත් විදුලි පණිවුඩ යැව්වත් කිසිවකට පිළිතුරු ලැබෙන්නේ නැහැ. අන්තිමේ කුමක් හෝ පිළිතුරක් දී නිශ්ශබ්ද වෙනවා. මේ සම්බන්ධයෙන් ඉතාම අසතුටුදායක තත්ත්වයක් පවතිනවා.

විදුලි මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මාසයකට වරක් දිනයක් නියම කෙරෙනවා. පාරිභෝගිකයන්ට අවවාද දී විතව දැනුම් දීම සඳහා එම දිනය සතිය කට කලින් පළාත් පාලන මණ්ඩලවලට දන්වනු ලබනවා. එහෙත් දැන් කලක සිට හිටි හැටියේම කිසිම දැන්වීමක් නැතිව, කිසිම හේතුවක් නැතිව විදුලි බලය නතර වෙනවා. ඒ නැවැත්වීම කෙරෙන්නේ මහ මධ්‍යස්ථානයෙන්ද පළාත් පාලන මණ්ඩලයෙන්ද යන වග පාරිභෝගිකයන් දන්නේ නැහැ. එම නිසා පළාත් පාලන මණ්ඩලවල නියෝජිතයන්ට පාරිභෝගිකයන්ගේ ඇනුම් බැණුම්වලට මුහුණ දෙන්නට සිදු වෙනවා. මෙවැනි පිළිවෙළක් තිබීම මහජනයාට කරදරයක්. ඒ වාගේම රජයටත් හිස රදයක්. අපට ලැබෙන බැණුම් සියල්ලම අප රජය පිට පටවනවා. ඒවායේ දොස් පරොස්, හොඳ නරක විනිවිද පෙනෙන්නේ මහා මැතිවරණයකදීයි. විදුලි බල අංශයේ සැර වැඩි කර ගැනීමට අප උදව් දෙන්නේ ඒ වැඩි වන සැරයෙන් කොටසක් අපටත් ලැබේය යන බලාපොරොත්තුවෙනුයි.

අ. භා. 2.47

ලීලාරත්න විජේසිංහ මයා.
(திரு. லீலாரத்ன விஜேசிங்க)
(Mr. Leelaratne Wijesinghe)

මින්නේරිය ගම් ප්‍රදේශයට විදුලි බලය සපයා දීමට දැන් ගරු ඇමතිතුමාට මුදල් අවශ්‍ය වී තිබෙනවා. මා එය අනුමත කරනවා. ඒ එක්කම, අලුතෙන් විදුලි බලය ලබා දීමට පෙර, දැනට විදුලි බලය දී තිබෙන තැන්වල එය හරිහැටි ක්‍රියාත්මක කළ යුතු බව මා ඇමතිතුමාට මතක් කරනවා. පොළොන්නරු නගරයට විදුලි බලය ලැබී තිබෙනවා. එම නගරයට එන කෙනකු මින්නේරිය පසු කරගෙන ආ යුතුයි. දැන් පොළොන්නරු නගරයේ සතියකට හතර පස් වරක් විදුලි බලය නැති වෙනවා. පෙරෙයිදාත් රෑ එලි වන තුරු විදුලිය තිබුණේ නැහැ. සමහර දිනවල විදුලි එලිය නිවෙමින් පත්තුවෙමින් තිබෙනවා. එය දැන් මහා නාඩගමක් වී තිබෙනවා. නාඩගම් මඩුවලත් සමහර විට එවැනි අවස්ථා අපට දකින්න ලැබෙනවා. විදුලි බලය සැපයූ දා සිටම දැන් අවුරුදු ගණනක් තිස්සේ මේ තත්ත්වය පවතින නිසා එහි පාරිභෝගිකයන්ට හරියාකාර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විදුලි බලය ලැබෙන්නේ නැහැ. අඳුතෙන් විදුලි බලය සපයන්නට පෙර විදුලි බලය සැපයූ ස්ථානවලට හරියාකාර විදුලි බලය ලබා දීම තමුන්නාන්සේගේ යුතුකමයි. මෑද පත්තු මෑද ගම්සභාවට අයිති පලු ගස්දමන-හේවාගම කොටසට විදුලි බලය සපයන්නය කියා දැන් අවුරුදු හතරක් පහක් තිස්සේම අර අදිනවා. ගම් සභාවේ ඡන්දය පැවැත්වෙන විට තමුන්නාන්සේ ගිහින් හෙට අනිද්දාම විදුලිය සපයනවාය කියා පොරොන්දු දෙනවා. නමුත් ඡන්දය අවසාන වනවාත් සමගම තමුන්නාන්සේ දකින්නටවත් නැහැ. සිටවූ සමහර කණු ගලවනවා. එතෙක් වැඩ කළ මිනිසුනුත් අකුළා ගෙන යනවා. සිටවූ කණු කිපයක් ඔහේ තිබෙනවා. එපමණයි. වැඩක් කෙරෙන පාටක් නැහැ. මෑද පත්තු මෑද ගම්සභාවේ සෑතපුම් භාගයක පමණ සුළු කොටසකට යි, විදුලි බලය දෙන්නට තිබෙන්නේ. නමුත් ඒ වැඩ කොටස සම්පූර්ණ කරන්නේ නැහැ. පාර අයිනේ දමා තිබෙන කණු දිරාපත් වෙනවා. ඇමතිතුමා පැමිණෙන විට නම් නිලධාරීන් කලබල වෙනවා. ඒ නිසා ඒ ගැන අවධානය යොමු කරන මෙන් මා ඉල්ලා සිටිනවා. පලුගස්දමන-හේවාගම කොටසට ජූනි මාසය වන විට විදුලිය සපයනවාය කියා තමුන්නාන්සේ පොරොන්දු වුණා. එම නිසායි මා ඒ කාරණය මතක් කළේ. අලුතෙන් මුදල් වෙන් කර අලුත් වැඩ වලට අතගැසිය යුත්තේ ඒවා අවසානයක් කළාට පසුව නේද?

මින්නේරියේ වී මෝල් හැට හැත්තෑවක් පමණ තිබෙනවා. මින්නේරියේ පාරිභෝගිකයින්ගෙන් තමුන්නාන්සේට විශාල ආදායමක් ලබා ගන්නට පුළුවන් වෙයි. ළඟම තිබෙන තමුන්නාන්සේගේ බංගලාවටත් විදුලිය ගන්නට පුළුවන් වෙයි. ඒ සමගම තවත් කාරණයක් මතක් කළයුතුව තිබෙනවා. පොලොන්නරුවේ ශුද්ධ නගරයට, එනම් පෞරාණික වස්තු තිබෙන ප්‍රදේශයට, විදුලිය සැපයීමේ වගකීමත් තමුන්නාන්සේ භාර ගන්නට ඕනෑ. දැන් රාත්‍රී කාලයට ඒ ප්‍රදේශයේ කිසිම ආලෝකයක් නැහැ. එමනිසා පුරා වස්තු නිදන් හොරු හාරනවා; විනාශ කරනවා. ඒ අතරේ අර හිපියන් එහෙමත් ඇවිත් නාඩගම් නටනවා. තමුන්නාන්සේගේ කාල සීමාව තුළම මේ පෞරාණික සිද්ධස්ථාන තිබෙන ප්‍රදේශයටත් විදුලි ආලෝකය සැපයුවහොත් තමුන්නාන්සේගේ නමත් පවතිනවා. විශේෂයෙන්ම ගල් විහාරයත් ඒ අවට තිබෙන පුරා වස්තූන් ආරක්ෂා කරන්නට පියවර ගත යුතුයි. මේ වැය ශීර්ෂය අනුමත කරන අතර අපේ ප්‍රදේශවල අඩුපාඩුකම් හරිගස්සා දෙන ලෙස ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

අ. භා. 2.51

ගරු සී. පී. ද සිල්වා

(கௌரவ சீ. பீ. டி சில்வா)

(The Hon. C. P. de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීවරුන් නොයෙකුත් අඩුපාඩුකම් ගැනත් වැරදි ගැනත් කරුණු ඉදිරිපත් කරන්නට යෙදුණා. ඒ ගැන මා බොහොම සතුටුයි. මේ දෙපාර්තමේන්තුව පාලනය කරන සාමාන්‍යාධිකාරීතුමාත්, ඉඩම් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්තුමාත් ඒ කරුණු අසා ගෙන සිටියා. ගරු මන්ත්‍රීවරුන් ඉදිරිපත් කළ සියලුම කරුණු ගැන පරීක්ෂා කර බලා අඩුපාඩුකම් තිබෙනවා නම් ඒවා ඉක්මණින්ම හරිගැස්සීමට ක්‍රියා කරනවා ඇති.

බෙන්තර-ඇල්පිටියේ ගරු මන්ත්‍රීතුමා (කාරියවසම් මයා.) ආරෝග්‍යශාලාවලට විදුලිය නැත කිව්වා. ආරෝග්‍යශාලාවලට විදුලිය නොමැතිවීම ගැන මා ඉතාම කණගාටුවෙනවා. ඒ අඩුපාඩුකම් ගැන පරීක්ෂා කර ඒවා ඉක්මණින්ම හරිගස්සන්නට මා බලාපොරොත්තු වෙනවා.

එතුමා ගිංගඟ ගැනත් සඳහන් කළා. මේ අවුරුද්දේ මුල හරියේදී මස්කෙළිඔය කිලොවොට් 90,000 ක විදුලි බල මධ්‍ය ස්ථානයක් අප විවෘත කළා. ලක්ෂපාන කිලොවොට් 50,000 යි. එතකොට විවෘත කළ මධ්‍යස්ථානය එමෙන් දෙගුණයක පමණ බලයක් උපදවනවා. 1966 අවුරුද්දේදී ලක්ෂපානේ කිලොවොට් 50,000 ක තවත් මධ්‍යස්ථානයක් විවෘත කළා. මස්කෙළිඔය දෙවන පියවර අනුව කිලොවොට් 75,000 ක තවත් මධ්‍ය ස්ථානයක් ඇති වෙනවා. ඒවාගේම මහවැලි ගඟ හැරවීමේ යෝජනා ක්‍රමය යටතේ පොල්ගොල්ලේ කිලොවොට් 40,000 ක තවත් මධ්‍යස්ථානයක් ඇති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු සී. පී. ද සිල්වා]

වෙනවා. නමුත් ශීඝ්‍රයෙන් ඇති වේ ගෙන යන දියුණුවේ හැටියට මේ ප්‍රමාණයත් මදි බවයි පෙනෙන්නෙ. ගිංගඟ ගැන අප තවම පරීක්ෂා කරනවා. ගංවතුරෙන් ඇති වන හානිය වැළැක්වීමට බැම්මක් බඳිනවාට වඩා පහසු ක්‍රමයක් තිබෙනවාය කියනවා. ඒ පිළිබඳව ඉදිරිපත් කර තිබෙන විශේෂඥ උපදෙස් මා භාර ගෙන නැහැ. ඒ ගැන නැවතත් පරීක්ෂා කරන්නය කියා මා නියෝගයක් දී තිබෙනවා. බැම්ටිකක් අඩු කර වැවක් බැඳ විදුලි බල මධ්‍යස්ථානයක් ඇති කිරීම ගැන අදහසක් තිබෙනවා. විශේෂඥයින්ගේ අදහස් මා භාර ගෙන නැහැ. ඒවා ගැන තවම පරීක්ෂා කරගෙන යන බව යළිත් කියන්නට සතුටුයි.

ගම්බද නගර රාශියකම විදුලි බලය සැපයීම පිළිබඳව අඩුපාඩුකම් තිබෙන බව මා දන්නවා. ආරෝග්‍යශාලා, තානායම්, ආණ්ඩුවේ දෙපාර්තමේන්තු සඳහා වෙන් වශයෙන් විදුලි බලය සැපයීමේ මාර්ග තිබෙනවා. ඒවා කාලයක් තිස්සේ තිබුණු ඒවායි. නමුත් ජල විදුලිය රැගත් ග්‍රිඩ් කම්බි සවි කරන විට ඔවා සියල්ලක්ම නැති වෙනවා. එතකොට ඒවා සේරම ඉවත් කරනවා. එසේ නැතුව අතරමගදී ඉවත් කරන්නේ නැහැ. ග්‍රිඩ් කම්බි ව්‍යාපාරය ක්‍රියාවේ යෙදුණාසින් පසුව පමණයි එසේ කරන්නේ.

කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමාද (ඉලංගරත්න මයා.) කතා කළා. හැම මුදල් ඇමතිවරයෙක්ම ඇස්තමේන්තුවල මුදල් කපා හරින බවත් එතුමා කිව්වා. හැම මුදල් ඇමතිවරයාම එය කරන්නට දක්ෂ බව ඇත්තයි. එහෙත් එසේ කපා හරින්නේ එක්තරා ප්‍රතිපත්තියක් අනුවයි. ගිය අවුරුද්දේ මෙපමණ වැය කළාය; මේ අවුරුද්දේ මෙපමණ වැය කරනවාය යනුවෙන් ඒ වෙන් කළ මුදල් ප්‍රමාණය අනුව විස්තර ඉදිරිපත් කිරීම හොඳය කියා මා සිතනවා. වෙන් කර තිබෙන මුදල් ප්‍රමාණය අනුව වැඩ කටයුතු සීමා කෙරෙනවා. එම අදහස හරිය කියා මා විශ්වාස කරනවා.

අළුත් පනත අනුව පළාත් පාලන ආයතන මගින් පාලනය වන ප්‍රදේශවලට අළුතින් විදුලි බල මධ්‍යස්ථාන දෙන්නේ නැහැ. ඒ සියල්ලක්ම කරන්නේ දෙපාර්තමේන්තුව මගිනුයි. එම වැඩ පිළිවෙළෙහි කිසි වරදක් නැහැ. මෙම ප්‍රශ්න විසඳීම සඳහා විදුලි දෙපාර්තමේන්තුවත් ගරු පළාත් පාලන ඇමතිතුමාත් ඉතා ළඟ සම්බන්ධයක් ඇතුව වැඩ කටයුතු කර ගෙන යන බව කිව යුතුයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම අවස්ථාවේදී මට එක කාරණයක් මතක් කරන්නට තිබෙනවා. මා එය මීට පෙරත් කියා තිබෙනවා. විදුලි දෙපාර්තමේන්තුවට පළාත් පාලන ආයතන මගින් විදුලි බලය සඳහා ගෙවන්නට තිබෙන ණය ප්‍රමාණය රුපියල් 1 කෝටි 70 ලක්ෂයක් වන තුරු ඉහළ ගොස් තිබුණා. දෙපාර්තමේන්තුව මගින් සපයන ලද විදුලි බලය වෙනුවෙන් එම ආයතනවලින් ගෙවිය යුතුව තිබුණු මුදල කොතෙක්දැයි ඒ අනුව පෙනෙනවා. දැන් එම මුදල් සෑහෙන පිළිවෙළකට ගෙවාගෙන යන බව පෙනෙනවා. පළාත් පාලන ඇමතිතුමාගේ උනන්දුව නිසයි එම තත්ත්වය ඇති වී තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මාතර පළාතට ජල විදුලි කම්බි වැටී තිබෙනවා. ගාල්ල, මාතර, හම්බන්තොට සහ නිස්සංසමහාරාමය පසු කොට කතරගම දක්වා එම කම්බි වැටී තිබෙනවා. එහෙත් ඒ මාර්ගය වැටී ඇති මැද හරියේ නොයෙකුත් ගම්වලට සහ නගරවලට විදුලි බලය ලබා දී නැහැ.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

බලපිටියේ ඉලෙක්ෂන් කණු එසේම තිබෙනවා. ඒවායේ කම්බි ඇද නැහැ.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி. சில்வா)
(The Hon. C. P. de Silva)

මා ඊට වඩා ඒ ගැන කතා කරන්නට යන්නේ නැහැ. මිළඟ අංකය ඉදිරිපත් කරන්නට මා දැන් අදහස් කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.
விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

පරිපූරක මුදල: විදුලි දෙපාර්තමේන්තුව (වාණිජ ව්‍යාපාරික කටයුතු): පාලන ගාස්තු

குறை நிரப்புத் தொகை: மின்சாரத் திணைக்களம் (வர்த்தக நடவடிக்கைகள்): நிர்வாகச் செலவுகள்

SUPPLEMENTARY SUPPLY: ELECTRICAL DEPARTMENT (COMMERCIALIZED ACTIVITIES): ADMINISTRATION CHARGES

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I move,

"That a supplementary sum not exceeding Rupees Six million (Rs. 6,000,000) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the services of the financial year beginning on October 1, 1968, and ending on September 30, 1969, and that the said sum only be expended as specified in the Schedule hereto:

Schedule

	Rs.
Head 63—Electrical Department Commercialised Activities).	
Vote No. 2—Administration Charges—Recurrent Expenditure ..	6,000,000."

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது
Question proposed.

අ. භා. 2.58

ඇස්. බී. යාලෙගම මයා. (රත්තොට)
(திரு. எஸ். பி. யாலேகம—றத்தோட்டை)
(Mr. S. B. Yalegama—Rattota)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාසල්රීහි ජලාධාර ප්‍රදේශයේ පසුගිය නියං කාලයෙහිදී වැය කරන්නට සිදු වුණු අතිරේක මුදල් ගැන මෙම පරිපූරක ඇස්තමේන්තුව යටතේ පෙනෙන විස්තරවල සඳහන් වෙනවා. ඒ ගැන වචනයක් දෙකක් කතා කරන්නට මා කැමතියි.

පරිපූරක මුදල්

කාසල්රී විදුලි බල මධ්‍යස්ථානය පිළිබඳව පවතින තත්ත්වය අප විසින් සොයා බැලිය යුතුයි. එම මධ්‍යස්ථානයෙන් විදුලිය සපයන කොළඹ වැනි ප්‍රදේශවලට පසුගිය කාලයේදී විදුලි බලය යම් ප්‍රමාණයකින් කපා හරින්නට සිදු වුණා. නියඟය නිසයි එම තත්ත්වය ඇති වුණේ. මෙතරම් විශාල මුදලක් වැය කර ආරම්භ කරන්නට යෙදුණු මෙම විදුලි බල මධ්‍යස්ථානයෙන් අප බලාපොරොත්තු වුණු සේවය ඉටු වී තිබෙනවාද යන්න ගැන අප විකක් සිතා බැලිය යුතුයි. මාස කිපයක් ඉඩෝරය පැවතුණු නිසා විදුලි බලය කපා හරින්නට සිදු වුණා. නියම සැලැස්මක් ඇතිව එම විදුලි බල මධ්‍යස්ථානය ඇති නොකිරීම නිසයි, ඒ අන්දමට නියඟ කාලයේදී විදුලි බලය කපා හැරීමට සිදු වුණේ. විශාල මුදලක් වැය කර, විශාල වෙහෙසක් දරා ඒ විධියේ ක්‍රමයක් ඇති කරන විට කොයි තරම් නියඟයක් ඇති වුණත් ඒ නියඟයට ඔරොත්තු දෙන අන්දමට ජලය රැස්කර තබා ගැනීමට පුළුවන් වන අන්දමට කටයුතු කරන්න ඕනෑ. ඒ කාලයේදී විදුලි බලය කපා හැරීම නිසා රජයේ කාර්යාලවල වැඩ ප්‍රමාද වුණා; කාර්මික වැඩ අත්හිටවන්නට සිදු වුණා. ඒ නිසා මේ රටට නිරපරාදේ ලක්ෂ සංඛ්‍යාත මුදලක් පාඩු වුණා. කාර්මිකයන්, ඉංජිනේරුවන් හරියට කල්පනා කර නියම සැලැස්මක් ඇතිව ඒ කටයුත්ත කළා නම් එවැනි පාඩුවක් සිදු වන්නේ නැහැ. ගරු විදුලි බල ඇමතිතුමා මේ ගැන සොයා බලන්නට ඕනෑ. කාසල්රී විදුලි බල මධ්‍යස්ථානය හරියාකාර සකස් කර තිබෙනවාද, එසේ නැත්නම් ඊට හේතු මොනවාද කියා ඇමතිතුමා සොයා බලන්නට ඕනෑ. සති කීපයක ඉඩෝරයක් නිසා විදුලි බලය කපා හැරීමට සිදු වුණා නම් ඒ වැඩ පිළිවෙළේ මොකක් හෝ වැරැද්දක් තියෙන්නට ඕනෑ. ඒ ස්ථානයේ සැලැස්ම ඉදිරිපත් කළ කාර්මිකයන් ඉදිරිපත් කර තිබෙන්නේ කොයි විධියේ සැලැස්මක්ද යන්න සොයා බලන අතරම මින් ඉදිරියට එවැනි පියවරවල් ගැනීමේදී පරෙස්සම් වන්න ඕනෑ. අවශ්‍ය විදුලි බලය නිපදවීමට වුවමනා කරන ජලය රැස්කර තබා ගන්නට පුළුවන්කම තිබෙනවාද කියා සොයා බලන්නට ඕනෑ. කොයි තරම් නියඟයක් ඇතිවුණත් ඒ නියඟයට ඔරොත්තු දෙන පිළිවෙළට ජලය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[යාලෙගම මයා.]

රැස්කර තැබීමට පහසුකම් ඇති කරන්න ඕනෑ. අතරමග කඩා වැටෙන හැටියට මෙවැනි ව්‍යාපාර ඇති කිරීමෙන් රටට සිදු වන්නේ විශාල හානියක්. කාර්යාලවල වැඩ හරියාකාර කිරීමට නොහැකි වීම නිසාත්, නොයෙකුත් කර්මාන්ත ශාලාවල වැඩ ඇනහිටීම නිසාත් රටට විශාල පාඩුවක් සිදු වුණා. අනාගතයේදී මෙවැනි දේ සිදු නොවන අන්දමට පියවර ගන්නා ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අවුරුදු 2 කට පමණ ප්‍රථම ගම් 500 කට විදුලි බලය සැපයීමේ යෝජනා ක්‍රමය යටතේ අපේ කොට්ඨාශවල විදුලි බලය සැපයිය යුතු ගම් මොනවාද කියා අපෙන් ලැයිස්තුවක් ඉල්ලා තිබුණා. අපි ඒ අනුව ලේඛනයක් සකස් කර යැව්වා. මගේ ආසනයේ ගම්කාර්ය සභා 6 කුත් එක සුළු නගර සභාවකුත් තිබෙනවා. රත්තොට සුළු නගර සභාවටත් මගේ ආසනයේ තිබෙන මාතලේ කොහොන්සිය පත්තු ගම්කාර්ය සභාව, මාතලේ මැදසිය පත්තු ගම්කාර්ය සභාව, මාතලේ උඩසිය පත්තු (උතුර) ගම්කාර්ය සභාව, මාතලේ උඩසිය පත්තු ගම්කාර්ය සභාව, මාතලේ පල්ලේසිය පත්තු ගම්කාර්ය සභාව, මාතලේ පල්ලේසිය පත්තු (නැගෙනහිර) ගම්කාර්ය සභාව යන ගම්කාර්ය සභා 6 ටත් විදුලි බලය සපයා දෙන ලෙස මා ගරු පළාත් පාලන ඇමතිතුමාට යෝජනාවක් ඉදිරිපත් කළා. ඒ අනුව පළාත් පාලන ඇමතිතුමා මාතලේ පළාත් පාලන සහකාර කොමසාරිස්තුමාට නියෝග කර තිබුණා, මේ කාරණයට, වැඩ ලේඛනයේ ප්‍රමුඛත්වය දී වහාම ඒ ගැන ක්‍රියා කරන්නය කියා. ඒ සම්බන්ධයෙන් ගම්කාර්ය සභාවලින් සහ රත්තොට සුළු නගර සභාවෙන් විමසා තිබුණු විස්තරවලට ඒ ආයතනය මගින් පිළිතුරු සැපයුවා පමණක් නොව ඉල්ලා තිබුණු ඇප මුදල් පවා සෑම ආයතනයක් මගින්ම දෙපාර්තමේන්තුවේ තැන්පත් කළා. එහෙත් අද වන තුරුත් මෙය ක්‍රියාත්මක වී නැහැ. ප්‍රමුඛත්වය දෙන ලෙස ඇමතිතුමා නියෝග කළත්, පළාත් පාලන ආයතන ක්‍රියාකාරී වී ඇප මුදල් පවා බැඳ තිබුණත්, ඉන් එහාට මේ කටයුත්ත ගෙන ගොස් නැති බව කියන්නට ඕනෑ.

රත්තොට නගරයට විදුලි බලය සැපයීම සඳහා විදුලි මාර්ගයක් ඇදගෙන ගිහින් අතරමගදී එය නතර කර දමා තිබෙනවා. කැලෑ කපාගෙන භාගයක් දුර ඇදගෙන ගිය ඒ විදුලි මාර්ගයේ කටයුතු හදිසියේ නතර කර දමා තිබෙනවා. අද රත්තොට නගරයට විදුලි බලය සැපයීමට තිබෙන්නේ ඉතා පරණ විදුලිබල ජනක යන්ත්‍රයක්. එය අවුරුදු 50 ක්, 60 ක් පරණ එකක්. ඒකට වුවමනා කරන අමතර කොටස් ලංකාවේ නැහැ. හදිසියේ එය නැවතුණොත් දවස් ගණනක්, මාස ගණනක් විදුලි බලය නැතිව යනවා. එසින් ආරෝග්‍ය ශාලාවේ කටයුතුවලට විශාල බාධා ඇති වෙනවා. නගරයේ අනෙකුත් ආයතනවලටත් නොයෙක් කරදර ඇති වෙනවා. ඒ වගේම පාරිභෝගිකයන්ටත් නොයෙක් අවහිරකම් ඇති වෙනවා. ඒ නිසා කැලෑ එළි කරමින් බාගයක් දුරට ඇදගෙන ගිය මේ විදුලි මාර්ගයේ කටයුතු හදිසියේ නතර කර දමන්නට යෙදුණේ මන්ද කියා සොයා බලන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

මා කලින් නම් සඳහන් කළ ගම්කාර්ය සභා හයේ සෑම ස්ථානයකටම; ගෙයක් පාසා විදුලි බලය සපයා දෙන්නට යයි මා ඉල්ලා සිටියේ නැහැ. පළමුවෙනි පියවර හැටියට ගම්කාර්ය සභා ප්‍රදේශයේ මාර්ගවලටත්, මාර්ග අසිනේ තිබෙන නිවාසවලටත්, සුළු නගරවලටත් ප්‍රසිද්ධ ස්ථානවලටත් විදුලි බලය සපයා දුන්නාම ඇති. පළාත් පාලන ආයතන මේ කටයුත්ත සම්බන්ධයෙන් ක්‍රියාකාරී වෙලා අඩුශ්‍ය සංඛ්‍යා ලේඛන ආදිය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළා. මා කලින් සඳහන් කළ අන්දමට අවශ්‍ය ඇප මුදල් පවා විදුලි දෙපාර්තමේන්තුවේ තැන්පත් කර තිබෙද්දී අට මාසයක්, අවුරුද්දක් තරම ගත වන තුරු තවමත් ඒ වැඩ පිළිවෙල ක්‍රියාත්මක නොවූ බව මා කියන්නට ඕනෑ. මේ කාරණා කීපය ගැන ඇමතිතුමාගේ අවධානය යොමු කර මේවා ක්‍රියාත්මක කිරීම සඳහා හැකි තරම් ඉක්මණින් පියවර ගන්නවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 3.08

කේ. වයි. එම්. විජේරත්න බණ්ඩා මයා.
(සොරනාතොට)
(திரு. கே. வை. எம். விஜேரத்ன பண்டா—சொரணதோட்டை)
(Mr. K. Y. M. Wijeratna Banda—Soranatota)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විදුලි බලය පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේදී කරුණු කිහිපයක් පිළිබඳව ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නට මාත් අදහස් කරනවා. ඇමතිතුමා එළියට යන්න වගේ හදන නිසා මේවා එතුමාට ඇහේදැයි මා දන්නේ නැහැ.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி. சில்வா)
(The Hon. C. P. de Silva)
පොඩි වැඩකට යන්නෙ: ඉක්මණින් එනවා.

විජේරත්න බණ්ඩා මයා.
(திரு. விஜேரத்ன பண்டா)
(Mr. Wijeratne Banda)
පොඩි වැඩක්නම් කමක් නැහැ. ලොකු වැඩක් නම් අපට බාධාවක් වෙන්නට පුළුවනි. කොයිහැටි වුණත් එතුමාගේ ආසනයට ලක්ෂයක් ඉස්සරවෙලා වෙන් කරගෙන දෙවනුව අපටත් ටිකක් බෙදා හරින්නට එතුමාගේ කල්පනාව යොමු වී, ගම්වල දියුණුවට මුදල් ටිකක් වෙන් කරන්නට ලැහැස්ති වන මේ අවස්ථාවේදී, ගම්වල විදුලි යෝජනා ක්‍රමය අද සැහෙන ප්‍රමාණයකට අඩපණ වී තිබෙන බව ඉතා කණගාටුවෙන් මතක් කරන්නට ඕනෑ.

මා නියෝජනය කරන මැතිවරණ කොට්ඨාශයේ ගම් හතකට විදුලි බලය ලබා දීම සඳහා කණු සිටුවා වැඩ කටයුතු සූදානම් කරගෙන ගිය බව මා දන්නවා. කණු වලින් විදුලි බලය ලැබෙනවාදැයි අපේ ප්‍රදේශයේ හුඟදෙනෙක් අපෙන් ප්‍රශ්න කරනවා. පසුගිය දවසක ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා නියෝජනය කරන මහියංගන මැතිවරණ කොට්ඨාශයටත් විදුලි බලය ලබා දුන්නා මට මතකයි. ඒ සම්බන්ධයෙන් විවෘත කිරීමේ උත්සවය කුත් පැවැත්වුවා. සොරණාතොට ආසනය පසු කරගෙනයි, මහියංගනයට යන්නට තිබෙන්නේ. සොරණාතොට ප්‍රදේශයටත් විදුලි බලය වුවමනා කරනවා. මහියංගනයටත් විදුලි බලය වුවමනා කරනවා. ඒ නිසා, මහියංගනයට විදුලි බලය සැපයීම ගැන අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. අප විරුද්ධත්වය පළ කර සිටින්නේ අපේ ප්‍රදේශවලට විදුලි බලය ලබා නොදීම ගැනයි. අපට නිකම් කණු සිටුවීමෙන් පමණක් සෑහීමකට පත් වන්නට බැහැ. අයවැය ලේඛනය විවාදයට භාජන වූ අවස්ථාවේදීත් මා මේ ගැන ගරු ඇමතිතුමාට මතක් කර සිටියා. ගරු ඇමතිතුමාට ඒ අවස්ථාවේ කිව්වට පමණක් එය මතක් වෙන්නේ නැතිවා වෙන්නට පුළුවනි. ඒ නිසා අද නැවතත් ඒ ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නට විශේෂයෙන් මා අදහස් කරන්නේ විදුලි බලය සැපයීමේ කාර්යය භාරව කටයුතු කරන නිලධාරීන්ගෙන් පිරිසක් අද මේ ගරු සභාව අසල කුටියේ සිටිනු දකින්නට ලැබීම නිසයි. ඒ නිසා මා නැවතත් කියා සිටින මේ කාරණය ගැන පරීක්ෂා කර බලන හැටියට මා උදක්ම ඉල්ලා සිටිනවා. අප විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් වශයෙන් මෙහි අසුන් ගෙන සිටින නිසා අපේ ප්‍රදේශ ගැන ඒ තරම් සැලකිල්ලක් නොදක්වනවාදැයි මා දන්නේ නැහැ. ඒ නිසාම අපේ ප්‍රදේශවලට කණු සිටුවා පමණක් අප රවටන්නට හදනවායයි හිතන්නට අමාරුයි. එහෙත් අපට ලැබී තිබෙන්නේ නම් තවමත් ඒ කණු ටික පමණයි. කන්දේ ගෙදර, උඩුව, බෝගහ මඩිත්ත, හොරේතුඩුව, කැටවල ආදී ගම්වල දැනටමත් කණු සිටුවා තිබෙනවා. කණු සිටුවා තිබෙන තවත් තැන් ගණනාවක්ම තිබෙනවා. එහෙත් කණුවලින් පමණක් නම් වැඩක් වන්නේ නැහැ.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி. சில்வா)
(The Hon. C. P. de Silva)
සමහර තැන්වල කණුත් නැහැ.

විජේරත්න බණ්ඩා මයා.
(திரு. விஜேரத்ன பண்டா)
(Mr. Wijeratne Banda)
ගරු ඇමතිතුමාට නම් ඔය කොයි දෙය කින්වත් අඩුවක් නැහැ. එතුමා නියෝජනය කරන මින්නේරිය මැතිවරණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජේරත්න බණ්ඩා මයා.]

කොට්ඨාශයට නම් ළඟදීම කණු වැටෙයි. නිකම්ම කණු නොවෙයි, කොන්ක්‍රීට් කණු ම ඒ ප්‍රදේශයට නම් වැටෙයි. ඒ ගැන කිසිම සැකයක් නැහැ. ඒ නිසා ගරු ඇමතිතුමාට නම් ඒ වාසියින් අඩුවක් නැහැ. ඇයි ඉතින් මින්නේරියට අද ලක්ෂයක්ම සම්මත කරවා ගන්නවා නොවැ.

කන්දේගෙදර අවට ඇති වතුවලට නම් විදුලි බලය ලැබී තිබෙනවා. එහෙත් ගම් වලට විදුලි බලය ලැබී නැහැ. අපට විදුලිය ලැබෙන පාටවත්, දැන් පෙනෙන්නට නැහැ. අපට විදුලි කොටනවා පමණයි. මෙතැනදී මේවා ගැන කියන හැම අවස්ථාවකදීම වාගේ ගරු ඇමතිතුමා මොකක් හරි විහිළුවක් කියලා නිකම් ඉන්නවා මිසක් අපේ ඉල්ලීම්වලට ඇහුම්කන් දී අපට විදුලි බලය දෙන්නේ නැහැ. ඒ නිසා අපට නිතර නිතර මේවා මතක් කරන්නට සිදු වෙනවා. අපේ ඕනෑකම් හරියාකාර ඉෂ්ට කර දෙනවා නම් මේ තරම් කාලය මිඩංගු කරන්නට වුවමනාවකුත් නැහැ. මේ විධියට පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළාම කාලය නාස්ති කරන්නට කිසිම වුවමනාවක් ඇති වන්නේ නැහැ. අප ඉල්ලන දේ කලට වේලාවට අපට දෙනවා නම්. ඒවා නොලැබෙන නිසා බොහෝ වේලාවක් කථා කරන්නට සිදු වෙනවා. එය කනගාටුදායකයි. කණු සිටුවූ තැන්වලට විදුලි බලය දුන්නා නම් නැවත නැවතත් ඒ ගැන කියන්නට සිදු වන්නේ නැහැ. අපේ අවශ්‍යතාවන් අපට නොලැබෙන විට අපේ ප්‍රදේශවාසීන් අපෙන් අහන්නේ, ජාතික ආණ්ඩුවට මේවා ඉදිරිපත් කෙළේ නැද්ද යන ප්‍රශ්නයයි. අප මේවා රජයට ඉදිරිපත් කරන්නේ නැති නිසා රජය ඒවා නොදෙන බවයි සාමාන්‍ය ජනයා විශ්වාස කරන්නේ. ජනතාව මේවාට චෝදනා කරන්නේ අපටයි. ඒ නිසා හැකි හැම අවස්ථාවකම අපේ ප්‍රදේශවල අඩු ලුහුඬුකම් ගැන ගරු ඇමතිතුමාට කරුණු ඉදිරිපත් කරන්නට අපට සිදු වෙනවා. දීර්ඝ විශයෙන් මේ ගැන කථා කරන්නට වුවමනා කරන්නේ නැහැ. කාලය මිඩංගු වන නිසා මා ලුහඬින් සඳහන් කළ කරුණු ගරු ඇමතිතුමාගේ සැලකිල්ලට භාජන කරනු ඇතැයි අපේක්ෂා කරන බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

අ. භා. 3.12

කාරියවසම් මයා.
(திரு. காரியவசம்)
(Mr. Kariyawasam)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගිංගඟ යෝජනා ක්‍රමය ගැන ගරු ඇමතිතුමා සඳහන් කළ නිසා බොහොම සන්තෝෂයෙනුයි මා මේ අවස්ථාවේ කතා කරන්නේ. ගිංගඟ යෝජනා ක්‍රමය යටතේ විදුලි බලය නිපදවන්නට කටයුතු සලස්සනවායයි කීම නිසා මා බොහොම සන්තෝෂ වෙනවා. කලින් විශේෂඥයන් යෝජනා කර තිබුණේ විදුලි බලය නිපදවන්නට ජලාශ සෑදීමේ වැඩ පිළිවෙළක් නිසා ගරු ඇමතිතුමාගේ මේ ප්‍රකාශය අපේ ප්‍රීතියට හේතු වෙනවා. පසුගිය කාලයේ යෝජනා ක්‍රම දෙකක් තිබුණා. එකක්, දෙපැත්තේ වේලි බැඳ ගංවතුර බස්සන්නයි. ඒ ක්‍රමය ක්‍රියාත්මක කරන්නට කල්පනා කර තිබුණා. හිනිදුම ගරු මන්ත්‍රීතුමාත් ඒ ගැන සඳහන් කළා. ගඟ බඩ පත්තුව, වැල්ලබඩ පත්තුව, ගාලු කඩවත් සතර යන ප්‍රදේශවල ජනයාත්, බෙන්තර වලල්ලාවිටි කෝරළයේ ඉහළ කොටසෙහි ජනයාත් ලොකු බියකින් සිටියා මේ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කළොත් විශාල ප්‍රදේශයක් ජලයෙන් යට වී විනාශ වී යන නිසා ගරු ඇමතිතුමා කළ ප්‍රකාශය නිසා දැන් ඒ බිය පහව ගියා. ඒ ප්‍රකාශය කිරීම ගැන ගරු ඇමතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා. විශේෂඥ උපදෙස් අනුව ක්‍රියා කරනවා නම් ගරු ඇමතිතුමාට දකුණු පළාතට පමණක් නොව තවත් විශාල ප්‍රදේශයකට වුවත් විදුලි බලය සපයන්නට හැකියාවක් ලැබෙනවා ඇති.

ඊළඟට ගම් පන්සියයයේ යෝජනා ක්‍රමය ගැනත් වචනයක් කථා කරන්නට ඕනෑ. මැතිවරණ කොට්ඨාශයක ගම් හතකට විදුලි බලය දෙන්නට යෝජනා කර තිබෙනවා. එහෙත් සමහර මැතිවරණ කොට්ඨාශවල ලැබුණේ පහකට පමණයයි ආණ්ඩු පක්ෂයේ ඇතැම් ගරු මන්ත්‍රීවරුන් කියනවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මට අහන්නට ලැබුණා. මා නියෝජනය කරන කොට්ඨාශයේ ගම් 120 ක් තිබෙනවා. ග්‍රාම සේවකවරුන් 60 ක් පමණ සිටිනවා. ඡන්දදායකයින් හැට දහස් ගණනක් සිටිනවා. ලක්ෂ $1\frac{1}{2}$ කට වැඩි ජන ගහණයක් සිටිනවා. මේ කොට්ඨාශයේ ගම් දෙකකට ග්‍රාමීය විදුලි බල යෝජනා ක්‍රමය යටතේ විදුලිය සැපයීමට සුදුසුයි කියා ලියා එවා තිබුණා. ඒ බව කියා එවා තිබුණේ මෙයට අවුරුදු 3 කට පමණ කලි නුයි. ඒ කියන්නේ අතුරු මැතිවරණය අවසාන වූ හැටියේම වාගේ. එසේ කියා එවීම ගැන බොහොම සන්තෝෂ වෙනවා. එහෙත් තවමත් එය ක්‍රියාත්මක වී නැහැ. ඒ ගම් දෙක අම්පෙගම හා හබුරුගලයි.

මට කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමා කීවාක්මෙන් එයින් එක ගමක නම් කනු කීපයක් සිටුවා තිබෙනවා. මෙය මෙතෙක් පමා වන්නේ ඇයි කියා අහන්නට කැමතියි. එසේ අසන්නට හේතුව මෙයයි; බෙන්තර-ඇල්පිටිය කොට්ඨාශයේ පසුගිය අතුරු මැතිවරණය සමයේදී කිසිම ඉල්ලීමක් නැතිව ඒ කොට්ඨාශයට යාබද නගරයක් වන කුරුඳුගහ හැතැප්ම නගරයට විදුලි බලය දුන්නා. ගරු ඇමතිතුමා ගොස් විවෘත කළේ. ඒ ප්‍රදේශයේ ගම් සභාපතිවරයා නඩුවකුත් දැම්මා අවසර නැතිව විදුලිය දැම්මා කියා. ඒ තරම් ඕනෑ කමකින් ඉල්ලන්නේ නැති ප්‍රදේශවලටත් විදුලි බලය දෙනවා නම් ඉල්ලන ප්‍රදේශවලට නොදෙන්නේ ඇයි? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලි කොටන කොට ඇස් අන්ධ වෙනවා. ඒ විධියට පසුගිය අතුරු මැතිවරණය කාලයේදී විදුලි බලය දී බෙන්තර-ඇල්පිටිය ඡන්දදායකයින්ගේ ඇස් අන්ධ කරන්න හැදුවත් එය හරිගියේ නැහැ. ඒ ප්‍රදේශයේ අයගේ ඇස් හොඳයි. හොඳට සිහි කල්පනාව තිබෙනවා. ප්‍රතිඵලවලින් එය පෙනුණා. විශේෂයෙන්ම ඕමත්ත කියන ප්‍රදේශයට අපි විදුලි බලය ඉල්ලුවා. ඊට පසුව ඒ ගැන පරීක්ෂා කරන්නට නිලධාරියෙකුත් ගියා. ඔහු රපෝර්තු කර තිබෙනවා විදුලිය පරිභෝගයට ගැනීම සඳහා මිනිසුන් එහි නැත කියා. ඒ නිසා ඒ අදහස රජය අත්හැර දැම්මා. ඊට පසුව එහි ගම්සභාපතිවරයා මෙන්න මේ ගෙවල්වලට පරිභෝගය සඳහා විදුලිය ලබා ගන්නට බලා පොරොත්තු වෙනවා, මේ මේ කර්මාන්ත ශාලා විදුලිය ලබා ගැනීමට බලා පොරොත්තුව සිටිනවා, ඒ නිසා විදුලි බලය දෙන්නය කියා සිය ගණනකගේ අත්සන් ඇති ලිපියක් එව්වා. එහෙත් අර නිලධාරියාගේ වැරදි බොරු රපෝර්තුව පිළිගත්තා මිස ගරු ඇමතිතුමා හෝ අධ්‍යක්ෂතුමා ඒ ගැන සොයා බලා අවශ්‍යතාව අනුව කට යුතු කළේ නැහැ. මේ කාරණය ගැන සොයා බලා මෙවැනි බොරු කරන නිලධාරීන්ට දඬුවම් කරන හැටියට මා ඉල්ලා සිටිනවා. මෙවැනි නිලධාරීන් නිසයි රටේ දියුණුව කඩාකප්පල් වන්නේ. ඒ නිසා එවැනි නිලධාරීන්ට දඬුවම් දෙන ලෙස ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

අ. භා. 3.18

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ (අකුරැස්ස)

(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ—அக்குறஸ்ஸ)

(Dr. S. A. Wickremasinghe—Akuressa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඇමතිතුමා විදුලි බලය බෙදා හැරීමේදී කට යුතු කරන්නේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් නියෝජනය කරන ආසනවලට හා එක්සත් ජාතික පක්ෂයට බලය ඇති පළාත් පාලන ප්‍රදේශවලටත් විශේෂ සැලකිල්ලක් දක්වමින්ය කියා විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීන් තුළ හැඟීමක් ඇති වන ආකාරයට කටයුතු කිරීම ගැන මා පළමුවෙන්ම කණගාටු වෙනවා. නිදර්ශනයක් වශයෙන් කරුණක් කියන්නම්. මගේ ආසනයට තවම ග්‍රාමීය විදුලි බලය ආවේ නැහැ.

ගරු එම්. ඩී. බණ්ඩා (කෘෂිකර්ම හා ආහාර ඇමති)

(கௌரவ எம். டீ. பண்டா—விவசாய, உணவு அமைச்சர்)

(The Hon. M. D. Banda—Minister of Agriculture and Food)

මගේ ආසනයටත් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

වෙන්න පුළුවන්. එහෙත් කුරුණෑගලට තිබෙනවානේ. [බාධාකිරීමක්] අකුරැස්සේ සුළු නගර සභාව මෙය කියන්නට වී අවුරුදු 5 ක් පමණ වෙනවා. පළමුවෙන්ම කිව්වා විදුලි බලය උපදවන යන්ත්‍රයක් සවි කරන්නේ නැත අකුරැස්ස උඩින් ජල විදුලිය යන නිසා කියා. ඒ විදුලි කම්බි ගාල්ල මාතර දක්වා යනවා. එහෙත් අකුරැස්ස සුළු නගර සභාවට විදුලි බලය ලැබී නැහැ. සමහර ස්ථානවල, පළාත් පාලන ආයතන විදුලි බලය බෙදා හරිනවා. තවත් සමහර ස්ථානවල විදුලිබල දෙපාර්තමේන්තුවම විදුලි බලය බෙදා හරිනවා. අකුරැස්සට විදුලි බලය සැපයීම සමාගම් දෙකකට කොන්ත්‍රාත් දී තිබෙනවා. ඒ කොන්ත්‍රාත්තු යෝජනා කර තිබෙන්නේ විදුලි බල දෙපාර්තමේන්තුව මගිනුයි. ඒ කොම්පැනි දෙක තෝරා ගනු ලැබ තිබෙන්නේ සුළු නගර සභාව මගින් නොවෙයි. විදුලි බල දෙපාර්තමේන්තුව මගින් නම් කරන ලද ඒ කොම්පැනි දෙකට විදුලි බලය සැපයීමේ කොන්ත්‍රාත්තු භාර දුන්නත් අද වනතුරු ඒ සම්බන්ධයෙන් කිසිවක් කෙරී නැහැ. මේ කටයුත්ත සඳහා පළාත් පාලන අංශයෙන් මුදල් ණයට ගෙන දැන් අවුරුදු දෙකක් වෙනවා. මේ කටයුත්තේ ප්‍රමාදය ගැන මා විදුලි බල දෙපාර්තමේන්තුවට කීප වතාවක්ම මතක් කළා. එහෙත් එයින් ප්‍රයෝජනයක් වී නැහැ.

අකුරැස්සේ ආරෝග්‍යශාලාවට ජල පහසුකම් ඇති කළ යුතුව තිබෙනවා. නොම්මර දෙකක් පමණ ඇතින් ඇති ළිඳකින් වතුර පොම්ප කරන්නට සිදු වී තිබෙනවා. විදුලි බලය උපදවන විශේෂ යන්ත්‍රයක් සවි කොට විදුලි බලය ලබාගෙන වතුර පොම්ප කරන්නට ගියහොත් විශාල වියදමක් දරන්නට සිදු වෙනවා. ජල විදුලි බලය ඉක්මනින් ලැබෙනැයි බලාපොරොත්තු වුණු නිසා විශාල අමතර වියදමක් දරා විදුලි බලය උපදවන විශේෂ යන්ත්‍රයක් සවි කෙළේ නැහැ. නගර සභාවට විදුලි

පරිපූරක මුදල්

බලය ලැබී නැතත් ඒ ප්‍රදේශයේ පෞද්ගලික ස්ථානවලට විදුලි බලය ලැබී තිබෙනවා.

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)

විදුලි බලය සැපයීමට කොන්ත්‍රාත් දී තිබෙන සමාගම් දෙකේ නම් මොනවාද?

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

මට ඒවායෙ නම් මතක නැහැ. ඒවා සිංහල නම් නොවන නිසා මතක නැහැ.

ප්‍රදේශයේ තිබෙන පෞද්ගලික කර්මාන්ත ශාලාවකට විදුලි බලයදී තිබෙනවා. අවසානයේදී ආරෝග්‍යශාලාවට විදුලි බලය ලබා ගත්තේ ඒ කර්මාන්ත ශාලාවෙනුයි. සුළු නගර සභා සීමාව තුළ පිහිටි ආරෝග්‍යශාලාවට සුළු නගර සභාවෙන් විදුලි බලය ගන්නට බැහැ. මේක පුදුම තත්ත්වයක්. ඒ ප්‍රදේශයේ ආදායම් පාලක නිලධාරියකු ඉන්නවා. උන්නැහේට පෞද්ගලික කර්මාන්තශාලාවක් තිබෙනවා. ඒකට විදුලි බලය සපයා තිබෙනවා. අකුරැස්සේ සිට නොම්මර දෙකක් දුරින් කඩුකන්නේ පිහිටි ඒ කර්මාන්ත ශාලාවට ලක්ෂපාන විදුලි බලය සපයලා. මොනවාදෝ ලස්සන වේප් වගයක් හදන්නයි, ඒ කර්මාන්ත ශාලාව පිහිටුවා තිබෙන්නේ. ඒකට විදුලි බලය දී ඇතත් සුළු නගර සභාවට දී නැහැ. ඒ කර්මාන්තශාලාවෙන් ආරෝග්‍යශාලාවට විදුලි බලය ලබාගෙන දැන් මාස දෙකක් වෙනවා. ඒ ආරෝග්‍යශාලාවේ එක් පරණ කොටසකට තවම විදුලි කම්බි ඇද නැහැ. කම්බි ඇදීම විදුලිබල දෙපාර්තමේන්තුව විසින් කළ යුතුව තිබෙනවා. විදුලි බලය ලැබුණහොත් පාවිච්චි කළ හැකි වන අන්දමට ගොඩනැගිලි සාදන්නැයි බල කළ නිසා ඒ ආරෝග්‍යශාලාවේ කොටසක් ඒ විධියට සාදා තිබෙනවා. ගම්මුන් එකතු වී ළමා වාට්ටුවක් සාදා පරිත්‍යාග කළා. ඒකට විදුලි බලය තිබෙනවා. එහෙත් ප්‍රසූතිකාගාරයට විදුලි බලය නැහැ. මාතෘ වාට්ටුවට විදුලි බලය නැහැ. විදුලිබල දෙපාර්තමේන්තුව තවම ඒකට විදුලි කම්බි ඇද නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
නගර සභාවට දෙන්නේ "බල්ක් සප්ලයි" එකක්.

වෛද්‍යාචාර්‍ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)
තවම "ට්‍රාන්ස්ෆෝමර්" එකක්වත් නැතිව "සප්ලයි" දෙන්නේ කොහොමද?

අකුරැස්සේ සුළු නගර සභාවට විදුලි බලය නැහැ. හැබැයි, විදුලි කම්බි නම් ගාල්ල දක්වා යනවා.

සී. ආර්. බෙලිගම්මන මයා. (ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)
(திரு. சீ. ஆர். பெலிகம்மன—உள்நாட்டு விவகார அமைச்சரின் பாராளுமன்றக் காரிய தரிசி)
(Mr. C. R. Beligammana—Parliamentary Secretary to the Minister of Home Affairs)
සභාපති කවුද?

වෛද්‍යාචාර්‍ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)
යූ. එන්. පී. කාරයෙක්. නම සූරියාරච්චි. කලින් වතාවක මා සමඟ තරහ කළ ඩී. සී. වනිගසේකර මහත්මයාගේ මස්සිනා.

බෙලිගම්මන මයා.
(திரு. பெலிகம்மன)
(Mr. Beligammana)
මන්ත්‍රීතුමාගේ වැරැද්ද.

වෛද්‍යාචාර්‍ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)
සභාපතිතුමා නැන ඇහුවේ මොනවටද? මන්ත්‍රීතුමා මෙවැනි ළදරු තර්ක ඉදිරිපත් කිරීමෙන් මේ ගරු සභාවටත් නින්දා කරනවා.

පසුගිය දවස්වල පැවති වතුර හිඟය නිසා දිසාපතිතුමාගේ ප්‍රමුඛත්වයෙන් අතුරළිය වෙල් යායට වතුර පොම්ප කරන්නට

ලෑස්ති කළා. එසේ කළේ වතුර නැති වුණොත් අක්කර දහස් ගණනක කුඹුරු පාළු වන නිසයි. ඒ වෙල් යාය අසලින්ම විදුලි රැහැන් ඇද තිබුණත් වෙල් යායට වතුර පොම්ප කරන්නට සිදු වුණේ කලු තෙල්වලින් ක්‍රියා කරන යන්ත්‍රයක් මගිනුයි. කලුතෙල් පාවිච්චි කොට වතුර පොම්ප කළොත්, ඒ වියදම පියවා ගන්න වී නොවෙයි රත්රන් පැහුණත් බැරි තරම්. එම නිසා දිස්ත්‍රික් සම්බන්ධතා කමිටුවට මා යෝජනා කළා, ආහාර වගා ව්‍යාපාරය සාර්ථක කර ගැනීම සඳහා වතුර හිඟ කාලවල ගහෙන් වතුර පොම්ප කරන්නට සිදු වුණාම ඒ සඳහා විදුලි බල දෙපාර්තමේන්තුව සහයෝගය නොදෙනවා නම් කලු තෙල්වලින් ක්‍රියා කරන යන්ත්‍ර ඒ සඳහා උපයෝගි කර ගන්නට එපාය කියා. විදුලි බල දෙපාර්තමේන්තුවේ වැරදි වැඩවලට විරෝධය දැක්වීමක් වශයෙන් දිස්ත්‍රික් සම්බන්ධතා කමිටුව එකච්ඡන්දයෙන් මගේ යෝජනාව පිළිගත්තා. මා කියන්නේ ඔප්පු කරන්නට පුළුවන් කරුණුයි. විදුලි බල දෙපාර්තමේන්තුව තමුන්නාන්සේලාගේ ආඩාරකරුවන් කියන හැටියට වැඩ කරන බවක් පෙනෙන්නට තිබෙනවා. කථාවක් තිබෙනවා, එළදෙනකගෙන් කිරි ගන්නට වුවමනා නම් වස්සා ඔළුවෙන් අනින්න වුවමනාය කියා—

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)
බුරුල්ලට.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
කවුද බුරුල්ලට අනින්නේ?

වෛද්‍යාචාර්‍ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)
මම නිදර්ශනයක් පෙන්වන්නම්. ගම් පුළුල් කිරීමේ යෝජනා ක්‍රමය යටතේ මගේ කොට්ඨාශයේ ඉඹුල්ගොඩගේනෙන් ඉඩම් බෙදා දෙන්නට 1960 සිට උත්සාහ ගත්තා. වර්තමාන ඉඩම් ඇමතිතුමා අනෙක් පැත්තට යන්න කලින් මට දන්වා එවා තිබුණා, ඒ සඳහා ගැසට්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

නිවේදනයක් නිකුත් කළාය කියා. එහෙත් 1965 දී ආණ්ඩුව වෙනස් වීමත් සමගම, 1964 ප්‍රසිද්ධ කළ ගැසට් නිවේදනය අනුව අර ඉඩම බෙදීමත් නතර වුණා. 1969 ත් අවසාන වන්නට ලඟාවී ඇති නමුත් තවම ඉඩම් බෙදා දී නැහැ. අප කොයි තරම් උද්ඝෝෂණය කළත් සිදු වී නිබෙන්නේ මොකක්ද?

ඒ පළාතේ ප්‍රාදේශිය ආදායම් නිලධාරී යෙක් රජයේ වැඩ, තැපැල් හා විදුලි සංදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමාගේ පෞද්ගලික ලේකම් වුණා. ඉඩම් හිමි ධන පතියෙක් වශයෙන් ඔහු විරුද්ධයි, රජයට ඉඩම් පවරාගෙන මහජනයා අතර බෙදා දෙනවාට. ඔහු පෞද්ගලික ලේකම් වුණාට පසුව ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල දෙපාර්තමේන්තු සමග සම්බන්ධකම් ඇති කර ගත්තා. එවැනි පුද්ගලයන්ගේ බලපෑම නිසායි, 1964 දී ගැසට් කළ නිවේදනය අනුව ඉඩම් බෙදන්නට මෙතෙක් පුළුවන්කමක් නොලැබුණේ. ඉඩම් මැන බෙදා වෙන් කරන්නට ආණ්ඩුව රුපියල් දහ දාහකට වඩා වියදම් කර තිබෙනවා. එසේ විශාල මුදලක් වියදම්කර වෙන් කළ ඉඩම් පවා මහජනයාට නොබෙදා නතර කර තිබෙනවා. මා කලින් සඳහන් කළ පුද්ගලයා වැනි ප්‍රතිගාමීන් නිසා මෙවැනි දේවල් සිදුවී තිබෙන බව මා අවධාරණයෙන් ප්‍රකාශ කරනවා.

අකුරැස්ස ප්‍රදේශයට විදුලි බලය දුන්නොත් පළාතේ මන්ත්‍රීවරයාට විශේෂ වාසියක් වේය යන සැකය නිසාදෝ මෙතෙක් ඒ පළාතට විදුලි බලය ලබා දී නැහැ. පෞද්ගලික ෆැක්ටරියකින් ආරෝග්‍යශාලාවට යන්තම් විදුලි බලය ලබා ගන්නට පුළුවන් වුණා. මෙවැනි තත්ත්වයක් දිගටම පැවතීමට ඉඩ නොදී ගරු ඇමතිතුමා මගේ කොට්ඨාශයේත් හැකි පමණ ඉක්මණින් ග්‍රාමීය විදුලි බල යෝජනා ක්‍රමය ක්‍රියාවේ යොදන ලෙස මතක් කරනවා. විශාල වෙල් යායවල් අසලින් ගඟ ගලා බසින තැන් කීපයක්ම මගේ කොට්ඨාශයේ තිබෙන නිසා ග්‍රාමීය විදුලි බල යෝජනා ක්‍රමයක් විශේෂයෙන් එහි ක්‍රියාත්මක කළ යුතුයි. වැහි කාලවල දී එම වගාවල් සම්පූර්ණයෙන්ම වතුරෙන් යට වෙනවා. වැස්ස නැති කාලවලදී ආරෝහණ ක්‍රමයෙන් ඒවාට වතුර ටිකක් ලබා ගත්තොත් විශාල ප්‍රදේශයක් වගා කරන්නට පුළුවනි. ෆැක්ටරිවල තේ ඇඹරීමට විදුලි බලය දෙන නමුත් ගොවිතැන් කිරීම සඳහා එය ලබා දෙන්නේ නැහැ. වාරිමාර්ග දෙපාර්තමේන්තුවත් විදුලි බල දෙපාර්තමේන්තුවත් යන දෙකම මේ ඇමතිතුමා අතේ තිබුණත් මේ කටයුත්ත කෙරෙන්නේ නැහැ.

නිල්වළා ගඟ යෝජනා ක්‍රමය සඳහා ගරු ඇමතිතුමා මේ වාරයේදී වෙන් කර තිබෙන්නේ රු. 10 යි. එහෙත් වැලිගම ප්‍රදේශයේ රේල් ගේට්ටු දෙකක් මඟ හරවා පාරක් කැපීම සඳහා රු. 50 ලක්ෂයක් වෙන් කර තිබෙනවා. මෙය තමුන්නාන්සේට නින්දාවක් නොවේද? රටට අවනම්බුවක් නොවේද? නිල්වළා ගඟ සම්බන්ධයෙන් වූ ඇමෙරිකන් යෝජනා ක්‍රමය දැන් ක්‍රියාත්මක කරන්නට බැරි බව තමුන්නාන්සේ පිළිගන්නවා ඇති. නගරයේ මට්ටමටත් වඩා උසින් වතුර මට්ටම නගින්නේ වේලි බැඳ දිය බැස්සීමට යෝජනා කරන ලද ඒ විනාශදායක වැඩ පිළිවෙළ තමුන්නාන්සේ අනුමත නොකරන බව මේ සභාවට දන්වා තිබෙනවා. ඒ සංවර්ධන වැඩ පිළිවෙල සම්බන්ධයෙන් නියම විධියේ සැලැස්මක් ඇති කළහොත් නිල්වළා ගඟේ වැඩි වතුර ජලාශවල රඳවාගෙන එය හම්බන්තොට දිස්ත්‍රික්කයට හැරවීමට පුළුවන්කම තිබෙනවා.

මහවැලි ගඟ හැරවීමේ කටයුතු සම්බන්ධයෙන් නම් ගරු ඇමතිතුමා බොහොම පුරසාරම් කියනවා. එය ප්‍රශංසනීයයි. එය කරන්නට පුළුවන් බවත් ඇත්ත. පූංචි ගඟක් වුවත් නිල්වළා ගඟ සම්බන්ධයෙනුත් එවැනිම වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරන්නට පුළුවන්කම තිබෙනවා. එය වියලි කලාපයේ මායිමෙන් ගලා බසින නිසා ගඟේ තරමට එවැනි යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරන්නට පුළුවනි. ලංකා කාලයේදී දිය හැරවූ කිරමඇරේ කොටසක තවමත් වතුර ගලා බසිනවා. ඉංජිනේරු ක්‍රම අද මෙන් දියුණුව නොපැවති ඒ කාලයේදීත් එසේ කිරීමට පුළුවන් වුණා නම්, අද එය කොයිතරම් හොඳට ක්‍රියාත්මක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරන්නට පුළුවන්ද? මේ තරම් විශාල ලෙස ප්‍රයෝජනයට ගන්නට පුළුවන්කම තිබෙන දිය කඳක්, වේලි බැඳ මුහුදට බැස්සීමට ඇමෙරිකන් විශේෂඥයන් යෝජනා කරන්නේ අපේ වාරිමාර්ග ඇමතිවරයා මෝඩයෙකැයි ඔවුන් හිතන නිසාද?

මගේ කතාව අවසාන කරන්නට පෙර තව එක් කරුණක් මතක් කරන්නට තිබෙනවා. රාජ්‍ය ඇමතිතුමා කර තිබෙන ප්‍රකාශයක් නිසා ඊයේ පත්‍රයේ මගේ නමත් වැටී තිබෙනවා. මටත් මෑතදී අළුත් කාර් එකක් ලැබුණේ කොහොමද කියා රාජ්‍ය ඇමතිතුමා ප්‍රශ්න කර තිබෙනවා. ඒ කථාව සම්පූර්ණයෙන්ම වැරදියි. මට කාර් එකක් ලැබුණේ නැහැ. මගේ භාර්යාවට නම් ඇයගේ සහෝදරයාගෙන් කාර් එකක් ලැබුණා. ඒක මට ලැබුණාය කියන්නේ කොහොමද?

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

භාර්යාවයි තමුන්නාන්සේයි එකයි නොවැ.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

දෙදෙනකු එක් කෙනෙකු වන්නේ කොහොමද? මා වංචනික අන්දමට මේ රටට කාර් එකක් ගෙන්වූවාය යන හැඟීමක් දෙන්නට උත්සාහයක් කර තිබෙන බවයි මෙයින් පෙනෙන්නෙ. කාර් එකක් තෑගි දෙන්නට තත්ත්වයක් තිබෙන මගේ භාර්යාවගේ සහෝදරයකු—එංගලන්තයේ පුරවැසියකු—තමාගේ සහෝදරියට කාර් එකක් තෑගි කළාම ඒක මේ පාර්ලිමේන්තුවේදීත් මතු කරන්නට වුවමනාවක් තිබෙනවාද? ඒක මේ කාර් දුසිම් ගණනින් ගෙන්වන ලේක්හවුස් කාරයින් වැනි පල් හොරුන්ගේ ක්‍රියාවට සමාන කරන්නට පුළුවන්ද? එම නිසා හේතුවක් නැතිව කෙනෙකුට නින්දා කරන්නට තැත් කිරීම අපරාධයක් බව මා ප්‍රකාශ කරනවා.

අ. භා. 3.37

ආර්. එම්. අප්පුහාමි මයා. (බණ්ඩාරවෙල)
(திரு. ஆர். எம். அப்புஹாமி—பண்டாரவளை)
(Mr. R. M. Appuhamy—Bandarawela)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඇමතිතුමා රුපියල් 60,00,000 ක පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබෙනවා. ගම් පන්සියයකට විදුලි බලය සැපයීම සඳහා වෙන් කළ රුපියල් 66,22,250 ප්‍රමාණවත් නැති නිසා තවත් රුපියල් 14,55,000 ක් අමතර වශයෙන් ඉල්ලා සිටිනවා.

ග්‍රාමීය විදුලි බල යෝජනා ක්‍රම සම්බන්ධයෙන් මේ දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරිත්වය ඉතාම දුර්වල බව අපට පෙනෙනවා. මේ දෙපාර්තමේන්තුව ගමන් කරන්නේ ගොළු බෙලි ගමනින්. මේ ගම් පන්සියයේ වැඩ අවසාන කරන්නට අඩු වශයෙන් අවුරුදු පනහක්වත් ගත වෙන්නට පුළුවනි. ග්‍රාමීය විදුලිබල යෝජනා ක්‍රම ක්‍රියාත්මක වන්නේ ඒ තරම් හෙමින්. මගේ කොට්ඨාශයෙන් ආරම්භ වන හපුතලේ කොට්ඨාශයට අයත් එරෙ නවල ගමට විදුලි බලය සැපයීමේ ග්‍රාමීය යෝජනා ක්‍රමයක් තිබෙනවා. එහි වැඩ දැන් සම්පූර්ණයෙන් අවසානයි. නමුත් මේ දක්වා විදුලි බලය සපයා නැහැ. රජයේ වැඩ ඇමතිතුමාට පහසු දිනක, විවේක තිබෙන දිනෙක මේ යෝජනා ක්‍රමය විවෘත කරන තෙක් විදුලි බලය සපයන්නට එපාය කියා ගරු ඇමතිතුමා නියෝගයක් කර තිබෙනවාද කියා මා දන්නේ නැහැ. පාරිභෝගිකයින් විදුලි බලය බලාපොරොත්තුවෙන් නොඉවසිල්ලෙන් පසු වෙනවා. නමුත් රජයේ වැඩ භාර ඇමතිතුමාට පහසු දිනයක් එළඹෙන තෙක් විදුලි බලය සපයන්නට එපාය කියා ඉඩම් ඇමතිතුමා නියෝගයක් කර තිබෙනවාලු. රජයේ වැඩ ඇමතිතුමා නිතරම සැරිසරන්නේ බණ්ඩාරවෙල ප්‍රදේශයේයි. එම නිසා දිනයක් යොදා ගන්නට එතුමාට ඒ තරම් අමාරුවක් නැහැ. සම්භර විට නැකතක් බලනවාද දන්නෙත් නැහැ. ඒ කොයි හැටි වෙතත් තමුන්නාන්සේ රජයේ වැඩ ඇමතිතුමාට ඒක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අජිත් පුහාම් මයා.]

භාර දී තිබෙනවා නම් පුළුවන් තරම් ඉක්මණින් ඒක විවෘත කරන්නටය කියන්න.

ඒ සමගම මතක් කළයුතු තවත් කාරණයක් තිබෙනවා. වැන්කියුලන්බර්ග් සහ පොඩිඅජිත් පුහාමි කියන මහත්වරුන් දෙදෙනාට පමණක් එමගින් විදුලිය සපයා තිබෙනවා. රජයේ වැඩ ඇමතිතුමාට ප්‍රසිද්ධියක් දෙන්නට තිබෙන ඕනෑකම නිසා එතුමාට පහසු දිනයක් එළඹෙන තෙක් මේ යෝජනා ක්‍රමය විවෘත නොකර බලා ගෙන සිටිනවා නම් මේ දෙදෙනාට පමණක් විදුලිය සපයා තිබෙන්නේ මක් නිසාද? ඒ අන්දමට කටයුතු කරනවා නම් එහි කිසිම සාධාරණත්වයක් ඇත්තේ නැහැ. මෙම අරමුණ යටතේ ගම් පහක් පමණ තෝරා ගෙන තිබෙනවා. සොරනාතොට ගරු මන්ත්‍රීතුමා (විජේරත්න බණ්ඩා මයා.) කිව්වා වාගේ, ඒ ගම්වලින් එකක කණු සිටුවා වැඩ අවසන් කර තිබෙනවා. එය ක්‍රියාත්මක කරන්නට නැකතක් එන තුරු බලා සිටිනවාද කියන්නට දන්නේ නැහැ. එම ප්‍රදේශයේ ජනතාව විදුලි බලය ලබා ගැනීමේ ආසාවෙන් බලාගෙන සිටිනවා. ඒ ගමට කියන්නේ ලියංගහවෙලයි. ඒ ගමේ පාරිභෝගික යන්ට තවමත් විදුලි බලය ලබා දී නැති නිසා ඔවුන් බලවත් කනස්සල්ලෙන් පසු වෙනවා. කවුරුන් විසින් මෙය විවෘත කරනු ලැබුවත් අපට කමක් නැහැ. අපි අපේ සහයෝගය දෙන්නට නිතරම ලෑස්තියි. අපි එම උත්සවවලට සහභාගි වන්නට කැමතියි. එම නිසා අපේ පාරිභෝගිකයන්ගේ අවශ්‍යතාව ඉටු කිරීම සඳහා අප්‍රමාදව කටයුතු කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දියතලාවේ විදුලි ඉංජිනේරුතුමාගේ ක්‍රියාත්මක භාවයේ තිබෙන දුර්වලකම නිසා අපේ ප්‍රදේශයේ ගම්වලට විදුලිය සැපයීම දිනෙන් දින පමා වෙනවා. මේ ළඟදීත් මා එතුමාගෙන් ඒ ගැන විමසුවා. දෙවන ගමනට විදුලි බලය සැපයීම සඳහා තව මාස කීපයක් වුවමනා වන බව උන්නැහේ මට කිව්වා. අවශ්‍ය උපකරණ නැති බවත් කියනවා; පටන් ගෙන තිබෙන වැඩ අවසන් වී නොමැති බවත් කියනවා. අපේ ගම්බද ප්‍රදේශවල වෙසෙන ජනතාවට විදුලි බලය සපයා දීම අත්‍යවශ්‍ය දෙයක් බව කිව යුතුයි. එම වැදගත් සේවය ඉටු කිරීම සඳහා හැකි තරම් මහන්සි ගන්න ලෙස මා ඉල්ලා සිටිනවා. මා මුලින් සඳහන් කළා වැනි නියෝගයක් දියතලාවේ විදුලි ඉංජිනේරු තුමාට නැවත නිකුත් කරන හැටියට මතක් කරනවා.

ගම් ප්‍රදේශවලට විදුලි බලය සැපයීමේ අරමුණ යටතේ මගේ බණ්ඩාරවෙල කොට්ඨාශයත් තෝරා ගෙන තිබෙනවා. විශේෂයෙන් උඩපේරුව, උතුරු කැබිල්ලවෙල, දකුණු කැබිල්ලවෙල, කලමඩුගස් තැන්න, යනාදී ගම්වලට විදුලි බලය සපයා දෙන ලෙස මා මතක් කරනවා. කුඹල්වෙල කෝරළේ විදුලි බලය සැපයිය යුතු ගම් ගණනාවක්ම තිබෙනවා. තමුන්නාන්සේගේ දෙපාර්තමේන්තුවෙන් අප මේ ගැන නොයෙකුත් වතාවල ඉල්ලුම් කර තිබෙනවා. උඩකුඹල්වෙල, දෝව, හල්පෙ, දෙමෝදර, ඇල්ල, නාඋල වැනි ගම් බොහොම ඉක්මනින් දියුණුව කරා යන ගම් හැටියට සඳහන් කරන්නට පුළුවනි. පොඩි පොඩි කර්මාන්ත ඒ ගම්වල ආරම්භ කර තිබෙනවා. එසේ හෙයින් එම ගම්වාසීන්ට විශේෂයෙන්ම විදුලි බලය අවශ්‍යයි. එම නිසා ඒ ගම්වලට අවශ්‍ය කරන විදුලි බලය ඉක්මනින් සපයා දෙන ලෙස මා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා.

දුල්ගොල්ල ගමට විදුලි බලය සැපයීම සඳහා අවශ්‍ය කරන ට්‍රාන්ස්ෆෝමර් සවි කර තිබෙනවා. එහෙත් ඒ ගමට විදුලිය සැපයීම සඳහා මෙතෙක් ක්‍රියාත්මක වැඩ පිළිවෙළක් ආරම්භ කර නැහැ. මෙවැනි ප්‍රදේශවලට විදුලි බලය සැපයීම සඳහා ඉතා උනන්දුවෙන් ක්‍රියා කරන ලෙස මතක් කරනවා. මා කලින් කීවාක් මෙන්, නැවත වරක් අර විධියේ නියෝගයක් නිකුත් කොට තමුන්නාන්සේ එම ප්‍රදේශයේ අඩුපාඩු සපුරාලනු ඇතැයි විශ්වාස කරන බව සඳහන් කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 3.42

ගරු සී. පී. ද සිල්වා

(கௌரவ சீ. பீ. டி சில்வா)

(The Hon. C. P. de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ග්‍රාමීය විදුලි බලය සම්බන්ධයෙන් වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්නට මා අදහස් කරනවා. සෑම මන්ත්‍රීවරයෙකුගෙන්ම අපට අසන්නට ලැබුණා ඒ ඒ කොට්ඨාශ වල විදුලි බලය ලබා දෙන්නේ කුමන ආකාරයකින්ද යන වග. එම කටයුතු ගැන අපි පරීක්ෂා කර බැලුවා. දැනට තිබෙන තත්ත්වය අනුව දෙපාර්තමේන්තුව ගෙන තිබෙන තීරණය මෙයයි: යම් ප්‍රදේශයකට විදුලි බලය දෙනවා යයි සිතමු. එම ප්‍රදේශය සඳහා අවුරුද්දක් තුළ විකිණෙන විදුලි බලයෙහි වටිනාකම එම ප්‍රදේශයට විදුලි බලය සැපයීම සඳහා ගිය වියදමෙන් සියයට 12½ක් වත් වෙනවා නම්, අපි එවැනි ප්‍රදේශවලට විදුලි බලය සපයන්නට භාර ගන්නවා. යම් ප්‍රදේශයකට විදුලි බලය සපයීම සඳහා වැය වන මුළු මුදලත් එම ප්‍රදේශය වෙනුවෙන් අවුරුද්දකට වැය වන විදුලිය සඳහා ලැබෙන ආදායමත් ඒ ආකාරයට සසඳා බැලීමෙන් පසුවයි, අපි මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නේ.

එවැනි ගම් 510ක් දැන් ලබාගෙන තිබෙනවා. අවුරුදු 4කදී ඒ ගම් 510 පිළිබඳ කටයුතු අවසාන කරන්නට රජය බලාපොරොත්තු වෙනවා. එම අවුරුදු 4 න් පළමුවන අවුරුද්ද හැටියට 1969 හඳුන්වන්නට පුළුවනි. ඊළඟට 1970, 1971 සහ 1972 යන අවුරුදු 3 ගණන් ගන්නවා. දැන් ඒ ගම්වලින් 60ක වැඩ අවසාන කර තිබෙනවා. 200ක වැඩ කරගෙන යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එකක් කියන්නට කැමතියි. විදුලි බලය ලබාදීම සඳහා උපයෝගී කර ගන්න කණුව පමණයි මේ රටේ නිපදවන්නේ. වෙන එකක් තබා එම කණුව කළුපාට කරන්නේත් පිටරටින් ගෙන්වන ද්‍රව්‍ය වලිනුයි. කම්බි වැනි ද්‍රව්‍ය නිතරම ගෙන්වන්නට සිදු වී තිබෙන්නේ පිටරටිනුයි. එම බඩු හිඟය මෙවැනි කටයුතුවලදී හුඟක් දුරට බල පානවා. කැනඩාව, ඉන්දියාව, ප්‍රංශය සහ ජපන් රට වැනි රටවලින් අපට වුවමනා කරන බඩු අපි ගෙන්වනවා. මේ රටේ නිපදවන්නේ ඒ සඳහා ප්‍රයෝජන යට ගන්න කණුව පමණයි. කණු හිටෙව්වට කම්බි නැහැ. ලබන මැතිවරණයට කලින් ඒ කණුවලට කම්බි සවි කරන්නට පුළුවන් වෙයි. සිටවා තිබෙන සෑම කණුවලටම කම්බි අදියි. විදුලි බලයත් ලැබෙයි. විදුලි බල මධ්‍යස්ථාන ඇති කරන සැටි මා කිව්ව. මස්කෙළියේ සවි කර තිබෙන කිලොවොට් 90,000 මධ්‍යස්ථානය 1972 වනතෙක් ඇති. ඊට පස්සෙ අවශ්‍යතා සඳහා අප දැනටම ටෙන්ඩර් කැඳවා තිබෙනවා, මස්කෙළියේ දෙවැනි පියවර වශයෙන් කිලොවට් 75,000ක මධ්‍යස්ථානයක් සඳහා. මහවැලි ගඟේ පළමු වැනි පියවර වශයෙන් කිලොවට් 40,000 ක මධ්‍යස්ථානයක් සඳහාත් ටෙන්ඩර් කැඳවා තිබෙනවා. ඒක සවි වන්නේ රත්නොට ආසනයේ උකුවෙලයි. ඒ ස්ථානයේ වැඩ පටන් ගත්තම පළමුවෙන් ඒ ප්‍රදේශයට විදුලි බලය ලැබෙයි. අවුරුදු 4 කිනුයි, ගම් 500 යේ වැඩ කරන්න බලාපොරොත්තු වන්නේ. දැනට 60 ක වැඩ අවසන් කර තිබෙනවා. 200 ක වැඩ කරගෙන යනවා.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

விஞ்ஞ விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

පරිපූරක මුදල:
ගල්ඔය ව්‍යාපාරය සඳහා ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයට ආධාර

குறைநிரப்புத் தொகை: கல்லோயாத் திட்டத்துக்காக, ஆற்றுப் பள்ளத்தாக்கு அபிவிருத்திச் சபைக்குக் கொடை

SUPPLEMENTARY SUPPLY: GRANT TO RIVER VALLEYS DEVELOPMENT BOARD FOR GAL OYA PROJECT

ගරු සී. පී. ද සිල්වා

(கௌரவ சீ. பீ. டி சில்வா)

(The Hon. C. P. de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

1968 ඔක්තෝබර් 1 වැනිදායින් ආරම්භ වී 1969 සැප්තැම්බර් 30 වනදායින් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවය සඳහා ලංකාවේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ ලංකාණ්ඩුවේ වෙන කිසියම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු සී. පී. ද සිල්වා]

අරමුදලකින් හෝ මුදල් වලින් හෝ ලංකාණ්ඩුවට සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ලංකාණ්ඩුව විසින් ණය ලබා ගන්නා මුදලකින් හෝ රුපියල් සැත්තෑපන් ලක්ෂයකට (රුපියල් 75,00,000) නො වැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත පෙනෙන උප ලේඛනයේ නියමිත පරිදි වැය කළ යුතුය.

උපලේඛනය

ශීර්ෂය: 55—ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල අමාත්‍යාංශය	රු.
සම්මතයේ අංකය: 7—ආර්ථික සංවර්ධනය—මූලධන වියදම්	... 75,00,000 "

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැනට තිබෙන අය-වැය ලේඛනයෙන් ගල්ඔය සංවර්ධන ව්‍යාපාරය සඳහා රුපියල් ලක්ෂ 60ක් වෙන් කර තිබෙනවා. ගල්ඔය සංවර්ධන ව්‍යාපාරයේ වැඩ අවසාන කිරීම පිළිබඳව රපෝර්තුවක් ඉදිරිපත් කිරීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන් යුත් කොමිටියක් රජයෙන් පත් කර තිබෙනවා. එම කොමිටියේ රපෝර්තුව අනුව මේ අවුරුද්දට රුපියල් ලක්ෂ 75ක් වුවමනා වෙනවා. මේ වැඩ පිළිවෙල අවසාන වන්නේ තව අවුරුදු 3 කින්. 1971-72 වර්ෂයේදී වැඩ අවසාන වෙනවා. ඊට පසු ගල්ඔය මිටියාවතේ වැඩ දෙපාර්තමේන්තුවට භාර දී දෙපාර්තමේන්තුව මගින් කරගෙන යාමට සලස්වනවා.

ප්‍රශ්නය සභාගිමුඛ කරන ලදී.

விஷ எற்றுக்கொள்ளப்பட்டது.

Question proposed.

අ. භා. 3.48

ආර්. බී. රත්නමලල මයා. (කලාවැව)

(திரு. ஆர். பி. ரத்னமலல—கலாவெவ)

(Mr. R. B. Ratnamalala—Kalawewa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අතිරේක වැය ශීර්ෂය යටතේ වචන ස්වල්පයක් කථා කිරීමට මා බලාපොරොත්තු වෙනවා. අපේ ප්‍රදේශයට නම් විදුලි බලය තවම නැහැ. සියඹලාණ්ඩුව, කාගම, කටියාව, රාජාංගන, ලුණු වැව යන ව්‍යාපාර හැම එකක්ම තියෙන්නේ කලාවැව ආසනයේ බව ගරු ඇමතිතුමා දන්නවා. සියඹලාණ්ඩුව ව්‍යාපාරයේ කොටසක් කුරුණෑගල දිස්ත්‍රික්කයටත්, කොටසක් අනුරාධපුර දිස්ත්‍රික්කයටත් ඇතුළත් වෙනවා. නමුත් ඒ පිළිබඳ කටයුතු සියල්ලක්ම කරන්නේ කුරුණෑගල කච්චේරියෙන්. කලාවැව ප්‍රදේශයේ පදිංචි ගොවීන්ට නිවා සපහසුකම්වත් ගොවිතැන් පහසුකම්වත්, වාරිමාර්ග පහසුකම්වත් නැහැ. සියඹලාණ්ඩුව ගොවි ජනපදයේ අයටත් ඒ පහසුකම් නැහැ. අවුරුදු ගණනක් තිස්සේ ඒ ගැන කිව්වත්, ලිව්වත් කිසි වැඩක් සිදු වී නැහැ. දැන් ඒ ගොවීන් එම ව්‍යාපාරය අත්හැර දමා යන්නට සැරසී සිටිනවා. 1956 දී අක්කර දාහක පමණ ගොවිතැන් කිරීම සඳහා බළලු වැවේ සිට නැගම්පහ කෝරලය මැදින් කපන්නට පටන් ගත් ඇළ හැතැප්ම කාලක් පමණ කපා එහි වැඩ නැවැත්වීමෙන් පසු දැන් අවුරුදු ගණනක් තිස්සේ මිනින්දෝරුවන් ඇවිත් මනින නමුත් එහි වැඩ කටයුතු මෙතෙක් නැවත පටන් ගෙන නැහැ. ඒක බොරුවක් හැටියට ප්‍රදේශවාසීන් පිළිගෙන තිබෙනවා. බළලු වැව හොරොව්වේ සිට කපන ඇළ කපන්නේ කවදාද කියා මිනිසුන් මගෙන් ප්‍රශ්න කරනවා. මා කීප වතාවක් ගරු ඇමතිතුමාට ඒ ගැන මතක් කර තිබෙනවා. කපනවා යයි කියන නමුත් අද වනතුරු එහි වැඩ පටන් ගෙන නැහැ. ඒ ඇළ ලබන අවුරුද්දේවත් කපන්නට පටන් ගන්න හැටියට ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. 1956 තමුන්නාන්සේ ඉඩම් ඇමතිවරයා වශයෙන් කටයුතු කරන කාලයේදීයි මේ කටයුත්ත පටන් ගත්තේ. වලස්වැව දක්වා හැතැප්ම කාලක් විතර ඒ ඇළ කැපුවා. දැන් ඇළේ වැඩ නැවතී තිබෙනවා. අවුරුද්දෙන් අවුරුද්දට මිනින්දෝරුවන් විස්සක් විසිපහක් ඇවිත් මැන ගෙන යන නමුත්, වැඩක් කෙරෙන පාටක් නැහැ. ඒ නිසා ඒ ගැන සොයා බලන ලෙස නැවතත් මතක් කරනවා.

කාගම, කටියාව ප්‍රදේශයේ 1956න් එහා කළ වැඩක් මිස ඊට පසු කළ වැඩක් පෙනෙන්නට නැහැ. මේ යල් කන්නයේ කටියාව ජනපදයේ ගොවිතැන් කෙරෙන්නෙ නැහැ. ඇළවල් ශුද්ධ කරන්නය, ඇළවල් බඳින්නය කියනවා. එක තැනක දොපොළක පස් කට්ටි 20ක් 25ක් කපා දමා තිබෙනවා හැර, වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් නියම විධියට ඒ තිබෙන වැඩ කෙරී නැහැ. ඒ මිනිසුන්ට මේ කන්නයේ ගොවිතැන් නැහැ. 1968 අවුරුද්දේ කලාඔය පිටාර ගැලීමෙන් සෝදා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පාළු වී ගිය කුඹුරු විශාල මුදලක් වියදම් කර නැවත අස්වද්දා ගන්නට ඒ ගොවීන්ට සිදු වී තිබෙනවා. ඒ කරන වියදම් වෙනත් තැන්වලින් ඉඩම් ලබාගෙන දියුණු කර ගන්න පුළුවන් කියායි මා කල්පනා කරන්නේ. ඒ මිනිසුන්ට කිසිම වන්දි මුදලක් රජයෙන් ගෙවා නැහැ. ඒ වගේම වෙන ප්‍රදේශයකින් ඉඩම් දීලවත් නැහැ. මේවා කාටද කියන්නෙ? පුළුවන් තරම් කච්චේරියට කියා තිබෙනවා. නිලධාරී මහත්වරුන්ට කියා තිබෙනවා. ඒ කවුරුවත් ඇහුම්කන් නොදෙන බව කියන්නට ඕනෑ.

රාජාංගන ව්‍යාපාරයේ පදිංචි කරවීමට ඉඩම් කට්ටිකරුවන් තෝරා ගත්තා. කට්ටි කරුවන්ගෙන් කොටසක් ගිහින් එහි පදිංචි වුණා. ඒ වගේම අනවසරයෙන් දැන් අවුරුදු 5ක් 6ක් තිස්සේ ඒ බිම් කට්ටිවල පදිංචි වී සිටින කොටසකුත් ඉන්නවා. ඒ ඉඩම්, අර තෝරා ගත් කට්ටිකරුවන් සොයා ඒ උදවියට දෙන්නෙත් නැහැ. අනවසරයෙන් පදිංචිවී සිටින උදවියට දීමකුත් නැහැ. දවස ගානේ මිනිසුන් අඩදබර වේවී බලහත්කාරයෙන් ඒ ඉඩම් කට්ටිවල පදිංචිව සිටිනවා. ඒ මිනිසුන් ඒ ඉඩම් පුළුවන් තරම් හොඳට දියුණු කර තිබෙනවා. ඒ මිනිසුන් කට්ටිකරුවන් වශයෙන් තෝරාගෙන හෝ ඉඩම් පවරා දෙන්නෙ නැහැ. එක අවුරුද්දක දෙකක සිට නොව අවුරුදු කිහිපයක සිට මේ තත්ත්වය තිබෙනවා. ඇමතිතුමා මාසය කට දෙකකට වරක් රාජාංගන ජනපදයට යනවා. අපි කියන ඒවාවත්, තමුන්නාන්සේ කියන ඒවාවත්, කිසිම රාජකාරියක් නිලධාරීන්ගෙන් ඉටු වෙන්නෙ නැහැ.

ලුණුවැව ව්‍යාපාරය ගැන මම අයවැය විවාදයේ කාරකසභා අවස්ථාවේදීත් මතක් කළා. ඒ ව්‍යාපාරයට දැන් අවුරුදු 6 ක් ගත වී තිබෙනවා. ඒ ව්‍යාපාරය සඳහා යට වූ ඉඩම් වෙනුවෙන් ඒ ඉඩම් හිමියන්ට ඉඩම් දෙනවා තබා ඔවුන්ට උන්හිටි තැන් පවා නැතිව ගොස් තිබෙනවා. ඒ මිනිසුන්ට කන්නටවත් වන්දියක් වශයෙන් කිසිම මුදලක් ගෙවීවෙ නැහැ. ඉඩම් දුන්නෙත් නැහැ. මේවා කාට කියන්නද කියන එකයි මට නැවතත් මතක් කරන්නට තිබෙන්නේ. ඒ මිනිසුන්ට ගොඩින් අක්කර 2 බැගින් සහ මඩින් අක්කර 2 බැගින් දෙන්න කලින් යෝජනා කළා. ඒක දුන්නෙත් නැහැ. අවුරුදු 1½ කට විතර පසු අතිරේක ඉඩම් කොමසාරිස්තුමා දිසාපති කාර්යාලයට ගිහින් මාවත් එහි කැඳවලා රැස්වීමක් තබල ඒ උදවියට අක්කර 5 බැගින් බෙදා දෙන්නට තීරණය කළා. මා මේ ගැන දෙතුන් වතාවක්ම තමුන්නාන්සේට මතක් කළා. ඒ මිනිසුන් 22 වාරයක් ඇමතිතුමා හමුවුන්නට ඇවිත් මේ ගැන මතක් කර තිබෙනවා. අද වන තුරු ඉඩම් කච්චේරියක් තිබ්බෙවත් නැහැ. ලුණුවැව බැඳීමේදී නවගත්තේගම, දෙමටවැව ප්‍රදේශවල වැවට යටවුණු ඉඩම් වෙනුවෙන් ඉඩම් බෙදා දීම ප්‍රමාද කරන්නේ ඇයි කියා මා අහනවා. ලුණුවැව ව්‍යාපාරයේත් බලහත්කාරයෙන් මිනිසුන් පදිංචි වී සිටිනවා. ලුණුවැව බැඳීම ආරම්භ කරන විටම වගෙයි, මේ මිනිසුන් එහි ගොස් පදිංචි වුණේ. දැන් ඒ මිනිසුන් පන්නන්න බැහැ. ඒ මිනිසුන් දැන් පදිංචි වී අවුරුදු හතරක් පහක් වෙනවා. ඔවුන් සිටවූ පොල් දැන් පූදිනවා. ඒ ඉඩම් ඒ මිනිසුන්ටම දෙන්නට ඕනෑ. ඒ නිසා ගම්බදව කෙසේ වෙතත්, ජනපද ව්‍යාපාරවලින් දිනපතා තිබෙන කරදරය මගහැරවීම සඳහා තමුන්නාන්සේට අප හැමවිටම ඉදිරිපත් කරනවා. මේ අවුරුදු පහේදී කරලා තියෙන්නේ මොනවාද? ගමේ කතාවක් තියෙනවා. දෙවියන් වඳින්න ඉස්සර වෙලා නම් රෝගියා බත් කට කටවත් කෑවාය කියලා. ගරු ඇමතිතුමා ඔය පැත්තට ගියාට පස්සෙ ඒ ටිකත් නැති වෙලා ගියා නේද? ඉස්සර වෙලා තිබුණු ටිකවත් දැන් අපට ලැබෙන්නේ නැහැ.

යෝධ ඇලෙන් වතුර ලැබෙන වැව් 66 ක් තිබෙනවා. අනෙක් වැව් 42 කුත් තිබෙනවා. ඔය එකම වැවකවත් හොරොව්වක් නැහැ. ඉංගිරිසියෙන් ඒක කියනවා "ස්ලුස්" කියලා. හොරොව්වක්වත්, වාන්නක්වත්, මොකවත් නැහැ. කොයි තරම් අඩුපාඩුකම් තිබුණත් මේවා ගැන කියන්න කෙනෙක් නැහැ. කොයි පැත්තේ හිටියත් පට කමක් නැහැ. මා ගරු ඇමතිතුමාට කියන්නේ මට කර දෙන වැඩක් හැටියට සලකා මෙය කර දෙන්නට නොවෙයි. මේවා මහජනයා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රත්නමලල මයා.]

වෙනුවෙන් කොයි ආණ්ඩුවක් වුවත් කර දෙන්නට ඕනෑ වැඩ. ඒ නිසා කරුණාකර මේ ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරනවා නම් බොහොම හොඳයි.

දැන් විදුලි බලය සැපයීම ගැන කථා කළා. මේවා ගැන මේ හැටියට කථා කරන්නට අපට නියෝජ්‍ය කථානායකතුමාගේ අවසරය ලැබෙනවාද නැද්දැයි මට කියන්නට පුළුවන්කමක් නැහැ. සමහර විට ලැබෙන්නෙ නැතිවා වෙන්න ඇති. කැකිරාවේ සිට මහ ඉලුප්පලම පර්යේෂණාගාරය දක්වාත්, රාජාංගණය දක්වාත් විදුලි බලය ලබා දෙන්නට ගරු ඇමතිතුමා බලාපොරොත්තු වෙනවා වෙන්නට ඇති. එහෙම නම්, කරුණාකර එප්පාවල හරහා ලබා දෙන්නට ක්‍රියා කරන්නැයි මා මතක් කර සිටිනවා. රාජාංගනයත් දැන් හරියට කොළඹ වාගේ තමයි. ඒ වුණත් දියුණු වක් නැහැ. ජනගහනය නම් ඉන්නවා. ඕනෑ තරම්. ඒ නිසා ජනපද ව්‍යාපාරය ගැනත් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

ගම්බද වැව් දැන් එන්ට එන්ටම ජරා වාස වේගන එනවා. ඒවා වැඩි වැඩියෙන් කඩා බිඳගෙන යන්නට ඉඩ නොදී හොරොව්, වාන, ස්ලුස් ආදිය නැවතත් සකස් කර දෙන්නැයි මා කියා සිටිනවා. ඉංජිනේරු මහත්මයා අප සමග කථා කරන විට නම් අනේ බොහොම හොඳයි. ඒ වුණාට වැඩක් නැහැ. ඒවා කියන්න කෙනෙක් නැහැ. ඒකයි අපේ කනගාටුව. ඒ නිසා ඒ ගැනත් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන හැටියට මා ඉල්ලා සිටිනවා.

මේ පරිපූරක ඇස්තමේන්තුව සම්මත වෙනවා දකින්න අපි බොහොම කැමතියි. හැබැයි, ඔය පොළොන්නරුව සහ මින්නේරිය වැනි ප්‍රදේශවලට ගරු ඇමතිතුමා කරන වැඩ ප්‍රමාණයෙන් අඩුම ගණනේ දහයෙන් එක පංගුවක් හෝ මිහින්තලය, කැකිරාව සහ කලාවැව වැනි ප්‍රදේශවලටත් කරනවා නම් තමයි බොහොම හොඳයි කියන්න පුළුවන් වන්නේ. මා සඳහන් කළ ඔය කාරණා ටික කෙරෙහි ගරු ඇමතිතුමාගේ කාරුණික අවධානය යොමු වනු ඇතැයි බලාපොරොත්තු වන බව නැවතත් වරක් ප්‍රකාශ කරනවා. මගේ වචන ස්වල්පය සමාප්ත කරනවා.

අ. භා. 3.56

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අය වැය විවාදය පැවති අවස්ථාවේදී ගරු ඇමතිතුමා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ ඡන්දය ලබා ගැනීමට මත්තෙන් මේ ගරු සභාවට එක්තරා පොරොන්දුවක් දුන්නා. ඒ පොරොන්දුව ගැන පළමුවෙන්ම මම මතක් කරන්නට කැමතියි. ඊ්පාමර් නැමැති ජාත්‍යන්තර විශේෂඥයා ලවා කොමිෂන් සභාවක් මගින් පරීක්ෂණයක් පවත්වන්නට යෙදුණු බව තමුන්නාසේ දන්නවා. ඒ කොමිෂන් සභාවෙන් පිට කරන ලද වාර්තාව මේ ගරු සභාව වෙත ඉදිරිපත් කරන්නට එදා ගරු ඇමතිතුමා පොරොන්දු වුණා. ඡන්දය ලබා ගන්නට මත්තෙන් එතුමා දුන් ඒ පොරොන්දුව තවමත් ඉෂ්ට වෙලා නැති බව කනගාටුවෙන් මතක් කරනවා. අද රුපියල් ලක්ෂ හැත්තෑපහක පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබෙනවා. එහෙත් අර වාර්තාව නම් නැහැ. කෝ ඒ වාර්තාව? එය තවමත් ඉදිරිපත් කර නැහැ. අයවැය විවාදය අවස්ථාවේ කිව්වේ එය අච්චු ගහන්න දීලා තිබෙන බවයි. ඒ වෙලාවෙ මා කිව්වෙ එය අච්චු ගහන්න වුවමනාවක් නැහැ; ගල් අච්චුවේ ගහපු කොපියක් බැගින් නැත්නම් සයික්ලෝස්ටයිල් කොපියක් බැගින් හෝ මන්ත්‍රී මණ්ඩලය වෙත ඉදිරිපත් කළොත් ඇත කියායි. මෙතෙක් එය ඉදිරිපත් කළාද? නැහැ. එදා ගරු ඇමතිතුමා මේ ගරු සභාවට දුන් ඒ පොරොන්දුව ඉටු කර තිබෙනවාද?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

අච්චු කන්තෝරුවෙන් ආපු හැටියෙම බෙදනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

වගකිවයුතු ආණ්ඩුවක වගකිවයුතු ඇමතිවරයකු හැටියට, තමන් දුන් පොරොන්දුව ඉටු කරන්නට ගරු ඇමතිතුමාට යුතු කමක් තිබුණේ නැද්ද? නියම වගකිවයුතු ඇමතිවරයෙක් නම් මේ අතිරේක වැය ශීර්ෂය ඉදිරිපත් කරන්නට පෙර එදා දුන් පොරොන්දුව ඉටු කරන්නට තිබුණා නේද?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

ඒක අච්චු ගහලා ඉවර වුණු හැටියෙම බෙදනවා කිව්වා.

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி. சொய்ஸா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

අවුරුදු කීයක් ගත වෙයිද ඕක අච්චු ගහන්න?

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

මෙය ආර්ථික සංවර්ධන ව්‍යාපාරයක් නොවේයයි fපාමර් මහතා කියනවා. මෙය ඇත්ත වශයෙන්ම රට බංකොලොත් කරන ව්‍යාපාරයකැයි කියනවා. fපාමර් වාර්තාවේ මේ ආකාරයට අඩංගු වෙලා තිබෙන බව මම නිර්භයවම ප්‍රකාශ කරනවා.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

කොහොමද දන්නෙ?

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

මම ඒක කියෙව්වා. මා කියෙව්වාය කීවාට මගේ කීම බාර ගන්නය කියන්න බැහැ. නිල වශයෙන් වාර්තාව පිට කරන තුරු. ඒ වාර්තාව මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබුණා නම් මෙය ප්‍රතික්ෂේප වෙනවා.

වංචනික අන්දමින් රුපියල් 75,00,000 ක් ගන්නට ඒ වාර්තාව යටපත් කළාය කියා මා කියනවා. ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් ඒ වාර්තාව අරගෙන කියවා බලා මා කියන කරුණ ගැන තීරණයක් ගන්න. ඒ වාර්තාවේ හැටියට ගල්ඔය ජලාශය හැදීමට කෝටි 4 ක් වියදම් කර තිබෙනවා. එමෙන්ම නිලධාරීන්ට බංගලා හදන්නටත් කෝටි 4 ක් වියදම් කර තිබෙනවා. ජලාශය හදන්නට ගිය වියදමට සමාන වියදමක් දරා වායුසමීකරන යන්ත්‍ර ආදිය සවි කර නිලධාරීන්ට බංගලා හදා තිබෙනවා. නිලධාරීන්ගේ බංගලාවලටත් කෝටි 4 ක් වියදම් කළා කියා fපාමර් වාර්තාවේ තිබෙනවා. ඉතින් බංකොලොත් වන එක පුදුමයක්ද? ආර්ථික සංවර්ධනයක් නොවෙයි කියන එක පුදුමයක්ද? ඒ වාර්තාවේ කියනවා ගල්ඔය ව්‍යාපාරයේ එකම කොටසක් පමණයි ආර්ථික වශයෙන් රටට හානියක් හෝ බරක් නැතිව තිබෙන්නේ කියා. ඒ කොටස නම් පුරාණ ගොවිපොළවල් තිබුණු පට්ටිපොළ ආරයි. පට්ටිපොළ ආරේ ගොවිපොළවල් පමණයි අද වියදමට වඩා ආදායමක් ලබන්නේ. අනික් අක්කර ලක්ෂ ගණනක් පමණ වූ ප්‍රදේශයෙන් ලැබෙන අස්වැන්නට වඩා වියදම වැඩියි. ඒවා නඩත්තු කරන්නට සිදු වී තිබෙන්නේ මහජනයාගෙන් ලැබෙන අයබදු මුදල්වලිනුයි.

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Order, please! The Sitting is suspended for half an hour.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ. භා. 4.30 ට නැවත පවත්වන ලදී.

அதன்படி அமர்வு பி. ப. 4.30 மணிவரை இடை நிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று.

Sitting accordingly suspended till 4.30 P.M., and then resumed.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

May I suggest that, since Motion Nos. 5, 6 and 7 pertain to the Ministry of Lands, Irrigation and Power, they be discussed together ?

ගරු මන්ත්‍රීවරු
(கௌரவ அங்கத்தவர்கள்)
(Hon. Members)

Aye !

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වැය ශීර්ෂය ඉදිරිපත් කර තිබෙන්නේ මෙන්න මෙහෙමයි :

"46 දරණ පරිපූරක ඇස්තමේන්තුව

ඉඩම් වාරිමාර්ග හා විදුලි බල අමාත්‍යාංශය

55 වැනි ශීර්ෂය : ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිවරයා

7 වැනි සම්මතය : ආර්ථික සංවර්ධනය මූලධන වියදම් රු. 75,00,000."

මෙතැන ආර්ථික සංවර්ධනය කියා යොදන්නේ නැතිව මෙය ඉදිරිපත් කළා නම් වරදක් නැහැ. මුදල් විනාශ කරන රට බංකොලොත් කරන ව්‍යාපාරයක්ය කියා ඇත්ත ප්‍රකාශ කර මෙය ඉදිරිපත් කළා නම් වරදක් නැහැ. විශේෂඥයින් කර තිබෙන වාර්තා අනුව කිව්වා නම් අපේ රට තවත් බංකොලොත් තත්ත්වයකට ගෙන එන ව්‍යාපාරයකට රුපියල් 75,00,000 ක් ඕනෑ කර තිබෙනවාය කියා කමක් නැහැ. මා එසේ කියන්නේ නියම තත්ත්වය අපට ප්‍රකාශ කළ යුතුව තිබෙන නිසයි. එහෙම නැත්නම් අර වාතීාව අපට ඉදිරිපත් කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔය වාර්තාව ඉදිරිපත් කර තිබෙන fපාමර් කියන විශේෂඥයා ආණ්ඩුව නොදන්නා කෙනෙක් නොවෙයි. මීට කලින් ඩී. එස්. සේනානායක අගමැතිතුමාගේ කාලයේ ලංකාවට පැමිණ "කොළඹසිසේෂන් ස්කීම්ස්" නැත්නම් ජනපද ව්‍යාපාර ගැන විශාල වාර්තාවක් ඉදිරිපත් කළා. ඔහු ආසියාවේ අනික් රටවලත් ජනපද ව්‍යාපාර සම්බන්ධව විශාල දැනුමක් ඇති විශේෂඥයෙක්. ඔහු මේ සඳහා විශේෂයෙන්ම නැව තත් ලංකාවට කැඳෙව්වා. උන්නැහේ ලංකාවට කැඳවා ගල්ඔය ව්‍යාපාරය ගැන වාර්තා කරන්නැයි කීවා. විශේෂඥයන් ගණනාවක් මේ කොමිෂන් සභාවේ සිටියා. ඉංජිනේරුවන් සිටියා. මෙම දෙපාර්තමේන්තුවේම විශේෂඥයන් සිටියා. පිටස්තර විශේෂඥයනුත් සිටියා. ආර්ථිකමය හා සමාජමය පර්යේෂණයන් කර වාර්තාවක් සැපයීමයි, මේ අයට භාර වුණේ. විශ්ව විද්‍යාලයේ විශේෂඥයන් හා ශිෂ්‍යයන්ද මේකට සම්බන්ධයි. මේ පිරිස අංග සම්පූර්ණ පර්යේෂණයක් කළා.

ගල්ඔය ජනපදයේ පදිංචි කරවා සිටින අයට සහ ඒ අවට සිටින වැදි ජනයාට ලැබී තිබෙන ආර්ථික ප්‍රතිඵල ගැන පරීක්ෂා කර බැලූ ඒ පිරිස හොඳ වාර්තාවක් සකස් කළා. ඒ වාර්තාවේ උක් වගාව ගැනත් සඳහන් කර තිබෙනවා. සීනි කර්මාන්ත ශාලාවේ වියදම ආදායමට වැඩි වන බව එහි පෙන්නුම් කර දී තිබෙනවා. උක් වගා කළ යුතු ප්‍රදේශය ගැන නියම විධියට සොයා නොබලා උක් වගා කර තිබෙන බවත්, ඒ විධියටම උක් කර්මාන්ත ශාලාව පිහිටුවා තිබෙන බවත් එහි කියා තිබෙනවා. උක් වගා කර තිබෙන්නේ නුසුදුසු පසකලු. සුදුසු ප්‍රදේශ තිබියදී නුසුදුසු ප්‍රදේශයක උක් වගා කර තිබෙන වාලු. සීනි කර්මාන්ත ශාලාව පිහිටුවා තිබෙන්නේ නුසුදුසු ස්ථානයකලු. උක් වගාව වෙනත් ප්‍රදේශයකට ගෙන ගිය හොත් සීනි කර්මාන්ත ශාලාවට උක් ගස් ගෙන යෑම වියදම් වැඩි වන වැඩක්ලු. ඒ වාගේම එසේ කිරීමේදී ඇති වන ප්‍රමාදය නිසා උක් ගස් නරක් වන්නට පුළුවන්ලු. ඒ නිසා උක් වගාව වෙනත් තැනකට ගන්නවා නම් සීනි කර්මාන්ත ශාලාවත් ඒ අනුව වෙනස් කළ යුතු බව පැහැදිලි ලෙස පෙන්වා දී තිබෙනවා. උඩ වලවේ ප්‍රදේශයට උක් වගාව ගෙන යන එක මීට වඩා වාසිදායක විය හැකි බවද කියා තිබෙනවා. මේ විශාල මුදල සම්මත කරන්නට මත්තෙන් මේ කරුණු ගැන කල්පනා කර බලන්නට ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ වාර්තාවේ තව දුරටත් සඳහන් වන්නේ මොනවාද? ගඩොල් කර්මාන්ත ශාලාවක් ඇති කර තිබෙනත් එයත් ඒ තරම් ප්‍රයෝජනවත් කටයුත්තක් නොවන බව එහි සඳහන් කර තිබෙනවා. වුව මනා කරන ගොඩනැගිලි සාදා අවසන් වී තිබෙන හෙයින් ඒ කර්මාන්ත ශාලාවලට අනාගතයක් නැති බව පෙන්වා දී තිබෙනවා. ගල්ඔය තිබෙන හැම කර්මාන්තයක්ම අනාගතයක් නැති ඒවා මෙන්ම ආදායමට වඩා වියදම වැඩි ඒවා බව පෙන්වා දී තිබෙනවා. රුපියල් ලක්ෂ ගණනක් වියදම් කර මේ වාර්තාව සකස් කෙරෙව්වා. එහෙත් දැන් එය හංගාගෙන සිටිනවා. මේ හැංගිහොරා වැඩ සුදුසු නැහැ. අවංකව දේශපාලන කටයුතුවලට යෙදීම යුතුකමයි. අපට මේ වාර්තාව ඉදිරිපත් කළා නම් අද දින සාකච්ඡාවට භාජන වන මෙම වැය ශීර්ෂය මෙම ගරු සභාවට ඉදිරිපත් කරන්නට තරම් මේ ආණ්ඩුව නිර්භය වන්නේ නැහැ. බුල්ඩෝසර්, විශාල ට්‍රැක්ටර්, විශාල ජීප් ආදී රථ වාහන කොපමණ ගණනක් ගල්ඔය කටයුතු සඳහා යෙදෙව්වාද? ඒ සඳහා කොතරම් ධනස්කන්ධයක් වියදම් කළාද? දැනට රුපියල් කෝටි 100කට වඩා වියදම් කර තිබෙනවා. එහෙත් කිසිම ආදායමක් නැහැ. කෝටි 100ක් වියදම් කර කිසිම අනාගතයක් නැති කර්මාන්ත ටිකක් ආරම්භ කර තිබෙනවා. ඒ කර්මාන්ත තව දුරටත් නඩත්තු කරනවාට වඩා වඩා දමන එක හොඳයි. ආදායමට වඩා වියදම් වෙනවා නම්, අනාගතයක් නැත්නම් ඒවා පවත්වාගෙන යන්නේ මොකටද? ගඩොල් පුළුස්සා ඇති වැඩය මොකක්ද, ඒවා පාවිච්චි කරන්නට පුළුවන්කමක් ඒ ප්‍රදේශයේ නැත්නම්? රේල්ලුවක් නැති නිසා ඒ ප්‍රදේශයේ සිට බඩු අදින්නට සිදු වී තිබෙන්නේ ලොරිවලින්. මාතර ප්‍රදේශයේ පාසල්වලට වුවමනා කරන මේස, බංකු ආදිය ගල්ඔයෙන් ගෙනෙන්නේ ලොරිවලිනුයි. රේල්ලුවෙන් අදිනවා වාගේ 10 ගුණයක වියදමක් යනවා, ලොරිවලින් අදින්න. ගල්ඔය සිට බඩු අදින්න වෙන විධියක් නැහැ. රේල්ලුවට බඩු පටවන්න සැතපුම් 40 ක් පමණ ගෙන යන්න වෙනවා. බඩු ඇදීම සඳහා පහසු කම් ඇති නොකොට ගල්ඔය කර්මාන්ත ශාලා පිහිටුවීමෙන් කර තිබෙන්නේ විනාශදායක වැඩක්. ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය යටතේ මාතර සුළු කර්මාන්ත ආයතනයක් තිබෙනවා. එහි වැඩ කෙරෙන්නේ සමුපකාර ක්‍රමයටයි. එහෙත් ගල්ඔයෙන් මේස, බංකු ආදිය ගෙනෙන නිසා අර සුළු කර්මාන්ත ආයතනයේ වඩු වන්ට රජයෙන් ඕඩර් නැත්නම් ඇනවුම් ලැබෙන්නේ නැහැ. එම නිසා ඒ කර්මාන්තශාලා වසා දමන්නට සිදු වෙනවා. ගල්ඔයෙන් ඒ බඩු ගෙන්වීමට වියදම් කරන මුදලින් 1/10 කට මාතර ප්‍රදේශයෙන්ම බඩු සපයන්නට පුළුවන්කම් තිබෙනවා. 10 ගුණයක් වැඩියෙන් වියදම් කර ගල්ඔයෙන් බඩු ගෙන්නුවත්, ගල්ඔය කර්මාන්තශාලාවේ ආදායමට වඩා වියදම වැඩියි. එවැනි විනාශදායක වැඩ පිළිවෙළවල් මගින් ආර්ථික සංවර්ධනයක් කරන්නට පුළුවන්කමක් තිබෙනවාද? අප රැවටීමට මෙසේ කටයුතු කිරීම හරිද? අර වාර්තාව මුද්‍රණය කර දෙනවා යයි එදා කීවා. එහෙත් අද වන තුරු ලැබුණේ නැහැ.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

වාර්තාව මුද්‍රණය කරන්නට යවා තිබෙන බවත්, මුද්‍රණය කළ වහාම බෙදා දෙන බවත් පමණයි, මා එදා කීවේ.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

වගකිව යුතු ඇමතිවරයකුගේ පිළිතුරක්ද, ඒ? ඒ ප්‍රකාශය මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන්ට කළ නින්දාවක්. ඇමතිතුමා අප මෝඩයන් හැටියට කල්පනා කරනවාද? මා එදා කීවා, මුද්‍රණය කරන්නට පමා වෙනවා නම් ඒ වාර්තාව ගල්අව්චුවේ ගසාවත් දෙන්නය කියා. එහෙත් එය වත් කළේ නැහැ. එම වාර්තාවේ පිටපත් අපට සපයන්නට ඇමතිතුමාට පුළුවන්කමක් තිබෙනවා. එහෙත් එය කරන්නේ නැහැ. ගල්ඔය නියම තත්ත්වය ඒ වාර්තාවේ විස්තර කර තිබෙනවා. පුළුවන්නම් එය නැතැයි කියන ලෙස මා අභියෝග කරනවා. මේ විවාදය කල් තබා, අර වාර්තාව කියවා බලා, මා කී දේවල සුළු වරදක් හෝ තිබෙනවා නම් පෙන්වා දෙන ලෙස මා අභියෝග කරනවා. වියදම් කරන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

නට යන මේ තිස්පන් ලක්ෂය කප්පද? අප විසින් මේ තරම් පැහැදිලි ලෙස කරුණු පෙන්වා දී තිබියදීත්, තමාගේ අනුමැතිය ලැබූ හා ලෝකයේ පිළිගත් විශේෂඥයන් ගෙන් සමන්විත කොමිෂන් සභාවක් මගින් වාර්තා කර තිබියදීත්, ඒ ගැන කිසි සැලකිල්ලක් නොදක්වා කටයුතු කරන්නේ ඇයි? මෙසේ අනවශ්‍ය වියදම් කිරීම ජාතික අපරාධයක් නොවෙයිද? මෙය මේ ව්‍යාපාරයට පමණක් නොව ලංකාවේ බොහොමයක් සංවර්ධන ව්‍යාපාරවලට වැළඳී ඇති වසංගතයක්. තුල්හිරියේත් වුවමනා නැති ගොඩනැගිලි හදන බවට විවේචනයක් කෙරුණා. ගල්ඔය සංවර්ධනය සම්බන්ධයෙන් අර කොමිෂන් සභාව නිකුත් කර ඇති වාර්තාව කියවා බැලුවොත් තුල්හිරිය ගැනත් එයින් උපදෙස් ලබන්නට පුළුවනි. ගල්ඔය ජලාශයට රුපියල් කෝටි 4ක් වියදම් කළ අතර බංගලා සෑදීම සඳහාත් රුපියල් කෝටි 4 ක් වියදම් කර තිබෙනවා. අනවශ්‍ය වියදම් කොයි තරම් කර තිබෙනවාදැයි එයින්ම පෙනෙනවා. නිලධාරීන්ට සීත සුළං වදින ගෙවල් හදන්නට එසේ මුදල් නාස්ති කිරීම මහා අපරාධයක්. කළ යුතුව තිබුණේ තාර දැමූ විශාල පාරවල් හැදීමද? සැප පහසුකම් ඇති විශාල බංගලාවල් හැදීමද? ගල්ඔය තිබෙන්නේ සේනානායක සමුද්‍රය පමණක් නොවෙයි. සැලැස්මේ දුර්වලකම්වලට පිළියම් කිරීම සඳහා අතිසාරයට අමුඩ ගසන්නාක් මෙන් ජලාශ පිට ජලාශ හැදීම නිසා දැන් එහි ජලාශ 17 ක් පමණ තිබෙනවා. එසේ තිබියදීත් සමහර කාලවලදී වතුර නැතිව ජනපද විනාශ වී යනවා.

පස පරීක්ෂා නොකර නොයෙක් විධියේ වැවිලි කිරීම නිසා ඒවා සම්පූර්ණයෙන්ම අසාර්ථක වී ගොස් තිබෙනවා. නුසුදුසු පසෙහි නාරං ආදී වගාවන් කිරීමෙන් අද ඒවා කිසිම ප්‍රයෝජනයක් නැති තත්ත්වයකට පත් වී අවසානයි. වගා කරන ලද පොල්වලින් නියම ආදායමක් නැති බව වාර්තාවේ සඳහන් වෙනවා. හිතුවක්කාර අන්දමින් කරන ලද මෝඩකම් මෙම වාර්තාවෙහි පෙන්වා තිබෙනවා.

"කොම්බයින් හාවස්ටර්" ගල්ඔයට ගෙන්වා තිබෙනවා. යුරෝපාදී රටවල විශාල ඉඩම්වල කොම්බයින් හාවස්ටරයක් පදවාගෙන යන විට එයින් වගාව කපා ගන්නවා. පාගන්නේත් ඒ කෙන්මයි; පිදුරු මිටි ගැහෙන්නේත් ඒ කෙන්මයි; ඇඹරෙන්නෙත් ඒ කෙන්මයි; තිරිඟු මුට්ට ගැසෙන්නේත් ඒ කෙන්මයි. මෙවැනි ට්‍රැක්ටර් දෙකක් හෝ හතරක් ගල්ඔයට ගෙනැවිත් තිබෙනවා. එකක්වත් පාවිච්චි කෙළේ නැහැ. බඹ 10න් 10ට හෝ 20න් 20ට හෝ නියරවල් තිබෙන කුඹුරුවල දැවැන්ත කොම්බයින් හාවස්ටරයක් පදවන්නේ කොහොමද? හිතුවක්කාර ලෙස කැළෑ එළි කිරීම් නිසා දැන් ඒ ප්‍රදේශයේ දැව සාගතයක් ඇති වී තිබෙන බවත් මෙම වාර්තාවෙහි දැක්වෙනවා. ඒ නිසා, වඩු කර්මාන්තය සඳහා ඉදි කරන ලද ශාලාවෙන් දැන් කිසිම ප්‍රයෝජනයක් නැහැ.

මා වේලාව ගත කරන්න කතා කරනවා නොවෙයි. ආණ්ඩුවක් අවංකව කටයුතු කරන්නට ඕනෑ. තමන් අතින් වුණු වැරදි වසා ගැනීමට ආණ්ඩුවක් උත්සාහ කළොත් කවදාවත් රටක් හැදෙන්නේ නැහැ. මෙවැනි විශාල ව්‍යාපාරයක් මේ විධියට ප්‍රතිපත්ති විරහිතව ගෙන යන විට අනෙක් ව්‍යාපාර මෙයින් ආදර්ශයක් ගන්නේ කොහොමද? පාඩමක් ඉගෙන ගන්නේ කොහොමද? මා සඳහන් කළ මේ වාර්තාව ඉදිරිපත් නොකිරීම ගැන ඇමතිතුමා දෙන පිළිතුර මොකක්ද? ඒ පිළිතුර පිළිගන්න අපට පුළුවන්ද? වාර්තාව අච්චු ගැසුවොත් ඉදිරිපත් කරන්නම් යයි ඇමතිතුමා කියනවා. එසේ කියන ගමන්ම අපෙන් තව වැඩිපුර රුපියල් 75 ලක්ෂයක් ඉල්ලා සිටිනවා. අප අද මෙම ගරු සභාවෙහි කෙරෙන කතා ඇතුළත් වාර්තාව හෙට පළ වෙනවා; නැත්නම් ඊට පසුදා අපට එය නොවරදවා ලැබෙනවා. ඒ තරම් ඉක්මණින් මේවා මුද්‍රණය කරන්නට පුළුවන්කම තිබෙන්නා නමුත්, මේ ඇමතිතුමාගේ වාර්තාව පමණක් මාස ගණනක් තිස්සේ මුද්‍රණය කරන්නට බැරිව තිබෙනවා.

ගරු රාජ්‍ය ඇමතිතුමා මේ ගැන මොකද කියන්නේ? රජයේ මුද්‍රණාලය ඔය තරම්ම බංකොලොත් වුණු අදක්ෂ එකක්ද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

මා මේ ගැන කිසිවක් දන්නේ නැහැ. වාරිමාර්ග ඇමතිතුමා දැන් මට එය මතක් කළා.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

වාර්තාව අච්චු ගැසූ විට ඉදිරිපත් කරන්නම් යයි එදා ඇමතිතුමා කිව්වා. එදා සිට අද දක්වා සති ගණනක් ගත වී තිබෙනවා. මේ කාලය තුළ එය මුද්‍රණය කරන්නට බැරි වුණේ ඇයි? වාරිමාර්ග ඇමතිතුමාගේ පිළිතුර අපට පිළිගත හැකි එකක් යයි තමුන්නාන්සේලා හිතනවාද? ඒ පිළිතුර තවත් ඇමතිවරයෙකුට කරන නින්දාවක් නේද?

සමහර ගරු මන්ත්‍රීවරුන් මේ රටේ තිබෙන ජනපද ව්‍යාපාර ගැන කරුණු කිව්වා. මා ඒවා ගැන කථා කරන්නට බලා පොරොත්තු වන්නේ නැහැ. නමුත් ගල්ඔය ව්‍යාපාරය ගැන වචනයක් කිවයුතුව තිබෙනවා. ඒක රට බංකොළොත් වන ව්‍යාපාරයක් නිසා මා ඉල්ලීමක් කරනවා. රටේ සංවර්ධන් කටයුත්තක් හැටියට කෙරෙන්නේ ඒක පමණක්ය, අනික් සියලුම ව්‍යාපාරවලට වියදම් කළ මුදල සම්පූර්ණයෙන්ම අපතේ ගියාය, රට තව තවත් ණය වන ව්‍යාපාරවලට මුදල් යොදා තිබෙනවාය, යනාදී කරුණු ඇතුළත් ඒ වාර්තාව ඉදිරිපත් නොකළාට ඒ වාර්තාව අනුව සාකච්ඡාවක් කර මේ යෝජනාව පසුව ඉදිරිපත් කරන්න.

ෂෙල්ටන් ජයසිංහ මයා.
(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)

එතකොට අතිරික්ත මුදලක් හැටියට ඉදිරිපත් වෙන්නෙ.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

අර වාර්තාව බලා ඕනෑම විධියකට ඉදිරිපත් කරන්න. අවංකව කටයුතු කරනවා නම් කිසිම අමාරුවක් නැහැ. නමුත් වංචනික විධියට කටයුතු කරන නිසයි මේ සියලුම කරදර ඇති වන්නෙ.

අ. භා. 4.48

පී. එම්. කේ. තෙන්නකෝන් මයා.
(திரு. பீ. எம். கே. தென்னகூன்)
(Mr. P. M. K. Tennakoon)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල අමාත්‍යාංශය යටතේ ගරු ඇමතිතුමා පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේදී මගේ කොච්චාශයට බලපාන කරුණු කිහිපයක් ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නට මා බලා පොරොත්තු වෙනවා

සේනපුර ගොවි ජනපදය ගැන ගරු ඇමතිතුමා දන්නවා. 1957 ඇති වූ මහ ජල ගැල්මෙන් සේනපුර ජනපදයේ ගෙවල් 25 ක් අබලන් තත්ත්වයට පත් වුණා. ඒ ගෙවල පදිංචිකරුවන් ඒ කාලයේ සිටම මේ ගෙවල් ප්‍රතිසංස්කරණය කරන මෙන් වරින් වර ඉල්ලුම් කළේ වී නමුත්, එය ක්‍රියාත්මක නොවූ බව කණගාටුවෙන් මතක් කළ යුතුව තිබෙනවා. නමුත් එසින් අධෛර්යයට පත් නොවූ ගොවීන් තමන් දුකසේ උපයා ගත් ධනය වැය කර එක ගෙයකට රුපියල් 1,000; 1,500; 2,000 බැගින් වැය කර ඒ ගෙවල් යථා තත්ත්වයට පත් කරගෙන අද දක්වා ජීවත් වෙනවා. ගෙවල් ප්‍රකෘතිමත් කිරීම සඳහා තමන්ගෙන් වැය වූ මුදල ආණ්ඩුවෙන් නොලැබුණු නිසා ඒ අවුරුද්දේ සිට මෑතක් වන තෙක් සේනපුර ජනපදයේ ඒ ගෙවල් විසිපහ හිමි ගොවීන් ආණ්ඩුවට බදු මුදල් ගෙව්වේ නැහැ. පෞද්ගලික ධනය වැය කර ගෙවල් ප්‍රකෘතිමත් කර ගන්නට සිද්ධ වූ නිසා, එක්කෝ ඒ මුදල අපට දෙන්න, නැත්නම් ඒ මුදලට හරි යන තෙක් අපෙන් බදු අය නොකරන්න, කියා මේ අය කාලයක් නිස්සේ ඉල්ලීමක් කළා. නමුත් සේනපුර ජනපදයේ අලුවිහාරේගම අංක 34 දරණ නිවසේ පදිංචි කේ. ජී. ටිකිරි බණ්ඩා ඇතුළු අනෙකුත් අයට ඒ ඉඩම් අවලංගු කරනවාය කියා දිසාපතිතුමාගෙන් ලියුමක් ලැබී තිබෙනවා. අපට බදු මුදල් ගෙවන්නට බැරි වුණේ අසුවල් හේතුව නිසයි; එම නිසා ඒ කාලයට නියමිත හිඟ බදු මුදලින් අප නිදහස්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. එම්. කේ. තෙන්නකෝන් මයා.]

කරන්න; ඉතිරි කාලයට අප බදු මුදල් ගෙවන්න ලෑස්තිය කියා මේ උදවිය දිසා පතිතුමාට පෙත්සමක් යවා තිබෙනවා. අවාසනාවකට මෙන් ඒ පෙත්සමට ලැබී තිබෙන පිළිතුරයි මේ:

"4.2.69 වන දින.

1969.1.23 වන දින දාතමින් මා වෙත ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් කරුණ සම්බන්ධව එවූ පෙත්සම ගැනයි. එම පෙත්සමින් ඉදිරිපත් කර ඇති කරුණු හිඟ බද්දෙන් නිදහස් කිරීමට ප්‍රමාණවත් හේතූන් නොවන බැවින් එම බද්දෙන් නිදහස් කළ නොහැකි බව මෙයින් කරුණාවෙන් දන්වමි

මෙයට,
කීකරු සේවක,
අත්සන් කළේ/පී. බී. කුමාරසිංහ,
අනුරාධපුරයේ දිසාපතිතුමා වෙනුවට."

ඒ දුප්පත් ගොවීන්ට මෙවැනි ලිපියක් යවා තිබෙන නමුත් ආගම ජනපදයේ මිනිසුන්ගේ ගෙවල් විනාශ වූ අවස්ථාවේදී ගරු ඇමතිතුමා අළුතෙන්ම ගෙවල් තනා දුන් බව අප දන්නවා. මේ උදවියගේ ගෙවල් සම්පූර්ණයෙන්ම විනාශ වුණේ නැහැ. නමුත් අබලන් තත්ත්වයට පත් වුණා. අබලන් තත්ත්වයට පත් වුණත්, ඒ උදවිය තව දුරටත් ඒ ගෙවලම පදිංචි වී සිටි නිසා දිසාපතිතුමා හෝ දෙපාර්තමේන්තුව හෝ ඒ ගෙවල් ප්‍රකෘතිමත් කිරීම ගැන කල්පනා කළේ නැහැ. ඒ කෙසේ වෙතත් දුකසේ කාලයක් තිස්සේ උපයා ගත් ධනය වැය කර මේ ගෙවල් ප්‍රකෘතිමත් කර ගත්තාට පසු, දැන් අර හිඟ බදු මුදල් නොගෙවීවාය කියා ඔවුන්ගේ ඉඩම් අවලංගු කරනවා නම් ඒක සාධාරණ ක්‍රියාවක් නොවන බව ගරු ඇමතිතුමාට පෙනෙනවා ඇති. එම නිසා ඇමතිතුමාගේ කාරුණික අවධානය යොමු කර මේ උදවිය හිඟ බද්දෙන් නිදහස් කර ඉදිරි වැඩේ සිට මේ අයගෙන් බදු අය කර ගනිමින් මේ ගම්වාසීන්ට සහනයක් සලසා දෙනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

පසුගිය කාලයේ යම් යම් ඉඩම් බලහත්කාරයෙන් අල්ලා ගෙන ජීවත් වූ පිරිසක් සිටියා. ඉඩම් කච්චේරි පවත්වා එම ඉඩම් ඔවුන්ට නීත්‍යානුකූලව අත් කර දෙන්නට ගරු ඇමතිතුමා කටයුතු යෙදීම ගැන මා එතුමාට ස්තුතිවන්ත වෙනවා. එහෙත් මෙම අවස්ථාවෙහිදී මට තවත් කාරණයක් සඳහන් කරන්නට තිබෙනවා. මේ ගැන මා මීට පෙරත් කිප වතාවක්ම මතක් කර තිබෙනවා. මා කලින් සඳහන් කළ පිරිස එසේ ඉඩම් බලහත්කාරයෙන් අල්ලා ගත්තාට මොකද ඔවුන් යමක් කමක් තිබෙන උදවිය බව අප දන්නවා. එහෙත් ඉඩකඩම් නොමැතිකමින් ඊටත් වඩා දුක් විඳින පිරිසක් ඒ ගම්වල වෙසෙන බව මතක් කළ යුතුව තිබෙනවා. මා මූලින් සඳහන් කළ උදවියට නීත්‍යානුකූලව ඉඩම් අත්පත් කර දීම සඳහා ඉඩම් කච්චේරි පැවැත්තුවා වාගේම මේ උදවිය වෙනුවෙනුත් ඉඩම් කච්චේරි පවත්වා ඉඩම් බෙදා දීමේ වැඩ පිළිවෙළක් යොදන ලෙස මා ඉල්ලා සිටිනවා. මෙම ඉල්ලීම මා කිප වතාවක්ම කර තිබෙන බව මෙහිලා නැවත වරක් සඳහන් කරන්නට ඕනෑ. ඒ පිළිවෙළට කටයුතු නොකිරීම නිසා මේ පිරිසටත් බලහත්කාරයෙන් ඉඩම් අල්ලා ගැනීමේ ව්‍යාපාරයක යෙදෙන්නට සිදු වී තිබෙනවා.

එම කාරණය ඔප්පු කිරීම පිණිස එක්තරා සිද්ධියක් සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරන්නට මට පුළුවනි. මගේ ආසනයේ 43 වන තූලානේ පැතිස් රඹෑව නමින් ගමක් තිබෙනවා. ඒ ගමේ එක්තරා පවුලක හොඳට හැදුණු වැඩුණු තරුණයෙක් සිටියා. ඔහුට තමන්ගේ දෙමව්පියන් සමග ජීවත් වන්නට ඉඩකඩ මදි නිසා කළේ කුමක්ද? තම පියාගේ ඉඩමට අල්ලපු ඉඩමෙන් අක්කර කාලක් අල්ලාගෙන එහි ගෙයක් සාදාගෙන ජීවත් වන්නට කල්පනා කළා. එහි ප්‍රතිඵලය වූයේ කුමක්ද? තමුන්නාන්සේගේ අළුත් නීතිය යටතේ ඒ ගමේ හැදිච්ච වැඩිච්ච එම අසරණ කොළුවට දඩුවම් විඳින්නට තරම් තත්ත්වයක් උදා වුණා. තමාගේ පියා සතු ඉඩමට අල්ලපු ඉඩමෙන් අක්කර කාලක් අල්ලාගෙන එහි පැලක් අටවා ගෙන ජීවත් වීමේ වරදට ඔහුට විරුද්ධව අනුරාධපුර දිස්ත්‍රික් උසාවියේ නඩුවක් පැවරුවා. මේ තැනැත්තා ඊට වරදකරු වීම නිසා රුපියල් 200ක දඩයක් කන්නටත් සිදු වුණා. ඉඩම් නොමැති උදවියට ඉඩම් ලබා දීම සඳහා ඉඩම් කච්චේරි නොපවත්වන හේතුව නිසයි මෙම තත්ත්වය ඇති වී තිබෙන්නේ. එම තත්ත්වය හේතු කොටගෙන මා මූලින් සඳහන් කළ ගම්

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

වාසින් ඉඩම් අල්ලා ගත්තා වාගේ මේ උදවියටත් ඉඩම් අල්ලා ගන්නට සිදු වී තිබෙනවා. එම නිසා සෑම ගමකම පිහිටි ගොඩ ඉඩම් වේවා මඩ ඉඩම් වේවා ඉඩම් නොමැති පිරිසට බෙදා දීම සඳහා ඉඩම් කව්චේරි පැවැත්වීම පිණිස වැඩ කටයුතු යොදන්නැයි දිසාපතිතුමාට නියෝග කරන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම දැන් යම් යම් ඉඩම් බලෙන් අල්ලාගෙන සිටින උදවියට තමුන්නාන්සේගේ නියෝගය පිට නඩු පවරා හිරිහැර කරන්නට ඉඩ දෙන්න එපා. එම උදවිය පිටින් ගොස් බලෙන් ඉඩම් අල්ලාගෙන සිටින උදවිය නොවෙයි. ගම්වල වෙසෙන පවුල් දිනෙන් දින බර පතල තත්ත්වයට පත් වෙනවා. එම නිසා මේ අන්දමට බලහත්කාරයෙන් ඉඩම් අල්ලාගෙන පදිංචි වන්නට සිදු වෙනවා. එය නීති විරෝධී ක්‍රියාවක් හැටියට සලකා ගෙන එම උදවිය උසාවියට ඉදිරිපත් කොට හිරිහැර කරනවා. එය අසාධාරණ දෙයක් බව කිවයුතුයි.

මට තවත් කාරණයක් කියන්නට තිබෙනවා. මෑතකදී කපා අවසාන කළ නව්වදුව පෝෂිත ඇල කැපීමේදි ගම්වාසීන්ට අයත් සින්නක්කර ඉඩම්වලින් විශාල ප්‍රමාණයක් ඊට යට වුණු බව අප දන්නවා. ඒ ඉඩම් සඳහා මේ වන තුරුම වන්දි මුදල් ලැබී නැහැ. එම ඉඩම් අයිතිකරුවන්ට ගෙවිය යුතුව තිබෙන වන්දි මුදල් හැකි පමණ ඉක්මණින් ලබා දෙන්නට කටයුතු යෙදිය යුතුව තිබෙනවා. ඒ වාගේම මහකනදරාව ව්‍යාපාරය ආරම්භ කළ අවස්ථාවේදී ඊට යට වුණු සින්නක්කර ඉඩම්ද විශාල ප්‍රමාණයක් තිබෙනවා. එම ඉඩම් අයිතිකරුවන්ටත් වන්දි මුදල් ලැබී නැහැ. එම ඉඩම් සඳහා ගෙවිය යුතු වන්දි මුදල් ගෙවන ලෙස කාලාන්තරයක් තිස්සේ කියනවා. එහෙත් මේ වන තුරු ඒ ගැන ක්‍රියා කර නැහැ. මෙවැනි කරුණු පිළිබඳව මා වෙත නොයෙකුත් අන්දමේ පැමිණිලි ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහකනදරාව යාය 5 දරණ ප්‍රදේශයේ පිහිටි පාඨශාලාවෙහි රැස්වීමක් තිබ්බා. එය දේශපාලන රැස්වීමක මුහුණුවරක් ඉසුලූ බව අප දන්නවා. ගරු ඇමතිතුමාත් ඊට සහභාගි වුණා. ගරු ඇමතිතුමා දේශපාලන මුහුණුවරකින් යුත් ඒ රැස්වීමේදී මට චෝදනා මුඛයෙන් කථා කර තිබෙන බව මා දන්නවා. "තමුන්නාන්සේලාගේ මන්ත්‍රීතුමා මට අඩුපාඩුකම් කියන්නේ නැහැ. මා මොකද කරන්නේ" යන පිළිවෙළේ අදහස් ඇති වන අන්දමට තමුන්නාන්සේ එහිදී කථා කර තිබෙනවා. මා තරම් මගේ ප්‍රදේශයේ අඩුපාඩුකම් කියන වෙනත් ගොවි මන්ත්‍රීවරයෙක් නැති තරමයි. තත්ත්වය එසේ තිබියදී තමුන්නාන්සේ නිල ගමනක් ගොස් ග්‍රාම සංවර්ධන සමිතියේද සහයෝගය ඇතුව එවැනි රැස්වීමක් තබා තිබෙනවා. පරාජිත අපේක්ෂකයාත් මීට සහභාගි වී තිබෙනවා. තමුන්නාන්සේ එම අවස්ථා වෙහිදී මට චෝදනා මුඛයෙන් කතා කිරීම වැරදි බව මෙහිලා සඳහන් කරන්නට මා කැමතියි. පළාතේ මන්ත්‍රීවරයා වශයෙන් පෙනී සිටින මටත් මේ ගමන පිළිබඳ වැඩ සටහනක් එවන්නට යුතුකමක් තිබුණා. පළාතේ මන්ත්‍රීවරයා වශයෙන් එම ජන පදයේ තිබෙන අඩුපාඩුකම් මොනවාදැයි කියන්නට එවිට මටත් අවස්ථාවක් ලැබෙනවා. මෙවැනි නිල ගමනක් යන විට මෙතෙක් කල් වෙනත් ඇමතිවරුන් විසින් ගෙන ආ සම්ප්‍රදාය කඩා දැමූ එකම ඇමතිවරයා තමුන්නාන්සේ හැටියට මට සඳහන් කරන්නට පුළුවනි. වග කිවයුතු මන්ත්‍රීවරයකු වශයෙන් මා ඒ බව කියනවා. වෙනත් ඇමතිවරුන් එම කොට්ඨාශයට යන විට පිළිපදින ලද සම්ප්‍රදායයක් තිබුණා. එනම් ඔහු අසුවල් දවසේ එනවාය කියා පළාතේ මන්ත්‍රීවරයා වෙත දන්වා යැවීමයි. එම දැන්වීම ලැබුණාසින් පසු එම කටයුත්තට සහභාගි වීම සඳහා එන එක හෝ නොඑන එක හෝ අයිති මටයි. එහෙත් අර විධියේ වැඩ සටහනක් එවීම යුතුකමක්. නිල වශයෙන් එවැනි ගමනක් යන විට පවා මා වෙත දැනුම් දීමක් නොකළේ දේශපාලන වශයෙන් එවැනි රැස්වීමක් පවත්වා මට මඩ ගැසීමේ අදහසින් බව කිව යුතුයි. මෙවැනි වැරදි වැඩ නොකරන ලෙස මෙම ආණ්ඩුවෙන් මා ඉල්ලා සිටිනවා. මාත් මහජන ඡන්දයෙන් පත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. එම්. කේ. තෙන්නකෝන් මයා.]

වී ආ මන්ත්‍රීවරයෙක්. කොයිම ඇමතිවරයෙක් මගේ ආසනයට ආවත් මහජනයා වෙනුවෙන් ඉදිරිපත් වී අපේ ප්‍රදේශයට තිබෙන අඩුපාඩුකම් කියන්නට මටත් යුතුකමක් තිබෙනවා. එම සම්ප්‍රදාය තමුන්නාන්සේ කඩා බිඳ දමා තිබීම ගැන මා නැවත වරක් මගේ කනගාටුව ප්‍රකාශ කරනවා.

උතුරු මැද පළාතේ වැඩි දෙනෙකු හේන් කොටා ජීවත් වන බව ගරු ඇමතිතුමා දන්නවා. ඔවුන් වටිනා ගස් තියෙන තහනම් කැලෑ කොටන්නේ නැහැ. පුංචි ලදු කැලෑවල ඔවුන් හේන් කොටනවා. මෑතක සිට තමුන්නාන්සේලා හේන් කෙටීම තහනම් කර තිබෙනවා. ඒ ගැන නිලධාරීන් ගම්මුන්ට දන්වා නැහැ. මගේ ආසනයේ නොමිමර 64 තුලානේ උදවිය අක්කරය, දෙක හේන් කෙටුවා, ගම්බද ලදු කැලෑවල දිසාපතිවරයා ඔවුන්ට අක්කරයකට රුපියල් 10 බැගින් දඩගසා තිබෙනවා. මේ දඩ ගෙවා ඉඩම් කැලි අත්හැරීමට ඔවුන්ට නියම කර තිබෙනවා. මේක සාධාරණ නැහැ. වෂීාව නැති නිසා ගොවිතැන් කර ගන්නට බැරි බැවින් හේනක් කොටා හෝ ඔවුන් ඔවුන්ගේ දරු පැටවුන් රකින්නට ඕනෑ. ගොවිතැන් පාලු වුණාම ඔවුන්ට සහනාධාර වැඩ ලැබෙන්නෙ නැහැ. ගොවි ණය ගෙවා නැත කියා ඔවුන්ගේ සහල් පොත් පවා ආණ්ඩුව ඇපසු ගෙන තිබෙන නිසා ඔවුන්ට නොමිලේ හාල් ලබා ගන්නටත් බැහැ. කැලෑ කොටා හෝ අඹු දරුවන් පෝෂ්‍ය කරන්නට ඔවුන්ට සිදු වී තිබෙනවා. කැලෑ අක්කරයක් කෙටුවාට රුපියල් 10 ක් දඩ ගසනවා නම් ඒ රජරට ගොවීන්ට කාගේ පිළිසරණක්ද? තමුන්නාන්සේ එසේ දඩගසන්නය කියා නියමයක් කර නැත්නම් ඒ නිලධාරීන් හිතුවක්කාර අන්දමට ක්‍රියා කර තිබෙනවා. තමුන්නාන්සේගේ නියෝගයක් නැතිව ඒ නිලධාරීන් අහිංසක මිනිසුන්ට හිරිහැර කරනවා නම් මේ ගැන විධිමත් පරීක්ෂණයක් කරන ලෙස මා ඉල්ලා සිටිනවා. මේ කරුණු පිළිබඳව ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවමින් මගේ කථාව අවසාන කරනවා.

අ. භා. 5

ලීලාරත්න විජේසිංහ මයා.
(திரு. லீலாரத்ன விஜேசிங்ஹ)
(Mr. Leelaratne Wijesinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොලොන්නරු ආසනයේ පිඹුරත්තැව වැව ව්‍යාපාරය යටතේ සංවර්ධන වැඩ පිළිවෙළක් කරගෙන යනවා. ඒ සංවර්ධන ව්‍යාපාරය සඳහා යට වන අරුගම් වෙල ප්‍රදේශයේ ජනතාවට ඉඩම් දී තිබෙන නමුත් අලවකුඹුරේ යටවන ඉඩම් වල පදිංචි නිස් ගණනකට ඉඩම් දීම ඒ ඉඩම් නිලධාරී තැන ප්‍රතික්ෂේප කර තිබෙනවා. මොන කරුණක් නිසා කොට සකට ඉඩම් දී කොටසකට ඉඩම් නොදී තිබෙනවාද කියා මා දන්නේ නැහැ. ඒ නිසා ඒ නිස් ගණනටත් එම ව්‍යාපාරය යටතේ ඉඩම් දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

1968-69 වර්ෂයේදී රුපියල් 10 ක සංකේත වැය ශීර්ෂයක් සම්මත කරගන්නා ඒ වැව සංවර්ධනය කිරීමට රුපියල් ලක්ෂ 15 ක් ඉල්ලා සිටිනවා. මේ 15 ලක්ෂය සාධාරණ විධියට වියදම් වේද කියන්නට අමාරුයි, කොන්ත්‍රාත් දී වැඩ කරන්නට බලාපොරොත්තු වන නිසා. මේ වැව සංවර්ධන වැඩ වෙළඳ මණ්ඩලය කොන්ත්‍රාත් ගෙන කරගන යනවා. අනවශ්‍ය ලෙස මුදල් විශාල ප්‍රමාණයක් වියදම් කර මෙවැනි වැඩ කිරීමෙන් පලක් නැහැ. අක්කරයක් කැපීමට ගොවීන්ට දෙන්නේ රුපියල් 100 යි. මේ කොම්පැනිකාරයන්ට අක්කරයට රුපියල් 400 ගණනේ ගෙවා තිබෙනවා. ගොවීන්ට අක්කරයට රුපියල් 400 බැගින් ගෙවිවා නම් ඔවුන් සම්පූර්ණයෙන් ශුද්ධ කර මුලුත් ගලවා දෙනවා. කෙසේ හෝ රුපියල් 15 ලක්ෂයක් පෞද්ගලික කොම්පැනිකාරයන්ට ලැබෙන අන්දමටයි, ඇමතිතුමා වැඩ පිළිවෙල සකස් කර තිබෙන්නේ. මුල් ගල තැබීම සඳහා ඇමතිතුමා ගිය උත්සවයට රුපියල් 1,300 කට කිව්වු ගණනක් වියදම් කර තිබෙනවා. මේ විධියට වියදම් කරන්නට ගියොත් සංවර්ධනය සඳහා මිස වෙන වැඩක් සඳහා වියදම් කරන්නට මුදල් ඉතුරු වන එකක් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

පිඹුරත්තැවේ වැවට එහා පැත්තෙන් කුඹුරු වගා කරන්නට බැරි කොටසේ අක්කර 1,000 ක් තේක්ක වැවීම සඳහා එක පුද්ගලයකුට—බ්‍රිටෝ නමැති පුද්ගලයකුට—දී තිබෙන බව ආරංචියි. මීට කලින් එවැනි සිරිතක් තිබුණෙ නැහැ. අක්කර විසිපහේ පණහේ කට්ටි කඩල තමයි, ඉස්සර තේක්ක වවන්නට මිනිසුන්ට ඉඩම් දුන්නේ. එහෙත් මේ පිළිබඳව පළපුරුද්දක් නැති, මීට ඉස්සර තේක්ක වැවීමක් කර නැති, එවැනි ව්‍යාපාරයක යෙදී පළපුරුද්දක් හෝ ඒ වැඩ ගැන කිසිම සුදුසුකමක් නැති මේ බ්‍රිටෝ කියන පුද්ගලයාට තමුන්නාන්සේගේ දෙපාර්තමේන්තුව මගින් අක්කර දහක් දී තිබෙන්නේ කොහොමද කියා මා අහන්නට කැමතියි. මේකෙන් වගාවක් බලාපොරොත්තු වන්නට පුළුවන් වෙයිද, එසේ නැත්නම් කාලාන්තරයක් තිස්සේ වගා වෙලා තිබුණු ගස් කොලන් ටික සුන්නද්දුවිලිවෙලා යයිද කියන්නට බැහැ. වැලිකන්ද පැත්තට වෙන්න මේ අක්කර දහ දැන් මාස 2 කට විතර ඉස්සරවෙලයි දීල තිබෙන්නේ. තේක්ක වවන ප්‍රධාන ප්‍රදේශය තිබෙන්නේ ඊට එහා පැත්තෙයි. තේක්ක වවන ප්‍රදේශයට යාවයි, මේ බ්‍රිටෝ කියන පුද්ගලයාට මේ අක්කර දහ දීල තිබෙන්නේ. බ්‍රිටෝ මා කලින් කිව්වාක් මෙන් ඒ විධියේ කටයුත්තකට කිසිසේත් දක්ෂයෙකු නොවෙයි. මේ අන්දමට එක පුද්ගලයෙකුට අක්කර දාහ බැගින් තේක්ක වවන්නට දුන්නොත් මේ කටයුත්ත කෙරෙන්නෙම නැහැ. ඒ අක්කර දහේ තිබෙන වටිනා ගස් ටික නම් කොහේ හරි ගිහින් මිනිසුන්ගේ සාක්කුවලට සල්ලි ටිකක් යයි.

ගරු ඩී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி. சில்வா)
(The Hon. C. P. de Silva)

එහෙම වෙන්න බැහැ. මම සොයා බලන්නම්.

පරිපූරක මුදල්

ලීලාරත්න විජේසිංහ මයා.
(திரு. லீலாரத்ன விஜேசிங்ஹ)
(Mr. Leelaratne Wijesinghe)

ඊළඟට ගල්අමුණ ව්‍යාපාරය ගැන මතක් කරන්නට ඕනෑ. ගල්අමුණෙ සුංගාවිලට එහායින් ප්‍රදේශය තමුන්නාන්සේගේ ආඥායටත් බලපානවා. ගල්අමුණෙ ඉඩම් බෙදා දුන් දා සිට, දැන් අවුරුදු 10 කට වැඩි කාලයක් ඒ ප්‍රදේශයේ ගොවීන්ට යල් මෝසමේ වැඩ කර ගන්නට ජලය ලැබෙන්නෙ නැහැ. මාස් මෝසමේදී ඒ ප්‍රදේශය ඔක්කොම වතුරෙන් යට වෙනවා. ඒ නිසා ඒ මිනිසුන් අන්ත කාලකණ්ණි පිරිසක් බවට පත් වී සිටිනවා. ගල්අමුණ ව්‍යාපාරය අමතක නොකරන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

කවුඩුල්ල ව්‍යාපාරයේ දෙවෙනි කොටස සඳහාත් තමුන්නාන්සේ රුපියල් 15,00,000 ක් ඉල්ලා තිබෙනවා. මා ඒ ගැන සන්තෝෂ වෙනවා. අපි කාලයක් තිස්සේ පාර්ලිමේන්තුවෙදිත් මේ ගැන මතක් කළා. මේ රුපියල් 15,00,000 ජනතාවට වැඩදායක වන අන්දමට ඉතා කල් පනාකාරීව යෙදෙව්වොත්, ඒ ස්ථානයේ පාසල්, පාරවල්, ළිං, ඇළවල් ආදිය හරි ගස්සන්නට යෙදෙව්වොත්, කවුඩුලු ඇළ දෙවෙනි පියවර අවසාන කර ගන්නට පුළුවන් වෙයි. එහෙත් ඒ අන්දමට මුදල් වියදම් වෙයි කියා මා විශ්වාස කරන්නේ නැහැ.

ඊළඟට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉයැදුරෙකුව සිටි ඩී. ඩී. 75 දරන අංකය යටතේ සේවය කළ, ඩබ්ලිව්. සොලමන් සිල්වා මහත්මයාගේ වැඩ 1966 මැයි මාසයේදී තහනම් කරන්නට යෙදුණා. ගරු ඇමතිතුමාගේ වාහනය පැදෙව්වේ ඒ ඉයැදුරායි. අසතුටුදායක සෞඛ්‍ය තත්ත්වය නිසයි, ඔහු විශ්‍රාම යවා තිබෙන්නේ. විශ්‍රාම යවන්නට තරම් අසනීපයක් ඔහුට ඇත්තෙ නැහැ. අවුරුද්දකට කලින් වැඩ තහනම් කරල පසුව බලයෙන් විශ්‍රාම යවා තිබෙනවා. මා හිතන හැටියට පළමුවෙන් දේශපාලන වශයෙන් වැරදි කළායකියා ඔහුගේ වැඩ තහනම් කළ නමුත් ඒ වැරදි ඔප්පුකර ගන්නට පුළුවන් කමක් නොතිබුණු නිසයි, මේ අන්දමට බලහත්කාරයෙන් විශ්‍රාම යවා තිබෙන්නේ. ඇමතිතුමාගේ රථාචාර්යයා ඇමති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලීලාරත්න විජේසිංහ මයා.]

තුමාට විරුද්ධව කටයුතු කරයි කියා මා හිතන්නේ නැහැ. කෙසේ හෝ ඔහුගේ වැඩ තහනම් කර තිබෙනවා. ඊට පසු බලහත්කාරයෙන් විශ්‍රාම ගන්වා තිබෙනවා. මා කියන්නට යන්නේ 1965-66 වර්ෂය සඳහා ඔහුට ලැබිය යුතු වාර්ෂික වැටුප් වැඩිවීම මෙතෙක් ඔහුට නොගෙවීම ගැනයි. බඩට ගසා තල්ලු කර දැම්මට මොකද ඔහුට ගෙවන්නට තිබෙන ගෙවීම් වත් හරිහැටි ගෙවා නැහැ. ඒ නිසා සොල්මන් සිල්වා මහත්මයාට ලැබිය යුතු 1965-66 වර්ෂයේ වාර්ෂික වැටුප් වැඩිවීම ඔහුට ඉක්මණින් ගෙවන හැටියට තමුන්නාන්සේගෙන් මා ඉල්ලා සිටිනවා.

තමුන්නාන්සේගේ පිඹුරත්තෑවේ වැඩ පිළිවෙල ගැන අපි ඉදිරි කාලයේදී බලන්නට ඕනෑ. පිඹුරත්තෑව වැවේ ඉඩම් බෙදා දීම සම්බන්ධයෙන් පසුගිය දවසක මා මෙහිදී මතක් කළ විට ඇමතිතුමා කියා සිටියා, ඒ ඉල්ලුම් පත්‍ර හොර ඉල්ලුම් පත්‍ර වගයක්ය කියා. ඊට පසුව මට ඒ ගැන ආරංචියක් ලැබුණෙ නැහැ. එහෙත් මේ හොර ඉල්ලුම් පත්‍ර අනුව වුවත් දිසාපතිතුමා අද දහකට වැඩි පිරිසක් ඉඩම් දීම සඳහා තෝරාගෙන තිබෙනවා. ඉල්ලුම් පත්‍ර නව දහස් ගණනක් දිසාපති කාර්යාලයට ලැබී තිබෙනවා. මේ හැම ඉල්ලුම් පත්‍රයකින්ම රු. 9.44 බැගින් ආණ්ඩුව අය කර ගත්තා. ඉල්ලුම් පත්‍ර නව දහස් ගණනක් ලැබුණා නම්, එක ඉල්ලුම් පත්‍රයකින් රු. 9.44 බැගින් රුපියල් ලක්ෂයක තරම් ආදායමක් දුප්පත් ගොවීන්ගෙන් ආණ්ඩුව ලබාගෙන තිබෙනවා. ඒ මුදල් ඔවුන්ට ආපසු ගෙවන්න කියායි, මා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටින්නෙ. මීට ඉස්සර ඉඩම් නැති ගොවීන්ට ඉඩම් බෙදා දීම සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවන විට ඒ විධියේ මුදලක් අය කර නැහැ. ඒ කාලයේ ඒ මිනිසුන්ට වියදම් වුණේ ලියුම් ලියාපදිංචි කිරීමට වියදම් වන ශත 60 පමණයි. එසේ මේ වාරයේදී අය කරගත් රු. 9.44 ආපසු ඒ මිනිසුන්ට ගෙවනවා දැයි ගරු ඇමතිතුමාගෙන් ප්‍රශ්න කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

අ. භා. 5.7

කාරියවසම් මයා.
(திரு. காரியவசம்)
(Mr. Kariyawasam)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අය වැය විවාදයේදී අපට මේ කරුණු ගැන කථා කරන්නට අවස්ථාවක් නොලැබුණු නිසයි, විශේෂයෙන්ම අපි මේ කරුණු ගැන අද කථා කරන්නේ. මීට ඉස්සර අවස්ථාවල මා ඉඩම් ඇමතිතුමාගේ වැය ශීර්ෂ යටතේ කථා කළ අවස්ථාවලදී එතුමාගේ කටයුතු දෝෂදර්ශනයට ලක් කළා. එහෙත්, ඇත්ත වශයෙන්ම, අද නම් මා ගරු ඇමතිතුමා එවැනි දෝෂ දර්ශනයකට ලක් කරන්නට මේ පරිපූරක ඇස්තමේන්තුව පිළිබඳ විවාදයේදී බලාපොරොත්තු වන්නේ නැහැ. ඊට වැදගත් හේතුවක් තිබෙනවා. මම ඒකත් සඳහන් කරන්නම්. ගරු ඇමතිතුමා එසේ කරන විට අමනාප වෙනවා. වැඩි වැඩියෙන් දෝෂ දර්ශනයට ලක් කළොත් එතුමා වැඩි වැඩියෙන් අමනාප වෙනවා. එතකොට කරන්න අදහස් කරගෙන සිටි ටික පවා එතුමා කරන්නේ නැහැ. ඒ නිසා මේ අවස්ථාවේදී එතුමාගේ ගුණ පමණක් වර්ණනා කර, එතුමාගේ හොඳ පමණක් සඳහන් කර, කෙසේ හෝ මගේ ප්‍රදේශයට වුවමනා කරන කාර්ය යන් එතුමා ලවා කරවා ගන්නටයි මා බලාපොරොත්තු වන්නේ.

අප මේ ගරු සභාවේදී කරුණු ඉදිරිපත් කරන්නේ, කථා කරන්නේ, අපේ පෞද්ගලික වුවමනාවන් ඉටු කරවා ගැනීමට නොවෙයි. පෞද්ගලික හේතූන් උඩ නොවෙයි අප කථා කරන්නේ. අප මෙහිදී කථා කරන්නේ පොදු මහජනතාවගේ වැඩකටයුතු සම්බන්ධයෙන් බව මේ අවස්ථාවේදී විශේෂයෙන් මතක් කරන්නට කැමතියි. අපේ හිතමිත්‍ර මිහින්තලේ ගරු මන්ත්‍රීතුමාට කළා වාගේ අසාධාරණයක් මටත් කර තිබෙනවා. බෙන්තර-ඇල්පිටිය මැතිවරණ කොට්ඨාශය නියෝජනය කරන මහජන මන්ත්‍රීවරයා වශයෙන් අද සිටින්නේ මමයි. නවත් කාරණයක් ඒ සම්බන්ධයෙන් මේ ගරු සභාවේ සිටින මහජන මන්ත්‍රීවරුන්ට මතක් කරන්නට මම කැමතියි. වැඩි ඡන්ද සංඛ්‍යාවක් ත්‍යාගයකින් ලබා මේ ගරු සභාවට එන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මන්ත්‍රීවරුන් අතරින් සමහර විට තුන් වැන්නා නැත්නම් හතරවැන්නා හැටියට මා හඳුන්වන්නට සමහර විට පුළුවනි. ඒ තරම් පිරිසකගේ නියෝජිතයා හැටියට මා හඳුන්වන්නට පුළුවනි. එවැනි නියෝජිත තත්ත්වයක් තිබෙන මන්ත්‍රීවරයෙකු හැටියට මේ විධියේ කරුණු සඳහන් කරන්නට සිදු වීම ගැන මා කනගාටු වෙනවා.

පසුගිය කාලයේදී බෙන්තර ගඟ ව්‍යාපාරය යටතේ තැනින් තැන වේලි වගයක් බඳින්නට පටන් ගත්තා. ගරු ඇමතිතුමාත් එහි වේල්ලක් බඳින්නට ගියා. එතුමා ඒ සඳහා එහි යන බව ඒ ප්‍රදේශයේ මහජන මන්ත්‍රීවරයා වශයෙන් දැනට පෙනී සිටින මට යම්තමින්වත් දැනුම් දුන්නා නම් කොහොම හරි මාත් එතුමා සොයා ගෙන එන්නට යනවා යනවාමයි. එහෙත් ඇත්ත වශයෙන්ම එතුමා මට ඒ ගැන යම්තමින්වත් දැනුම් දුන්නේ නැහැ. ඒ එකක්. මේ ගැන මීට පෙරත් කිව්වා.

ගරු ඉඩම් ඇමතිතුමා වරක් "බ්ලූ පිල්මිස්" නමින් හඳුන්වන හෙලුවැලි කොම්පැනියක නියෝජිතයකු සමග ඒ ප්‍රදේශයට ගිහිල්ලා එක්තරා ස්ථානයක බෝක්කුවක් එහෙම විවෘත කරලා සභාවකුත් පවත්වා පැමිණියා. ඒ රැස්වීමේදී මටත් දොස් කීයා තිබෙනවා. මගේ ප්‍රදේශයට මා කිසිම වැඩක් කරන්නේ නැතැයි ඒ රැස්වීමේදී කියා තිබෙනවා. ගරු ඉඩම් ඇමතිතුමා ගැනයි මා සඳහන් කෙළේ. මා ඒ ප්‍රදේශයට වැඩ කරන්නේ නැති බවට එතුමා ප්‍රචාරයක් කර ඇවිත් තිබෙනවා. හෙලුවැලි රූප කොම්පැනියක් කියලයි මා සඳහන් කෙළේ. නියෝජිතයකු සමග ගරු ඇමතිතුමා එහි ගිය බවයි මා කිව්වෙ. නියෝජිතයාගේ නම සඳහන් කරන්නට වුවමනාවක් නැහැ. නම දැන ගන්නට වුවමනා කෙනෙක් ඉන්නවා නම් කරන්නට තිබෙන්නේ 1965 අවුරුද්දේ හැන්සාඩ් වාර්තාව කියවන එකයි. මහර මන්ත්‍රීතුමා (සූරියාරච්චි මයා.) ඉදිරිපත් කළ කතා පුවත ටිකක් කියෙව්වොත් දැනගන්නට පුළුවන් වේවි. ගරු ඇමතිතුමා එදා කෙළේ ඉතාමත් අසාධාරණ, අයුක්ති සහගත වැඩක් බව පමණක් මේ අවස්ථාවේ කියන්නට කැමතියි.

බෙන්තර ගඟ ව්‍යාපාරය මෙතෙක් කල් ප්‍රමාද වීම ගැන කියන්නට ඕනෑ. මා ඒ ගැන සඳහන් කරන්නේ ඇත්ත වශයෙන්ම මහත් කනගාටුවකිනුයි. මා මේ ගරු සභාවට මන්ත්‍රීවරයකු වශයෙන් 1960 දී පළමුවෙන්ම පත් වී ආ දවසේ මා කළ කථා වේදී එවකට ඉඩම් ඇමතිවරයා වශයෙන් සිටි වර්තමාන ඉඩම් ඇමතිතුමාට මේ ගැන සඳහන් කළා. මේ ව්‍යාපාරය කර ගෙන යන්නැයි ඉල්ලා සිටියා.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

ඒක බොහොම උන්දුවෙන් කරගෙන යනවා.

කාරියවසම් මයා.
(திரு. காரியவசம்)
(Mr. Kariyawasam)

ඒ දැන්. එය පටන් ගත්තේ අතුරු මැතිවරණ කාලයේදී. එය මේ තරම් කාලයක් කරන්නට තරම් දෙයක් නොවෙයි. දැන් අවුරුදු අටක් නමයක් වෙනවා. එය ඉක්මනින් පටන් ගන්න ලෙස තමුන්නාන්සේගෙන් මා ඉල්ලා සිටියා. එහෙත් පටන් ගත්තේ ඇතිතාක් පසු කර දමා සිට අතුරු මැතිවරණය සඳහා ගිය අවස්ථාවේදීයි. එය ඉක්මනින් කර අවසන් කරතොත් ඒ ප්‍රදේශයේ පොදු මහජනයාට සහ ඒ ප්‍රදේශයට විශාල සේවයක් සිදු වන බව කියන්නට කැමතියි. එදාට මම ගරු ඇමතිතුමාට බොහොම ගරු කරන්නට කැමතියි.

පසුගිය අවුරුදු පහක කාලය තුළ මගේ ප්‍රදේශයේ ඉඩම් සංවර්ධනය හා සම්බන්ධ පාරවල් තැනීම ආදී වැඩ කටයුතු සම්පූර්ණයෙන්ම අත්හැර දමා තිබෙනවා. මේ තරම් විශාල ජනගහනයක් ඇති මේ තරම් විශාල ප්‍රදේශයක ඉඩම් සංවර්ධන වැඩ කටයුතු සම්පූර්ණයෙන්ම අත්හැර දමා තිබෙනවායයි මා කිව්වොත් තමුන්නාන්සේ පුදුමයට පත් වෙනවා නොඅනුමානයි. එහෙත් ඒකයි වෙලා තියෙන්නේ. පසුගිය අවුරුදු පහේදී. බඹරාන යෝජනා ක්‍රමයට අදාළ පාර සම්පූර්ණයෙන් අත්හැර තිබෙනවා. හොරවාන-ඔකන්ගල පාර සම්පූර්ණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කාරියවසම් මයා.]

යෙන්ම අත්හැර දමා තිබෙනවා. ජනපද යෝජනා ක්‍රම සම්පූර්ණයෙන්ම අත්හැර තිබෙනවා. මේ ප්‍රදේශයට පාරවල් ඉතා මත් අවශ්‍යයි. ඒවා අත්හැර දැමීම කනගාටුදායකයි. දිසාපතිතුමා මෑත කාලයක කුරුදු වැවීමේ ව්‍යාපාර තුනක් පටන්ගෙන තිබෙනවා. එය බොහොම හොඳයි. අලුත් යෝජනා ක්‍රමයක්, පිටුගල යෝජනා ක්‍රමය නමින් ඇති කර තිබෙනවා. ඒ ගැනත් මා ස්තුතිවන්ත වෙනවා. නවත් එක් කාරණයක් සඳහන් කරන්නට තිබෙනවා. ගිංගඟ, නිල්වලා ගඟ, කළුගඟ යන මේ යෝජනා ක්‍රම ගැන විශේෂඥයන් වාර්තාවක් පිට කර තිබෙනවා. ඒ වාර්තාවේ පිටපත් ඒ ප්‍රදේශවල මන්ත්‍රීවරුන්ටවත් ලැබෙන්නට සලස්වන්නය කියා මා ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම ගරු රාජ්‍ය ඇමතිතුමාට කියනවා මුද්‍රණාලයෙන් එය මුද්‍රණය කර දෙන්නය කියන්නෙයි කියා. මේ යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් අපි අදුරෙහි තබා තිබෙනවා. අපි ඒ පොත කාගෙන් හෝ ඉල්ලා ගන්නට ඕනෑ. පොත් දෙකක් මුද්‍රණය කර තිබෙනවා. ඒ පොත් දෙක ඒ ප්‍රදේශයේ මන්ත්‍රීවරුන්ටවත් ලැබෙන්නට සලස්වන්නය කියා මා කියා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කට්ටිකරුවන්ගේ ගෙවල් ආඩාර පිළිබඳවත් සුදුසු වැඩ පිළිවෙළක් සකස් කරන්නය කියා මා මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා. රුපියලේ අගය අඩු වී තිබෙනවා. ජීවන වියදම ඉහළ ගොස් තිබෙනවා. ද්‍රව්‍ය මිල වැඩි වුණා. ගොඩනැගිලි උපකරණවල මිලත්, විශේෂයෙන්ම f පික්ස් ක්‍රමය නිසා, ඉහළ ගියා. කුලිකරුවන්ගේ පඩිය වැඩි වුණා. තත්ත්වය එසේ තිබියදී තව මත් ගෙයක් සාදා ගැනීමට දෙන්නේ මීට අවුරුදු දහයකට පහළොවකට කලින් තිබුණු ක්‍රමයටම රුපියල් 1,000 ක මුදලක් පමණයි. ඒ මුදලෙන් දැන් ඒ කටයුත්ත කරන්නට බැහැ. ඒ නිසා කට්ටිකරුවන්ට ගෙවල් සඳහා දෙන ආඩාර මුදල වැඩි කරන හැටියට මා ඉල්ලා සිටිනවා.

එමෙන්ම මේ අයට ගෙයක් සාදා ගැනීමට දෙන වැඩිම කාලය අවුරුදු 2 යි. නැත්නම් 3 යි. සමහර ගම්වැසියන්ට ලෙඩදුක් හැදෙනවා. මා දන්නා එක මිනිහෙක් අවුරුදු 4 ක් ම වාතගාය හැදී බොහොම අමාරුවෙන් ජීවත් වුණේ. අවුරුදු 4කට පසු ඔහු සනීප වී නැවත අර ගෙයි වැඩ පටන් ගෙන ආඩාර මුදල් ඉල්ලූ විට දෙන්නට ක්‍රමයක් නැහැ කීවා. එවැනි අය දහයක් පහළොවක් පමණ අපේ ගම්වල සිටිනවා. ප්‍රධාන කට්ටිකරුවා අසනීප වූ විට වැඩ ඇනහිටිනවා. ඒ නිසා ගෙවල් සඳහා ආඩාර මුදල් දෙන කාලසීමාව වැඩි කරන ලෙස මා ඉල්ලා සිටිනවා. එමෙන්ම එක් තරා හතරැස් අඩි ප්‍රමාණයක් දී ඒ අනුව ගෙය හදන්නය කියා නියමයක් කරනවා.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி. சில்வா)
(The Hon. C. P. de Silva)
වැඩි වුණාට කමක් නැහැ.

කාරියවසම් මයා.
(திரு. காரியவசம்)
(Mr. Kariyawasam)
එහෙම වෙනවා නම් මා කැමතියි. එහෙත් වැඩි වුණත් මුදල් දෙන්නේ නැහැ. ඒ ගැන ගාල්ලේ දිසාපතිතුමා සමග මා කිප වරක් තර්ක කර තිබෙනවා. අඩි සියයක් දෙසියයක්, වැඩි වුණොත් මුදල් දෙන්නේ නැහැ. දෙනවා යයි ගරු ඇමතිතුමා කියනවා නම් කරුණාකර චක්‍ර ලේඛනයක් පිට කරන හැටියට මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තවත් කරුණක් තිබෙනවා. ඒ ප්‍රදේශයේ අක්කර 25, 50, 75, 100, 150 ආදී වශයෙන් මධ්‍යම පන්තියට දී තිබෙන ඉඩම් තිබෙනවා. ඒවා දීලා අවුරුදු 30 ක් 35 ක් පමණ වෙනවා. ඒ ඉඩම්වලට ආඩාර මුදලුත් ලබා ගෙන තිබෙනවා. එහෙත් ඒ එකම ඉඩමක්වත් වගා කර නැහැ. සමහර ඉඩම්වල අක්කරයක් දෙකක් තේ වගා කර අත්හැර දමා තිබෙනවා. ඒවා සංවර්ධනය කර තිබෙනවාය කියා නිලධාරීන් රිපෝර්තු කර තිබෙනවා. එහෙත් ඒවා සංවර්ධනය නොකර අත්හැර දමා තිබෙනවා. ඒ නිසා ඒ ඉඩම් දුප්පතුන් අතර අක්කරය බැගින් බෙදා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා. ඒ ඉඩම් එකක්වත් භුක්ති විඳින්නේ නැහැ. එය ඒත්තු ගන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වන්නට පුළුවන් තත්ත්වයක් තිබෙනවා. වැවුණු භූක්ති විඳිනු ලබන අක්කර යකින් ගම් සභාව රුපියල් 5 ක් වෂීය කට අය කරනවා. ඒ නිසා අවුරුදු 8 කින් 10 කින් පමණ ඒ බද්ද ගෙවා නැත්නම් එසින් පෙනෙන්නේ ඒ ඉඩම් සංවර්ධනය නොකළ භූක්ති නොවිඳින ඉඩම් බවයි. සමහර විට මෙය ආරංචි වුණාම හෙට අනින්දා ඒ මුදල් ඔක්කොම ගෙවන්නට පුළුවන්. ඒ නිසා එම බද්ද මෙතෙක් කල් නොගෙවා ඇති ඉඩම් ආපසු අර ගෙන ඒ ප්‍රදේශයේ සිටින ඉඩම් නැති දුප්පත් අය අතර බෙදා දෙන හැටියට මා ඉල්ලා සිටිනවා.

33 ශ්‍රී 5676 දරන ලැන්ඩ් රෝවර් රථය අනිසි ලෙස පාවිච්චි කළා යයි චෝදනා කොට මේ මණ්ඩලයේ සේවය කළ රියැදුරකු වූ බී. වී. පියසේන මහතා අස්කර තිබෙනවා. මේ සිද්ධිය ඇති වී දැන් බොහෝ කාලයක් ගත වී ඇතත් මේ අවුරුද්දේ ඔහු සේවයෙන් අස්කර තිබෙනවා. මේ රියැදුරා ඒ ලැන්ඩ් රෝවර් රථය ඔහුගේ ගෙදර ගෙන ගොස් පාවිච්චි කිරීම ඔහුට විරුද්ධව තිබුණු චෝදනාවයි. මේ රියැදුරාට මොළේ අමාරුවක් හැදුණා. කොටින්ම ඔහුට පිස්සු හැදුණා. ඒ පිස්සුව නිසා ඔහු ඒ රථයත් රැගෙන ගමට ගියා. මේ ගැන ගෙදර පිරිස කලබල වුණා. ඔහුගේ තත්ත්වය අවබෝධ කර ගෙන ඔහුට වෙදකම් කළා. මාස ගණනාකින් පසුව ඔහුට සුවය ලැබුණා. උෂ්ණාධික ප්‍රදේශයක අවුරුදු දහයක් පහළොවක් සේවය කිරීම නිසා එවැනි අසනීපයක් ඔහුට ඇති වුණා විය හැකියි. ඔහුගේ අසනීපය පිළිබඳව වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කරන ලෙස පාලක පක්ෂය ඉල්ලා සිටියා. ඒ අනුව වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළා. දැන් ඔහු සේවයෙන් පහ කරනු ලැබ සිටිනවා. ඒ නිසා දැන් ඔහු අන්‍යථ තත්ත්වයකට වැටිලා. ඔහුට අර්ථසාධක අරමුදලින් රුපියල් දහ දෙලොස් දාහක් ලැබෙන්නට වුවමනායි. කෙසේ වුණත් මේ විධියට ඔහු සේවයෙන් පහකර දැමීම අසාධාරණයි. කෙනකු අසනීප වී අසරණ තත්ත්වයකට පත් වුණාට පසුව සේවයෙන් අස් කර දැමීම යුක්තිසහගත නැහැ. ඒ නිසා ඒ ගැන සොයා බලන ලෙස මා ඉල්ලා සිටිනවා.

බෙන්තර-ඇල්පිටිය ප්‍රදේශය ගරු ඇමතිතුමාට හොඳට හුරු පුරුදු ප්‍රදේශයක්. ගරු ඇමතිතුමා උපන් ප්‍රදේශයේ මිනිසුන් දියුණු වන්නට බොහොම කැමතියි. ඒ වාගේම ඒ ප්‍රදේශයේ සිටින්නේ හොඳ මිනිසුන් බවත් කියන්නට කැමතියි. ඒ නිසා ඒ මිනිසුන්ගේ අනාගතය ගැන කල්පනා කර බලා කිසියම් සේවයක් කරන මෙන් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලනවා.

බලපිටිය කොට්ඨාශයේ එක්තරා ස්ථානයකට ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ මුදල්වලින් පාඨශාලා ගොඩනැගිල්ලක් දී තිබෙනවා. මා නියෝජනය කරන කොට්ඨාශයේ බමරවාන වැනි ගම්වල ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් දුන් ඉඩම්වලයි, මිනිසුන් පදිංචි වී සිටින්නේ. ඒ දුප්පත් මිනිසුන්ගේ දරුවන් තමයි ඒ ප්‍රදේශයේ පාඨශාලාවලට යන්නේ. ඒ පාඨශාලා ගොඩනැගිලි කීපයක්ම අද හෙට කඩා වැටෙන තත්ත්වයක පවතිනවා. අධ්‍යාපන දෙපාර්තමේන්තුවට මුදල් නැතිකම නිසාදෝ ඒ පාඨශාලා ගොඩනැගිලි සාදන්නට ක්‍රියා කරන බවක් පෙනෙන්නේ නැහැ. ඒ නිසා ඒ ප්‍රදේශයේ දරුවන්ගේ අධ්‍යාපනය ගැන කල්පනා කර බලා විද්‍යාගාරයක් තැනීමට මුදල් වෙන් කර දෙන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. මේ කටයුත්ත කිරීමට එතුමා නොකැමති වෙතැයි මා හිතන්නේ නැහැ.

අ. භා. 5.21

එම්. ඒ. අබ්දුල් මජීඩ් මයා. (පොතුවිල්)
(ஜனாப் எம். ஏ. அப்துல் மஜீத்—பொத்துவில்)
(Mr. M. A. Abdul Majeed—Potuvil)

I should like to bring two or three problems regarding the Amparai District to the notice of the Hon. Minister.

The Government rightly brought in a change of policy in that the minor irrigation schemes that had been handled by the Commissioner of Agrarian Services should be handed over to, and come under, the Irrigation Department. This was brought to the notice of the Amparai District

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අබ්දුල් මජීඩ් මයා.]

Agricultural Committee, and nearly 143 items that were on the investigation and construction list of the District Agricultural Committee of the Amparai District were handed over to the Irrigation Department.

Now there is one snag. Though the Irrigation Department had taken over the responsibility—I am speaking of the Gal Oya Left Bank River Division as well as the Channel Division—money has not been provided for these items. Either you must get the Commissioner of Agrarian Services to hand over the funds necessary to complete these minor irrigation works that had been given over to the Irrigation Department or you must provide the money and see to it that these works are completed. These are not big works. They bring in immediate benefit. Normally, if this change had not taken place, all these items would have been constructed and finished by the end of this year. I do hope the Hon. Minister will give the necessary instructions.

ගරු සී. පී. ද සිල්වා

(கௌரவ சீ. பீ. டி சில்வா)

(The Hon. C. P. de Silva)

I shall do so.

එම්. ඒ. අබ්දුල් මජීඩ් මයා.

(ஜனாப் எம். ஏ. அப்துல் மஜீது)

(Mr. M. A. Abdul Majeed)

There is another problem. In my humble opinion the last Government was very short-sighted in bringing about a reversal of policy in that field channels should be constructed by the colonists in the major colonization schemes. As a result of that policy we saw that paddy production in the major colonization areas did not come up to expectation. I believe the National Government rightly gave priority to food production, reversed this policy and determined not merely that the field channels in major colonization schemes and irrigation schemes should be provided by the Government but also brought in a welcome measure in that crash programmes for the provision of irrigation facilities should be undertaken in major colonization and irrigation schemes like the Gal Oya Scheme.

In the Gal Oya Scheme—I am referring to the Left Bank Channel Division—there are still about 20 miles of irrigation channels to be constructed to provide irrigation facilities to colonists in Block J, Samanthurai area. When I discussed this with the Irrigation Department officials they told me that when the G.O.D.B. handed over the Left Bank area to the Irrigation Department they had almost made them understand that all these irrigation facilities had been provided. Now the Irrigation Department knows—and they have agreed at the meeting of the District Agricultural Committee —that more than 20 miles of channels should be provided to benefit 6,000 acres of paddy land. There is really an item in the Budget which refers to the provision of additional irrigation facilities for both Block E and Block J in the Left Bank area, Amparai District. I humbly request the Hon. Minister to kindly see that the remaining channels are constructed this year, because our experience in Gal Oya has been that, wherever these crash programmes have been undertaken and additional irrigation facilities provided, they have had an immediate impact on paddy production resulting in increased yields.

You would see from statistics taken from the Amparai District that we came second in the Island as far as buying paddy under the G.P.S. was concerned. If these snags are attended to, I believe we could give you more paddy.

Then, the Government Agent, Amparai District, had written to the Additional Permanent Secretary early last year requesting that a crash programme of improvements to irrigation facilities be undertaken in the River Division of Gal Oya Valley, what is popularly known as the Pattipalai Aru Scheme, and also in the Panama Pattu D. R. O's Division,

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

where you get nearly 9,000 acres of paddy fields. The Government Agent had supplied all the data to the Permanent Secretary. If the Hon. Minister would kindly request his Permanent Secretary to pursue this matter and see to the request of the G.A., Amparai this would result not only in increased yield of paddy, which would benefit the whole Island, but also help the peasants of Panama Pattu.

There is another matter which I wish to bring to the notice of the Hon. Minister and that is about the augmentation scheme of Laugalla Tank. The D.A.C. of the Amparai District allotted number one priority for this scheme and the then Director of Irrigation, Mr. Silva Gunasekera, visited the area and estimates were prepared and he told me that the cost of augmenting the tank could be recovered within a period of ten years.

But, about two years back the D.A.C., Amparai was informed that in view of the Heda Oya Scheme the augmentation of the Laugalla Tank was being removed from the D.A.C. priority list. Now, I believe the situation has changed and the Heda Oya Scheme is not going to be a reality in the foreseeable future.

Since it is the opinion of your irrigation engineers that the full money that will be spent on augmenting the Laugalla Tank could be recovered within a period of ten years, I would earnestly request the Hon. Minister to see that this scheme, which was about to get into the Estimates two years back when it was stopped, be reconsidered. I must say that about 9,000 acres of paddy land in the Panama Pattu D.R.O's division will be benefited when this scheme is completed.

This is one area where there are Sinhalese villages which are the most backward in the Island. They should have been brought under the Kandyan Peasantry Commission. I do not know why that did not happen. These villagers have a feeling that they are a sort of lost people.

I would, therefore, once again urge upon the Hon. Minister to start work on the augmentation scheme of the Laugalla Tank.

I must also thank the Hon. Minister for having ordered the Kanjukudithan Aru scheme in the Akkaraipattu South area to be taken in hand. This is almost nearing completion.

The Hon. Minister promised to visit my electorate and gave me a date last year. Since then he has been postponing his visit. I do not want to worry him much, but at least he must come and see what his department is doing in that place. I want the Hon. Minister to give me a date and visit my electorate early so that he can see for himself the work that has been done during the last few years.

අ. භා. 5.30

යාලෙගම මයා.

(திரு. யாலேகம)

(Mr. Yalegama)

මගේ කොට්ඨාශයේ ඉඩම් ප්‍රශ්නයත් ජනපද ප්‍රශ්නයත් සම්බන්ධයෙන් කරුණු කීපයක් ඉදිරිපත් කරන්නට මා බලාපොරොත්තු වෙනවා. ජනපද වැසියන්ට දෙන ආධාර මුදල් සම්බන්ධයෙන් පළමුවෙන් මතක් කළ යුතුව තිබෙනවා. ඉඩම් දෙපාර්මේන්තුවෙන් දෙන සැලැස්ම අනුව ගෙයක් හදා ගැනීම සඳහා ඉඩම් කට්ටිකරුවකුට රජයෙන් රුපියල් 1,000 ක ආධාර මුදලක් ලැබෙනවා. මේ ආධාර දීමේ ක්‍රමයෙහි තිබෙන අසතුටුදායක, කණගාටු දායක තත්ත්වය ගැන මා නොයෙක් අවස්ථාවල මෙම ගරු සභාවෙහිදී ගරු ඇමතිතුමාට කරුණු පෙන්වා දී තිබෙනවා. රත්නොට ඡන්දදායක කොට්ඨාශය ජනපද රාශියක් තිබෙන ප්‍රදේශයක්. ඉඩම් දෙපාර්මේන්තුවෙන් දෙන ලද සැලැස්ම අනුව ගෙවල් හදා අවුරුදු හය හත ගත වී තිබුණත් තවමත් රජයේ ආධාර මුදල නොලැබුණු කට්ටිකරුවන් විශාල ගණනක් එහි සිටිනවා. කෙනකු ඉඩම් අක්කර කාලක් බාගයක් ලබා ගන්නේ ඔහුගේ දුප්පත් කම නිසයි. එය ලබා ගත්නාට පසු, රජයෙන් දෙන සැලැස්මක් අනුව ගෙයක් හදා ගැනීමට ඒ තැනැත්තා කොසිතරම් මුදලක් ණය විය යුතුද යන්න වග තමුන්නාන්සේලා දන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[යාලෙගම මයා.]

නවා. ණය වී ගෙයක් හදා අවුරුදු ගණනක් යන තුරුත් රජයේ ආධාර මුදල ඔහුට ලැබෙන්නේ නැත්නම් ඔහු මොන තරම් අමාරු තත්ත්වයකට පත් වේදැයි ගරු ඇමතිතුමා කල්පනා කර බලන්න. ජනපද කට්ටිකරුවන් මේ ආධාර මුදල් සම්බන්ධයෙන් ආදායම් පාලක නිලධාරිතුමාටත් දිසාපතිතුමාටත් නිතර නිතර මැසිවිලි කියා තිබෙනවා. එම නිසා ගරු ඇමතිතුමා මේ ගැන විශේෂ සැලකිල්ල යොමු කොට, ආදායම් පාලක නිලධාරීන් ආදී ඒ අවශ්‍ය නිලධාරීන්ට නියෝග කොට මෙම ආධාර මුදල් හැකි පමණ ඉක්මණින් කට්ටිකරුවන්ට ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

ජනපදවල ජල ප්‍රශ්නය ඊළඟට තිබෙන තවත් ලොකුම ප්‍රශ්නයක්. අවුරුදු 10 ක් 15 ක් පමණ කාලයක් තිස්සේ ජනපදවල පදිංචිව සිටින වැසියන්ගේ අවශ්‍ය ජල ප්‍රශ්නය තවමත් විසඳා නැහැ. ජනපද සඳහා ඉඩම් තෝරා ගැනීමේදී එහි ජල පහසුකම් තිබේද ජල පහසුකම් සැලැස්වීමේ මාර්ග තිබේද යන කරුණු විශේෂයෙන් සොයා බැලිය යුතුයි. එසේ නොකර, ඉඩම් තිබෙන පළියට, කඳුහෙල් සහිත ඉඩම් කට්ටිකරුවන්ට දීමෙන් ඔවුන්ට මහත් හිරිහැරයකට මුහුණ පාන්නට සිදු වෙනවා. රත්තොට ආසනයේ ජනපද 75ක් පමණ තිබෙනවා. එයින් 30 ක 40 කම තවමත් ජල ප්‍රශ්නය විසඳී නැහැ. එම නිසා, මේ සම්බන්ධවත් ඉඩම් දෙපාර්තමේන්තුවට නියෝග කොට මෙම ජනපද වැසියන්ගේ ජල ප්‍රශ්නය හැකි ඉක්මනින් විසඳන ලෙස මා ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

සමහර ජනපද කට්ටිකරුවන්ට ඔවුන්ගේ ඉඩම් සඳහා බදු ඔප්පු නොදීම අනෙක් ප්‍රශ්නයයි. සමහර කට්ටිකරුවන් අවුරුදු 10, 15 ඉඩම්වල පදිංචි වී සිටින නමුත් ඔවුන්ට බදු ඔප්පු ලැබී නැහැ. මේ තත්ත්වය නිසා අද නොයෙක් විධියේ අයථා වැඩ සිදු වන බවත් ගරු ඇමතිතුමාට විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ. බදු ඔප්පු නො දෙන නිසා සමහර අය ඉඩම් අල්ලාගෙන ඒවා වෙනත් අයට විකුණනවා. එම නිසා හැකි තරම් ඉක්මනින් ඒ ඉඩම් කට්ටිකරුවන්ට බදු ඔප්පු දීමට වැඩ පිළිවෙළක් සකස් කරන ලෙස මා ඉල්ලා සිටිනවා. දැනට එම බදු ඔප්පු දීම් සිදු වන්නේ ඉතා හෙමිහිටියි. එම නිසා ඒවා ලබා දෙන ලෙස කට්ටිකරුවන් නිතරම අපට කියනවා. ඒ ගැනත් ඇමතිතුමාගේ සැලකිල්ල යොමු වේයයි මා බලාපොරොත්තු වෙනවා.

ඉඩම් හරියාකාර මැන මායිම් ගල් නොතැබීම නිසා ජනපදිකයන් අතර නිතරම ආරාවුල් ඇති වී, ලේ වැගිරීම් සිදු වී උසාවි යන්නට පවා සිදු වෙනවා. සමහර මායිම් අද තිබුණු තැන නොවෙයි, හෙට තිබෙන්නේ. සමහරුන්ගේ මායිම් වැටවල් අඩියෙන් අඩිය ඉදිරියට යනවා. ඉඩම් බෙදීමේදී හරියාකාර මැන මායිම් ගල් තබනවා නම් මෙවැනි ආරාවුල් ඇති වන්නේ නැහැ. එම නිසා ඒ ගැනත් වැඩ පිළිවෙළක් යොදන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඒ ඒ ප්‍රදේශවල ජනපද ඇති කළාට ප්‍රදේශයේ ගම්කාර්ය සභාවලින් ඒවායේ දියුණුවට කිසිම රුකුලක් ලැබෙන්නේ නැහැ. ඒ ජනපදවල පාරවල් හා ජල ප්‍රශ්නය විසඳීම සම්බන්ධයෙන් කම්කාර්ය සභාපතිවරුන් කීප දෙනකු සමගම මා සාකච්ඡා කර තිබෙනවා. ඒ ජනපදවල් දියුණු කිරීම සඳහා ඉඩම් දෙපාර්තමේන්තුවෙන් ආධාරයක් නොලැබෙන නිසාත්, එම ජනපද අයත් වන්නේ ඉඩම් දෙපාර්තමේන්තුවට නිසාත්, එම ජනපද සඳහා ගම්කාර්ය සභා නියෝජිතයන් පත් වුණත් ඒවාට ආධාර දෙන්නට ඒ ගම්කාර්ය සභාවලට පුළුවන්කමක් නැතැයි ඒ අය කියනවා. පළාත් පාලන ආයතනවල දියුණුව සඳහා වාර්ෂිකව පළාත් පාලන අමාත්‍යාංශයෙන් ආධාර මුදලක් දෙන්නා වාගේ, ඒ ජනපදවල දියුණුවට අවශ්‍ය වැඩ කිරීම සඳහා ඉඩම් දෙපාර්තමේන්තුවත් ඒ ඒ ගම්කාර්ය සභාවලට වාර්ෂිකව ආධාර මුදලක් දෙනවා නම් එම ජනපදවල පාරවල් හා ජල ප්‍රශ්න පහසුවෙන් විසඳන්නට එම ගම්කාර්ය සභාවලට පුළුවන්කම ලැබෙන බව මේ අවස්ථාවේදී පෙන්වා දෙන්නට කැමතියි.

තවත් කාරණා දෙකක් කියන්නට තිබෙනවා. එන්සාල් ඉඩම් අක්කර 2,000ක් පමණ රත්තොට කොට්ඨාශයේ තිබෙනවා. එන්සාල් වැවීම සඳහා සමුපකාර සමිතියක් අප ආරම්භ කර තිබෙනවා. අර එන්සාල් ඉඩම් අක්කර 2,000 ඒ සමුපකාර සමිතියට ලබා දෙන ලෙස ඉල්ලීමක් කර තිබෙනවා. ඒ ඉල්ලීම ඉෂ්ට කරන බවට රජය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පොරොන්දුවකුත් දී තිබෙනවා. එහෙත් දැනටමත් වෙනත් කොට්ඨාශවල මිනිසුන් පැමිණ එම එන්සාල් ඉඩම්වලින් අක්කර පණහ, සියය අල්ලාගෙන එන්සාල් වැවීම ආරම්භ කර තිබෙනවා. දැනටමත් සමුපකාර සමිතියට දී ඇති අක්කර 500 යේ එන්සාල් වගා කළාට පසුව තවත් අක්කර 500 කුත්, එහිත් වගා කළාට පසු තවත් අක්කර 500 කුත් යනුවෙන් පියවරෙන් පියවරට අක්කර 2,000 ම ඒ සමුපකාර සමිතියට ලබා දෙන බවටයි, රජය පොරොන්දු වී තිබෙන්නේ. එන්සාල් වැවීම සඳහා එම සමුපකාර සමිතිය වෙනුවෙන් වෙන් කර ඇති ඉඩම් දැනටමත් වතු කරයේ සමහර උදවිය—විශේෂයෙන් ඉන්දියානුවන්—විසින් අල්ලාගෙන තිබෙන බව මෙම අවස්ථාවෙහිදී මතක් කරන්නට කැමතියි. ඔවුන් අක්කර 25, 30 බලහත්කාරයෙන් අල්ලාගෙන එන්සාල් වැවිල්ල කරගෙන යනවා. සමුපකාර සමිතිය මගින් ගෙන යන වැඩ පිළිවෙළින් විශාල සේවාවක් ඉටු වන බව කිවයුතුයි. එම සමිතිය මගින් අක්කර 5, 10 යන ප්‍රමාණයට ඒ ඉඩම් සාමාජිකයන් අතර බෙදා දෙනවා. ඔවුන් එම ඉඩම්වල එන්සාල් වැවීමේ කටයුතු කරනවා. දැනටමත් අක්කර 500 ක් පමණ එන්සාල් වැවීම සඳහා 75ක් 80ක් පමණ සාමාජිකයන් අතර බෙදා දී තිබෙනවා. තවත් අක්කර 500 ක් ලැබුණායින් පසු වෙනත් සාමාජිකයන් 100 ක් පමණ අතරේ ඒවා බෙදා දෙන්නට බලාපොරොත්තු වෙනවා. ඒ අන්දමට සෑම කෙනෙකුටම සෑහෙන අන්දමේ ආදායමක් එමගින් ලබා ගන්නට මාගී සලස්වා දී තිබෙනවා. එහෙත් අද නොයෙකුත් අන්ද මේ විජාතිකයන් පැමිණ අපේ ආසනයේ එන්සාල් වවන්නට සුදුසු ඉඩම් අක්කර 25, 50 බලහත්කාරයෙන් අල්ලාගෙන සිටිනවා. ඒ අනුව කටයුතු සිදුවුණොත් සමුපකාර සමිතිය ලබා ගන්නට බලාපොරොත්තු වන ඉඩම් ප්‍රමාණය ලබා ගන්නට නොහැකි වෙනවා. එම නිසා පිටස්තර උදවියට ගොස් ඉඩම් අල්ලාගෙන වවන්නට ඉඩ දී තිබීම සම්පූර්ණයෙන් නවත්වා දමන ලෙස නියෝග කරන මෙන් මා ඉල්ලා සිටිනවා. එම ඉඩම් අවලංගුකොට නැවත ඒවා රජයට පවරා ගෙන මෙම සමුපකාර සමිතියේ ප්‍රයෝජනයට දීම සඳහා එම ඉඩම් වෙන් කර තබන ලෙස මාතලේ දිසාපති වරයාට නියෝග කරන මෙන් මා නැවත වරක් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ සමාජයෙහි සිදු වන ඉතාම කනගාටුදායක සිද්ධියක් ගැන කියන්නට කැමතියි. මගේ ආසනයටත් එම කනගාටුදායක සිද්ධිය බලපාන බව කිවයුතුයි. මගේ ආසනයේ සැඩොල් කුලයට අයත් පවුල් කීපයක් පදිංචිව සිටින ගමක් තිබෙනවා. එම කුලයේ උදවියට අද සිදු වී තිබෙන්නේ ඉතාම කනගාටුදායක අන්දමේ තත්ත්වයකට මුහුණ දෙන්නටයි. යම්කිසි ජනපදයක ඔවුන් පදිංචි කෙරෙව්වත් ඔවුන්ට එම පරිසරයෙහි ජීවත් වන්නට අමාරුයි. අනිකුත් කුලවලට අයත් උදවිය ඔවුන්ට හිරිහැර කරදර කරනවා. ඉඩම් කච්චේරි පවත්වා එම උදවියට ඉඩම් ලබා දෙනවාටද අනිකුත් උදවිය විරුද්ධයි. අනිකුත් කුලවල උදවිය සැඩොල් කුලයෙහි අය සමග එකට ජීවත් වන්නට කැමති නැහැ. එම නිසා ඔවුන් පිළිබඳ මෙම ප්‍රශ්නය විසඳන්නට බොහෝ අමාරු වී තිබෙනවා. තමන් වැටී සිටින මෙම කනගාටුදායක තත්ත්වයෙන් මිදීම පිණිස එම සැඩොල් කුලයට අයත් උදවිය විසින් එක්තරා ඉල්ලීමක් කර තිබෙනවා. දඹුල්ල වැනි ප්‍රදේශයකින් වැවක් යටතේ වෙනම අස්වද්දාගෙන ජීවත් වීම සඳහා වෙනම ඉඩම් ප්‍රමාණයක් ලබා දෙන්නට කටයුතු සලස්වන හැටියටයි ඔවුන් ඉල්ලා සිටින්නේ. පවුලකට අක්කර 5 බැගින් ලැබුණත් ඔවුන්ට ඇති. එතකොට එය ඔවුන්ට සීමාවුණු වෙනම ගමක් හැටියට සලකන්නට පුළුවනි. දැන් තිබෙන තත්ත්වය අනුව ඔවුන්ට තම දරුවන් සඳහා හොඳ අධ්‍යාපන පහසුකම් ලබා ගන්නට ඉඩක් නැහැ. ඔවුන් ජීවත් වන්නේ හිහා කෑමෙනුයි. ඒ හැරෙන්නට වෙන කිසිම ආදායමක් ඔවුන්ට ඇත්තේ නැහැ. සමාජය විසින් ඔවුන් සම්පූර්ණයෙන්ම කොන් කර තිබීමයි එයට හේතුව. රත්තොට ආසනයේ කළල්පිටිය ගමෙයි මේ උදවිය දැනට පදිංචිව සිටින්නේ. රජයෙන් දෙනු ලබන ඉඩම් කට්ටිවල ඒ අයට ජීවත් වන්නට අනික් කුලවල උදවිය ඉඩ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[යාලෙගම මයා.]

දෙන්නේ නැහැ. ඒ අය ඔවුන්ට නොයෙකුත් අන්දමේ හිරිහැර කරදර කරනවා. ඔවුන් සම්පූර්ණයෙන්ම වාගේ කොන් කර දමා තිබෙනවා. එම නිසා කරදරයක් හිරිහැරයක් නැතුව ඔවුන්ට ජීවත් වීම සඳහා —

ගරු සී. පී. ද සිල්වා

(கௌரவ சீ. பீ. டி சில்வா)

(The Hon. C. P. de Silva)

පවුල් කීයක් සිටිනවාද?

යාලෙගම මයා.

(திரு. யாலேகம)

(Mr. Yalegama)

පවුල් 15 ක් 20 ක් විතර සිටිනවා.

දඹුල්ල වැනි ප්‍රදේශවල අත්හැරීගිය ඉඩම් ඕනෑතරම් තිබෙනවා.

ගරු සී. පී. ද සිල්වා

(கௌரவ சீ. பீ. டி சில்வா)

(The Hon. C. P. de Silva)

මොන වැව යටතේ ද ඒ අය අස්වද්දා ගෙන ජීවත් වන්නට කල්පනා කරන්නේ? තමුන්නාන්සේට පුළුවන්ද, ඒ අය ඉල්ලා සිටින වැව් ප්‍රදේශය කුමක්ද කියා මට පසුව ලියා දෙන්නට?

යාලෙගම මයා.

(திரு. யாலேகம)

(Mr. Yalegama)

මා එය තමුන්නාන්සේට ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා. ඒ අයට අක්කර 5 බැගින් දුන්නත් ඇති. කොහෙන් නමුත් අත්හරුණු ඉඩම් කට්ටි ප්‍රමාණයක්—දඹුල්ල වැනි ප්‍රදේශයකින් හොඳයි—වෙන් කර දී ඔවුන් වෙනුවෙන් වෙනම ජනපද ව්‍යාපාරයක් ඇති කරන මෙන් ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. යම්කිසි වැවක් යටතේ තිබෙන ඉඩම් ප්‍රමාණයක් ගැන සොයා බලා හැකි ඉක්මණින් තමුන්නාන්සේට දන්වන්නම්.

අ. භා. 5.45

තුඩාවේ මයා.

(திரு. துடாவ)

(Mr. Tudawe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගල් ඔය ව්‍යාපාරයේ දෙවන පියවර සඳහා රුපියල් 75,00,000 ක පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබෙනවා. මේ යෝජනාව යටතේ කථා කළ අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය වික්‍රමසිංහ) fපාමර් මහත්මයාගේ වාර්තාව මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නට ගරු ඇමතිතුමා පොරොන්දු වූ නමුත් එය ඉදිරිපත් නොකළ බවත්, ගල්ඔය ව්‍යාපාරය යටතේ කෙරී ගෙන යන්නාවූ වැඩ කටයුතු ගැන අපට සෑහෙන විස්තරයක් ලබා ගැනීමට නුපුළුවන් බවත් ප්‍රකාශ කළා. ඒ වාගේම, ගල්ඔය ව්‍යාපාරය අසාර්ථක අවාසිදායක ව්‍යාපාරයක් බවත් එතුමා පෙන්වා දුන්නා.

ගරු ඇමතිතුමා මේ යෝජනාව ඉදිරිපත් කරමින් එතුමා විසින් පත් කරන ලද කමිටුවක් ගැනත් සඳහන් කරන්නට යෙදුණා. ජේ. ඒ. අමරතුංග මහත්මයාගේ නායකත්වය යටතේ කමිටුවක් පත් කර තිබෙනවා. ඒ කමිටුවේ වාර්තාව මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවාද කියා මා දැනගන්නට සතුටුයි. ඇත්ත වශයෙන්ම ඇමතිතුමාගේ මේ ව්‍යාපාරය සඳ අලියකු හැටියට අපට හඳුන්වන්නට පුළුවනි. මේ ව්‍යාපාරය යටතේ කෙරෙන දූෂණ ලෝකයේ වෙනත් කිසිම රටක කෙරෙන්වාය කියා මා සිතන්නේ නැහැ. ගල්ඔය ව්‍යාපාරයේ තත්ත්වය ගැන අද මුළු රටම දන්නවා. ගල්ඔය කිව්වාම මිනිසුන් ගල් ගැසෙනවා. ගල්ඔය සිදුවන මහජන මුදල් නාස්තිය ගැන සොයාබලන්නට කොමිෂන් සභාවක් පත් කරන මෙන් අම්පාරේ ගරු මන්ත්‍රීතුමා (සෝමරත්න සෙනරත් මයා.) ඉල්ලීමක් කළා මට මතකයි. ගල්ඔය සිදුවන නාස්තිය වැළැක්වීමට, දූෂණ නැවැත්වීමට කොමිෂන් සභාවක් පත් කිරීම අවශ්‍යයි. කොමිෂන් සභාවක් පත් කළොත් ගල්ඔය පමණක් නොවෙයි ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයේත් කෙරෙන නොයෙකුත් දූෂණකම් හෙළි වන බව මා කියන්නට සතුටුයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ සමගම තරුණ ගොවි පොළවල් 40ක් සම්බන්ධයෙන් තවත් රුපියල් 8,50,000 ක වැය ශීර්ෂයක් තිබෙනවා. ඇත්ත වශයෙන්ම තරුණ ගොවි වැඩ පිළිවෙල වැද ගත් වැඩ පිළිවෙළක් හැටියට හඳුන්වන්නට පුළුවනි. මේ රටේ තරුණයින් ගොවිතැනට සම්බන්ධ කර ගැනීමට සෑම පහසුකමක්ම සැලැස්විය යුතුයි. ඔවුන්ට ගොවිතැනට අවශ්‍ය අවි ආයුධ, උපකරණ, පොහොර යනාදී සෑම දෙයක්ම සපයා දිය යුතුයි. තරුණයින් ගොවිතැනට පොළඹවන මෙවැනි තරුණ ගොවි පොළවල් රට පුරාම ආරම්භ කළ යුතුයි. නමුත් මුළු ලංකාවටම අද තිබෙන්නේ තරුණ ගොවි පොළවල් 40 ක් පමණයි. එයින් කීයක් සාර්ථක අන්දමට පවත්වා ගෙන යනවාද කියා අප දන්නේ නැහැ. තරුණ ගොවි පොළවල් නියම අන්දමට ක්‍රියාත්මක කර ගෙන යනවා නම් එයින් රටට විශාල ප්‍රයෝජනයක් අත් වන බව අමුතුවෙන් කියන්නට වුවමනාවක් නැහැ. මේ තරුණ ගොවි පොළවලට කොයි විධියට තරුණයින් තෝරා ගත්තත් ඔවුන්ට කෘෂිකර්මය පිළිබඳව පුහුණුවක් දීම ඉතාම අවශ්‍යයි. එසේ නැතිව පාඨශාලාවලින් පිටවන තරුණයින් කෙළින්ම ගොවිපොළවලට ඇතුළු කිරීමෙන් ඒ තරම් ප්‍රයෝජනයක් ලැබෙන්නෙ නැහැ. එක පළාතකට එක බැගින්වත් කෘෂිකර්ම පාඨශාලා ඇති කරනවා නම් හොඳයි. ගරු ඉඩම් ඇමතිතුමාට ගරු කෘෂිකර්ම ඇමතිතුමා සමග එකතු වෙලා මේ වැඩය කරන්න පුළුවන්. පාඨශාලා පිහිටුවා තරුණයන්ගේ කෘෂිකර්ම දැනීම දියුණු කරනවා නම් තමයි, තරුණ ගොවිපොළවල් ආරම්භ කිරීමෙන් ප්‍රයෝජනයක් ලැබෙන්නේ. කෘෂිකර්ම ඇමතිතුමාගේත් සහයෝගය නැතුව මේ වැඩය කරන්න බැහැ. ඒ නිසා කෘෂිකර්ම ඇමතිතුමාගෙත් සහයෝගය ලබාගෙන තරුණ ගොවීන් හැටියට බඳවා ගන්නා උදවියට කෘෂිකර්ම පුහුණුව ලබා දීමට වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාපලානේ ගොවිපොළ තිබෙන්නේ මාතරට කිට්ටුවයි. එතැන තරුණයන් දහස් ගණනකට කෘෂිකර්මය පිළිබඳව පුහුණුවක් දෙන්නට පුළුවන්. සිංහල අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයෙන් සමත්, කෘෂිකර්මය පිළිබඳව ආශාවක් ඇති අයට කෘෂිකර්මය පිළිබඳව පුහුණුවක් දෙනවා නම්, ඒ අයට කෙළින්ම තරුණ ගොවිපොළවල සේවයේ යෙදෙන්නට බැරි වුණත් කෘෂිකර්ම කටයුතුවල යෙදෙන්නට ඔවුන් තුළ විශාල හැඟීමක් ඇති වෙනවාට කිසිම සැකයක් නැහැ. මේ තරුණ ගොවිපොළවලට තරුණයන් බඳවා ගැනීමේදී ගොවිපොළ පිහිටි ප්‍රදේශයෙන්ම තරුණයන් බඳවා ගැනීම ඉතාමත් අවශ්‍යයි. එහෙත් මගේ ඡන්ද කොට්ඨාශයේ තිබෙන තල්පාවිල තරුණ ගොවිපොළට තරුණයන් බඳවාගෙන තිබෙන්නේ ඒ ප්‍රදේශයෙන් නොවෙයි. ඒ අවට ගම්වලින් වත් නොවෙයි. බලපිටියේ පැත්තේ උදවියයි බඳවාගෙන තිබෙන්නේ. ඇයි මේ විධියට කටයුතු කරන්නේ ?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

එහෙම බඳවාගෙන තිබෙනවා නම් ඒක වැරදියි. මම ඒ ගැන සොයා බලන්නම්.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

සොයා බලා වැරැද්දක් තිබෙනවා නම් හරිගස්සන්නට ඕනෑ. ඒ ප්‍රදේශයේම තරුණයන් ඒ ගොවිපොළට බඳවා ගැනීමට සලස්වන්නට ඕනෑ. තල්පාවිල, කුඹල්ගම, කැකණදුර, යනාදී ගම්වල ගොවිතැනට හිත ඇති රැකීරක්ෂා නැති තරුණයන් ඉන්නවා. ඒ අය ගැන නොබලා, කොට්ඨාශයේ මන්ත්‍රීවත් නොදන්වා, හිතුවක්කාර අන්දමට තමන්ට වුවමනා උදවිය ඒ ගොවිපොළට ඇතුළු කරගෙන තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයේ තරුණ සමිතිවල ලේකම් මහතුන්ගේ ලියුම් අරගෙන එන අය තෝරා ගන්නා බව පොලොන්නරුවේ මන්ත්‍රීතුමා (ලීලාරත්න විජේසිංහ මයා.) කියනවා. වෙන ප්‍රදේශවලින් පැරණුටි මාර්ගයෙන් ඒවාට තරුණයන් ගෙන යනවා.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

මා ඒ ගැන සොයා බලා ගරු මන්ත්‍රීතුමා කියන දේ ඇත්ත නම් ඒ වැරද්ද හරිගස්සනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
එසේ නම් ඒ ගැන ඊට වඩා කථා කරන්නෙ නැහැ. මීට වඩා තරුන ගොවි පොළවල් ඇති කර තරුණයන් වැඩි වැඩි යෙන් ඒවාට අද්දා ගන්නට ඕනෑ. අපි තරුණයන්ට මේ විධියට කියනවා.

සාගර පරදවන මහා වැව් පොකුණු තැනූ—එසවූ කලෙක ලෝවාමහාපායෙ කනු
පරපුරෙකින් පැවත එන ලක් පොළවෙ— දිනූ එම්බා වීර තරුණය ඔබ දැන් පෙරට එනු.

සාගර වැනි වැව් කැප්පවූ, ලෝවා මහා පායට ගල් කනු එසවූ පරපුරකින් පැවත එන සිංහල තරුණයන්ට ඉදිරියට එන්නය කියනවා. තමුන්නාන්සේලා මොන වද කර තිබෙන්නේ? දැන් අපට එන්ට කියන්නේ තමුන්නාන්සේලාගේ ආණ්ඩුව බිඳ දමන්ටද? ඒ ගල් කණු එසවූ, ඒ සාගර වගේ වැව් කැපූ වීරවරයින්ගෙන් පැවත එන තරුණයන්ට අද සිදුවී තිබෙන්නේ ඔවුන්ට කිසිම සැලකිල්ලක් නොදක්වන, ගොවිතැනට අතහිත දෙන්නට ලැහැස්ති නැති, මේ ආණ්ඩුව පෙරළා දමන්නටයි. ඒ තරුණයන්ට අපට අද ආයාචනා කරන්නට සිදු වී තිබෙන්නේ මේ ආණ්ඩුව පෙරළා දමන්නට පෙරමුණට ගන්න කියායි. තමුන්නාන්සේලා ඒ තරුණයන්ට කර තිබෙන්නේ මොනවද?

මහවැලි ගඟ හැරෙව්වාම ඔක්කොම හරි යනවා යයි කියනවා. ආණ්ඩුවේ නායකයා, අගමැතිතුමා අද මොකද කියන්නේ? මහ වැලි ගඟ හැරෙව්වාම රැකී රක්ෂා නැති තරුණයන් නොව රැකීරක්ෂාවලට තරුණයන් හොයා ගන්නට පුළුවන් වේද කියන්ට බැරි බවයි අගමැතිතුමා කියන්නේ. ඒක දවල් හීනයක්. ගංගාවක් හරවා සීඝ්‍රයෙන් වැඩි වේගත යන තරුණයන්ට රැකීරක්ෂා සපයන්නට පුළුවන් නම්, ලෝකයේ හැම රටක්ම ඒක කරයි. හැම රටකම වගේ ගංගාවක් තිබෙනවා. එහෙම නම් ගංගාවක් හැරෙව්වාම ඒ රටේ රැකීරක්ෂා ප්‍රශ්නය විසඳ ගන්නට පුළුවනි. අගමැතිතුමා කියන අන්දමට ගඟක් හරවා මේ ප්‍රශ්නය විසඳන්නට බැහැ. මේ ප්‍රශ්නය විසඳන්නට ධනපති ක්‍රමය නැති කර දමා සමාජවාදී වැඩ පිළිවෙලක් ගෙන යන්නට ඕනෑ. මේ ප්‍රශ්නය විසඳන්නට පුළුවන් වෙන්නේ ඒ මාර්ගයෙනුයි. අපේ රටේ තරුණයන්ට අනාගතයක් ඇති කරන්නට පුළුවන් ඒ මාර්ගයෙන් තමයි. තමුන්නාන්සේලාගෙන් අපට සමාජවාදයක් බලාපොරොත්තු වෙන්න බැහැ. එහෙම නම් ඉඛිබන්ගෙන් පිහාටුත් බලාපොරොත්තු වෙන්න පුළුවන්.

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)
තමුන්නාන්සේගේ කවිය වෙන සම්ප්‍රදායකට අයිති කවියක්.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
මට තේරුණේ නැහැ.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
ඒ කවිය අනුරාධපුර කාලය ගැන කියවුණු කවියක්.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
ඇත්ත තමයි. තමුන්නාන්සේලා දැන් උදා කර තිබෙන්නේ ඒ කාලයද? මේ පැරකුම් යුගයද? තමුන්නාන්සේලා මේ උදාකර තිබෙන පැරකුම් යුගය නිසා අර පැරකුම් ගල්රුව දැන් පුපුරනවලු.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
ගල් පලන්න බොහොම ලෙහෙසියි.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
තමුන්නාන්සේලා කියන්නේ ගල් පැලෙන බොරු. දැන් ගල් පැලෙන්නෙ ඒ නිසයි. ඒ කොයිහැටි වෙතත් තරුණ ගොවි ව්‍යාපාර තව තවත් ආරම්භ කරන්න කියා ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටින්නට කැමතියි. තරුණයන්ට තව ආධාර කරන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)
ඒ පටන්ගෙන තිබෙන්නේ හොඳ වැඩක් නේද?

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
දැනට තිබෙන්නේ තරුණ ගොවිපොළ වල් 40 යි. ඒවයේ තරුණයන් කී දෙනෙකු සිටිනවාද? අවුරුදු 15ත්, 20 ත් අතර තරුණයන් කොයිතරම් විශාල පිරිසක් මේ රටේ සිටිනවාද?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
151 ක් පිහිටුවනවා. එක පාරට බැහැ.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
බොහොම ස්තුතියි. මේ සංඛ්‍යාව තවත් තුන් ගුණයකින්වත් වැඩි කරන්නට ඕනෑ.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
එක ඡන්ද කොට්ඨාශයකට එක බැගින් ඇති කුරනවා.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
ඇමතිතුමා එක ඡන්ද කොට්ඨාශයකට එක බැගින් දෙන්නට බලාපොරොත්තු වෙනවා මට සැකයි. මොකද තව වැඩි කාලයක් නැහැ. මම හිතන්නේ නැහැ තමුන්නාන්සේලාට ඉදිරියට කරන්නට ලැබෙයි කියා.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
ඔය කතාව මීට ඉස්සරත් කිහිප වතාවක් කිව්වා. තව වතාවක් අපි ඒක බොරු කරනවා.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
කමක් නැහැ. මේ ඉදිරියට තිබෙන මාස කිහිපයෙදීවත් මේ සම්බන්ධයෙන් සැහෙන කටයුත්තක් කරනවා නම්, ඒ සම්බන්ධයෙන් අපි ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඊළඟට මුරුතවෙල ජලාශය තැනීමේ යෝජනා ක්‍රමය ගැන මා සඳහන් කරන්නට ඕනෑ. ඒ ගැන කථා කිරීමේදී ඒ ජලාශය තැනීම නිසා ඉඩම්වලින් ඉවත් කරන ලද ගොවීන් අද විඳින දහදුක ගැන මතක් කරන්නට ඕනෑ. මා කියන්නේ ඇහින් දැක්ක දේවල්. ඒ මිනිසුන්ට අද ඉන්න පැල්පතක් නැහැ. බොන්න වතුර බින්දුවක් නැහැ. ඔවුන්ට ලැබිය යුතු මාසික සහනාධාර මුදල් නියමාකාරයට ලැබෙන්නේ නැහැ. ඒ නිසා ඒ මිනිසුන් ඉතා මත්ම අසහනයකින් තමයි, ජීවත්වෙන්නේ. වතුර ටික පවා හරියාකාර ලැබෙන්නේ නැහැ. බවුසරයෙන් බෙදන්නේත් වතුර ගැලොම් කිහිපයක් පමණයි. ඒ උදවිය අද මේ ආණ්ඩුවට ශාප කරන බව කියන්නට ඕනෑ. අනාගතයේදී මේවායින් මොන මොන විධියේ ප්‍රතිඵලයක් ලැබේදැයි කියන්නට පුළුවන්කමක් නැහැ. එහෙත් අද ඒ උදවිය විඳින දුක ගැන කල්පනා කරන විට මේවා නොකියා බැහැ. මිනිසුන් යවන්නට කලින් කළ යුතු පූර්ව සංවිධාන කිසිවක් නොකළ නිසා අද ඒ ජනයා දුක් විඳිනවා. අද ඒ ප්‍රදේශයේ සිටින ජනතාවට තමන්ගේ ළමයින් යැවීමට පාඨශාලාවක්වත් තිබෙනවාද?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
දැන් හැදිල ඇති.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
ඔව්, හැතැප්ම තුනක් යන්න ඕනෑ. පාසලක් හොයාගන්නට. මේ විධියට ඒ උදවියට මිනිසුන් හැටියට ජීවත් වන්නට පුළුවන්කමක් තිබෙනවාද? තිරිසනුන් වාගේ තමයි ජීවත් වන්නට අද සිදු වී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

තිබෙන්නේ. මුරුතවෙල ජනපදයේ මිනිසුන් විඳින දුක ගැන හොඳාකාර දන්නා කෙනෙකු හැටියටයි මා මේවා සඳහන් කරන්නේ. ඒ නිසා මේ සම්බන්ධයෙන් වාර්තාවක් ගෙන්වා, තොරතුරු හරියාකාර දැනගෙන, ගොවීන්ට විඳින්නට සිදු වී තිබෙන මේ දුක් කරදර සම්බන්ධයෙන් සහනයක් ලබා දෙන්නැයි මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. එය වැදගත් යුතුකමක්. මිනිසුන් ගෙන ගොස් කැලෑවලට දමනවා මිස ඔවුන් ජීවත් වන්නේ කොහොමද කියා බලන්නේ නැහැ. ගරු කෘෂිකර්ම ඇමතිතුමා හිනා වෙනවා. මෙය හිනා වන්නට කාරණයක් නොවෙයි.

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)

මේවා අහන අපට හිනා නොවී ඉන්න පුළුවන්ද? මෙච්චර කාලයක් කිසිම ඉඩක් කඩක් නැතිවයි හිටියේ. වැවක් හදලා මිනිසුන් දැන් පදිංචිවෙලා ඇළවල් කාරිය කපාගෙන වැඩ කරගෙන යනවා. ගරු මන්ත්‍රීතුමා ඒ උදවියට යන්න එපාය කිය නවා. ඒක පුදුමයට කාරණයක් නොවෙයිද?

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

මා කියන්නේ ඒ උදවියගේ දුක් ගැන විලි ගැන සොයා බලා පිළියමක් කළ යුතු බව මිස ඒ උදවිය අධෛර්යයට පත් වන දෙයක් නොවෙයි.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

වැඩි කල් යන්න ඉස්සර වෙලා ඒ උදවිය සන්තෝෂ වෙනවද නැද්ද කියලා අපට බලාගන්න පුළුවන් වෙයි. තව මාස කීපයකින් බලන්න පුළුවනි.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

එහෙම තත්ත්වයක් ඉක්මනින් උදා වෙනවා නම් සන්තෝෂයි. ඒ වුණත් මේ තරම් දුක් විඳගෙන ඒ මිනිසුන් එතෙක් කල් ජීවත් වෙයිද, ඒ මිනිසුන්ගෙ ජීවිත එතෙක් කල් තියෙයිද කියන එකයි ප්‍රශ්නය. වටේ තිබෙන කැලෑව නිසා පොළොහුන් දෂ්ට කිරීමෙන් මිනිසුන් කිහිප දෙනෙක්ම මළා.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

ඉස්සරත් කැලෑව තිබුණා.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

මේ ප්‍රදේශය නියෝජනය කරන මන්ත්‍රීවරයා මම නොවෙයි. මෙය මුල්කිරිගල ආසනයටයි අයිති. මගේ කොට්ඨාශයට මෙය සම්බන්ධ නැතත්, එහි ජීවත් වන්නේ ලංකාවේ මහජනයා නිසා මේ රටේ උපත ලබා, මේ රටේ ජීවත් වී, මේ රටේදීම මරණයට පත් වී, මේ රටේම තමන්ගේ ඇට කටු දමන්නට සිටින්න පිරිසකගේ දුක් ගැනවිල්ල මේ ගරු සභාවට ඉදිරිපත් කිරීම මා කල්පනා කරන හැටියට මගේ යුතුකමක්. මා මේ කතා කරන්නේ විශාල කැක්කුමක් ඇතිවයි. කඳුළු වගුරුවමින් තමයි ඒ උදවිය තමන්ගේ දුක් ගැනවිලි මා සමග කියා සිටියේ. බින්නැන්නේ වැදි ළමයින් වාගේ හරියට ඇඳගන්නට වස්ත්‍රයක් පවා නැතිව පුංචි ළමයින් සිටිනවා දකින්නට කාටද පුළුවන්? ඔවුන්ට ලැබිය යුතු සහනාධාර ආදියත් නියම විධියට ලැබෙන්නේ නැහැ. ඒවා ගැන තමුන්නාන්සේ සොයා බලන්නට ඕනෑ.

උඩ වලවේ ව්‍යාපාරයට නරුණයන් තෝරා ගත්තේ මේ අවුරුද්දේ නොව ගිය අවුරුද්දේ සැප්තැම්බර් මාසයේ. ඒ උදවියට තවමත් ජනපදවල ඉඩම් දීලා නැහැ. තෝරා ගැනීම නම් ඉක්මනින් කළා. අද ලැබේවි, හෙට ලැබේවි, අනිද්දා ලැබේවි කියා හිතාගෙන ඒ උදවිය මග බලා ගෙන ඉන්නවා. දැන් දැන් ලියුම් එනැයි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බලාපොරොත්තුවෙන් සිටින නමුත් තව මත් කිසිම දෙයක් ලැබී නැහැ. ගරු ඇමතිතුමා වෙනත් වැඩක යෙදී සිටිනවා මිස මගේ කථාව අහගෙන ඉන්නෙ නැතිවා වගෙයි පෙනෙන්නේ. ගරු ඇමතිතුමාට මා කියන්නේ මෙයයි. එක් ගමකින් එක් තරුණයා බැගිනුයි තෝරා ගත්තේ. මාතර ජන්ද කොට්ඨාශයෙන් 29 දෙනකු පමණයි තෝරා ගත්තේ. අවුරුද්දක් බලා සිටියත් තවම ඉඩම් ලැබී නැහැ. ගරු ඇමතිතුමා මේ ගැන කුමක් කරනවාදැයි අහන්නට කැමතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට ගම් පුළුල් කිරීම සම්බන්ධයෙන් ඉඩම් ගැනීම ගැන කියන්නට කැමතියි. ගරු ඇමතිතුමාගේ වැඩ පිළිවෙළක් තිබුණා නුවරඑළිය හා මාතලේ දිස්ත්‍රික්කවලට හැර අනික් ඒවාට ගම් පුළුල් කිරීමේ කටයුතු සඳහා ඉඩම් ගැනීමට වියදම් කරන්නේ රුපියල් ලක්ෂ 2 ක් පමණයි කියා. එය 1960 සිට තිබුණු එකක්. දැන් 1969ත් පසු වී තිබෙනවා. තවමත් ක්‍රියාත්මක කර ගෙන යන්නේ ඒ ප්‍රතිපත්තියමයි. වැඩි වූ ජනගහණය අනුව බලන්නේ නැතිව තිබෙන තදබදය ගැන බලන්නේ නැතිව මේ ලක්ෂ 2 කේ සීමාව තබා ගෙන හැම දාම කියනවා වියදම් කරන්නට පුළුවන් ලක්ෂ 2 යි ඒ නිසා තවත් ඉඩම් ගන්නට බැහැ කියා. ඒ යල්පැනපු තීරණය වෙනස් කර වැඩිවන ජනගහණය අනුව ඒ ඒ දිස්ත්‍රික්කවලට අවශ්‍යතාව අනුව ලක්ෂ දෙකට වැඩියෙන් වියදම් කරන්නට කටයුතු කරන්නය කියා මා ඉල්ලා සිටිනවා. ගල්ඔයට 75,00,000 ක් වියදම් කරනවා නම් මාතර දිස්ත්‍රික්කයට 75,00,000 ක් වියදම් කරන්නට බැරි ඇයි? ලක්ෂ 2 ක් වියදම් කර තවත් වියදම් කරන්නට බැරිය කියා බලාගෙන ඉන්නවා. ඒ අතර අනුන්ගේ ඉඩම්වල පදිංචි වී සිටි අය උසාවිය මාර්ගයෙන් දොට්ට දමා ඔවුන් අතරමං වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නුවරඑළියේ මන්ත්‍රීතුමාට (ඩොනල්ඩ් ජේ. රණවීර මයා.) අයිති අක්කර 29 ක ඉඩමක් මාතර තිබුණා. එය ආරෝග්‍යශාලාවක් හදන්නට ආණ්ඩුවට ගත්තා. ඊට පසුව තීරණයක් ගත්තා ඒ ආරෝග්‍ය ශාලාව දැනට ආරෝග්‍ය ශාලාව තිබෙන භූමියේම හදන්නට ඕනෑ කියා. ඒ තීරණය ගත්තාට පසුව අර අක්කර 29 යේ ඉඩම නිවාස යෝජනා ක්‍රමයක් සඳහා දෙන්නය කියා ලිපිකරු මහත්වරුන් ඉල්ලුවා. ගංවතුරෙන් පීඩා විඳින මහජන තාවට ගෙවල් සාදාගැනීමට දෙන්නය කියා අපි කිව්වා. එහෙත් ගරු ඉඩම් ඇමතිතුමා ඒ කිසිවකට ඇහුම්කන් දෙන්නේ නැතිව මේ ඉඩම තමන්ගේ පක්ෂිකයෙක් වන නුවරඑළියේ මන්ත්‍රීතුමාට ආපසු දුන්නා. ගරු ඇමතිතුමා නැත කියනවාද? දැන් සිදු වී තිබෙන්නේ කුමක්ද? ඒ ඉඩම කොටස් කර වික්කා. ඊට පසුව ආදායම් බදු දෙපාර්තමේන්තුව ඒ ඉඩම අත්පත් කර ගත්තා. ඒ නිසා එම ඉඩම කට්ටි කඩා විකුනූ අවස්ථාවේ ඉඩම් කොටස් ගත් අයටත් ඒවා නැතිව ගියා. පැල් හදාගෙන පදිංචි වී සිටි අයටත් ඒවා නැතිව ගියා. දැන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව එම ඉඩම අත්පත් කර ගෙන තිබෙනවා. කලින් රජයට අත්පත් කර ගෙන තිබුණු ඉඩම ආපසු දුන්නේ අයිතිකරු තමන්ගේ පාක්ෂිකයෙක් වූ නිසාමයි.

1967-68 වර්ෂය සඳහා වූ ඉඩම් කොමසාරිස්තුමාගේ වාර්තාව අනුව රජයට පවරා ගත් ඉඩම් අක්කර 43 රූඩ් 2 පර්චස් 13 ක් ආපසු දී තිබෙනවා. සමහර විට නුවරඑළියේ මන්ත්‍රීතුමාගේ අක්කර 29 ත් එයට ඇතුළත්ව ඇති. එසේ ආපසු දී තිබෙන ඉඩම් තමුන්නාන්සේලාගේ දේශපාලන හිතවත්කම් උඩ දුන් ඉඩම්ය කියා සලකන්නට බැරිද? නුවරඑළියේ ගරු මන්ත්‍රීතුමාගේ ඉඩම දැන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව අත්පත් කර ගෙන තිබෙන නිසා දැන් නැවතත් එය රජයට අයිතියි. ඒ නිසා ඒ ඉඩම ලොකු ධනවතුන්ට ගන්නට ඉඩ නොදී— කලින් ඉඩම් කොටස් ලබා ගෙන සිටි අයට දෙන්න එපාය කියා මා කියන්නේ නැහැ —පර්චස් 20 බැගින් ගංවතුරෙන් අනාථ වන අයට බෙදා දෙන්නය කියා මේ අවස්ථාවේ මා ඉල්ලා සිටිනවා. ගරු ඇමතිතුමා මේ ප්‍රශ්නයට පිළිතුරක් දෙනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා. මේ ඉඩම පිහිටා තිබෙන්නේ මාතර නගරයට ආසන්නවයි. මාතර නගර සභා සීමාවට ආසන්නව වල් ගම පිහිටි අක්කර 29 ක් වූ මේ ඉඩමෙන් අක්කර 15 ක් පමණ එකිනෙකාට විකුණා තිබෙනවා. දැන් ඒ උදවියටත් ඒ ඉඩම් කොටස් අහිමි වන තත්ත්වයක් මතු වී තිබෙන්නේ දේශීය ආදායම් දෙපාර්ත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

මේන්තුව මේ ඉඩම අත්පත් කරගෙන තිබෙන නිසයි. කෙසේ හෝ දැන් නැව තත් මේ ඉඩම ආණ්ඩුවට අවුත් තිබෙ නවා. ඒ නිසා ඉඩම් මිළදී ගත් අයට ඒ කොටස් දී ඉතිරි කොටස ගංවතුරෙන් අනාථ වූ අයට ගෙවල් සාදා ගැනීම සඳහා දෙන්නට විධිවිධාන යොදන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මා මීට වඩා කාලය ගත කරන්නේ නැහැ. ආපසු දෙන ලද මේ ඉඩම නැවත වරක් ආණ්ඩුව සතු වී තිබෙන හෙයින් ගරු ඇමතිතුමා දේශ ප්‍රේමී පියවරක් ගනීද නැද්දැයි අපට තීරණය කරන්නට සිදු වන්නේ එතුමා දෙන පිළිතුර අනුව බව මා මතක් කරනවා.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

මේ ගැන ඒජන්තගෙන් අසා බලන්නට ඕනෑ.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

දැන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මේ ඉඩම අත්පත් කරගෙනයි තිබෙන්නේ.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

ආණ්ඩුවේ වෙන දෙපාර්තමේන්තුවකට මේ ඉඩම වුවමනාදැයි සොයා බලන්නට ඕනෑ.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

මේ ඉඩම් ආණ්ඩුවේ වැඩකට යොදන්නේ නැත්නම් ගංවතුරෙන් අනාථ වූ අයට ගෙවල් සාදා ගැනීම සඳහා දෙනවාද?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

ඔව්.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

බොහොම ස්තුතියි.

අ. භා. 6.11

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

ගරු ඉඩම් ඇමතිතුමාගෙන් කාරණා තුනක් සම්බන්ධයෙන් ප්‍රතිඥා ගන්නට බලාපොරොත්තුවෙනුයි, මා නැඟී සිටියේ. මෙම පරිපූරක ඇස්තමේන්තු පිළිබඳ සාකච්ඡා පැවැත්වීගෙන යන අන්දම දෙස බලන විට අපට පෙනී යන්නේ ලබන මහා මැතිවරණයෙන් පෙර මේ වාගේ දේවල් ගැන කථා කරන්නට අපට නැවත අවස්ථාවක් නොලැබෙන බවයි. මැතිවර ණයට මාස කිපයකට පෙර මේ මුදල් විය දම් කරමින් පට පට ගා වැඩ ටිකක් කරන්නටයි, මේ ලැස්ති වන්නේ.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

මුදල් වියදම් කරන්නට වුවමනා ඒවාට දැන් වියදම් කරලා ඉවරයි.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

ඇත්තෙන්ම නැහැ. සමහර කරුණු සඳහා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව මුදල් වෙන් කර තිබෙනවා. එහෙත් වැඩ කෙරී නැහැ. අපේ ප්‍රදේශ පිළිබඳ තත්ත්වය නම් ඒකයි. අමාත්‍යාංශ කීපයක මුදල් මේ විධියට තවම වියදම් නොකර තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

අ. භා. 6.12

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Order, please! The hon. Deputy Chairman of Committees will now take the Chair.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසන යෙන් ඉවත් වූයෙන්, කාරකසභා නියෝජ්‍ය සභා පතිතුමා [ජී. ජේ. පාරිස් පෙරේරා මයා.] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிரா சனத்தினின்று நீங்கவே, குழுக்களின் உப அக்கிராசனர் அவர்கள் [திரு. ஜீ. ஜே. பாரிஸ் பெரேரா] தலைமை தாங்கினார்கள்.

Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. G. J. PARIS PERERA] *took the Chair.*

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

නීතියෙන් ප්‍රශ්න මතුවන බව ඇත්ත. ඇමතිවරුන්ට වුණත් ඒ ගැන සැකයක් තිබෙනවා. කෙසේ වුණත් මේ මුදල් සම්මත කරගෙන මැතිවරණයට පෙර කරන වැඩ කටයුතුවලදී විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් නියෝජනය කොට්ඨාශවලත් යම් වැඩ කොටසක් කර දුන්නාට කමක් නැති බව මා මතක් කරන්නට කැමතියි. ඒක ප්‍රයෝජනවත් වන්නට පුළුවනි. එතකොට මහජන රැස්වීම්වලදී විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් නියෝජනය කරන කොට්ඨාශවලටත් මේ මේ වැඩ කර දී තිබෙනවා යයි කියන්නට ඉඩ ලැබෙනවා. විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් නියෝජනය කරන කොට්ඨාශවලට පැමිණ භය නැතිව කට ඇර කථා කරන්නට ඉඩ ලැබෙනවා.

මට මේන්න් මේ කාරණා තුන ගැන ඇමතිතුමාගෙන් ප්‍රතිඥා වුවමනායි. ඉඩම් සංවර්ධන ආඥාපනත සංශෝධනය කරන අවස්ථාවේදී මා විසින් ගෙන එන ලද සංශෝධනයක් ගරු ඇමතිතුමා පිළිගත්තා. ගම් පුළුල් කිරීම යටතේ යම් යෝජනා ඉදිරිපත් කර තිබෙනවා නම් දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභාවේ මාර්ගයෙන් එය ඉඩම් කොමසාරිස් වෙත එවා මාසයක් ඇතුළත ඒ ගැන ක්‍රියා කරවන්නට ඕනෑ යයි මා ගෙනා යෝජනාව එතුමා පිළිගත්තා.

පරிபூரக மුදල්

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
ඉඩම් කච්චේරි පවත්වන්න.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

හබරාදූව කොට්ඨාශයේ ගම් පුළුල් කිරීමේ ක්‍රමය යටතේ ඉඩම් අක්කර 55 ක් වෙන් කර තිබෙනවා. දැන් ඒ සඳහා මාස හතක් අටක් ගත වෙලා. අද දක්වාම ඉඩම් කච්චේරියක් පවත්වන්නට බැරි වී තිබෙනවා. ඇද්දුම්කැලේ වත්තෙන් අක්කර 55 ක් වෙන් කර එක් වරක් එය මනින්නට ගියත් කිසියම් වරදක් නිසා නැවත වාර්තාවක් ඉල්ලා තිබෙනවා. ස්ථිර ලේකම්තුමා මේ ගැන දන්නවා. මේ වැඩේ ආපසු යන්නට ඉඩ නොදෙන බවට ගරු ඇමතිතුමා කරුණාකර ප්‍රතිඥාවක් දෙන්න.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
ඒක හරි.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

බොහොම ස්තුතියි. ආපසු යවන්නට නම් එපා. කරුණාකර ඒ තැබූ පියවර ආපසු ගන්නට එපා. ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳ පනතේ දෙවැනි ඡේදය යටතේ දැන්වීම් ගසා හමාරයි. දැන් වුවමනා කරන්නේ මිනින්දෝරු මහතකු ලවා ඒ ප්‍රදේශය මන්නවා ගන්නටයි. ඒ නිසා කරුණාකර ඒ වාර්තාව ඉල්ලාගෙන ඒ පනතේ හතර වැනි ඡේදය යටතේ ඊළඟ පියවර ගන්න. ඒ ගත් පියවර ආපසු නොගන්නා බවට ගරු ඇමතිතුමා මට පොරොන්දු වුණා. ඒ ගැන බොහොම ස්තුතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
සුප්‍රීම් උසාවියට යන්නේ නැත්නම් තමයි.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
සුප්‍රීම් උසාවියට යන්නේ නැහැ. එක් තරා කොටසක් දෙන්නට වතු අයිතිකාර යන් කැමතියි. අක්කර 55 ක් දෙන්නට කැමතියි.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
එහෙම නම් ප්‍රශ්නයක් නැහැ.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
වත්තට පාඩුවක් නොවන විධියට එක් තරා කොටසකින් අක්කර 55 ක් දෙන්න. පසුගිය දවසක ඒ ඉඩම් මැන්න අවස්ථා වේදී දෙස්තර විග්නරාජා කැමැත්ත පළ කර තිබෙනවා. ඒ ඉඩමෙන් 2/3 ක් අයිති දොස්තර විග්නරාජාටයි. බස්නායක මහ තාට අයිතිය තිබෙන්නේ 1/3 ක් පමණයි. බස්නායක මහතාත් ඊට කැමැත්ත පළ කළ බව ආරංචියි. මගේ ඉල්ලීම පිළිගැනීම ගැන මා ඇමතිතුමාට ස්තුතිවන්ත වෙන වා.

කොග්ගල අහස් යාත්‍රාංගනයට අයත්, ගාලු පාර දෙපැත්තේ ඉඩම්වල පවුල් කීප යක් අනවසරයෙන් පදිංචි වී ඉන්නවා. ඔවුන් බලහත්කාරයෙන් අල්ලාගෙන තිබෙන්නේ හබරාදුව ගම්සභාව දියුණු කරන්නට ඉඩකඩ ඇති භූමි භාගයකුයි. ඒ වටිනා ඉඩම් එසේ නාස්ති වන්නට ඉඩ දෙන්න එපා. දැනටමත් ඒ ඉඩම්වල පවුල් විස්සක් විසිපහක් අනවසරයෙන් පදිංචි වී සිටින අතර, ඉතිරි හරියේත් අනවසරයෙන් පදිංචි වන්නට මිනිසුන් සූදානමින් සිටිනවා. ඊට ඉඩ තබන්න එපා. සමහරවිට මගේ මේ ඉල්ලීම නිසා මට දේශපාලන වශයෙන් පාඩුවක් සිදු වන්නට පුළුවනි. අනවසරයෙන් රජයේ ඉඩම් අල්ලාගෙන සිටින්නන්ටම ඒ ඉඩම් පවරා දීමයි. සාමාන්‍ය සිරිත. එහෙත් මෙහිදී ඒ ක්‍රමය ක්‍රියාත්මක කරන්නට එපා. ඔවුන් අතර ඉඩම් නැත්තවුන් සිටිනවා නම්, කොග්ගල අහස් යාත්‍රාංගනයටම අයිති ගහට කිට්ටුව ඇති ඉඩම්වලින් ඔවුන්ට කොටස් බෙදා දෙන්න. සංචාරක කටයුතු වලටත්, නගර සංවර්ධන කටයුතුවලටත් උපයෝගි කර ගන්නට පුළුවන්. මහ පාර අයිනේ ඇති ඉඩම් නම් ඒ පුද්ගලයන්ට පවරා දෙන්න එපා. ඒ ගැනත් පැහැදිලි ප්‍රකාශයක් කරනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
කොග්ගල ඒ ඉඩම් අයිති ආරක්ෂක අමාත්‍යාංශයට නේද? ඒ ගුවන් හමුදාවේ ඉඩම් නේද?

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
නෑ.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
දිසාපතිතුමාගෙන් අහන්නම්.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
ඒ ඉඩම් පාලනය වන්නේ දිසාපතිතුමා යටතේයි.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
ඒ සම්බන්ධයෙන් දිසාපතිතුමාගෙන් රපෝර්තුවක් ලබා ගන්නම්.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
අනවසරයෙන් ඒ ඉඩම්වල පදිංචි වූවන් ඉවත් කරන්න දිසාපතිතුමා දැනටමත් නියෝග කර තිබෙනවා. එහෙත් අනවසර යෙන් පදිංචි වූවන්ටම ඒ ඉඩම් ලබා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දෙන්න බලසම්පන්න දේශපාලනඥයන් පිරිසක් උත්සාහ කරනවා. එම නිසා, දිසා පතිතුමාගේ නියෝගය ක්‍රියාත්මක කරන්නය කියා මා ඉල්ලා සිටිනවා.

උණවටුනේ, බොනවිස්ටා කන්දේ ජල යෝජනා ක්‍රමයක් ඇති කිරීම සඳහා මුදල් වෙන් කර තිබෙනවා. එහෙත් තවම එය ආරම්භ කර නැහැ. එය තිබෙන්නේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ යි. ඒ වැඩ කටයුතු වහාම ආරම්භ කරන ලෙස නියෝග කරන මෙන් මා ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
ඒක හරි.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
බොහොම ස්තුතියි.

අ. භා. 6.20

මංගල මූණසිංහ මයා. (බුලත්සිංහල)
(திரு. மங்கள மூனசிங்க—புலத்சிங்கள)
(Mr. Mangala Moonesinghe—Bulathsinhala)

නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය අවස්ථාවේදීත් මේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් වැඩි විස්තරයක් කරන්නට මට අවස්ථාව ලැබුණේ නැහැ. මීට කලිනුත් කීප අවස්ථාවක්ම මතක් කර ඇති කාරණයක් නැවතත් මතක් කරන්නට මා අදහස් කරනවා. බුලත්සිංහල කොට්ඨාශයේත්, කළුතර දිස්ත්‍රික්කයේ හා තවත් දිස්ත්‍රික්ක කීපයකත් රජයේ ඉඩම් රාශියක් අනවසරයෙන් අල්ලාගෙන තිබෙනවා. රටේ හැම තැනකම ඉඩම් හිඟයක් තිබීමයි, ඊට හේතුව. ඒ දැඩි ඉඩම් හිඟය නිසා, කොතැනක හෝ රජයේ ඉඩමක් තිබුණොත් මිනිසුන් එහි අනවසරයෙන් පදිංචි වෙනවා. එහෙත් එසේ අනවසරයෙන් රජයේ ඉඩම්වල පදිංචි වූවන්ට බලපත්‍ර දීම හරියාකාර කරන්නට මෙතෙක් රජය අපොහොසත් වී තිබෙනවා. ඒ බලපත්‍ර වහාම නිකුත් කරන බවට ඇමතිතුමා හැම දාමත් පොරොන්දු වෙනවා, කිරීමට වැයම් කරනවා. එහෙත් ඒ පොරොන්දු ප්‍රකාර මෙතෙක් බලපත්‍ර නිකුත් කර නැති බව කණගාටුවෙන් වුණත් සඳහන් කරන්නට සිදු වී තිබෙනවා. හැම අවුරුද්දේම පොරොන්දු වන නමුත් මෙය හරියාකාර නොකෙරෙන නිසා මහජනයාටත් අපටත් රජයේ නිලධාරීන්ටත් කරදර රාශියකට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා. ආණ්ඩුවේ ඉඩමක් අල්ලාගෙන අවුරුදු තුන හතරක් තිස්සේ එහි පදිංචි වී සිටින කෙනකු හැම විටම එතැනම නොසිටියහොත්, දවස් දෙක තුනක් ගත වන්දනා ගමනක්වත් ඔහු ගියහොත් අහළ පහළ කෙනකු ඒ ඉඩමට පැන එයින් කොටසක් අල්ලා ගන්නවා. එයින් ඒ මිනිසුන් දෙදෙනා අතර ආරාවුලක් හට ගන්නවා. එය එතැනින් නවතින්නේ නැහැ. ඒ ප්‍රශ්නය උඩම පවුල් දෙකට බෙදෙනවා, ගම දෙකට බෙදෙනවා. ග්‍රාම සේවකටත් ආදායම් පාලක නිලධාරියාටත් අපටත් මේ ප්‍රශ්නය නිසා වැඩ රාශියක් කරන්නට සිදු වෙනවා. සමහර විට මේ ආරාවුල බේරුම් කිරීම සඳහා දිසාපතිතුමාට පවා එම ඉඩමට එන්නට සිදු වෙනවා. ඇතැම් විට මේ ආරාවුල කෙළවර වන්නේ මිනීමැරුමකින්. එම නිසා, මේ බලපත් හැකි පමණ ඉක්මනින් දුන්නොත් කරදර රාශියක් බේරුම් කර ගන්නට පුළුවන් වන අතර එය මහජනයාටත් විශාල සේවයක් වෙනවා. බලපත් දීම ප්‍රමාද වන්නේ ඒ සඳහා අවශ්‍ය ලිපිකරු මහත්වරුන් ආදී නිලධාරීන් මදි නිසා වෙන්න පුළුවනි. ඒ සම්බන්ධයෙන් සුදුසු පිළිවෙළක් යොදා ගෙන මේ බලපත් දීම ඉක්මන් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

තවත් කරුණක් මතක් කළ යුතුව තිබෙනවා. මෙම ඉඩම් කැබෙලි මහජනයාට දී තිබෙන්නේ මීට අවුරුදු 35 කට පමණ පෙරදියි. ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දෙන ලද මෙම ඉඩම්වල ගෙවල් හදා ගැනීම සඳහා එහි වැසියන්ට රුපියල් දහක ආධාර මුදලකුත් දුන්නා. පොල් හෝ රබර් හෝ වගා කිරීම සඳහාත් රජයෙන් ආධාර දුන්නා. ගල් වැටි බැඳීමට ආධාර දුන්නා. ඒ ආධාර කිසිවක් අද ඒ මිනිසුන්ට ලැබෙන්නේ නැහැ. අවුරුද්දෙන් අවුරුද්ද එම ආධාර කැපී ගොස් තිබෙනවා. දෙපාර්තමේන්තුවෙන් දෙනු ලබන සැලැස්ම අනුව ගෙයක් හැදීම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මංගල මුණසිංහ මයා.]

රුපියල් දාහකින් ඒ කාලයේදී කළ හැකිව තිබුණ නමුත් අද අවුරුදු 35 කට පසු ඒ මුදලෙන් එවැනි ගෙයක් හදන්න කොහෙත්ම පුළුවන්කමක් නැති බව අපත් තමුන්නාන්සේත් දන්නවා. ඒ කාලයේදී එක් දිස්ත්‍රික්කයක හෝ එක් කොට්ඨාශයක හෝ සෑහෙන ගණනකට මේ මුදල ලැබුණ නමුත් දැන් එය ක්‍රමයෙන් අඩු වී ගොස් තිබෙනවා. එක් අතකින් රුපියල් දාහේ මුදල මදි. අනෙක් අතින් එය ලැබෙන්නේ ඉතාම සුළු ගණනකට පමණයි. අනෙක් ආධාර කිසිවක් අද ලැබෙන්නේ නැහැ. අද රටේ හැම තැන කම වාගේ මේ විධියට ඉඩම් කැබලි මහ ජනයාට බෙදා දී තිබෙනවා. ගල්ඔය, උඩ වලවේ වැනි ව්‍යාපාරවලත් සිදුවූයේ එයයි. අපගේ බලාපොරොත්තුව තව ඉදිරියටත් මේ විධියට ඉඩම් කැබලි බෙදා දීමයි. එහෙත්, මෙයින් අපේ රටේ ආර්ථික තත්ත්වයේ හෝ මිනිසුන්ගේ හෝ කිසිම දියුණුවක් ඇති වී නැති බව පෙනී යනවා. සාමාන්‍යයෙන් ඉඩම් දෙනු ලබන්නේ ඉඩම් නැති මිනිසුන්ටයි. ඉඩම් තියෙන අයට ඒවා දෙන්නේ නැහැ. දුප්පත් ගැමියකුට ඉඩමක් ලැබුණොත් එය දියුණු කර ගැනීමට ඔහුට මුදල් නෑ. මාර්ගයක් නෑ. එම නිසා මහජනයාට ඉඩම් කැබලි බෙදා දෙනවා නම් ඒවා දියුණු කර ගැනීම සඳහා ඔවුන්ට කිසියම් ආධාරයකුත් රජයෙන් දිය යුතුයි.

අද මේ ඉඩම් කැබලිවල තත්ත්වය ගැන කල්පනා කර බලන්න. සමහර ඉඩම් කැබලිවල රබර් වගා කර තිබෙනවා. සමහර ඉඩම් කැබලිවල ගොවිතැන් කර තිබෙනවා. සමහර ඉඩම් කැබලි හේන් වශයෙන් තිබෙනවා. මේ සෑම ඉඩමක්ම හිමි මිනිසුන් ඉතාම අමාරුවෙන් ජීවත් වන බව අපට පෙනෙනවා. යම් ඉඩමක රබර් පැළ සිටෙව්වා නම්, අවුරුදු පහක් හයක් ගත වන තුරු—වෙනත් ආදායම් මාර්ගයක් නොමැති නම්—ඔහුට ජීවත් වන්නට ක්‍රමයක් නැහැ. එමනිසා මොකද වෙන්නෙ? සමහර විට ඔහු ඉඩම් කැබැල්ල තවත් කෙනෙකුට විකුණා දමනවා. ඒවාගේම ගොවිතැන් කළ ඉඩම් කැබැල්ලක ගොවිතැන පාළු වුණොත්—ඉඳෝර යක් නිසා හෝ ගං වතුරක් නිසා හෝ පාළු වුණොත්—ඔහුට ණය වෙන්නට සිදු වෙනවා. හේන් කොටන මනුෂ්‍යයාගේ තත්ත්වයත් ඒකයි. අවුරුදු පනහේන කොටමින්ම ජීවත් වෙනවා මිසක් කවදාවත් ඔහුගේ තත්ත්වයෙහි දියුණුවක් ඇති වන්නේ නැහැ. පළල් වශයෙන් බලන විට වෙන් වශයෙන් ඉඩම් කැබලි දීමේ ප්‍රතිපත්තියෙන් රටටවත් සමාජයටවත් ඒ ඉඩම් ලැබූ මනුෂ්‍යයින්ටවත් ප්‍රයෝජනයක් ලැබී නැහැ.

එම නිසා නව ක්‍රමයක් ගැන දැන් කල්පනා කරන්නට ඕනෑ. නව ක්‍රමයක් ගැන සිතන්නට දැන් අවස්ථාව පැමිණ තිබෙනවා. ගරු ඇමතිතුමා බලාපොරොත්තු වන්නේ සෑමදාම තනි ඉඩම් කැබලි දෙන්නටයි. එහෙම ඉඩම් දුන්නාට කමක් නැහැ. නමුත් මා ඉල්ලීමක් කරනවා. එසේ ඉඩම් කැබලි දෙනවා නම් මින් ඉදිරියටවත් ප්‍රයෝජනයක් ඇති වන ක්‍රමයක් උඩ එසේ ඉඩම් දෙන්න. ඒ සඳහා ගතයුතු පියවර කීපයක් තිබෙනවා. පළමුවෙන්ම සංඛ්‍යා ලේඛන පිළියෙළ කර ගන්නට ඕනෑ. කැබලි වශයෙන් ඉඩම් කොපමණ දී තිබෙනවාද, මේ ඉඩම් කැබලිවලින් කීයක් හරියාකාර දියුණු කර තිබෙනවාද, මේ ඉඩම් කැබලිවල වගා කර තිබෙන ද්‍රව්‍ය මොනවාද, මේ ඉඩම් කැබලිවලින් දැනට ලැබෙන ආදායම කොපමණද, ඒ ආදායම ඊට වඩා වැඩි කරන්නට පුළුවන්ද යනාදී කරුණු ගැන මුලින් සංඛ්‍යා ලේඛන පිළියෙළ කර ගන්නට ඕනෑ. පියවරක් ගත යුත්තේ ඊට පසුවයි.

තමුන්නාන්සේලා තරුණ ගොවි ජන පද ව්‍යාපාර ආරම්භ කර තිබෙනවා. බුලත් සිංහල කොට්ඨාශයේ තිබෙන තරුණ ගොවි ව්‍යාපාරයෙන් සාර්ථක ප්‍රතිඵල ලැබී තිබෙනවා. ඒකට හේතුව මොකක්ද? ව්‍යාපාරයක් හැටියටයි ඒවා ගෙන යන්නෙ. තමුන්නාන්සේලා ඒවාට ආධාර දෙනවා. ඒවා එවැනි තත්ත්වයක තිබුණත් අද රට සෑම තැනම තිබෙන ඉඩම් කැබලි නොදියුණු තත්ත්වයකින් තිබෙනවා. ඒවා දියුණු තත්ත්වයකට පත් කරන්නට නම් ව්‍යාපාර ක්‍රමයක් ආරම්භ කළයුතුව තිබෙන බවයි මා පෙන්වා දෙන්නෙ. ඒක කරන්නට පුළුවනි. මා මුලින් කීවාක් මෙන් පළමුවෙන් සංඛ්‍යා ලේඛන පිළියෙළ කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගන්න. ඊටපසු අක්කරය දෙක බැගින් යම් තැනක ඉඩම් කැබලි සියයක් තිබෙනවා නම් ඒ සියය වෙනුවෙන් එක ව්‍යාපාරයක් ආරම්භ කරන්න. තරුණ ගොවි ජනපද ව්‍යාපාරවල මෙන් ඒ සඳහා වෙනම නිලධාරී මහත්මයෙක් පත් කරන්න. ඒ නිලධාරී මහත්මයාත් කච්චේරියත් අමාත්‍යාංශයත් සම්බන්ධ වෙන්නට ඕනෑ. ඒ නිලධාරී මහත්මයා ඒ ව්‍යාපාරය තුළම පදිංචි වී වැඩ කරන කෙනෙකු වෙන්නට ඕනෑ. ඊටපසු මේ සෑම ඉඩම් කැබැල්ලකම පස පරීක්ෂා කර බලන්නට ඕනෑ. මේ පස වඩාත්ම සුදුසු කුමන වගාවන්ටද කියා තීරණය කරන්නට ඕනෑ. ඒ වාගේම මේ ඉඩම්වල ගෙවල් සාදා ගන්නට ආධාරයක් දෙන්නට ඕනෑ. වගා කළයුතු යයි තීරණය කරන ලද පැළ වර්ග සිටුවන්නට ආධාර දෙන්නට ඕනෑ. පැළ සිටුවීමට පමණක් නොවෙයි පොහොර ලබා ගැනීමටත් ආධාර දෙන්නට ඕනෑ. සිටුවන ලද පැළවලින් ප්‍රතිඵලයක් ලැබෙන තෙක් ඒ ජනතාවට ජීවත් වන්නට ආධාර දෙන්නට ඕනෑ. එවැනි වැඩ පිළිවෙළක් අනුගමනය කළොත් රටපුරා තිබෙන මේ ඉඩම් කැබලි ආර්ථික වශයෙන් දියුණු කරන්නට පුළුවන් වෙනවාට කිසිම සැකයක් නැහැ. එහෙම නොකළොත් කවදාවත් මේ ඉඩම් කැබලි දියුණු වන්නේ නැහැ. කවදාවත් ඒ වායේ සිටින මහජනතාවගේ දියුණුවක් ඇති වන්නේත් නැහැ.

මෙම අවස්ථාවේදී ගොවිකම් ව්‍යාපාරය ගැන වචන ස්වල්පයක් නොකියා බැහැ. මේ රටේ පවත්වාගෙන යන තරුණ ගොවි ව්‍යාපාරය පිළිබඳව ගරු ඇමතිතුමාට මීට පෙරත් මා මතක් කර තිබෙනවා. මෙම තරුණ ගොවීන් වෙසෙන ගෙවල් සාදා ගැනීම සඳහා දෙනු ලබන ආධාර මුදල් ප්‍රමාණය මදියි. තරුණ ගොවි ව්‍යාපාරවල තිබෙන ගෙවල් සඳහා ආධාර දෙන්නේ රුපියල් 1,000 බැගිනුයි. දැන් මෙතන නිවාස ඇමති අංශය භාර ගරු ඇමතිතුමාත් සිටින බව පෙනෙනවා. ඒ නිසා එතුමාත් සමග කතා කර ගෙන එම ගොවීන් සඳහා මීට වඩා හොඳ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන ලෙස මතක් කරනවා. එම උදව්යට දැන් ලැබෙන රුපියල් 1,000 මුදල මදි බව මා නැවත වරක් කියනවා. ගෙයක් සාදා ගැනීමට අඩු වශයෙන් රුපියල් දෙතුන් දහසක්වත් ඔවුන්ට ලබා දෙන්නට වැඩ පිළිවෙලක් යොදනවා නම් හොඳයි. යම්කිසි ණය ක්‍රම යක් යටතේ එම වැඩ පිළිවෙල ක්‍රියාවේ යොදවන්නට පුළුවනි. මා මීට වඩා කතා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ.

අ. භා. 6.32

ලෙස්ලි ගුණවර්ධන මයා.

(திரு. லெஸ்லி குணவர்தன)

(Mr. Leslie Goonewardene)

ගරු ඇමතිතුමා පිළිතුරු දෙන්නට ප්‍රථම එක කාරණයක් ගැන මතක් කරන්නට තිබෙනවා. එතුමාගේ භාරයේ පවතින වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් මගේ ඡන්දදායක කොට්ඨාශයේත් යම් කිසි වැඩ ප්‍රමාණයක් කරගෙන යනවා. එයින් එකක් තමයි බොල්ගොඩ ගඟෙහි වතුර මුහුදට බැස්සීම සඳහා ග්‍රෝයින් බැම්මක් බැඳීමේ කටයුත්ත. මෙම කාරණය පිළිබඳව ගරු ඇමතිතුමාට කිප වතාවක්ම ලියුම් එවා තිබෙනවා. පිළිතුරු වශයෙන් කියා එවා තිබෙන්නේ එය සලකා බලන බවයි. මෙවැනි බැම්මක් බැඳීම දෙයාකාරයකින් ප්‍රයෝජනවත් වෙනවා. වතුර මුහුදට බැස්සීමට පුළුවන් වීම ඉන් පළමු වන කරුණයි. මුහුදු යන බෝට්ටුවලට නිතරම ඇතුළු වන්නට හැකි වන පරිදි බොල්ගොඩ ගඟ ඇතුළත ධීවර වරායක් දැමීමට හැකි වන ආකාරයට එම කටයුත්ත කළ හැකියි. එය දෙවන කාරණය වශයෙන් සලකන්නට පුළුවනි. එහෙත් මේ පිළිබඳව දැන් මතභේදයක් ඇති වී තිබෙනවා. දෙපාර්තමේන්තු දෙකක් අතරයි එම මතභේදය ඇතිවී තිබෙන්නේ. එනම් ධීවර දෙපාර්තමේන්තුවත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවත් අතරයි. මෙම වැඩ පිළිවෙළ සකස් කරගෙන යන්නේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගිනුයි. ධීවර අධ්‍යක්ෂතුමාගේ මතය නම් ධීවර වරායක් සඳහා මෙය ආධාර විය නොහැකි බවයි. මෙම වැඩ පිළිවෙල එක් වරක් වෙනස් කර තිබෙන බවත් අප දන්නවා. මෙම කාරණය ගැන ඇතැම් උද විය දීර්ඝ වශයෙන් විවේචන කරන්නට පුළුවනි. "ගංගා මුහුදට වැටෙන ස්ථාන වල මෙවැනි කටයුත්තක් කරන්නට පෙර මහ මුහුදේ සැඩ පහර වැනි දේ පිළිබඳව හොඳ ශාස්ත්‍රීය පරීක්ෂණයක් කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

බැලිය යුතුයි" යනාදි වශයෙන් මේ පිළිබඳව නොයෙකුත් විවේචන කරන්නට පුළුවනි. මා එම තර්ක පිළිබඳව එතරම් දුරට විවේචනය කරන්නට මෙම අවස්ථාවේදී කල්පනා කරන්නේ නැහැ. ඒ කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් යටකී අන්දමේ මතභේදයක් පවතින බව නම් මා දන්නවා.

මෙම කාරණය සම්බන්ධයෙන් ධීවර අධ්‍යක්ෂතුමාටත් ලියා යවා තිබෙනවා. මට මතක ඇති හැටියට ගරු ඇමතිතුමාටත් ලියා එවා තිබෙනවා. මා මෙම අවස්ථාවෙහිදී කියා සිටින්නේ ප්‍රමාද නොකර මෙම දෙකොටස අතර සාකච්ඡාවක් කැඳවා ඉක්මන් තීන්දුවක් ගන්නා හැටියටයි. මාත් එම සාකච්ඡාවට කැඳවා මේ පිළිබඳ තත්ත්වය ගැන සාකච්ඡා කරන්නට පුළුවනි. මේ ගැන සලකා බලන බව නම් කියා තිබෙනවා. සලකා බැලුවාට මදි. මේ ගැන මටත් දන්වා සාකච්ඡාවක් පවත්වන හැටියටත් අපතේ මුදල් වැය නොකර යටකී කොටස් දෙකටම ප්‍රයෝජනවත් වන ආකාරයෙන් මෙම කටයුත්ත ක්‍රියාවෙහි යොදවන හැටියටත් මා ඉල්ලා සිටිනවා.

අ. භා. 6.35

ගරු සී. පී. ද සිල්වා

(கௌரவ சீ. பீ. டி. சில்வா)

(The Hon. C. P. de Silva)

පානදුරේ ගරු මන්ත්‍රීතුමා (ලෙස්ලි ගුණවර්ධන මයා.) සඳහන් කළ කාරණය ගැන කියන්නට කැමතියි. ඒ පිළිබඳව යම්කිසි මතභේදයක් තිබෙනවායයි එතුමා කිව්වා. ඒ ගැන පරීක්ෂා කරන්නට සාකච්ඡාවක් ඇති කර තිබෙන බව සඳහන් කරන අතරම එතුමා කී අන්දමට ඒ ගැන කටයුතු කරන්නට අප උත්සාහ ගන්නා බවද කියන්නට කැමතියි.

තවත් මන්ත්‍රීවරුන් නොයෙකුත් කරුණු කිව්වා. ඇතැම් උදවිය කිව්වා මෙම රජය කිසිවක් කර නැති බව. ඒ වාගේම උඩවලව්වේ වැව, මුරුතවෙල වැව යනාදිය බැන්දාය කිව්වා. මුරුතවෙල වැව යටතේ අස්වද්දන ප්‍රමාණය අක්කර 13,000 යි. මාතර ගරු මන්ත්‍රීතුමා (තුඩාවේ . මයා.) කී කාරණය ගැන කියන්නට තිබෙන්නේ මෙයයි: එතුමා මොනතා කිව්වත් මුල්කිරි ගල ඡන්දයක කොට්ඨාශයේ උදවිය ඊට සතුටුයි. ඒ උදවියට තමන්ගේ සතුට ප්‍රකාශ කරන්නට සුදුසු අවස්ථාවක් වැඩි කල් යාමට මත්තෙන් ඵළඹෙනවා ඇති. අපි කොතෙක් වැඩ කළත් කරන්නේ නැති හැටියටයි ඒ අය සඳහන් කරන්නේ.

තරුණයන්ගේ ප්‍රශ්න විසඳන්නට මෙම රජය ක්‍රමානුකූලව කටයුතු යොදා තිබෙනවා. දැනටමත් ඒ ගැන බොහෝ දුරට කටයුතු යොදා තිබෙන බව කියන්නට කැමතියි. බුලත්සිංහල ගරු මන්ත්‍රීතුමා (මංගල මුණසිංහ මයා.) කිව්වා වගේ නොයෙක් දේ ගැන සොයන්නට තියෙනවා. අවශ්‍ය නිලධාරීන් සොයා ගන්නට ඕනෑ. අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්‍ය එස්. ඒ. වික්‍රමසිංහ) කී දේ මා පිළිගන්නවා. නමුත් ඒ සියලුම දේ කිරීමට අපට මුදල් නැහැ. පුළුවන් තරමින් ගරු මන්ත්‍රීතුමා කී හැටියට කරන්නට අප උත්සාහ කරනවා. ගොවි පොළක් දියුණුකර ආදායම් ගන්නට පුළුවන් වන පිළිවෙළට එය ඇති කරන්න ඕනෑ. පසුගිය රජය කාලයේදී අතුරු ඇලවල් කැපීම නැවැත්වුවා. අපි දැන් ඒ වැඩය කරනවා. ඒ නිසා අස්වැන්න වැඩි වන බව කිව්වා. හැම් තැනම ඒක කරන්න මුදල් අඩුයි. සමහරුන් උත්සාහ කළේ වැඩ කළේ නැත කියා පෙන්වන්නයි. නමුත් වැඩ කර තිබෙන බව පිළිගන්න මන්ත්‍රීවරුන් කියනවා, වැඩ කර තිබෙන්නේ හොඳ අදහසින් නොවේය කියා. ඒ නිසා කරපු වැඩවලටත් බණිනවා. මේ ආණ්ඩුව කාලයේදී ඔය වැව් සියල්ලක්ම බැන්දා. පසුගිය ආණ්ඩුව කාලයේදී නැවැත්වූ අතුරු ඇලවල් කැපීම අප නැවත පටන්ගෙන තිබෙනවා.

ඉදිරිපත් කළ සෑම ප්‍රශ්නයකටම මට දැන් පිළිතුරු දෙන්න බැහැ. කරුණු කිපයකට පමණක් පිළිතුරු දෙන්න කැමතියි. ඔප්පු දීම ගැන කිව්වා.

Now, about the permits, Sir, I know that this work is being held up in the kachcheries. The kachcheries have been instructed to employ casual hands on piece-work and pay them at so much per permit,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

and a lot of work is now being done. I cannot give the figures off-hand but I know a considerable amount of work is being done though it may not be altogether satisfactory.

About land-marking of allotments for purposes of giving grants under L. D. O., I have the figures but I am sorry I have not got them with me just now. A fair amount of work is being done to see that the grants are given to these allottees.

I agree that Rs. 1,000 is insufficient to build houses. But I must get the money for this. The rule has so far been that the house should be completed within three years. We have considered this matter and we have given instructions to the G. A. to allow a longer period to repay, at the discretion of the G. A. The G. A. can extend the period of repayment at his discretion depending on the ability of the man to pay. For deserving cases he can give a longer time to complete the house according to his means.

These instructions were issued recently. We appreciate the difficulties. The G. As themselves recommended that they should be given the discretion.

Now, about the printing of the reports on the rivers—the Gin-ganga, the Nilwala-ganga, the Kalu-ganga, the Mahaveli-ganga, and also the report on Gal Oya,—these have been with the printers for some time now. I told the Hon. Minister of State that I shall be writing to him to have the printing of the reports done without delay. I am personally keen about the Mahaveli-ganga report which is a very useful report.

I shall look into all the matters mentioned by hon. Members.

තුඩාවේ මයා.

(திரு. துடாவ)

(Mr. Tudawe)

එක කාරණයක් ගැන මතක් කරන්නට තියෙනවා. ගම් පුළුල් කිරීම සඳහා ගත් ඉඩම්වල සමහර දුප්පත් මිනිසුන් පදිංචි වී සිටිනවා. එවැනි මිනිසුන් කීප දෙන කුටම මාතර ඉඩම් නිලධාරිතුමා රුපියල් 50 ; 100, ආදි වශයෙන් දඩගසා තිබෙනවා. ඒක ඉතා කණගාටුදායක තත්ත්වයක්.

ගරු සී. පී. ද සිල්වා

(கௌரவ சீ. பீ. டி சில்வா)

(The Hon. C. P. de Silva)

ගම් පුළුල් කිරීම සඳහා ගත් ඉඩමකට, ඉඩම් කච්චේරියක් පවත්වන්නට කලින් කව්රුවත් හෝ ගොස් පදිංචි වෙනවා නම් ඒ අය ඉවත් කරන්නට ඕනෑ.

ප්‍රශ්නය විමසන ලදින්, සහාසම්මත විය.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

පරිපූරක මුදල : ඉඩම් කොමසාරිස් : තරුණයන් පදිංචි කරවීමේ යෝජනා

குறைநிரப்புத் தொகை : காணி ஆணையாளர் : வாலிபர் குடியமர்த்தல் திட்டம்

SUPPLEMENTARY SUPPLY : LAND COMMISSIONER : YOUTH SETTLEMENT SCHEME

ගරු සී. පී. ද සිල්වා

(கௌரவ சீ. பீ. டி சில்வா)

(The Hon. C. P. de Silva)

I move,

"That a supplementary sum not exceeding Rupees Eight hundred and fifty thousand (Rs. 850,000) be payable out of the Consolidated Fund of Ceylon or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year beginning on October 1, 1968, and ending on September 30, 1969, and that the said sum only be expended as specified in the Schedule hereto :

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

[ගරු සී. පී. ද සිල්වා]

Schedule

	Rs.
Head 56—Land Commissioner.	
Vote No. 7—Economic Development—Capital Expenditure ..	850,000 "

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

විනු විඩුක්කප්පට්ඩු එත්‍රුක්කොළ්ළප්පට්ඩතු.

Question put, and agreed to.

පරිපූරක මුදල: වාරිමාර්ග යෝජනා ක්‍රම: තැනීම, ප්‍රතිසංස්කරණය ආදිය

குறைநிரப்புத் தொகை: நீர்ப்பாசனத் திட்டம்: புனர் நிர்மாணம் முதலியன

SUPPLEMENTARY SUPPLY: IRRIGATION SCHEMES: CONSTRUCTION, RESTORATION, ETC.

ගරු සී. පී. ද සිල්වා

(கௌரவ சீ. பீ. டி சில்வா)

(The Hon. C. P. de Silva)

I move,

"That a supplementary sum not exceeding Rupees Seven million five hundred thousand (Rs. 7,500,000) be payable out of the Consolidated Fund of Ceylon or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon, for the service of the financial year beginning on October 1, 1968, and ending on September 30, 1969, and that the said sum only be expended as specified in the Schedule hereto:

Schedule

	Rs.
Head 60—Irrigation.	
Vote No. 7—Economic Development—Capital Expenditure ..	7,500,000."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

විනු විඩුක්කප්පට්ඩු, එත්‍රුක්කොළ්ළප්පට්ඩතු.

Question put, and agreed to.

පරිපූරක මුදල්

පරිපූරක මුදල: ප්‍රාදේශීය පාලනය: වාහන නඩත්තුව

குறைநிரப்புத் தொகை: மாகாண நிர்வாகம்: வாகனங்கள் பராபரித்தல்

SUPPLEMENTARY SUPPLY: PROVINCIAL ADMINISTRATION: MAINTENANCE OF VEHICLES

ගරු ආචාර්‍ය ඩබ්ලිව්. දහනායක (සවදේශ කටයුතු පිළිබඳ ඇමතිනි)

(கௌரவ கலாநிதி டபிள்யூ. தகநாயக்க—உள்நாட்டு விவகார அமைச்சர்)

(The Hon. Dr. W. Dahanayake—Minister of Home Affairs)

I move,

"That a supplementary sum not exceeding Rupees One hundred and seventy five thousand (Rs. 175,000) be payable out of the Consolidated Fund of Ceylon or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon for the services of the financial year beginning on October 1, 1968, and ending on September 30, 1969, and that the said sum may be expended as specified in the Schedule hereto:

Schedule

	Rs.
Head 71—Provincial Administration.	
Vote No. 2—Administration Charges—Recurrent Expenditure ..	175,000."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

විනු විඩුක්කප්පට්ඩු, එත්‍රුක්කොළ්ළප්පට්ඩතු.

Question put, and agreed to.

පරිපූරක මුදල: තුල්හිරිය රෙදි මෝල

குறைநிரப்புத் தொகை: நெசவாலை, துல்ஹிரிய

SUPPLEMENTARY SUPPLY: TEXTILE MILL, TULHIRIYA

ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන

(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)

(The Hon. D. P. R. Gunawardena)

I move,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුද්ල්

"That a supplementary sum not exceeding Rupees Thirty-eight million two hundred and eighty thousand (Rs. 38,280,000) be payable out of the Consolidated Fund of Ceylon or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year beginning on October 1, 1968, and ending on September 30, 1969, and that the said sum only be expended as specified in the Schedule hereto :

Schedule

	Rs.
Head 90—Minister of Industries and Fisheries.	
Vote No. 7—Economic Development—Capital Expenditure	38,280,000."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

පරිපූරක මුදල: ධීවරයින් සඳහා නිවාස

குறைநிரப்புத் தொகை : மீனவர்க்கு வீடுகள்

SUPPLEMENTARY SUPPLY : HOUSES FOR FISHERMEN

ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන

(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)

(The Hon. D. P. R. Gunawardena)

I move,

"That a supplementary sum not exceeding Rupees Four Hundred thousand (Rs. 400,000) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon for the service of the Financial Year beginning on October 1, 1968, and ending on September 30, 1969, and that the said sum may only be expended as specified in the Schedule hereto :

Schedule

	Rs.
Head 93—Department of Fisheries.	
Vote No. 5—Services provided by the Department—Capital expenditure ..	400,000."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

පරිපූරක මුදල්

පරිපූරක මුදල: "එක්ස්පො '70" ප්‍රදර්ශනයට ලංකාව සහභාගිවීම

குறைநிரப்புத் தொகை : "எக்ஸ்போ 70"இல் இலங்கை பங்குபெறுதல்

SUPPLEMENTARY SUPPLY : CEYLON'S PARTICIPATION IN EXPO '70

ගරු හියු ප්‍රනාන්දු (වාණිජ හා වෙළඳ ඇමති)

(கௌரவ ஹியூ பெர்ணண்டோ—வர்த்தக, வியாபார அமைச்சர்)

(The Hon. Hugh Fernando—Minister of Commerce and Trade)

I move,

"That a supplementary sum not exceeding Rupees One million seven hundred thousand (Rs. 1,700,000) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year beginning on October 1, 1968, and ending on September 30, 1969, and that the said sum may be expended as specified in the Schedule hereto :

Schedule

	Rs.
Head 99—Department of Commerce.	
Vote No. 2—Administration Charges—Recurrent Expenture ..	1,700,000."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

පරිපූරක මුදල: වෙළඳ පර්යේෂණ, වාණිජ තොරතුරු, ප්‍රචාරය ආදිය

குறைநிரப்புத் தொகை : சந்தை ஆராய்ச்சி, வர்த்தகத் தகவல், பிரசாரம் ஆதியன

SUPPLEMENTARY SUPPLY : MARKET RESEARCH, COMMERCIAL INTELLIGENCE, PROPAGANDA, ETC.

ගරු හියු ප්‍රනාන්දු

(கௌரவ ஹியூ பெர்ணண்டோ)

(The Hon. Hugh Fernando)

I move,

"That a supplementary sum not exceeding Rupees Five hundred thousand (Rs. 500,000) be payable out of the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු හියු ප්‍රනාන්දු]

Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year beginning on October 1, 1968, and ending on September 30, 1969, and that the said sum only be expended as specified in the Schedule hereto :

Schedule

	Rs.
Head 99—Department of Commerce.	
Vote No. 2—Administration Charges—Recurrent Expenditure ..	500,000."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

විනු විඩුක්කප්පට්ඩු, ඒற்றුක්කොළ්ளப்பட்டது.

Question put, and agreed to.

පරිපූරක මුදල: පොල් කෙඳි මණ්ඩලයට ආධාර

குறைநிரப்புத் தொகை : தென்னந்தும்பு சபைக்கான கொடை

Supplementary Supply : Grant to Coconut Fibre Board

ගරු හියු ප්‍රනාන්දු

(கௌரவ ஹியூ பெர்ணண்டோ)

(The Hon. Hugh Fernando)

I move,

"That a supplementary sum not exceeding Rupees Five hundred thousand (Rs. 500,000) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon for the service of the financial year beginning on October 1, 1968, and ending on September 30, 1969, and that the said sum may be expended as specified in the Schedule hereto :

Schedule

	Rs.
Head 98—Minister of Commerce and Trade.	
Vote (New) No. 7—Economic Development—Capital Expenditure	500,000."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

විනු විඩුක්කප්පට්ඩු, ඒற்றுක්කොළ්ளப்பட்டது.

Question put, and agreed to.

පරිපූරක මුදල: ජාතික නැව් සංස්ථාවේ මූලධනයට දායක මුදල්

குறைநிரப்புத் தொகை : தேசிய கப்பற் சரக்கேற்றுக் கூட்டுத்தாபனத்துக்கான நன்கொடை

Supplementary Supply : Contribution to the Capital of National Shipping Corporation

ගරු හියු ප්‍රනාන්දු

(கௌரவ ஹியூ பெர்ணண்டோ)

(The Hon. Hugh Fernando)

I move,

"That a supplementary sum not exceeding Rupees eight million one hundred and sixty thousand (Rs. 8,160,000) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year beginning on October 1, 1968 and ending on September 30, 1969, and that the said sum may be expended as specified in the Schedule hereto :

Schedule

	Rs.
Head 98—Minister of Commerce and Trade.	
Vote (New) No. 7—Economic Development—Capital Expenditure	8,160,000."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

විනු විඩුක්කප්පට්ඩු, ඒற்றுක්කොළ්ளப்பட்டது.

Question put, and agreed to.

ලෙස්ලි ගුණවර්ධන මයා.

(திரு. லெஸ்லி குணவர்தன)

(Mr. Leslie Goonewardene)

I would please request the Hon. Minister to give an explanation on each of these items.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

පරිපූරක මුදල: වැඩිවන සිරකරුවන් නඩත්තුකිරීම

குறைநிரப்புத் தொகை: கைதிகளைப் பேணல் முதலியன

SUPPLEMENTARY SUPPLY: MAINTENANCE OF PRISONERS, ETC.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

I move,

"That a supplementary sum not exceeding Rupees One Million eight hundred thousand only (Rs. 1,800,000) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year beginning on October 1, 1968, and ending on September 30, 1969, and that the said sum may be expended as specified in the Schedule hereto:

Schedule

	Rs.
Head 115—Department of Prisons.	
Vote No. 1—Personal emoluments and other allowances of staff ..	162,500
Vote No. 2—Administration charges—Recurrent expenditure ..	1,535,000
Vote No. 3—Administration charges—Capital expenditure	102,500
Total ..	1,800,000."

This item deals with a sum of money required for the administration of the Prisons. Owing to the increase in the cost of living, the prices of items of food, and so on have gone up. This sum is required for the purpose of feeding prisoners.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පරිපූරක මුදල්

පරිපූරක මුදල: නීති කොමිසම: කාර්‍යමණ්ඩල පෞද්ගලික පඩිනඩි හා අනිකුත් දීමනා ආදිය

குறைநிரப்புத் தொகை: சட்டவாணைக் குழு: பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிற படிகளும் ஆதியன

SUPPLEMENTARY SUPPLY: LAW COMMISSION: PERSONAL EMOLUMENTS AND OTHER ALLOWANCES OF STAFF, ETC.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

I move,

"That a supplementary sum not exceeding Rupees Fifty thousand (Rs. 50,000) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at disposal of, the Government of Ceylon, or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year beginning on October 1, 1968, and ending on September 30, 1969, and that the said sum only be expended as specified in the Schedule hereto:

Schedule

	Rs.
Head (New) 118, Law Commission.	
Vote No. 1—Personal emoluments and other allowances of staff ..	32,418
Vote No. 2—Administration charges—Recurrent expenditure	17,582
	50,000."

It has become necessary to incur an expenditure of Rs. 50,000 in connection with the establishment of the Law Commission.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

Sir, I strongly object to this.—[*Interruption*].

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
Those are interruptions by various hon. Members.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
They are responsible Ministers .

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
I am in charge of this item.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
Then other Ministers should not interrupt.

කාර්කසභා නියෝජ්‍ය සභාපතිතුමා
(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
I would request the Hon. Minister to please go on with the explanation.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
This item deals with the implementation of the new Law Commission. This sum is required in order to make available to the Law Commission the necessary staff, accommodation, equipment and other facilities as may be necessary to enable the commission to carry out its work effectively.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 15 වෙනි යෝජනාව විස්තර කළ හැටියෙයි මා නැගිට්ටෙ.

පරිපූරක මුදල්

කාර්කසභා නියෝජ්‍ය සභාපතිතුමා
(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
නැහැ. 16 වෙනි යෝජනාව.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
ඒක දැන් ඉවරයි.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunesekera)
15 වෙනි යෝජනාව ගැන ඇමතිතුමා තෝරා දුන්නා විතරයි. තෝරා අවසාන වන විටමයි, මා නැඟී සිටියේ.

කාර්කසභා නියෝජ්‍ය සභාපතිතුමා
(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The House has passed that item. Now item No. 16 is before the House which deals with the Law Commission.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunesekera)
මට පුළුවනි, නීති කොමිසම ගැන පැය ගණනක් වුණත් කථා කරන්න.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
Sir, allow him to speak.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Leslie Gunawardene)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ටිකක් ඉඩ දෙන්න. මේ ශීර්ෂය යටතේ බන්ධනාගාර ගැන කථා කරනවාට ගණ රාජ්‍ය ඇමතිතුමාගේ විරුද්ධත්වයක් නැහැ.

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)
නැහැ, කොහොමද මේ ශීර්ෂය යටතේ බන්ධනාගාර ගැන කථා කරන්නේ ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා
(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Item No. 16 is now before the House.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

නීති • දෙපාර්තමේන්තුවේ අඩුපාඩුකම් ගැන මට පැය දෙක-තුනක් වුණත් කථා කරන්නට පුළුවනි. නමුත් මම ඒ ගැන කථා කරන්නට යන්නේ නැහැ. නීතිය ගැන සඳහන් කරන්නට ඉස්සරවෙලා නීතිය තීරණය කළායින් පසුව යන බන්ධනාගාර දෙපාර්තමේන්තුව ගැන විනාඩි 5ක්, 10ක් කථා කරන්නම්.

කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා
(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

බන්ධනාගාර දෙපාර්තමේන්තුව ගැන තිබුණු යෝජනාව සම්මත වෙලා ඉවරයි.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

හරි. රාජ්‍ය ඇමතිතුමා කියනවා විරුද්ධත්වයක් නැහැ කියා.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

Sir, you can allow the hon. Member to say under this item what he had to say under item No. 15 in regard to Prisons.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

ඉතින් මොකද, මේ කලබැගෑනිය? බලන්න, රාජ්‍ය ඇමතිතුමා කොයිතරම් හොඳට •ජනසම්මතවාදී විධියට ක්‍රියා කරන්නට උත්සාහ කරනවාද කියා.

කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා
(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

16 වෙනි හා 17 වෙනි යෝජනා දෙකම එකට ගන්නවා.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

හොඳයි.

අද සිර ගෙදර මර ගෙදරක් වෙලා තිබෙනවා. ඊට හේතුව මම කියන්නම්. මේ පුවත ඉංගිරිසි පත්‍රවල හරි හැටි පළ වෙලා ඇතැයි මා හිතන්නේ නැහැ. වැලිකඩ බන්ධනාගාරයේදී පසුගිය සතියේ ඇති වූ සාහසික අපරාධය ගැන ඉංගිරිසි පත්‍රවල තවමත් පළ වෙලා නැහැ. සමහර විට මෙය ගරු රාජ්‍ය ඇමතිතුමා දැකලා නැතිවා වෙන්නට ඇති.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

නඩු දමනවා.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

තවම නඩු දමලා නැහැ. ඒ නිසා අපට ඒ සිද්ධිය ගැන කථා කරන්නට පුළුවන්. මේ කාරණය තවම උසාවිය ඉදිරියට ගිහිල්ලා නැහැ. සිරගෙදර ඇති වූ සාහසික මිනී මැරුම සිදු වුණේ කුමන පරිසරයකද? මෙවැනි අපරාධ මේ වකවානුවේදී සිදු වූ පළමුවැනි වතාව මෙය නොවෙයි. මේ ආණ්ඩුව බලයට පත්වුනාට පස්සේ මෙවැනි අපරාධ එකක් දෙකක් නොව, ගණනාවක්ම නොයෙක් දෙපාර්තමේන්තුවල ඇති වෙලා තියෙනවා. පොලිසියේදීත් මෙවැනි සාහසික අපරාධ සිදු වී තිබෙනවා. යුද හමුදාවේ මෙවැනි දරුණු මිනී මැරුම් නැතත්, ඊට වඩා පිකක් මෙහායින් නැවතුණු බරපතල සමාජ අපරාධ නම් සිදු වී තිබෙනවා. විශ්ව විද්‍යාලයේ ගොඩනැගිලි විනාශ කර දමන තරමේ ඒවා සිදු වී තිබෙන බව අපට දැනගන්නට ලැබී තිබෙනවා. නිල ඇඳුම් දමාගත් පිරිසක් සේවය කරන තවත් දෙපාර්තමේන්තුවක් වන බන්ධනාගාර දෙපාර්තමේන්තුව මගින් සිදු වූ මේ අපරාධය කොළඹ මහ නගරය තුළ මීට දවස් තුනකට පමණ පෙර සිදු වී තිබෙන බව දැන් අපට ආරංචි වෙලා තිබෙනවා.

මෙහි පසුබිම කුමක්ද? ගරු රාජ්‍ය ඇමතිතුමා, ගරු මුදල් ඇමතිතුමා වෙනුවට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

අද ඉදිරිපත් කළ මේ පරිපූරක ඇස්තමේන්තුව යටතේ දැන් මා ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් අහන්නේ ඒ ප්‍රශ්නයයි. මෙවැනි අසාධාරණ සහ අධාර්මික සිද්ධීන් ඇති වන්නේ මොන හේතුවක් නිසාද? මා කියන්නේ මේ විධියේ අධාර්මික සිද්ධීන් ඇති වන්නේ අධාර්මික පාලනය නිසා බවයි. හැම අවුරුද්දේම රාජාසන කථාවෙන් පාර්ලිමේන්තු සැසි වාරයක් විවෘත කරන්නට පෙර ජයමංගල ගාථා කියවා කෙළවර කරන්නේ, "දේවෝ වස්සතු කාලේන" යන්නෙන් පටන් ගෙන "පීතෝ භවතු ලෝකෝච—රාජා භවතු ධම්මිකෝ" යන්න අවසානයේදී කියමිනුයි. එහෙත් රාජා අධාර්මික නිසා—මේ රජයේ තිබෙන අධාර්මික ස්වරූපය නිසා—තමයි මෙවැනි සාහසික සිද්ධීන් ඇති වන්නේ. ඒකයි මට කියන්නට තිබෙන්නේ. ගරු ඇමතිතුමාගේ පෞද්ගලික පාලනය යටතේ මේ රට පැවති සුමාන කිහිපය තුළ කොළඹ පොලිස් අංශයේ වැඩ කොටසක් කිරීමට යොදා ගත් ගොඩනැගිල්ලක හතරවැනි තට්ටුවේදීත් මිනීමැරුම් කීයක් සිදු වුණාද? දෙකක්ම සිද්ධ වුණා නොවෙයිද? හමුදාව විශ්ව විද්‍යාලයට යවා එතන තිබුණු ගොඩනැගිලි බොහොමයක් විනාශ කර දමා එතන ඇති වූ ඒ කනගාටුදායක සිද්ධිය මේ අධාර්මික රජයේ තවත් එක අවස්ථාවක්.

ඊළඟට බන්ධනාගාර දෙපාර්තමේන්තුවෙන් පාලනය වන සිරගෙයිදී, හොරෙන් පැනලා යන්නට උත්සාහ කළ සිරකරුවකු අල්ලා ගෙනැවිත් කළ දේ කොයි තරම් දරුණුද? එය ඔප්පු කරන්නට සමහර විට සාක්ෂි නැතිව ඇති. ඒක හොඳටම පැහැදිලියි. මේ කතන්දරය කියවන ඕනෑම කෙනකුට එය ඉතාම පැහැදිලි ලෙස තේරුම් ගන්නට පුළුවනි. පැනලා යන්නට උත්සාහ කළ සිරකරුවකු අල්ලාගෙන නිලධාරීන් එකතු වෙලා මරා දැමූ බව පැහැදිලියි. අධාර්මික පාලනයක් තිබෙන රටක මිස ධාර්මික පාලනයක් තිබෙන රටක මෙවැනි භයානක සිද්ධීන් ඇති වන්නට බැහැ. මෙන්න මේ පරිසරය ඇතුයි මා සඳහන් කරන්නේ. ධාර්මික පාලනයක් තිබෙන රටක නම් කවදාවත් මෙවැන්නක් සිදු වන්නට බැහැ. ප්‍රශ්න ඇසීම සඳහා පොලිස් ස්ථානයකට ගෙන එනු ලබන සැකකරුවකු පොලීසියේ අත්අඩංගුවේ, පොලීසියේ ආරක්ෂාව යටතේ, පොලීසියේ රැකවරණය ලබමින් සිටිය යුතු මනුෂ්‍යයකු විය යුතු නමුත්, පසුව දකින්නට ලැබෙන්නේ ඒ මනුෂ්‍යයාගේ මෘත ශරීරය නම්, තත්ත්වය කොයි හැටියට ඇද්ද? පැනයන හිරකරුවෙක් නැවත අත්අඩංගුවට ගෙන හිරගෙදරට ගෙනා විට නැවත දකින්නට ලැබෙන්නේ, ඉල ඇට කැඩුණු, පටිපාරවලට ඇඟේ හැම තැනම ඉල්ලුණු, මරා දැමූවෙකුගේ මළ සිරුරක්. මෙවැනි අධාර්මික රජයකින් රැකවරණය ලබන භයානක පසුබිමක් ඇති මෙවැනි ආධාර්මික ක්‍රියා නිසා බරපතල සමාජ පරිහානියකට අද රට මුහුණ දී තිබෙන බව මේ සිද්ධීන්ගෙන් අපි අවබෝධ කර ගන්නට ඕනෑ. මෙන්න මේ කරුණු රටවැසියාට පැහැදිලි කර දීමටයි මා මේ අවස්ථාවේදී නැගී සිටියේ. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ, පොලීසියේ හා හමුදාවේ හොඳ අය කිසි කෙනෙක් නැත කියා මා කියන්නේ නැහැ. එහෙත් හොඳ හැම එකක්ම අහිබවා ගෙන නරක මතු වී මෙවැනි සාහසික සිද්ධීන් ගැන අහන්නට දකින්නට අපට සිදු වී තිබෙන්නේ මේ අධාර්මික රජයෙන් අධාර්මික පසුබිමකට රැකවරණය ලැබෙන නිසයි. පොලිස් කාර්යාලයේ 4 වැනි තට්ටුවෙන් වැටී මියගිය අහිංසකයින් දෙදෙනා පිළිබඳව සහනදායක වචනයක්වත් මේ දක්වා මේ රජයේ පාලකයන්ගෙන් කියවී නැහැ. විශ්ව විද්‍යාලයේ ගොඩනැගිලි කුඩුකර දැමූ හමුදා සේනාංක පිළිබඳව ගරු අගමැතිතුමා කළ නිර්ලජ්ජී කථාව පසුගිය දා ඉල්ලා අස් කර ගත්තා පමණයි. මේ අලුත්ම සිද්ධියෙන් පෙනෙන්නේ කුමක්ද? මේ රජය බලයේ සිටින තාක් කල් මෙවැනි අධාර්මික ක්‍රියාවන් නොදැමුණු නිලධාරීන් අතින් සිදු වුවත් ඔවුන්ට මේ රජයේ රැකවරණය ලැබෙන නිසා භය නැතිව වැරදි ඉස්මතු වී හැම තැනම මේ විධියේ අධාර්මික ක්‍රියා සිදු වේගෙන යනවා. ගරු රාජ්‍ය ඇමතිතුමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තු රාශිය කම මෙවැනි අධාර්මික සිද්ධීන්ට සම්බන්ධ අය උසස් පදවිවල වැජඹෙනවා. ඒ නිසා එවැනි වැරදි අදහස් වලින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නොමග ගිය බන්ධනාගාර, පොලිස් හා වෙනත් දෙපාර්තමේන්තුවල සිටින නිලධාරීන් ඒ දෙස බලා ඉගෙන ගන්නා පාඩම කුමක්ද? ඔවුන් ඉගෙන ගන්නා පාඩම නම් තමන් මොනවා කළත් මොන වැරදි කළත් මොන නොමනා ක්‍රියා කළත් මොන අධාර්මික ක්‍රියා කළත් මේ රජයේ මැති ඇමතිවරුන්ගෙන් ආරක්ෂාව ලැබෙනවාය කියන එකයි. වැලිකඩ බන්ධනාගාරයේදී සිදු වූ සිරිල් දිසානායක කියන සිරකරුවාගේ මරණය ගැනත් අපට කියන්නට තිබෙන්නේ එපමණයි.

ගරු නීයෝජ්‍ය සභාපතිතුමනි, මෙවැනි සිද්ධියක් වෙන රටක සිදු වුණා නම් ඒ දෙපාර්තමේන්තුව භාර ඇමතිවරයා තම පදවියෙන් ඉල්ලා අස් වෙනවා. තමන් යටතේ තිබෙන දෙපාර්තමේන්තුවක මෙවැනි සාහසික මිනීමැරුමක් සිදුවුනා නම් තමන් යටතේ තිබෙන දෙපාර්තමේන්තුවක් වැරදි පාලනය නිසා මිනිහෙකුගේ ජීවිතය නැති වුණාය, එවැනි භයානක සිද්ධියකට ඉඩකඩ සැලසුණේ දෙපාර්තමේන්තුවේ වැරදි පාලනය නිසාය, කියා ඇතැම් විට ඇමතිවරයා තම නිලයෙන් පවා ඉල්ලා අස් වෙනවා. වෙන රටවල නම් ඇමතිවරයාට කිසිම සම්බන්ධකමක් නැතිව, ඇමතිවරයා දන්නේවත් නැතිව, ඉංජිනේරු අංශයේ හෝ රියදුරාගේ වරදින් දුම්රියක් පීලි පැන ජීවිත හානි වුණොත් ඇමතිවරයා ඉල්ලා අස් වෙනවා. අපේ සම්ප්‍රදාය මොකුක්ද? ඇමතිවරයා වරදක් කරන විට ඉල්ලා අස් වන්නේ ඇමතිවරයාගේ දූලායි. වරද කළේ ඇමතිවරයායි. එහෙත් ඔහුගේ දියණිය විශ්ව විද්‍යාලයෙන් අස් කරගෙන ආවා. ඇමතිවරයකු වරදක් කරන විට වෙනත් කවුරුත් හෝ අස් වෙනවා. මේ විධියට අලුත් දේශපාලන සම්ප්‍රදායයක් මේ රටේ ඇති කිරීමට මේ අධාර්මික රජය ක්‍රියා කර තිබෙනවා.

වැලිකඩ බන්ධනාගාරයේ සිදු වූ ක්‍රියාව ගැන මෙතෙක් කල් ගත් පියවරවල් මොනවාද? දැන් මේක සිදු වී දවස් පහක් හයක් වෙනවා. පසුගිය 23 වැනිදා තමන්ගේ නිදහස උදෙසා එක් හිරකරුවකු හිරෙන් පැන යන්නට උත්සාහ කළා. හිරකරුවන් හිරෙන් පැන යන්නට උත්සාහ කරන්නේ ලංකාවේ විතරක් නොවෙයි. හිරෙන් පැන යන්නට උත්සාහ කර මරුමී නොකා බේරුණු හිරකරුවන් අපේ රටේ ජීවත් වෙනවා. ඒ අධිරාජ්‍යවාදී යුගයේදී හිරේ වැටී සිටි සමහර මිනිසුන් හිරෙන් පැන ගොස් මැරුම් නොකා අදත් ජීවත් වෙනවා. එහෙත් මේ රජය කරන්නේ මොකක්ද? හිරකරුවකු පැනයද්දී ගම්මුත් එකතුවී ඔහු අල්ලා බන්ධනාගාර නිලධාරීන්ට භාර දුන්නා. ඔහු වැලිකඩ බන්ධනාගාර නිලධාරීන්ට භාර දුන්නායින් පසු සිදු වුනේ මොකක්ද? ඔහු පරලොව ගියා. මේ රජය දාමරික ක්‍රියා වලට දෙන රැකවරණය වැඩි වී තිබෙනවා. ඒ නිසා මින් පසු රාජාසන කථාව පවත්වන විට "රාජා භවතු ධම්මිකෝ" යනුවෙන් කරන ප්‍රාර්ථනය හරි හැටි ඉෂ්ට වන විධියට කටයුතු සලස්වා ගැනීමට මේ රටේ මහජනයා වග බලා ගත යුතුව තිබෙනවා.

මේ පරිපූරක මුදල ඉල්ලා තිබෙන්නේ බන්ධනාගාරයේ තිබෙන යම් යම් අඩුපාඩු වගයක් සකසා ගැනීමටයි. කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ මූලධන වියදම් සඳහා රුපියල් ලක්ෂ 18 ක් ඉල්ලා තිබෙනවා. මේ මුදල ලබාගෙන බන්ධනාගාරයේ අඩුපාඩු මගහරවන එක හොඳයි. ඇත්තෙන්ම අද බන්ධනාගාරයේ අභ්‍යන්තර තත්ත්වය ඉතාමත්ම ඛේදජනකයි. එහි නිලධාරීන්ට බොහෝ විට දුෂ්කර පරිසරයක සිට වැඩ කරන්නටයි, සිදු වී තිබෙන්නේ. මා දවසක් සිරකරුවකු බැලීම සඳහා හදිසියේ අලුත්කඩේ රිමාන්ඩ් බන්ධනාගාරයට ගියා. එතැන උදේ 8 ට වැඩට පැමිණි නිලධාරියා හැන්දෑවේ 4 වන තුරු ඇතුළු වන දොරටුව ළඟ තිබෙන දුගඳ වහනය වන වැසිකිළිය ඉදිරිපිට මේසයක් පුටුවක් තබාගෙනයි, වැඩ කරන්නේ. එහි යන කෙනකුට එතැන මිනිත්තු දෙකක්තුනක්වත් නතර වී සිටීමට අමාරු පරිසරයක් තිබෙනවා. එහෙත් එහි දිනපතාම වැඩට එන නිලධාරීන්ට උසුලන්නට බැරි තරම්, දුගඳ වහනය වන ඒ වැසිකිළිය ආසන්නයේ සිට වැඩ කරන්නට සිදු වෙනවා. එවැනි පරිසරයක සිට වැඩ කරන නිලධාරීන් මේ විධියට හැසිරීම පුදුමයක්ද? ඒ නිලධාරීන් කිසිම ආත්ම පාලනයක් නැතිව මේ විධියට හැසිරීම ගැන පුදුම වන්නට වුවමනාවක් නැහැ. එහෙත් මිනිස් ජීවිතය පිළිබඳ ප්‍රශ්නයක් නිසා මේවා ගැන මීට වඩා සැලකිලිමත් වන්නට ඕනෑ. ඒ නිලධාරීන් කරන වැඩට හැළපෙන විධියට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

පරිසරය සකසා දීම රජයක යුතුකමයි. රාජකාරියක් භාර දී නරකාදියක දැමීම සුදුසුද? එතැන ඒ අන්දමින් පැය හතක් අටක් වැඩ කරන්නට සැලැස්සීමෙන් චරිතය පිරිහෙනවා; දේශ භක්තිය පිරිහෙනවා. ඒ වාගේම වෙනත් නොයෙක් විධියේ මානසික දුෂ්කරතාවන්ට ඔවුන් ගොදුරු වන්නට පුළුවනි. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මෙන්ම පොලිස් දෙපාර්තමේන්තුවේත් මෙවැනි වැඩ සිදු වන්නේ ඒ තත්ත්වය නිසා බවයි, මගේ හැඟීම. එ නිසා ඒ තත්ත්වය වැළැක්වීමට කරුණාකර සැහෙන පියවරක් ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා.

අ. භා. 7.5

එම්. තෙන්නකෝන් මයා.
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennakoon)

නියෝජ්‍ය සභාපතිතුමනි, බන්ධනාගාර සම්බන්ධයෙන් සාකච්ඡා කරන මේ අවස්ථාවේදී, බන්ධනාගාරවලින් බලාපොරොත්තු වන සේවය සමාජයට ඉටු වී තිබෙනවාදැයි රජයේ සැලකිල්ල යොමු කළ යුතුව තිබෙනවා. සමාජයට අහිතකර පුද්ගලයන්, සමාජයට බරක් වී ඇති පුද්ගලයන්, බන්ධනාගාරගත වීමෙන් පසු යහපත් පුද්ගලයන් වශයෙන් යළිත් සමාජයට එවීමයි, අප විශේෂයෙන් බන්ධනාගාර වලින් බලාපොරොත්තු වන්නේ. එහෙත් මේ තාක් බන්ධනාගාරවලින් සිදු වී ඇත්තේ එහි අනෙක් පැත්තයි. ළමා අපරාධකරුවන් පිළිබඳ තත්ත්වයත් එසේමයි. වරක් බන්ධනාගාරගත වූවන් යළි යළිත් බන්ධනාගාරගත වන බව පෙනෙන්නට තිබෙනවා. එයින් පෙනෙන්නේ, වරක් බන්ධනාගාරගත වූවකු යළිත් අපරාධවල යෙදීමට පෙළඹෙන බවයි. නොපැකිළෙන බවයි. එතෙක් තිබුණු ලජ්ජා භය දෙක බන්ධනාගාරගත වීමෙන් නැති වන නිසා බන්ධනාගාරගත වූවන් නැවතත් අපරාධවල යෙදෙනවා, සමාජ දූෂණ වැඩ වල යෙදෙමින් සාමකාමී පුද්ගලයන්ගේ ජීවිතවලට තර්ජනයක්ව ජීවත් වෙනවා. යළි යළිත් අපරාධ කිරීම සඳහා බන්ධනාගාර තුළදී ඔවුන් පුරුදු පුහුණු වන බවයි එයින් පෙනෙන්නේ.

මේ අනුව බලන විට, බන්ධනාගාරවලින් යහපතට වඩා අයහපතක් සිදු වී තිබෙන නිසා බන්ධනාගාරගත වන්නන්ගේ චරිත ශෝධනය සඳහා කළ යුත්තේ කුමක්දැයි දැනගැනීමට පර්යේෂණයක් කළ යුතුව තිබෙනවා. බන්ධනාගාරගත වන්නේ යළිත් අපරාධ කිරීමට නොපෙළඹෙන සේ බන්ධනාගාර සකස් විය යුත්තේ, පාලනය විය යුත්තේ, කෙසේදැයි පර්යේෂණ කිරීමට දැන් අවස්ථාව එළඹ තිබෙනවා. එවැනි පර්යේෂණයක් කොට, බන්ධනාගාරවලින් සමාජයට විය යුතු සේවය නොපිරිහෙළා ඉටු වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම රජයේ යුතුකමක්.

ගම්බද අපරාධකරුවන් ගැන ටිකක් කල්පනා කර බලමු. බන්ධනාගාරගත වීමට ගම්මුන් තුළ ලොකු භයක් ලජ්ජාවක් තිබෙනවා. එහෙත් ගම්බද අපරාධකරුවකු බන්ධනාගාරයෙන් පිට වන්නේ, යළිත් අපරාධ කරමින් සමාජයට හිරිහැර කිරීමට ලොකු පුහුණුවක් ලබාසි. එවැනි පුද්ගලයන් සමාජයට යාමෙන් බන්ධනාගාරයෙන් බලාපොරොත්තු වන යුක්තිය ඉෂ්ට වනවා වෙනුවට සිදු වන්නේ අයුක්තියක්. එම නිසා, බන්ධනාගාරවල පරිපාලනය ගැනත් සමාජ සංශෝධනයත් චරිත පිරිසිදු කිරීමත් සඳහා බන්ධනාගාර මගින් ගත යුතු පියවර ගැනත් විධිමත් පරීක්ෂණයක් පවත්වා, සමාජයට වන අවහිරකම් කරදර මගහැරවීමට බන්ධනාගාරය ප්‍රයෝජනයට ගන්නා ලෙස ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

අ. භා. 7.10

ලීලාරත්න විජේසිංහ මයා.
(திரு. லீலாரத்ன விஜேசிங்ஹ)
(Mr. Leelaratne Wijesinghe)

ගරු සභාපතිතුමනි, මේ රටේ බන්ධනාගාරවල ඉතාම දුක්ඛදායක කණගාටුදායක සිද්ධීන් වනවා පමණක් නොව මිනිස්කමට පවා නොහොබිනා අන්දමේ යම් යම් වැඩ පිළිවෙළවල්ද පවතින බව මා මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ. බන්ධනාගාර පාලනය සම්බන්ධයෙන් අධිරාජ්‍ය යුගයේ සිට පැවත එන සියලුම ක්‍රම තවමත් ඒ හැටියඩම අපේ බන්ධනාගාරවල පවත්වාගෙන යනවා. වැරදි කිරීමත්, වැරදි සිදුවීමත් සාමාන්‍ය මිනිස් ගති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යක්. වැරදි කරන අයට දඬුවම් දීමත් එක් තරා ක්‍රමයකට කළ යුතුයි. බන්ධනාගාර පරිපාලනය සම්බන්ධයෙන් අලුත් ක්‍රම ඇති කොට හොඳ හිරකරුවන්ට ඉක්මනින් නිදහස ලබා ගැනීමේ පහසු කම් සැලසෙන අන්දමේ සංශෝධනයක් ඇති කරන බව මේ ආණ්ඩුව බලයට පැමිණීමෙන් පසු කරන ලද පළමුවන රාජාසන කතාවෙහි සඳහන් වුණා. ශ්‍රේෂ්ඨ වාර්තාව පීට වුණා. එහෙත්, මගේ කල් පනාවේ හැටියට, එය දැන් හමස් පෙට්ටි යට ගිහින් තිබෙනවා. ඊට පසුව බන්ධනා ගාර සම්බන්ධයෙන් කිසිම පරීක්ෂණයක් කෙරුනේ නැහැ.

හාපුරා කියා ජීවිතයේ පළමුවන වරට වරදක් කර දඬුවම් ලබන හිරකරුවාත් වරින් වර වැරදි කරමින් අවුරුදු 10 ක් 12 ක් තිස්සේ විටින් විට හිරේ වැටෙමින් සිටින පරණ හිරකරුවාත් යන දෙදෙනාම එකම හිර මැදිරියේ දැම්මයි දැන් පවතින සිරිත. එයින් සිදු වන්නේ මොකක්ද? අර අලුත් හිරකරුවා පරණ හිරකරුවා ගෙන් සෑම දුෂ්ටකමක් නපුරුකමක් නොහොබිනාකමක්ම ඉගෙන ගැනීමයි. අන්තිමේදී අර හිරකරුවා හිරෙන් එළියට එන්නේ, ඉතාම නරක නපුරු මිනිහකු හැටියටයි. එම නිසා හාපුරා කියා හිරේ වැටෙන මිනිහාත් පරණ හිරකරුවාත් හිරගෙදරදී වෙන් කර තැබීම ඉතාම අවශ්‍ය කාරණයක්. අලුතෙන් හිරේ වැටෙන අයට ධර්මය කියා දීමෙන් හෝ ඔවුන්ගේ මානසික අසහනය දුරු වීම සඳහා කිසියම් අත්කම් ආදියක යෙදවීමෙන් හෝ ඔවුන් හොඳ පුරවැසියන් බවට පත් කොටු හිර ගෙදරින් පිට කිරීමේ වැඩ පිළිවෙළක් එහි ඇති විය යුතුයි. අද හිරගෙවල ආගම ධර්මය කියා දීම පවා සාධාරණ අන්දමින් කෙරෙන්නේ නැහැ. එය කෙරෙන්නේ යම් යම් පූජක පක්ෂවල බලපෑම් හා ඕනෑ එපාකම් අනුවයි. එම නිසා නියම විධියේ ආගමික හැඟෙස්මක් හිරගෙවල ඇති වන්නේ නැහැ.

අනුරාධපුරයේ හිර ගෙදර පාලනය සෑහෙන තරම් සතුටුදායක තත්ත්වයක පවතින බව මා මේ අවස්ථාවේදී විශේෂ යෙන් සඳහන් කරන්නට ඕනෑ. එහි තද බදය තරමක් දුරට තිබුණත් වැඩිපුර හිර කරුවන් පැන යන්නේ නැහැ. අලුත් හිර කරුවනුත් පරම දාමරික හිරකරුවනුත් එක්ව තැබීමේ වැඩ පිළිවෙළ වහාම වෙනස් කොට හිරගෙදර ප්‍රතිසංවිධානයක් කරන ඉලස ඉල්ලමින් මගේ බඹන ස්වල්පය අවසාන කරනවා.

අ. භා. 7.13

තුඩාවේ මයා.

(திரு. துடாவ)

(Mr. Tudawe)

ගරු සභාපතිතුමනි, අවුරුදු හතරහමා රක් තිස්සේ චතුර බින්දුවක්වත් බත් උළක්වත් නොලැබුණු කෙනකු බත් පිහා නක් ලැබුණ විට එය ගිඩි ගිඩි ගා නිල දමන්නාක් මෙන් පරිපූරක ඇස්ත මේන්තු කීපයක්ම තමුන්නාන්සේලා එකවර ගිල දැම්මා. ඉන් සමහර ඒවා සම් බන්ධයෙන් ඉතා වැදගත් කරුණු කීප යක්ම ඉදිරිපත් කරන්නට මා අදහස් කරගෙන සිටි නමුත් ඊට අවස්ථාවක් මට නොලැබීම ගැන මගේ කණගාටුව ප්‍රකාශ කරනවා. ගරු රාජ්‍ය ඇමතිතුමා නම් අපට මීට වඩා සාධාරණ විධියට කරුණු ඉදිරි පත් කිරීමට අවස්ථාව ලබා දුන්නා. එහෙත් මේ අවස්ථාවේදී පරිපූරක ඇස්ත මේන්තු තුනක් සම්බන්ධයෙන් එකවරම කතා කළා.

බන්ධනාගාර සම්බන්ධයෙන් මටත් වචනයක් දෙකක් කියන්නට තිබෙනවා. බන්ධනාගාරවලින් පිටවන උදවිය නැවත බන්ධනාගාරවලට පැමිණීම සම්බන්ධව නිකවැරටියේ ගරු මන්ත්‍රීතුමා (එම්. තෙන්නකෝන් මයා.) කරුණු කිව්වා. බන්ධනාගාර ගත වී නිදහස් වන සිරකරු වන් නැවතත් බන්ධනාගාර ගත වන්නේ මක් නිසාද? වැඩි වැඩියෙන් සිරකරුවන් නැවත නැවත බන්ධනාගාර ගත වන්නේ සිරකරුවන්ගේ චරිත ශෝධනය පිළිබඳව අද විධිමත් වැඩ පිළිවෙළක් නැති නිසයි. අද බන්ධනාගාර ගත වන සිරකරුවන් ගෙන් වැඩ ගන්නවා. ඔවුන්ට මානසික වශයෙන් හා ශාරීරික වශයෙන් නොයෙ කුත් දුක් වේදනා දෙනවා. ඔවුන් හොඳ පුරවැසියන් කිරීමට කටයුතු කරන්නේ නැහැ. මානසික විද්‍යාව ගැන උගත් උදවිය යොදවා ඔවුන්ගේ සිත් වෙනස් කරවීමට, ඔවුන් යහපත් මනුෂ්‍යයින් බවට පත් කරවීමට වැඩ පිළි වෙළක් නැහැ. බන්ධනාගාර දෙපාර්ත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

මේන්තුවට අයිති ඉතාම වැදගත් කාර්‍යභාරය ඒකයි. නමුත් අද ඒ කාර්‍යභාරය ඉෂ්ටවන වැඩ පිළිවෙළක් නැහැ. මේ තත්ත්වය යටතේ බන්ධනාගාර ගත වන පිරිස තව තවත් වැඩි වෙනවාට කිසිම සැකයක් නැහැ. අවුරුදු ගණනාවකට පෙර මේ රටේ බන්ධනාගාර පිළිබඳව සොයා බැලූ කොමිෂන් සභාවක් කළ නිර්දේශ තවමත් සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර නැති බව පොලොන්නරුවේ ගරු මන්ත්‍රීතුමා (විජේසිංහ මයා.) ප්‍රකාශ කළා. මගේ අදහස දැන් අළුත් කොමිෂන් සභාවක් පත් කිරීමට අවස්ථාව පැමිණ තිබෙන බවයි. මේ රටේ බන්ධනාගාර ගැනත් බන්ධනාගාර ගතවන සිරකරුවන් ගැනත් සිරකරුවන්ගේ චරිත ශෝධනය පිළිබඳව ගතයුතු ක්‍රියා මාර්ගයන් ගැනත් සොයා බලන්නට අළුතෙන්ම කොමිෂන් සභාවක් පත් කළ යුතු යයි මා යෝජනා කරනවා. එසේ කිරීමෙන් මේ රටේ සිරඟෙවල් පිරී යෑම වැළැක්වීමට පියවර ගත යුතුයි. ලංකාවේ බන්ධනාගාරවල අද විශාල තදබදයක් පවතිනවා. විශේෂයෙන්ම ඒ තත්ත්වය ඔවුන්ගේ සෞඛ්‍යයට හානි කරයි. මේ තත්ත්වය සම්බන්ධයෙන් උසාවිවලට උපදේශයක් දෙන්නට ඕනෑ. අද බොහොම සුළු වැරදිවලටත් මිනිසුන් බන්ධනාගාර ගත කිරීමේ සිරිතක් තිබෙනවා. සුළු දඩයක් ගැසීමෙන් නිදහස් කරන්නට පුළුවන්කම තිබුණත් බන්ධනාගාර ගත කිරීමේ සිරිතක් තිබෙනවා. එසේ සිර දඬුවම් දීමෙන් ආණ්ඩුවටත් අලාභ වෙනවා; මහජනතාවටත් අලාභ වෙනවා. සතියකට හමාරකට බන්ධනාගාර ගත කිරීමේ තේරුමක් නැහැ. නමුත් එවැනි අවස්ථාවලදී දඩයක් ගසා නිදහස් කරනවා නම් ඒ දඩ මුදල ආණ්ඩුවට ලැබෙනවා. ආණ්ඩුවට ලාභයක් වෙනවා. නමුත් බන්ධනාගාර ගත කිරීමෙන් මහජනතාවටත් ආණ්ඩුවටත් අලාභයක් වෙනවා. එම නිසා සුළු වැරදිවලට බන්ධනාගාර ගත කිරීම සම්පූර්ණයෙන් නැවැත්විය යුතුය කියා මා කල්පනා කරනවා.

මාතර බන්ධනාගාරයේ සේවය කරන නිලධාරීන් ගැන ඉදිරිපත් කළ යුතු කාරණයක් තිබෙනවා. අද ඒ නිලධාරීන්ට හරියාකාර රාජකාරිය ඉෂ්ට කරන්නට අමාරු තත්ත්වයක් තිබෙනවා. හේතුව ඔවුන් සඳහා නිවාස ක්‍රමයක් නොමැති වීමයි. බන්ධනාගාරය කිට්ටුවෙන් වාසය කරන්නට ඔවුන්ට අවස්ථාවක් සැලසී නැහැ. බොහෙම ඈත ප්‍රදේශවල සිට ඔවුන්ට රාජකාරිය සඳහා යන්න එන්න සිද්ධ වී තිබෙනවා. එම නිසා මේ නිලධාරීන්ට බන්ධනාගාරය කිට්ටුවෙන් පදිංචි වන්නට නිවාස ක්‍රමයක් ආරම්භ කරන මෙන් මා අවසාන වශයෙන් ඉල්ලා සිටිනවා.

අ. භා. 7.19

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

බන්ධනාගාර පාලනය වන්නේ මගේ අමාත්‍යාංශය යටතේ නොවෙයි. මා මේ යෝජනා ඉදිරිපත් කළේ අධිකරණ ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමාත් ඒ වාගේම මුදල් ඇමතිතුමාත් නැති නිසයි. යම් රටක බන්ධනාගාර, එල්ලුම් ගහ හෝ උසාවි නැතිනම් එම රටේ ඉතා හොඳ ශිෂ්ටාචාර සම්පන්න සමාජයක් තිබෙනවා යයි අප විශ්වාස කරනවා. එහෙත් ලෝක ස්වභාව අනුව මනුෂ්‍යයාගේ තන්හාවේ තිබෙන බරපතල කම නිසා පැනනගින යම් යම් ප්‍රශ්න හේතුකොට ගෙන හැම යුගයකදීම වාගේ හැම රටකම පාහේ බන්ධනාගාර වැනි ස්ථාන ඇති කරන්නට සිදු වී තිබෙනවා. ලංකාව ගැන කල්පනා කර බලන විට මෙම රජය කාලයේදී පමණක් නොව පසුගිය ආණ්ඩු කාලවලදීත්, කොටින් කියතොත් රජදරුවන් රට පාලනය කළ කාලවලදීත් මේවා ඇති කර තිබුණු බව අප දන්නවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හබරාදුව ගරු මන්ත්‍රීතුමා (ප්‍රින්ස් ගුණසේකර මයා.) බණ පදයක් කිව්වා. එහෙම් "රාජා භවතු ධම්මිකෝ" යන්නයි. ඒ අන්දමට බුදු රජාණන් වහන්සේ දේශනාකර තිබෙන්නේ රජ පරම්පරාවල් මගින් රට පාලනය කරන ලැබුවාවූ කාලවලට ගැලපෙනසේයි. ඒ කාලවලදී බොහෝ විට රට පාලනය කළේ එක පුද්ගලයකු විසිනුයි. එහෙත් අද රට පාලනය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරන්නේ එක පුද්ගලයකු විසින් නොවෙයි. අද රට පාලනය කරන්නේ මහජනයායි. මන්ත්‍රීවරු තෝරනු ලබන්නේ මහජනයා විසිනුයි. අගමැතිවරුන් ඇමතිවරුන් තෝරන්නේත් මහජනයායි. ලංකාවේ මෙන්ම අනික් රටවලත් වෙසෙන මහජනයා අතැම් විට අල්ලස්කාරයන් තෝරනවා. අතැම් විට මිනීමරුවන් තෝරනවා. අතැම් විට බංකොලොත්කාරයන් තෝරනවා. අතැම් විට බේබද්දන් තෝරනවා. එපමණක් නොවෙයි, අතැම් විට කාන්තාවනුත් තෝරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට නියම කරන්නට බැහැ, පාර්ලිමේන්තුවට රහතන් වහන්සේලා පමණක් තෝරා එවන ලෙස. එම නිසා කුමන ආණ්ඩුවක වුවත් හොඳ වැඩ නොකරන උදවිය සිටින්නට පුළුවනි. යම් කාල සීමාවක රටක් තුළ සිදු වන අපරාධ මැන බලා එම කාලයේදී පැවති ආණ්ඩුව නරකය කියා අපට කියන්නට බැහැ. බණ්ඩාරනායක යුගයේදීයි මේ රටේ අගමැති වරයකු වෙඩි තබා මැරුවේ. අපට ඊට වඩා අපරාධයක් ගැන කල්පනා කරන්නටවත් බැහැ. එවැනි අවස්ථාවකදී අප කිසිවකු කිව්වේ නැහැ, බණ්ඩාරනායක අගමැතිතුමා නරක මිනිසෙකැයි කියා. එතුමා මරන්නට පෙර එතුමාගේ ආණ්ඩුව මගින් කිසිම විභාගයක් නැතුව කළ දේවල් ගැන අප දන්නවා. එදා කීප දෙනෙක්ම මරා දැම්මා. ඒ උදවිය මැරුණාසින් පසුවවත් කිසිම විභාගයක් නැහැ. ඒ අන්දමට මරා දැමූ එක් තැනැත්තකු නම් බේරුවල ඩේවිඩ් සිල්වා මහතායි. ඒ මහතා මැරුවේ වෙඩි තබලායි. තව කීප දෙනෙක් ද ඒ අන්දමට මරා දමා තිබෙනවා. රජය විසිනුයි ඒවා කළේ. සමහර විට එසේ කරන්නට ඇත්තේ නොයෙකුත් කරුණු නිසා වන්නට පුළුවනි. එහෙත් "රාජා භූවතු ධම්මිකෝ" යන්න ගැන සිහිපත් කොට බණ්ඩාරනායක මහතාගේ ආණ්ඩුවේ සිටි ඇමතිවරු නරක මිනිසුන් යයි කිසිවකු කිව්වේ නැහැ. එවැනි මිම්මකින් රජයක් මැනිය යුතු නැහැ. එම තර්කය වෙනුවෙන් මා දෙන පිළිතුර එපමණයි.

අවසාන වශයෙන් මා තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා මෙම මුදල් අනුමත කරන්නට ඉඩ දෙන්නය කියා. එසේ නොකළොත් හිරේ සිටින අයට කෑම නැති වෙනවා.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා (අගලවත්ත)

(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா—அகலவத்தை)

(Dr. Colvin R. de Silva—Agalawatta)

මා සිතුවේ හිරෙන් නිදහස් වේවිය කියායි.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

விஞ வினவப்பட்டு ஏற்றுக்கொளளப்பட்டது.

Question put, and agreed to.

පරිපූරක මුදල: ශ්‍රේෂ්ඨාධිකරණයේ සංචාර සහ අනිකුත් වියදම්

குறைநிரப்புந் தொகை: உயர் நீதிமன்றத்தின் சுற்றுலாச் செலவுகளும் வேறு செலவுகளும்

SUPPLEMENTARY SUPPLY: CIRCUIT AND OTHER EXPENSES OF THE SUPREME COURT

ගරු විමලසේන

(கௌரவ விமலசேன)

(The Hon. Wimalasena)

I move,

"That a supplementary sum not exceeding Rupees seventy thousand (Rs. 70,000) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon of from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year beginning on October 1, 1968, and ending on September 30, 1969, and that the said sum may be expended as specified in the Schedule hereto:

Schedule

	Rs.
Head 114—Registrar of the Supreme Court.	
Vote No. 2—Administration charges—Recurrent expenditure ..	70,000."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

விஞ வினவப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා
(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Item No. 18.

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி. சொய்சா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)
Could the Hon. Minister moving the Supplementary Estimate give a short explanation ?

කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා
(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That is what the Hon. Minister is trying to do.

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி. சொய்சா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)
Item 17 was not explained.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
It was agreed to take up the two items together.

කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා
(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The hon. Member for Minuwangoda was not here. It was agreed to take up both items together.

Will the Hon. Minister move item 18 ?

පරිපූරක මුදල: උකු කිරි කම්හල
குறைநிரப்புத் தொகை: கட்டிப்பால் தொழிற்சாலை

SUPPLEMENTARY SUPPLY: CONDENSED MILK FACTORY

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)
I move,

"That a supplementary sum not exceeding Rupees One million two hundred and seventy-two thousand and two-hundred and forty-three (Rs. 1,272,243) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year beginning on October 1, 1968, and ending on September 30, 1969, and that the said sum may be expended as specified in the Schedule hereto :

Schedule

	Rs.
Head 134—Minister of Agriculture and Food.	
Vote No. 7—Economic Development—Capital Expenditure	1,272,243
New Sub-head 17—Contribution to the Milk Board for the Establishment of a Condensed Milk Factory."	

This is just an accounting matter. The Milk Board had received certain assistance from the New Zealand Government as Aid for the Milk Board in establishing the Condensary. Part of that money has been accounted for in the Books of the Treasury and the Ministry and the other part has not been accounted for in the Treasury Books. The Auditor-General had pointed out that that also should be brought into account. This is only to adjust the account, to get it properly entered in the Treasury Books as well as in the Ministry Books. This is for that purpose. There is no money involved.

It is just to rectify the account.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

පරිපූරක මුදල: සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව—ගමන් වියදම් හා ප්‍රවාහණ

குறைநிரப்புத் தொகை: கூட்டுறவு ஆக்கத் திணைக்களம்: பயணமும் ஏற்றி இறக்கலும்

SUPPLEMENTARY SUPPLY: DEPARTMENT OF CO-OPERATIVE DEVELOPMENT: TRAVELLING AND TRANSPORT

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)

I move,

"That a supplementary sum not exceeding Rupees One hundred and fifteen thousand (Rs. 115,000) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year beginning on October 1, 1968, and ending on September 30, 1969, and that the said sum may be expended as specified in the Schedule hereto:

Schedule

	Rs.
Head 141—Department of Co-operative Development.	
Vote No. 2—Administrative Charges ..	115,000."

This sum of money has been required to meet the travelling expenses involved in the activities of the Co-operative Department. We have had a larger number of officers appointed and a great deal of work had to be performed by the Co-operative Inspectorate and other officers during the last year. The original draft proposals put up to the Treasury had been cut down to begin with. Now, we have to find this extra money to meet the normal travelling expenses. This Supplementary Estimate is for that purpose.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

வினா எடுத்தியம்பப்பெற்றது.

Question proposed.

අ. භා. 7.24

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

සමුපකාර දෙපාර්තමේන්තුවේ කටයුතු හරියාකාර කරගෙන යාම සඳහා එම දෙපාර්තමේන්තුවට අයත් නිලධාරීන්ගේ ගමනා ගමන කටයුතු වෙනුවෙන් වුවමනා කරන මුදල් වෙන් කර ගන්නටයි මෙම පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කර තිබෙන්නේ. සමුපකාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ ගමන් බිමන් වැඩි කරනවා වෙනුවට අඩු කරනවා නම්, සමුපකාර සමිති සමහර විට මීට වඩා හොඳින් පවත්වාගෙන යන්නට පුළුවන් වෙනවා ඇතැයි මා සිතනවා. අය වැය ලේඛන විවාදය අවස්ථාවෙහිදී මේවා පිළිබඳව අපට කරුණු කියන්නට ඉඩකඩ සැලසෙන්නේ අවුරුද්දකට වරක් පමණයි. සමුපකාර දෙපාර්තමේන්තුව මගින් පානදුර කොට්ඨාශයේ වැඩ කටයුතු කරගෙන යන්නේ කෙසේද යන්න ගැන කියන්නට වුවත් අපට පුළුවන් වන්නේ එවිටයි. මේ වෂීයේත් මා ඒ ගැන කිව්වා. නමුත් කියන්නට කණගාටුයි, කොයිතරම් කිව්වත් ගරු ඇමතිතුමාගෙන් පිළිතුරක් නැහැ. මා නිතර නිතර කියද්දීත් පිළිතුරු නොලැබීමට තිබිය හැක්කේ එකම හේතුවයි. ඒ හේතුව නම් පිළිතුරක් නැති වීමයි. අද මා පරණ කථා කියන්නට අදහස් කරන්නෙ නැහැ. අළුත් කාරණයක් ඉදිරිපත් කරන්නට තියෙනවා. ඊයේ පෙරේදා සමුපකාර දෙපාර්තමේන්තුවේ උසස් නිලධාරීන් ඇතුළු පිරිස ක්‍රියා කර තිබෙන ආකාරය ගැන වචනයක් කියන්නට ඕනෑ.

මගේ කොට්ඨාශයේ මුස්ලිම් ප්‍රදේශයක් වන හේනමුල්ලේ විවිධ සේවා සමුපකාර සමිතියක් තියෙනවා. විවිධ සේවා සමුපකාර සමිති වැඩි හරියක් විවිධ සේවා කරන්නෙ නැහැ, කඩ සමිති පවත්වාගෙන යාම පමණයි, කරන්නේ. ඒකට කමක් නැහැ. ඒ විවිධ සේවා සමුපකාර සමිතිය අවුරුදු 8 ක පමණ කාලයක් තිස්සේ සභා රැස්වීම් නොපවත්වා බොහොම වැරදි විධියට කටයුතු කරගෙන ගොස් තිබුනා. ඒ සමුපකාර සමිතියේ මැනේජර් මහත්මයත් වැරදි කර තිබුනා. මේවා හෙළි වන විට සභා රැස්වීමක් පවත්වා අළුත් කොමිටියක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

පත් කර ගන්නට යෙදුණා. ඒ අළුත් කොමිටිය, පරණ කොමිටිය කළ වැරදි හෙළි කරන කට්ටියක්. ඒ කොමිටිය මැනේජර් මහත්මයා කළ හොරකම් ගැන පැමිණිලි කර, දෙපාර්තමේන්තු නිලධාරියකු ලවා පරීක්ෂණයක් පවත්වා ඒ හොරකම් ඔප්පු කළා. මැනේජර් මහත්මයා කළ හොරකම් ඔප්පු වූ නිසා ඔහු අස්කරන්නට කියා කළු තර සහකාර කොමසාරිස්තුමාට ලියා තිබෙනවා. එහෙත් සහකාර කොමසාරිස්තුමා කර තිබෙන්නේ කුමක්ද? අළුතෙන් පත් වූ කොමිටිය, අවුරුදු 8 ක් තිස්සේ දූෂණයෙන් පිරී තිබුණු සමුපකාරය පිරිසිදු කිරීමට ගෙන යන වැඩපිළිවෙළට ආධාර කර තිබෙනවාද? නැහැ. අළුත් කොමිටිය පත් වූ දා සිටම සහකාර කොමසාරිස්තුමාත්, ප්‍රාදේශීය සමුපකාර පරීක්ෂක මහත්මයත්, පානදුරේ සමුපකාර සංගමයේ නිලධාරිනුත් ක්‍රියා කර තිබෙන්නේ පරණ කොමිටියේ තැරැව් කාරයන් වශයෙනුයි. අළුත් කොමිටිය පත් වූ දා සිටම ඒ කොමිටියට විරුද්ධව පෙත්සම් ගියා. ඒ කොමිටියේ සමහර අයගේ සුළු සුළු වැරදි තිබෙන බව මා පිළිගන්නවා. ඒ සමිතියේ ලේකම් ධුරයට පත් වූ කාරක සභිකයා, මීට කලින් කුකුල් සමිතියක සිටිද්දී ඒ සමිතියේ ණය හරියාකාර පියෙවිවෙ නැති කෙනෙක්. ඒ නිසා මෙයා අස් කරන්න ඕනෑය කියා ඉල්ලා තිබෙනවා. අස් වූ කොමිටියේ මහත්වරුන්ගේ වුවමනාවට, මේ විධියේ පෙත්සම් ගියාම, අළුත් කොමිටියට හිරිහැර කිරීමයි, කළුතර සහකාර කොමසාරිස්තුමා කළේ.

මැනේජර් මහත්මයාට විරුද්ධව පරීක්ෂණය පවත්වා, ඔහුට විරුද්ධව තිබූ චෝදනා ඔප්පු කර ඔහුගේ වැඩ තහනම් කර තිබෙනවා. දැන් මාස ගණනාවක් තිස්සේ, මේ පරීක්ෂණ වාර්තාව අනුමත කරනවාද, මේ තැනැත්තා අස්කරනවාද කියා දන්වා නැහැ. ලියන ලියුම්වලට උත්තරත් නැහැ. මේ තත්ත්වය උඩ මා විශේෂ නියෝජිත පිරිසක් සමඟ ගොස් කොළඹ මහා කොමසාරිස්තුමා හමු වුණා. දැන් මාස 2 ක් ගත වී තිබෙනවා. පරණ කොමිටිය නියම සාමාජික ලැයිස්තුවත් සාදා නැහැ. අළුත් කොමිටිය, සහකාර කොමසාරිස්තුමාට පෙත්සම් යැවී අයත් ගෙන්වාගෙන දෙගොල්ලන්ගේම කැමැත්තෙන් බොහොම අමාරුවෙන් යම්කිසි විධියක සාමාජික ලැයිස්තුවක් සාදා ගත්තා. ඒ විධියේ ලැයිස්තුවක් හදා ගෙන රැස්වීමක් කැඳවා තිබෙනවා. එහෙත් ඒ රැස්වීම් පවත්වන්නට පෙර ඒ ලැයිස්තුවේම සඳහන් කොටසක් තමන්ගේ සම්පූර්ණ කොටස් මුදල් ගෙවා තිබෙනවා. නියමිත මුදල් ගෙවීමෙන් පසු ඒ සාමාජිකයන්ට ඡන්දය දෙන්නට සම්පූර්ණ බලය තිබෙනවා. එහෙත් ඊයෙ-පෙරේදා පැවැත්වූ රැස්වීමකදී සමුපකාර සහකාර කොමසාරිස්තුමා කියා තිබෙනවා ඒ මිනිසුන්ට ඡන්දය දෙන්ට බලය නැහැ කියා. ඡන්දය දෙන්නට බලය තිබෙන්නේ තමන් හදා ගත් ලැයිස්තුවේ මිනිසුන්ට පමණක් යයි ඔහු කියා තිබෙනවා. කෘෂිකර්ම හා ආහාර ඇමතිතුමාගේ සමුපකාර දෙපාර්තමේන්තුවේ සිටින සහකාර කොමසාරිස්වරුන් නීතිය දන්න උදවිය දැයි මා දන්නේ නැහැ. ඒ සමුපකාර සමිතියේ ලේකම්ගෙන් මට ලියුමක් ලැබුණා, අසුවල් දිනයේ සමුපකාර සමිතියේ සභා රැස්වීමක් තිබෙනවා, කරුණාකර ඒකට පැමිණෙන්නය කියා. පළාතේ මන්ත්‍රිවරයා හැටියට මම ඒ රැස්වීමට ගියා. ඒ රැස්වීම ආරම්භයේදී සහකාර කොමසාරිස්තුමා කියා සිටියා, දෙපැත්තම සතුටු වන සාමාජික ලැයිස්තුවක් මෙතැන තිබෙනායැ,—දෙපැත්ත කියන්නේ, නියෝජිත කොමිටිය සහ නියෝජිත කොමිටියට විරුද්ධව පෙත්සම් යැවූ අය. සහකාර කොමසාරිස්තුමා මේ දෙපැත්ත ගණන් ගන්නෙ එක තරමටයි—අපි එකඟත්වයකට පැමිණ ඒ ලැයිස්තුව මට දුන්න වෙලාවේදී ඒ අනුව ඡන්ද බලය තිබෙන සාමාජිකයන්ට පමණක් මේ රැස්වීමේදී ඡන්ද බලය දියයුතුය කියායැ මා අදහස් කරන්නේ කියා. මම ඒ අවස්ථාවේදී ඇහුවා, ඒක කරන්නේ කොහොමද කියා. "මේ සමිතියක්. මේ සමිතියේ පිළිගත් ලැයිස්තුවේ කොටසක්, කොටස් මුදල් ගෙවා සම්පූර්ණ කර තිබෙනවා නම් ඒ උදවියට ඡන්ද බලය තිබෙනවා. ඒ බලය පාවිච්චි කිරීම වළක්වන්නට තමුන්නාන්සේට බලයක් නැහැ. මේ සමිතියේ කොමිටිය වැරදි විධියට ක්‍රියා කර ගෙන යනවා කියා තමුන්නාන්සේ හිතනවා නම් ඒ ගැන චෝදනා ඉදිරිපත් කර, විභාගයක් පවත්වා කොමිටිය ඒ චෝදනා වලට වරදකරුවන් වෙනවා නම් සමිතියේ බලය තමුන්නාන්සේ අතට ගන්න තමුන්නාන්සේට බලය තිබෙනවා. හැබැයි, පාන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දුරේ සංගමය අතට ගත්ත වගේ විභාගයක් පවත්වන්නේ නැතුව නම් දැන් ගන්න බැහැ. හදිසි නීතිය දැන් නැහැ. ඒ නිසා තමුන්නාන්සේගේ වුවමනාවන් ඉෂ්ට කර ගන්නට දැන් සුළු බාධාවක් තිබෙන බව මාත් පිළිගන්නවා. එහෙත් විභාගයක් පවත්වා අද තිබෙන නීති යටතේ කොමිටිය අයින් කරන්නට තමුන්නාන්සේට බලය තිබෙනවා. ඇයි, එහෙම නොකරන්නේ? මම තමුන්නාන්සේට දෙන අවවාදය නම් මේ රැස්වීම පවත්වන්නට එපා කියන එක යි? කියා මා නැගිට එන්න ආවා. ඒ අවස්ථාවේ දී ඒ කොමිටිය අනුගමනය කරන සාමාජිකයනුත් නැගිට ආවා. අපි නැගිට ආවේ මේ රැස්වීමට සහභාගි වන්නට බලය තිබෙන සාමාජිකයන් සියලු දෙනාටම ඊට සහභාගි වන්නට ඉඩ නොදෙන නිසා අපි රැස්වීමෙන් පිටවන බව කියමිනුයි.

එහෙත් ඒ කළුතර සමුපකාර සහකාර කොමසාරිස්තුමා අපි පිටව ගියායින් පසු එහි මූලාසනය ගෙන රැස්වීම පවත්වා අළුතෙන් කොමිටියක් පත් කරගෙන තිබෙනවා. ඒ කොමිටිය නිලධාරීන් පත් කර තිබෙනවා. ඒ නිලධාරීන් විසින් නීත්‍යනුකූල කොමිටියට ලියුමක් එවා තිබෙනවා, අසුවල් දින ගණන ඇතුළත අපට සමුපකාරය භාර දෙන්නටය කියා. ඒ නිලධාරීන් මගෙන් ඒ ගැන ඇසුවා. මම නීතිඥ උපදෙස් ලබාගැනීමෙන් පසුව කිසිවක් භාර දෙන්න එපා කියා ඒ උදවියට අණ දී තිබෙනවා. මේක නීත්‍යනුකූල කොමිටියක් නොවේ නම් අපි සුප්‍රීම් උසාවිය දක්වා යන්න ලැහැස්තියි. මේ විධියට දේශපාලන පක්ෂ භජනය උඩ යූ. එන්. පී. යට පත් දම් අල්ලන්නට ලැහැස්ති නැති මිනිසුන් බලයට පත් වුණාම, ඔවුන් පහ කර දමන්නට මා පළාතේ මන්ත්‍රීවරයා හැටියට සිටින තුරු ඉඩ නොදෙන බව මම මේ සභාවේ ප්‍රකාශ කරනවා. මීට පෙරත් ඇමතිතුමා මගේ කෝවිඨාශයේ මේ විධියේ දෙයක් කර තිබෙනවා. මම ඉදිරියට එහෙම කරන්නට ඉඩ දෙන්නෙ නැහැ. සුප්‍රීම් උසාවිය දක්වා මම සටන් කරනවා.

පානදුරේ සංගමය හොඳට වැඩ කරගෙන ගිය සංගමයක්. මම නැවතත් ඒක මතක් කරනවා. කිසිම හේතුවක් කොහෙත්වා ඇමතිතුමාගේ විශේෂ බලය පාවිච්චි කර ඒක දෙපාර්ශ්වීකරණයේ පාලනය යටතට ගත්තා. මම මේ කාරණය මේ සභාවේ මතක් කරන්නේ මේ 4 වෙනි වතාවටයි. පානදුර මහා සංගමයේ කොමිටිය ඔවුන්ගේම වුවමනාව පිට කොළඹ මහ කොමසාරිස්තුමා හමුවෙන්න ආවා. ඇවිල්ල මොනවද කිව්වෙ? කොමසාරිස්තුමනි, අපට ආරංචියි, අපට විරුද්ධව පෙත්සම් එවා තිබෙනවාය කියලා. ඒ නිසා අපි ආවේ, අපට විරුද්ධව යම් චෝදනා වගයක් එල්ල කර තිබෙනවා නම් ඒවා ඔක්කොම බොරු බව කියන්නටයි; ඒවා විශ්වාස කරන්නටත් එපාය කියන්නටයි. ඕනෑම දෙයකට මුහුණ දෙන්නට අපි සූදානම්" යනුවෙන් මේ උදවිය කියා තිබෙනවා. එතකොට මහ කොමසාරිස්වරයා කිව්වේ මොකක්ද? ඒ විධියේ මොකවත් නැහැ, ඒ ගැන භය වන්නට එපා යන්නයි ඔහු කියා තිබෙන්නේ. ඒ නිසා මේ උදවිය ආපසු යන්නට ගියා. ගිහිල්ලා සුමාන තුනක් ගත වුණේ නැහැ, ගරු ඇමතිවරයා මෙය විසුරුවා හැරියා. කිසිම චෝදනාවක් ඉදිරිපත් නොකර, හදිසි නීතිය යටතේ තමයි මෙය කර තිබෙන්නේ. ගරු ඇමතිතුමාට එසේ කිරීමට බලය තිබෙන බව අපි දන්නවා. අපි එය පිළිගන්නවා. එහෙත් මෙය යුක්තියක්ද? ඒකයි අපට අහන්නට තිබෙන ප්‍රශ්නය. ගරු ඇමතිතුමා එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයකු බව අපි දන්නවා. එතුමා එක්සත් ජාතික පක්ෂයේ සිටි පලියට, පානදුරේ ඉන්න එක්සත් ජාතික පක්ෂයට අයත් හොරුන්ට සමුපකාර ව්‍යාපාරය භාර දීම හරිද? ඒ ප්‍රශ්නය මම අහනවා. මෙය දැන් හොරුන්ට භාර දී තිබෙනවා. මේ ඔක්කොම ක්‍රියා කර තිබෙන්නේ ඒ ආකාරයට බව මා හොඳට දන්නවා. ඇත්ත වශයෙන්ම ජාවාරම් කර සමුපකාර සමිතියෙන් අස් වන්නට සිදුවූ පනාවල රාළහාමිවැනි උදවියගේ වුවමනාවන් අනුවයි මෙතන කටයුතු කෙරෙන්නේ. ගරු ඇමතිතුමා මේවා නොදන්නවා වන්නට පුළුවනි. එතුමා මේවා නොකරනවා වෙන්නටත් පුළුවනි. මේවා කරන්නේ ඒ ප්‍රදේශයේ එක්සත් ජාතික පක්ෂයේ උදවියයි. හේන මුල්ල විවිධ සේවා සමුපකාර සමිතියේ වුවත් වැඩ කරගෙන යන්නට ඉඩ නොදී මේ විධියට හිරිහැර කරනවා. ඒ ගැන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

ඇමතිවරයා කරන්නේ මොකක්ද? ගරු ඇමතිතුමා මේ රටේ සමුපකාර ව්‍යාපාරය පවත්වාගෙන යන්නේ මේ රටේ ඉන්න තමන්ගේ දේශපාලන පාක්ෂිකයින්ට ජාවාරම් කරන්නට ඉඩ දීමටද? මම ඒ ප්‍රශ්නය අහනවා. ගරු ඇමතිතුමාගේ වුව මනාවට මෙවැනි අක්‍රමිකතාවන් මෙහි කෙරෙනවායයි මා විශ්වාස කරන්නේ නැහැ. ගරු ඇමතිතුමා දැනුවත්ව නම් මේ විධියේ වැරැද්දක් නොකරන බවට සැක යක් මා තුළ නැහැ. ඒ බව මා දන්නවා. එතුමා විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරයකු හැටියට සිටි කාලයේදී පෞද්ගලිකව එතුමා ගැන දැනගන්නට මට අවස්ථාව ලැබුණු නිසා එතුමාගේ අවංකභාවය ගැන මා තුළ ලොකු සැලකිල්ලක් පවතිනවා. එහෙත් ගරු ඇමතිතුමාට තමන් පිළිගන්නා උසස් ප්‍රතිපත්ති අනුවම ක්‍රියා කරන්නට ඇතැම් අය ඉඩ දෙන්නේ නැහැ. අවංකම වැඩ කරන්නට ගියොත් සමහර විට එතුමාට ඔය ඇමති ධුරය පවා නැති වන්නට ඉඩ සැලසෙන්නට ඉඩ තිබෙන බව මා දන්නවා. එහෙම තමයි සිද්ධ වන්නේ. ඒ නිසා මේවා සම්පූර්ණයෙන්ම හරිගස්සන්නැයි මා ගරු ඇමතිතුමාට කියන්නේ නැහැ. අපි සුප්‍රීම් උසාවියට ගිහිල්ලා හෝ අපට පුළුවන් ශක්ති ප්‍රමාණයේ හැටියට කරුණු ඉදිරිපත් කර මේවා හරිගස්සනවා.

අ. භා. 7.38

තුඩාවේ මයා.

(திரு. துடாவ)

(Mr. Tudawe)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගමන් විය දම් හා ප්‍රවාහණ ගාස්තු සම්බන්ධයෙනුයි මේ පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කර තිබෙන්නේ. මේ ඇස්තමේන්තුව සම්බන්ධයෙන් විස්තර ඉදිරිපත් කරමින් ගරු ඇමතිතුමා කියා සිටියේ මේ වැය ශීර්ෂය ඉදිරිපත් කරන්නට හේතු වී තිබෙන්නේ ගමන් වියදම් සහ ප්‍රවාහණ ගාස්තු සඳහාම නොවන බවයි. සමුපකාර සමිතිවල දූෂණ සහ වංචාත් අයථා පාලන යත් ගැන විශේෂ විමර්ශන කරන්නටත්, උසාවිවල යන්නටත් අවශ්‍ය නිසා මේ මුදල් වුවමනා කරන බව පෙනී යනවා. මේ කාලය තුළදී සමුපකාර සමිතිවල දූෂණ වැඩි වෙලා තිබෙන බව අපට පෙනී යනවා. මෙම උප ශීර්ෂය යටතේ මුදල් වියදම් කරනු ලබන්නේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සාමාන්‍ය ගමන් ගාස්තු ගෙවීම් සඳහා පමණක් නොවන අතර, ස්ථාන මාරුවීම් පිළිබඳ ගමන් ගාස්තු සහ සමුපකාර සමිතිවල දූෂණ, මුදල් වංචා සහ පාලනය යනාදිය පිළිබඳ විශේෂ විමර්ශන පැවැත්වීම සහ උසාවිවල පෙනී සිටීම සඳහා ගමන් ගාස්තුද වෙනුවෙනැයි ගරු ඇමතිතුමා සඳහන් කර තිබෙනවා. ගරු ඇමතිතුමා සපයා ඇති විස්තරය අනුව 1965-66 වර්ෂයේදී රු. 15,60,402 කුත්, 1966-67 වර්ෂයේ රු. 16,44,866 කුත්, 1967-68 වර්ෂයේදී රු. 16,94,132 කුත් මේ කරුණු සඳහා වැය කර තිබෙන බව පෙනී යනවා. ඒ කොයි හැටි වෙතත්, එන්ට එන්ටම සමුපකාර සමිතිවල දූෂණත් වැඩි වෙලා තිබෙනවා. සමුපකාර සමිතිවල ගණන් බැලීමත් බොහෝ දුරට ප්‍රමාද වෙලා තිබෙනවා. සමහර සමුපකාර සමිතිවල, බලාගෙන යන විට එක් අවුරුද්දක ගණන් පරීක්ෂක වාර්තා ලබා ගැනීමට තවත් අවුරුද්දක් ගතවන බව අපට පෙනී ගොස් තිබෙනවා. අවුරුද්ද ඉවර වී මාස තුනකින් නැත්නම් හතරකින් ගණන් පරීක්ෂණ වාර්තාව ලබා ගන්නට කිසිම සමුපකාර සමිතියකට බැරි වෙලා තිබෙනවා. සමහර සාංවත්සරික මහා සභා රැස්වීම් පවත්වන්නේ ඊළඟ අවුරුද්දේ අවසාන භාගයේ පමණ. හේතුව ගණන් වාර්තාව ප්‍රමාද වීමයි. එහෙත් ගරු ඇමතිතුමා එතුමාගේ වාර්තාවේ සඳහන් කර තිබෙනවා සමුපකාර සමිති පරීක්ෂකවරුන් 140 දෙනෙක් 1969 ජූලි මාසයේ සිට අලුතින් සේවයට බඳවා ගත්තාය කියා. ඔය 140 දෙනා ප්‍රමාණවත් නැහැ. සමුපකාර සමිතිවල ගණන් බැලීම් පමණක් නොවෙයි අවශ්‍ය.

සමුපකාර ව්‍යාපාරය ඉදිරියට ගෙන යන්නට මේ ආණ්ඩුවේ අදහසක් තිබෙන බව කියා මා දන්නේ නැහැ. මේ ආණ්ඩුවේ වැඩි සැලකිල්ල යොමු කරන්නේ පෞද්ගලික ව්‍යාපාර සම්බන්ධවයි. මේ රටේ සමුපකාර සංවර්ධනය නියම විධියට කිරීම නම් ගණන් බැලීම හෝ උසාවියට යෑම පමණක් නොවෙයි. සමුපකාර අධ්‍යාපනයක් ලබා දීමට වැඩ පිළිවෙළක් සකස්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කිරීමත් ඉතාම අවශ්‍යයි. සමුපකාර අධ්‍යාපනයක් දෙන්නේ නැත්නම් අපේ රටේ සමුපකාර ව්‍යාපාරය ඉදිරියට ගෙන යන්නට බැහැ. සමුපකාරය පිළිබඳ අධ්‍යාපනයක් නැති නිසා සමුපකාර සමිති හිතුවක්කාර විධියට තමන්ගේ පාලනයට යටත් කොට ගෙන පවත්වා ගෙන යන්නට සමහරුන්ට පුළුවන් වී තිබෙනවා. මේ කට යුත්තු සඳහා මේ සමුපකාර සමිති පරීක්ෂක වරුන් 140 දෙනා ප්‍රමාණවත් නැහැ. ඒ නිසා සමුපකාර අධ්‍යාපනය රටේ ප්‍රචාරය කිරීමට නැත්නම් ගම්වලට ගොස් මහජනයා එක්රැස් කර සමුපකාර ව්‍යාපාර යෙන් කරන්නට පුළුවන් සේවය ගැන මහජනයාට කරුණු කියා දීමට, සමුපකාර ධර්මය ප්‍රචාරය කිරීමට ධර්ම දූතයින් වශයෙන් ගම්වලට යන්නට පුළුවන් සමුපකාර අධ්‍යාපන අංශයට කැප වූ පිරිසක් අපට අවශ්‍යයි. ඒ අන්දමට මහජනයාට සමුපකාර ව්‍යාපාරය ගැන කරුණු ඉදිරිපත් කළොත් සමුපකාර සමිතිවල තිබෙන දූෂණ බොහෝ දුරට නවත්වා ගන්නට පුළුවන් වේවි. මහජනයාගේ අයිතිවාසිකම් මහජනයාගේ යුතුකම් සමුපකාර ව්‍යාපාරයෙන් ගන්නට පුළුවන් සේවය යනාදිය සම්බන්ධයෙන් සෑහෙන අවබෝධයක් රටේ ජනතාවට දෙනවා නම් සමුපකාර සමිති පරීක්ෂකවරුන් අඩු වුණත් කමක් නැහැ. සමුපකාර අධ්‍යාපනය ප්‍රචාරය කිරීමට වැඩ පිළිවෙළක් හදන්නට පුළුවන් නම් පරීක්ෂකවරුන්ගේ සංඛ්‍යාව අඩු කරන්නටත් පුළුවන් වේවි.

විවිධ සේවා සමුපකාර සමිති ව්‍යාපාරය ආරම්භ කළේ සමුපකාර ව්‍යාපාරය අද තිබෙන තත්ත්වයට පත් කරන්නට නොවෙයි: සමුපකාර ව්‍යාපාරය වෙනත් අංශවලට යොමු කරන්නට නැත්නම් නිෂ්පාදන කටයුතුවලට යොදවන්නටයි. ඒ අනුව බලන විට අද සමුපකාර ව්‍යාපාරය ඉදිරියට ගොස් තිබෙනවා යයි කියන්නට පුළුවන්ද? ඇත්ත වශයෙන්ම අද සමුපකාර ව්‍යාපාරය පසුබැස තිබෙනවා. සමුපකාර ව්‍යාපාරය ගැන අද අපට ආඩම්බර වන්නට බැහැ. සමුපකාර ව්‍යාපාරයේ දියුණුව ගැන දෙපාර්තමේන්තුවට පුරසාරම් කියන්නත් බැහැ. එන්න එන්නම මේ රටේ සමුපකාර ව්‍යාපාරය පිරිහිගෙන යනවා. සමුපකාර සමිති පවත්වා ගෙන යන්නට බැරි තත්ත්වයක් ඇති වී තිබෙනවා. මාතර දිස්ත්‍රික්කයේ සමුපකාර සමිති ගණනාවක්ම වසා දමා තිබෙනවා. ඒවා පණ ගන්වා ඒවා ප්‍රතිසංවිධානය කර මහජන සහයෝගය ලබා ගෙන ඒවා දියුණු කරන්නට ක්‍රියා නොකර ඒවා සමුපකාර සමිති සංගම්වලට පවරනවා නම් එහි තේරුම මොකක්ද? ජනතාවට සමුපකාර ධර්මය පිළිබඳ හැඟීමක් දෙන්නේ නැත්නම්. දුර්වල සමුපකාර සමිති නඟාසිටුවන්නට වැඩ කරන්නේ නැත්නම් ඒවා ලෙහෙසියෙන්ම සමිති සංගම්වලට පවරා දෙනවා නම් මේ රටේ සමුපකාර ව්‍යාපාරයක් නැහැ. ඒ නිසා ගමක තිබෙන කිසිම සමුපකාර සමිතියක් විසුරුවා හැර සංගම්වලට බාර දෙන්න එපා. ඒවා කෙසේ හෝ පණගන්වා ගෙන මහජන සහයෝගයත් ලබා ගෙන ආණ්ඩුවෙන් නුත් දිය හැකි ආධාර දී එයින් කරන්නට පුළුවන් සේවය ගැන කරුණු පහදා දී ඒවා නඟා සිටෙව්වොත් තමයි ජනතාවට සේවයක් කළා වන්නේ. බඩු ටික පමණක් බෙදීමෙන් වැඩක් නැහැ. බඩු ටික බෙදන අතරම ගුණ වගාව ඇති කිරීමට වැඩ පිළිවෙළක් සකස් කරන්නට ඕනෑ. සමුපකාර අධ්‍යාපනය ගැන ප්‍රචාරය කිරීමට සමුපකාර පරීක්ෂකවරුන් යෙදවිය යුතු යයි මා කීවේ ඒ නිසයි.

සමුපකාර නීතියේ දුර්වලකම් තිබෙනවා. ඒ නීතිය සංශෝධනය කරන බවට ගරු ඇමතිතුමා පොරොන්දු වුණා. මේ පරණ ව්‍යවස්ථාව වෙනස් කර අතීතයෙන් ලබා ගත් අත් දැකීම් ප්‍රයෝජනයට ගනිමින් අලුත් සමුපකාර ව්‍යවස්ථාවක් සකස් කරන්න. සමුපකාර ව්‍යාපාරයේ යෙදී සිටින හොරුන්ට තදබල දඬුවම් දෙන්නට ඒ ව්‍යවස්ථාවෙන් අවස්ථාව සලසා දෙන්නට ඕනෑ. ඒ හොරුන්ට හැංගෙන්නට හෝ පැන යන්නට හෝ ඉඩ දෙන්නට එපා. අද තිබෙන ව්‍යවස්ථාවේ ඇති දුර්වලකම් නිසා ඕනෑම තක්කඩිකමක් කර සෑන ඔල්ලේ ගෙදරට වී ඉන්නට පුළුවනි. සමුපකාර දේපල රජයේ දේපල මෙන් සලකා රජයේ දේපලවලට හානි පමුණුවන උදවියට දඬුවම් පමුණුවන්නාක් මෙන් ඒ දේපලවලට හානි පමුණුවන්නන්ටත් දඬුවම් පැමිණවීම අවශ්‍යයි. එසේ නොකර තොන් සමුපකාර ව්‍යාපාරයට එය ලොකු අවහිරයක් වෙනවා. සමුපකාර ව්‍යාපාරය

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

හරියාකාර ගෙන යන්නට නම් හොරුන්ට දඬුවම් දෙන්නට ක්‍රියා කළ යුතුයි. හිතුවක්කාර ලෙස වැඩ කරන, මහජන දේපල කොල්ල කා ගන්නා අයද සමුපකාර ව්‍යාපාරයේ යෙදී සිටින නිසා යහපත් මහජනයා මේ ව්‍යාපාරයට ඇදා ගැනීම අපහසු වී තිබෙනවා. ඒ නිසා මහජන දේපල ආරක්ෂා කර ගන්නට නීති රීති ඇති කරන්නට ඕනෑ. සමුපකාර දේපල මහජන දේපලයි. ඒවා ආරක්ෂා විය යුතුයි. කාරක සභාවට බලතල දී වැඩ කරගෙන යන්නට ඉඩ දීම පමණක් ප්‍රතිපත්තිය නොවිය යුතුයි. ඒ අතර රජය වැඩිපුර ඇඟිලි ගසන්නට යෑමත් හොඳ නැහැ. නිදහසේ ඒ ව්‍යාපාරය ගෙන යන්නට ඉඩ දිය යුතු අතරම වැරදි විධියට කටයුතු කරන්නට ඉඩ ප්‍රස්තාව නොදෙන්නටත් රජය වග බලා ගන්නට ඕනෑ. වැරදි විධියට සමුපකාර දේපල පාවිච්චි කරන උදවියට තදබල දඬුවම් දිය හැකි වන අයුරින් නීතිරීති සකස් කර තිබෙන්නට ඕනෑ.

දේශපාලන හේතු උඩ යම් කටයුතු කිරීමට රජය ඉදිරිපත් වීමත් වැරදියි. දේශපාලන ඇඟිලි ගැසීම් අනුව ක්‍රියා කිරීමක් ගැන පානදුරේ ගරු මන්ත්‍රීතුමා (ලෙස්ලි ගුණවර්ධන මයා.) සඳහන් කළා. ඇමතිතුමා නම් ඒ විධියට කටයුතු කරන්නට කැමැත්තක් නැතිව ඇති. එහෙත් යම් යම් හිතවතුන්ගේ ඉල්ලීම් අනුව ක්‍රියා කරන්නට ඇමතිතුමා වුණත් පෙළඹෙන්නට පුළුවනි. ඒක මනුෂ්‍ය ගතියක්. ඒ නිසා ඒ තත්ත්වය නැති කර දේශපාලන බලපෑම්වලින් සහ ඇඟිලි ගැසීම්වලින් තොරව යහපත් සේවාවක් ගෙන යන්නට ඉඩ දීම අවශ්‍යයි. අප ලැස්තියි, ඒ විධියට කටයුතු කරගෙන යන්න. සමුපකාරය දේශපාලනයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙනුත් අදහසක් තිබෙන බව දැනගන්නට තිබෙනවා. ඒක නම් හොඳ අදහසක් නොවේ යයි මා හිතනවා. එහෙත් මේ ව්‍යාපාරයට තිබෙන බාධාව ඒක නම් ඒ බාධාව ඉවත් කිරීමට වුණත් අපේ එකඟත්වය දෙනවා. සමුපකාර ව්‍යාපාරය අපේ රටට අවශ්‍යයි. මෙය අප විසින් ගෙන යා යුතු ව්‍යාපාරයක්. මේ ව්‍යාපාරය ලොකු හපන්කම් කර තිබෙනවා. ලංකාව ගැන මෙන්ම වෙනත් රටවල් ගැන සලකන විටත් තත්ත්වය ඒකයි. හොඳවේ සමුපකාර ව්‍යාපාරය ගැන ඔය කරුණු ටික ඉදිරිපත් කරන ගමන් එක් සමිතියක් පිළිබඳ විශේෂ කාරණයක් ගැන ගරු ඇමතිතුමාට දැනුම් දිය යුතුව තිබෙනවා.

මාතර සීමාසහිත වැලිවේරිය විවිධ සේවා සමුපකාර සමිතියට අලුතින් නිලධාරීන් තෝරා ගැනීමක් මාස කීපයකට පෙර සිදු වුණා. අලුත් නිලධාරි මණ්ඩලය පත් වූ විට පරණ නිලධාරි මණ්ඩලය ඒ අලුත් නිලධාරි මණ්ඩලයට තඹ සතයක්වත් දුන්නේ නැහැ; පොත් පත් දුන්නේ නැහැ. ඒ අය ඉවත් වෙලා ගියා. අලුත් නිලධාරි මණ්ඩලය මේ සමිතියේ තත්ත්වය ගැන කිසිවක් දන්නේ නැහැ. පරණ නිලධාරි මණ්ඩලය තඹ සතයක් නොදී යන්නට ගිය නිසා නියමිත බඩු ප්‍රමාණය ලබා ගැනීම සඳහා ලොකු දුෂ්කරතාවකට මුහුණ පාන්නට අලුත් නිලධාරි මණ්ඩලයට සිදු වුණා. සමහර විට සමිති සංගමයෙන් ණයට බඩු ගෙන එන්නට සිදු වුණා. ඒ වාගේම තමන්ගේ මුදල් යොදා බඩු ටික ටික ගෙනැවිත් බෙදා දෙන්නට සිදු වුණා. හිටපු භාණ්ඩාගාරික, සමිතියේ මුදල් වෙනත් වැඩවලට යොදවා තිබෙනවා. ඔහු සමිතියේ පොත් පත් අලුත් කාරක සභාවට භාර දෙන්නේත් නැහැ. සමුපකාර සමිතිවල එවැනි මංකොල්ලකෑම් ඇති වන්නට ඉඩ තබන්නේ ඇයි? හිටපු භාණ්ඩාගාරික ගෙන් සමිතියේ මුදල් හා පොත් පත් අර ගෙන දෙන්නට සමුපකාර දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබෙනවා. ඒ හිටපු භාණ්ඩාගාරිකට විරුද්ධව නඩු නොදමන්නේ ඇයි? තම යුතුකම් පැහැර හැරිය හිටපු කාරක සභාවට විරුද්ධව ක්‍රියා නොකරන්නේ ඇයි? ඒ කාරක සභිකයන් වැඩි දෙනා එක්සත් ජාතික පාක්ෂිකයන් නිසා ද? ඔවුන් එවැනි චණ්ඩිකම් කරන්නේ තමුන්නාන්සේලාගේ පුළුවන්කාරකම් හිතට අරගෙනයි. මොන තරම් දූෂණ ක්‍රියා කළත් තමුන්නාන්සේලාගේ උදව්වෙන් ඒවා යටපත් කර ගන්නට පුළුවන් යයි ඔවුන් විශ්වාස කරනවා. එවැනි තත්ත්වයක් ඇති වීමට ඉඩ නොදෙන ලෙස මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. මහා සභා රැස්වීමකදී හිටපු කාරක සභාව ඉවත් කොට අළුත් කාරක සභාවක් පත් කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගත්තා නම්, ඒ අළුත් කාරක සභාවට තමන්ගේ යුතුකම් ඉෂ්ට කරන්නට ඉඩ දෙන්නට ඕනෑ. අළුත් කාරක සභාවට සමිතියේ මුදල් හා පොත් පත් ලබා නොදීම කොයි තරම් වැරැද්දක්ද? එම නිසා කරුණාකර වැලිවේරිය විවිධ සේවා සමුපකාර සමිතියේ මේ අර්බුදය නිරාකරණය කර දෙන ලෙස මා ඉල්ලා සිටිනවා. පළාතේ සමුපකාර සංවර්ධන උප කොමසාරිස් තුමා ගැන වැඩිපුර යමක් කියන්නට මා කැමති නැහැ. වයස වැඩිකම නිසාදෝ සමුපකාර ව්‍යාපාරය ඉදිරියට ගෙන යන්නට එතුමාට පුළුවන්කමක් නැහැ. එම නිසා අළුත් අද හස් ඇති කෙනෙක් එම තනතුරට පත් කරනා ලෙස මා ඉල්ලා සිටිනවා. එවිට, දැනට අභාවයට යමින් පවතින ඒ සමුපකාර සමිතිවලට යළිත් පණ පොවන්නට පුළුවන්කම ලැබෙයි.

මාතර දිස්ත්‍රික්කයේ සමුපකාර සමිති සංගම්වලට ලබා ඇත්තේ ඉතා කණගාටු දායක ඉරණමක්. වැල්ලබඩපත්තු සමුපකාර සමිති සංගමය පාලනය වන්නේ, දෙපාර්තමේන්තුවෙන් පත් කළ මණ්ඩලයක් මඟින්. කඩවත් සතරේ සමුපකාර සමිතිය පාලනය වන්නේත් එවැනිම මණ්ඩලයකින්. වැලිගම් කෝරළයේ සමුපකාර සමිති සංගමයත් පාලනය වන්නේ මණ්ඩලයකින්. මොරවක් කෝරළයේ විවිධ සේවා සමුපකාර සමිති සංගමයේ තත්වයත් එසේමයි. කන්දබඩ පත්තුවේ විවිධ සේවා සමුපකාර සමිති සංගමය පවණයි මහජන නියෝජිතයන් මඟින් පාලනය වන්නේ. මෙය ඉතාමත් කණගාටු දායක තත්ත්වයක් නොවෙයිද? මාතර දිස්ත්‍රික්කයේ සමුපකාර සංගම්වලට ලබා ඇත්තේ මෙවැනි ඉරණමක් නම්, ප්‍රදේශයේ සමුපකාර ව්‍යාපාරය දියුණු තත්ත්වයක පවතිනවා යයි කියන්නට පුළුවන්ද? සමුපකාර දෙපාර්තමේන්තුවක් තිබීමෙන් ඇති ප්‍රයෝජනය මොකක්ද, සමුපකාර සංගම්වලට මෙවැනි තත්ත්වයක් උදා වන්නට ඉඩ හැර නිහඬව සිටිනවා නම්? සමුපකාර සංගමයක් නරක අතට හැරෙමින් තිබෙනවා නම් සමුපකාර දෙපාර්තමේන්තුව කරන්නේ එය තව දුරටත් නරක් වන්නට ඉඩ හැර, අන්ති මේදී එහි පාලනය දෙපාර්තමේන්තුවෙන් පත් කෙරෙන මණ්ඩලයකට පැවරීමයි. යම්කිසි සමුපකාර සංගමයක කාරක සභාවක් වැරදි විධියට කටයුතු කරනවා නම්, ඔවුන් ඉවත් කර වෙනත් කාරක සභාවක් පත් කර ගන්නට සාමාජිකයන්ට අවකාශය සැලසීමයි, දෙපාර්තමේන්තුවේ යුතුකම. එසේම, නරක විධියට නැත්නම් වැරදි අන්දමට ක්‍රියා කළ කාරක සභික යන්ට නැවතත් කාරක සභාවට පත් වන්නට ඉඩක් නොලැබෙන සේ නීති රීති සංශෝධනය කරන්නාටත් ඕනෑ. එසේ නොකොට, යම්කිසි කාරක සභාවක් වැරදි විධියට ක්‍රියා කරනවාය කියමින් ඔවුන් ඉවත් කොට, දෙපාර්තමේන්තුවෙන් පත් කෙරෙන මණ්ඩලයකට එහි පාලනය පවරනවා නම් එය සමුපකාර ප්‍රතිපත්තියට පටහැනි ක්‍රියාවක් නොවෙයිද? දැනටමත් මණ්ඩල මඟින් පාලනය වන හැම සමුපකාර සමිති සංගමයකම පාලනය වහාම ඒ ඒ සංගම්වල අළුත් කාරක සභාවලට පැවරිය යුතු යයි මා කියන්නේ නැහැ. දැනට මණ්ඩලයක් මඟින් පාලනය වන කඩවත් සතරේ සමුපකාර සමිති සංගමයේ තත්ත්වය දැන් බොහෝ දුරට හොඳ අතට හැරී තිබෙනවා. එසේම එහි පාලනය තමන් අතටම ගන්නට සමිතියේ සාමාජිකයනුත් කැමතියි. මේ ගැනත් මා ගරු ඇමතිතුමාගෙන් ප්‍රකාශයක් බලාපොරොත්තු වෙනවා. පසුගිය කාරක සභාවේ වැරදි කළ උදවිය සම්බන්ධව සෑහෙන විස්තර දෙපාර්තමේන්තුවෙන් ලබාගෙන ඒ අයට නැවත කාරක සභාවට පත් වීමට නොහැකි වන අන්දමේ නීතියක් දැමීමට ඇමතිතුමා කටයුතු කරනවා නම් ඊට මගේ එකඟත්වය ලැබෙනවා. එසේ කිරීමෙන් පළාතේ සමුපකාර ව්‍යාපාරය ඉදිරියට ගෙන යාමට කටයුතු කරන ලෙස මා ඉල්ලා සිටිනවා. එසේ නැත්නම් මෙය සමුපකාර ව්‍යාපාරයක් නොවෙයි. දැන් මෙහි තිබෙන තත්ත්වය ගැන තමුන්නාන්සේට ආඩම්බර වන්නට, සන්තෝෂ වන්නට පුළුවන්කමක් නැහැ. මේ තත්ත්වය වහාම වෙනස් කළ යුතුයි.

විශේෂයෙන් මාතර කඩවත් සතරේ ශාඛා සමිති ගණනාවක්ම මට කරුණු ඉදිරිපත් කරමින් එම සමිති ඒවායේ සාමාජිකත්වයට පවරන ලෙස ඉල්ලා තිබෙනවා. අයිතිකාරයන් පැත්තක සිටියදී ඒවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

පාලක මණ්ඩලයකට පවරා තිබීම සාධාරණ නැහැ. ඔවුන් විසින් පත් කරන ලද නියෝජිතයන් වැරදි කළ පළියට මුළු සාමාජිකත්වයටම පහර ගසා මුළු සාමාජිකත්වයෙන්ම පළිගෙන තිබෙනවා. මුළු සාමාජිකත්වයේම අයිතිවාසිකම් නැති කර තිබෙනවා. එය අසාධාරණයි. ආණ්ඩු බලය ලත් පක්ෂය වැරදි කළ නිසා වෙනත් පක්ෂයක් බලයට පත් කරගැනීමේ අයිතිය මහජනතාවට නොදී, එක් පුද්ගලයකුට රට පාලනය කිරීම බාර දෙනවා වැනි වැඩක් මේක. එක්සත් ජාතික පක්ෂයට ප්‍රශ්නය විසඳන්නට බැරි නිසා, තමන් කැමති වෙනත් පක්ෂයක් බලයට පත් කර ගැනීම සඳහා මහජනතාවට අවස්ථාවක් නොදී, කිසියම් පුද්ගලයකු හෝ දෙදෙනකු තෝරා තමුන්නාන්සේලාට පමණයි මෙය කරන්නට පුළුවන් කියා ඔවුන්ට පාලනය බාර දෙනවා නම් එය අසාධාරණයි. ඉහත කී සමුපකාර සමිති සම්බන්ධයෙන් සිදුවී තිබෙන්නේ එවැනි දෙයක්. සමුපකාර ව්‍යාපාරයේ දියුණුව සඳහා අවංකව වැඩ කරන නිසා ගරු ඇමතිතුමා කෙරෙහි මගේ විශේෂ සැලකිල්ලක් තිබෙනවා. එහෙත් සාමාන්‍ය මනුෂ්‍ය ගතියක් වශයෙන් යම් යම් බලපෑම්වලට යට වීමට එතුමාට සිදු වී තිබෙනවා.

මාතර දිස්ත්‍රික්කයේ සමුපකාර සමිති සංගම්, සාමාජිකත්වයට බාර දිය යුතුය යන්න මගේ ප්‍රධාන ඉල්ලීමයි. අනෙක් සමිති සංගම් තුනත් සම්බන්ධව කරුණු සොයා බලා ඒවාත් මහජනයාට බාර දෙන්න.

තවත් වැදගත් කරුණක් ඇමතිතුමා ගෙන් දැනගත යුතුව තිබෙනවා. සමුපකාරය පිළිබඳව කොමිෂන් සභාවක් පත් කරන්නට යෙදුණා. එහි වාර්තාව ගැන අපට මෙතෙක් කිසිවක් දැනගන්නට නැහැ. එය මෙතෙක් මෙම ගරු සභාවට ඉදිරිපත් කර නැහැ. පත්තර මාර්ගයෙන් නම් ඒ සම්බන්ධව නොයෙක් නොයෙක් දේ දකින්නට ලැබුණා. ඒ ගැන යමක් මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට මා කැමති නැහැ. මේ රටේ සමුපකාර ව්‍යාපාරය දියුණු කිරීම සඳහා කැනඩාව ආදී රටවලින් විශේෂඥයන් කැඳවන්නට යන බවත් අපට දැනගන්නට ලැබී තිබෙනවා. මේ රටේ සමුපකාර ව්‍යාපාරය අඩ සියවසකටත් වඩා පැරණියි. එම නිසා සමුපකාරය පිළිබඳව ගුරුකම් ගැනීමට අපට පිටරට විශේෂඥයන් වුවමනා නැහැ. සමුපකාර ව්‍යාපාරය නියම මාර්ගයේ ගෙනයා හැකි අය මේ රටේ ඕනෑ තරම් සිටිනවා. සමුපකාරය සමාජවාදී ව්‍යාපාරයක් නිසා එය ඉදිරියට ගෙන යාමට, දියුණු කිරීමට, තමුන්නාන්සේලා සූදානම් නැහැ.

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி. சொய்சா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

ගරු සභාපතිතුමනි, රාත්‍රී කෑමට අඩු ගණනේ පැයක්වත් විවේක දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා
(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

If hon. Members agree, I have no objection.

ගරු ආචාර්ය දහනායක
(கௌரவ கலாநிதி தகநாயக்க)
(The Hon. Dr. Dahanayake)

තවත් කාලය ගත කරන්නේ මොකට ද? දිගටම රැස්වීම පවත්වාගෙන යමු.

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி. சொய்சா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

මෙහි අප කවුරුත් නැති අවස්ථාවේදී තමුන්නාන්සේලා පරිපූරක ඇස්තමේන්තු කිපයක් ඉක්මනින් අනුමත කර ගත්තා. තව ටික වේලාවකින් විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් තව කිප දෙනකු මෙහි පැමිණෙනවා. ඒ අය මේවා සම්බන්ධව කතා කරන්න අදහස් කරනවා. එම නිසා, කරුණාකර අඩු ගණනේ විනාඩි 45ක්වත් කෑම සඳහා විවේකයක් දෙනා ලෙස මා ඉල්ලනවා. අප ගැන නොව මේ වාතීකාර මහත්වරුන් ගැන කල්පනා කර බලන්න. ඒ උදවිය ඊයේත් වැඩ කර අදත් මේ විධියට කෑමට පවා විවේකයක් නැතිව වැඩ කරන්නේ කොහොමද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

ගරු ආචාර්ය දහනායක
(கௌரவ கலாநிதி தகநாயக்க)
(The Hon. Dr. Dahanayake)
ඒ උදවිය අද "ඔවර්ටයිම්" ටිකක් හම්බ කර ගත්තාවේ. ඒ මහත්වරුන් සතුටුයි වැඩ කරන්න.

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி சொய்சா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)
අඩු ගණනේ විනාඩි 45 ක වත් විවේකයක් දෙන්න.

කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා
(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Do you want to continue or do you wish that the Sitting should be suspended for dinner ?

ගරු ආචාර්ය දහනායක
(கௌரவ கலாநிதி தகநாயக்க)
(The Hon. Dr. Dahanayake)
If you are willing to remain, why cannot we ?

කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා
(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
If hon. Members agree, I do not mind waiting.

අ. භා. 8

කාරියවසම් මයා.
(திரு. காரியவசம்)
(Mr. Kariyawasam)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව පිළිබඳව වචන ස්වල්පයක් ප්‍රකාශ කළ යුතුව තිබෙනවා. විශේෂයෙන්ම මේ අවස්ථාවේදී ඇමතිතුමාගේ අවංකභාවය පිළිබඳව විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් දෙපොළක්ම කථා කරන්නට යෙදුණා. විරුද්ධ පාර්ශ්වයේ අප සියලු දෙනාම තමුන්නාන්සේ අවංක බව පිළිගන්නවා. නමුත් ඇමතිතුමා කොපමණ අවංක වුණත් ඇමතිතුමාගේ භාරයේ තිබෙන දෙපාර්තමේන්තුව යම් අන්දමකින් අවංක භාවයෙන් පිට පැන කටයුතු කරනවා නම් ඇමතිතුමාගේ අවංකභාවයටත් කැළලක් ඇති වන්නට ඉඩ තිබෙන බව මා මතක් කරනවා. නමුත් පෞද්ගලික වශයෙන් ඇමතිතුමා අවංකව කටයුතු කරන තාක් කල් එතුමාට අපකීර්තියක් නොවන බවත් මා ඒ සමඟම කියන්නට සතුටුයි.

මාතර ගරු මන්ත්‍රීතුමා (තුඩාවේ මයා.) කිවාක් මෙන්, මේ රටේ ගැමි ජනතාවට සමුපකාර ව්‍යාපාරය ගැන අධ්‍යාපනයක් දෙන්නට කටයුතු කරන්නට ඕනෑ. ඒ සඳහා ඇමතිතුමා පියවරක් ගනීවිය කියා මා බලාපොරොත්තු වෙනවා. ඇත්ත වශයෙන්ම අද ගැමි ජනතාව තුළ සමුපකාර ව්‍යාපාරය ගැන කිසිම අවබෝධයක් නැහැ. සමුපකාරය කියන්නේ රුපියල් පහ පහ එකතු කර කඩයක් දමා බඩු ගෙනැවිත් විකිණීමය කියා ඔවුන් කල්පනා කරනවා. සමුපකාරය ගැන ඇතැමුන් තුළ අවබෝධය එපමණයි. ඇල්පිටියේ සමුපකාර රැළි යකදී මේ රටේ ජනප්‍රිය නළුවකු වන ජෝ අබේවික්‍රම මට හමුවුණා. මා ඒ අවස්ථාවේදී ඔහුට කවියක් කියන්න කිව්වා. එතකොට ඔහු ප්‍රසිද්ධියේ නම් බැහැ නමුත් රහසින් කවියක් කියන්නම්ය කිව්වා. ඔහු කී කවිය මේකයි :

"සමුපා	කාරය
හොරකම්	වකාරය
අපායට	එය
මැදින්	පාරය"

සමුපකාරය ගැන මේ රටේ මහජනතාව අතර තිබෙන සාමාන්‍ය හැඟීමයි ඒ කවියෙන් පිළිබිඹු වෙන්නෙ. මේ හැඟීම නැති කරන තුරු මේ රටේ සමුපකාර ව්‍යාපාරය දියුණු කරන්නට බැහැ. එවැනි හැඟීමක් ඇති වන්නට හේතුව කුමක්ද කියා සොයා බලා පියවරක් ගතයුතුව තිබෙනවා. ඇත්ත වශයෙන්ම අද තිබෙන තත්ත්වය ඉතාම භයානකයි. සමුපකාර බැංකුවක් විවෘත කරන්නට ගරු ඇමතිතුමා ගාලු දිස්ත්‍රික්කයට පැමිණි අවස්ථාවේදී සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව පිළිබඳව මා එක් තරා ඉල්ලීමක් කළා. මේ දෙපාර්තමේන්තුවට වාහන සපයන්නය කියා මා එක් ඉල්ලීමක් කළා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගණපූරණයක් නැහැ.

මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට ගණපූරණයක් නොතිබියෙන්, බෙදුම් සිනු ශබ්ද කිරීමට නියෝග කරන ලදි.

පසුව ගණපූරණයක් තිබූයෙන්—

சபை எண்ணப்பட்டு நிறைவெண் இல்லாததால் பிரிவு மணி அடிக்கப்பட வேண்டுமென ஆணையிடப்பட்டது.

பிறகு, நிறைவெண் இருந்ததனால்—

House counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.

Later, a Quorum being present—

කාරියවසම් මයා.
(திரு. காரியவசம்)
(Mr. Kariyawasam)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇමතිතුමනි, ඇමතිතුමා ගාලු දිස්ත්‍රික්කයට පැමිණි අවස්ථාවේදී මා කළ ඉල්ලීමක් ගැනයි මා කථා කරමින් සිටියේ.

ගාල්ලේ සමුපකාර කොමසාරිස්තුමාගේ කාර්යාලය මහින් ඉතා විශාල වැඩ කොටසක් කළ යුතුව තිබෙන බව පෙනෙනවා. ගාලු දිස්ත්‍රික්කය ඉතා විශාල බව අප දන්නවා. එම නිසා එම ප්‍රදේශයේ සංවර්ධන කටයුතු කිරීම සඳහා විශාල කාර්ය මණ්ඩලයක් අවශ්‍යයි. දැන් සිටින කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බව ගරු ඇමතිතුමාට අප කියා තිබෙනවා. එතරම් විශාල ප්‍රදේශයක වැඩ කටයුතු සඳහා එකම වාහනයක්වත් ලබා දී නැහැ. එම ප්‍රදේශයේ ඇති කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑ තරම් වාහන තිබෙනවා. ඒවායින් බොහොමයක් නිකම් තිබෙනවා. එහෙත්, ඒවායින් එකක් හෝ මෙම ස්ථානයට මාරු කර දෙන්නට කටයුතු යොදා ඇත්තේ නැහැ. එම ඉල්ලීම ඉටු කර දෙන බවට ගරු ඇමතිතුමා පොරොන්දු වී ඇතත්, අද වන තුරුම ඒ ගැන කිසි වැඩ පිළිවෙළක් යොදා නැහැ. මෙම මුදල්වලින් ගන්නට යන අළුත්ම වාහනවලින් එකක් එම ප්‍රදේශයට ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

මෙම ප්‍රදේශයේ සමුපකාර ව්‍යාපාරය පිළිබඳව පවතින තත්ත්වය ගරු ඇමතිතුමා දැනගෙන සිටිය යුතුයි. මෙම ප්‍රදේශයේ සමුපකාර සංගම්වලින් හුඟ හරියක් අකාලයේ දූෂණයට ගොදුරු වී මැරී ගොස් තිබෙන බව කියන්නට සිදු වී තිබෙනවා. අළුත් උප කොමසාරිස්තුමා මෙම තත්ත්වය නැති කරන්න කොතරම් මහන්සි ගත්තත් ඒ මහන්සියෙන් වැඩක් සිදු නොවන බව කිව යුතුයි. එතුමා මෙහාට කොතෙක් වාර්තා එව්වත් ඒවා ගැන සලකා බැලීමක් නැහැ. එම නිසයි එන්ට එන්ටම මෙම තත්ත්වය බරපතළ වන්නේ.

මෙම දූෂණ තත්ත්වයට ගොදුරු වීම නිසයි මගේ කොට්ඨාශයේ සමිති ගණනාවක්ම වසා දමන්ට සිදු වී තිබෙනවා. කොතෙක් අඩපණව ගිය සමිතියක් වුවත් පණ ලබන එක්තරා අවස්ථාවක් තිබෙනවා. සමුපකාර සමිති සංගමයට නිලධාරීන් තෝරනු ලබන දිනට පෙර දිනයේ සි මෙම ප්‍රාණවත් භාවය ඇති වන්නේ. නැවත වරක් සංගමයට රුපියල් 100 ක් ගෙන ගොස් දීලා එහි සාමාජිකත්වය අළුත් කර ගන්නට බොහෝ දෙනා පෙළඹෙනවා. එසේ කොට එහි ඡන්දය ලබාගෙන සභාපතිකම හිමි කරගන්න තුරු පමණයි එම ප්‍රාණවත් භාවය තිබෙන්නේ. ඒ අන්දමට පණ ලබන සමිති ගණනාවක් තිබෙනවා. ගොඩාමුණ විවිධ සේවා සමුපකාර සමිතිය, මත්තක විවිධ සේවා සමුපකාර සමිතිය, බඹරවාන විවිධ සේවා සමුපකාර සමිතිය, මාරතුපිටිය විවිධ සේවා සමුපකාර සමිතිය, යනාදී සමිති ගණනාවක්ම තිබෙනවා. ඒවා පිළිබඳව විදුලි පුවත් මහින් පවා ගරු ඇමතිතුමාට සහ සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමාට මවිසින් දන්වා එවා තිබෙනවා. ඒවා ගැන විභාග කරන බව දන්වා එවා ඇතත් මේ වන තුරු කිසිවක් කෙරී නැහැ. මේවා ගැන සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමාගෙන් ඇසුවාම එතුමා කිසිවක් කියන්නේ නැහැ. ගොඩාමුණ විවිධ සේවා සමුපකාර සමිතියේ රුපියල් 32,000 ක වංචාවක් සිදුවුණු හෙයින් එම සමිතිය වසා දමා තිබෙනවා. එය නැවත පණ ලබන්නේ සමුපකාර සමිති සංගමයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සභාපතිවරයා තෝරන විටයි. අද ඇල්පිටියේ විවිධ සේවා සමුපකාර සමිති සංගමයේ සභාපතිවරයා වී සිටින්නේ ගොඩාමුණේ සංගමයේ සභාපතිවරයායි.

ජෝර්ජ් කොතලාවල මයා. (බණ්ඩාරගම)

(திரு. ஜோஜ் கொத்தலாவல—பண்டாரகம)

(Mr. George Kotelawala—Bandaragama)

වලපනේ තත්ත්වය කොහොමද?

කාරියවසම් මයා.

(திரு. காரியவசம்)

(Mr. Kariyawasam)

වලපනේට එහා ගම්වලත් ඊට වඩා සිදු වීම් ඇති වී තිබෙනවා. උසාවියෙන් පැමිණි මන්ත්‍රීවරයා වශයෙන් මේ පිළිබඳව නීත්‍යානුකූල තීරණයක් දෙන ලෙස මා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා. ගොඩාමුණ විවිධ සේවා සමුපකාර සමිතියේ සභාපතිවරයා අද ඇල්පිටිය විවිධ සේවා සමුපකාර සමිති සංගමයේද සභාපතිවරයා වෙනවා. ගොඩාමුණ සමිතියේ රුපියල් 32,000 ක වංචාවක් සිදු වුණු නිසා අද එහි කිසිම තත්ත්වයක් ඇත්තේ නැහැ. නමින් පමණයි එම සමිතිය තිබෙන්නේ. එහි සභාපතිවරයා අද ඇල්පිටිය විවිධ සේවා සමුපකාර සමිති සංගමයේ සභාපතිවරයා වී සිටින්නේ කෙසේද? වැසී ඇති සමිතිවලට රුපියල් 100 බැගින් බදි නවා. බැඳලා ඒ සමිතිවල ඡන්දය ලබාගෙන සභාපති වෙනවා. මෙවැනි තත්ත්වයක් පවතින විට මේ සමිතියේ දූෂණ ක්‍රියා සිදුවේද නැද්ද කියා තමුන්නාන්සේලා කල්පනා කර බැලිය යුතුයි. ඇල්පිටිය විවිධ සේවා සමුපකාර සමිති සංගමය කාලයක් පාලනය කළේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් කොමිටියක් දමලයි. මාතර ගරු මන්ත්‍රීතුමා (තුඩාවේ මයා.) කෙසේ කිව්වත් ඒ කාලයේ මීට වඩා අමුතු තත්ත්වයක් ඇති වී තිබුණු බව කියන්නට පුළුවනි. එම නිලධාරීන් ඉතා හොඳින් සේවය කර තිබෙන බවයි පෙනෙන්නේ. එහෙත් අපි භාර ගත්තායින් පසු ඊට වඩා වෙනස් තත්ත්වයකින් කටයුතු කෙරෙන බවයි පෙනෙන්නේ. සමුපකාර සමිතිවල නිල වලට සුදුස්සන් පමණක් පත් කර ගන්නට පුළුවන් වන ආකාරයට කටයුතු කරන්න ඕනෑ. සමුපකාර සමිති පිළිබඳ නීතිය ඉතා දුර්වල නිසා හොරුන්ට ඒ සමිතිවල සැඟවී සිටීමට ඉඩ තියෙනවා. ඒ නිසා සමුපකාර ව්‍යවස්ථා මාලාව සම්පූර්ණයෙන්ම වෙනස් කර කිසිම හොරෙකුට ඒ සමිතිවලට රිංගා ගැනීමට බැරි වන විධියට කටයුතු සලස්වන්නට ඕනෑ.

ආහාර ද්‍රව්‍ය බෙදා හැරීම වැඩි වශයෙන්ම සිදු වන්නේ සමුපකාර සමිති සමාගම් මාර්ගයෙනුයි. මගේ කොට්ඨාශයේ තිබෙන නියාගම සමුපකාර සමිතියෙන් බෙදා හරින හාල් තිරිසනකුටවත් කන්න බැහැ. මාසයක් දෙකක් තිස්සේ බෙදා දෙන්නේ මේ හාලයි. මේ හාල් කොහෙන් ගෙනෙනවද කියා මා දන්නෙ නැහැ. අතුගා දමන හාල් මිට් කර විකුණනවාද දන්නෙ නැහැ. ඇල්පිටිය සමුපකාර සංගමය මගින් බෙදා හරින හාල් මනුෂ්‍ය ආහාරයට කිසිසේත් සුදුසු නැති නිසා මනුෂ්‍ය ආහාරයට සුදුසු හාලක් ඒ ප්‍රදේශයට බෙදා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හාල් පොත් පිළිබඳවත් ලොකු ගැටලුවක් තිබෙනවා. හාල් පොත් තියෙන අයගේ ගෙවල් බිඳ හොරුන් ඒ හාල් පොත් අරගෙන ගියාම ඔවුන්ට නැවත හාල් පොත් ලබා ගන්නට බැහැ. එක දුප්පත් ගෙදරක මිනිසුන් හාල් පොත් පරෙස්සම් සඳහා ගෙදර තිබෙන පෙට්ටියේ දමා තිබෙනවා. ගේ බින්ද හොරුන් පෙට්ටිය පිටින්ම උස්සාගෙන ගිහින් තියෙන නිසා හාල් පොත් නැති වී තිබෙනවා. ගේ හොරු බින්ද බව පොලිසියත් පිළිගන්නවා. නමුත් හොරුන් අල්ලන්නෙ නැතිව නඩු පවරන්න බැහැ. ඇත්ත වශයෙන්ම ගේ හොරු බිඳ තිබෙන බව පොලිසියෙනුත් ඒ. ආර්. ඕ. මහත්මයාට ලිපියකින් දන්වා තිබෙනවා. දිසාපතිතුමාටත් ආහාර දෙපාර්තමේන්තුවටත් මේ ගැන දන්වා තිබෙනවා.

බෙලිගම්මන මයා.

(திரு. பெலிகம்மன)

(Mr. Beligammana)

මන්ත්‍රීතුමා මහන්සි වෙනවා නම් ගේ පොත් ලබා දෙන්න පුළුවන්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කාරියවසම් මයා.
(திரு. காரியவசம்)
(Mr. Kariyawasam)

ඒ උප ඇමතිතුමා ම්‍රාවනැල්ල පැත්තේ හොරෙන් පොත් දෙනවා ඇති. ඒ නිසයි, එහෙම කියන්නේ. ගරු ඇමතිතුමනි, ඒ උප ඇමතිතුමා ඒ විධියට පොත් දෙනවා නම් අපටත් ඒ පිළිවෙළට පොත් ලබා ඉදන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)

නැහැ, නැහැ. එහෙම දෙන්නෙ නැහැ.

කාරියවසම් මයා.
(திரு. காரியவசம்)
(Mr. Kariyawasam)

කෙසේ වෙතත් මා කී පිළිවෙළට අමාරුවේ වැටී සිටින අයට නැවත භාල් පොත් ලබා ගැනීමට පිළිවෙළක් ඇති කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගාලු කොට්ඨාශයේ සිටින්නේ ඉතාමත් අමාරුවෙන් කටයුතු කරන සමුපකාර නිලධාරි පිරිසක්. කාර්ය මණ්ඩලය මදි නිසා සහකාර කොමසාරිස්තුමා කාර්යාලය ඇතුළේ ඉදගෙන පාන් කෑල්ල කකා වැඩ කරනවා මා දැක තිබෙනවා. ඒ නිලධාරීන්ට යන්න එන්න වාහනයක් නැහැ. මේ විධියේ තත්ත්වයක් තියෙද්දී හරියට වැඩ කරන්නෙ කොහොමද? මේ නිලධාරීන්ට නොයෙකුත් දූෂණ කෙරෙන තැන් කිහිපයක්ම පාලනය කරන්නට තියෙනවා. බොහොම අමාරුවෙන් ඒ දූෂණ පිළිබඳව කරුණු සොයාගෙන වාර්තා කළාම මෙහෙන් ඒ පිළිබඳව තීරණ ගන්නෙ නැහැ. දූෂණ තිබෙන සමුපකාර සමිති විසුරුවා හැරීමට බල කරන්නෙ නැත්නම් සමුපකාර ව්‍යාපාරය දියුණු කරන්න බැහැ. සමුපකාර ව්‍යාපාරය පිළිබඳව නළුවකුගේ කටින් පිටවුණු,

"සමූපාකාර ය
පිටතින් අලංකාර ය
හොරකම් වකාර ය
අපායට ඒ මැදින් පාර ය"

කියන වැටහීම ඇතුවයි කටයුතු කරන්නට සිදු වෙන්නේ. ඒ නිසා මේ දූෂණ ගැන සොයා බලා වහාම දූෂණ පවතින සමිති විසුරුවා හරින්නට කටයුතු කරන ලෙස මා ඉල්ලා සිටිනවා. ඒ වගේම හොරකම් කරන උදවියට මේ රටේ දෙන්නට පුළුවන් ඉතාම තදබල දඩුවම් පැමිණවීම සඳහා නීති මාලාවක් සකස් කරන ලෙසත් මා ඉල්ලා සිටිනවා.

එම්. ඒ. ඩැනියෙල් මයා. (හේවාහැට)
(திரு. எம். ஏ. டானியல்—ஹேவாஹெற்ற)
(Mr. M. A. Daniel—Hewaheta)

ඒ දඩුවම් එකක් දෙකක් නම් කරන්න බලන්න.

කාරියවසම් මයා.
(திரு. காரியவசம்)
(Mr. Kariyawasam)

තමුන්නාන්සේ වගේ උදවිය අනුවුණෙන් කටු පිප්පෙ දමන්න වටිනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තමුන්නාන්සේට ස්තුතියි.

අ. භා. 8.16

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සාකච්ඡාව ටිකක් පළල් වුණු නිසා කෙටියෙන් වත් මේ අවස්ථාවට වැදගත් වන්නා වූ කරුණු දෙක-තුනක් ඉදිරිපත් කිරීම් පිණිසයි, කථා කරන්නට මා අවසර ඉල්ලා සිටියේ. මුලින්ම එකක් කියන්නට ඕනෑ. මේ සමුපකාර දෙපාර්තමේන්තුවට නොයෙක් බලතල තිබෙන බව ඇත්තයි. ඒ යටතේ සමුපකාර පරීක්ෂකයින්ද, නොයෙක් නිලධාරීන්ද නොයෙක් අවස්ථාවල ඒ ඒ සමිතිවලට ගොස් යම් යම් පරීක්ෂණ පවත්වන බවත්, ඒ ස්ථාන වල වැඩ කටයුතුවලට සහභාගි වන බවත් ඇත්තයි. ඒ නිසා ඒ සංචාර සඳහා සිදු වන වියදම් මේ ක්‍රමය තිබෙන තුරු ප්‍රමාණවත්ව තිබිය යුතු බවත් ඇත්තයි. ඒ නිසා ඇත්තටම සමුපකාර ව්‍යාපාරයේ ක්ටයුතු ගෙන යෑම සඳහා ඉල්ලන්නා වූ මුදලක් දෙන්නට බැරිය කියා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අපි කවදාවත් කියා ඇතැයි මා හිතන්නේ නැහැ. එහෙත් යන්නේ කුමකටද, වෙන්නේ කුමක්ද කියන ප්‍රශ්න ගැන අපි යම් යම් කරුණු ඉදිරිපත් කිරීම මේ වෙලාවේ හැටියට වරදක් නැහැ කියා මා විශ්වාස කරනවා.

දෙපාර්තමේන්තුවෙන් හෝ ඇමති අංශයෙන් මට ගිය සතියේ විස්තර සහිත ලිපියක් ලැබුණා. ඒ ලිපිය ලැබුණේ මා දෙපාර්තමේන්තුවටත්, මෙතැන ඇමතිතුමා සමඟ යම්කිසි සාකච්ඡාවකදීත් මතු කළ පැලවත්තේ සමුපකාර සමිතිය ගැනයි. දැන් නැවතත් එය මතක් කරමින් පිළිතුරේ සඳහන් වී තිබෙන කරුණුවල සාරාංශය මෙතැන ප්‍රකාශ කරන්නට යන්නේ මේ ගරු සභාවේ දැන් මෙතැන බඩගින්නේ වුණත්, සිටින්නා වූ අප කල්පනාවට ගත යුතු දෙයක් ගැන මතක් කරන්නටයි. සමුපකාර දෙපාර්තමේන්තුවට තිබෙන බලතල පාවිච්චි කරන, නොකරන විධියත්, නැත හොත් වෙනත් බලතල තිබිය යුතුද, එසේත් නැත්නම් මේ දෙපාර්තමේන්තුව තිබිය යුතුද, යන ප්‍රශ්න මෙයින් මතු වෙනවා. පැලවත්තේ සමුපකාරය පිළිබඳව මා මේ ස්ථානයේ සඳහන් කළ කරුණු ඒ ලිපියේත් සඳහන් කර තිබෙනවා. දෙපාර්තමේන්තුවේ පරීක්ෂණවලින් ඒ චෝදනා ඔප්පු වී තිබෙනවා.

අවුරුදු 4 කට පසු පැලවත්තේ සමිතියේ ගණන් පරීක්ෂාකර බැලීමට පරීක්ෂක තුමා "දෙපාර්තමේන්තුවෙන් එන්නට නියම වුණාම, මුළු පැලවත්තම දන්නා වූ දෙයක් එහිදී එළිදරව් වෙන්නට ඉඩ තිබුණා. එතැන ණය දෙන විට සිදු වූ වංචා වැනි නොයෙක් වංචා නිසා විශාල මුදල් හිඟයක් ඇති බවත්,—බොහොම කන ගාටුයි කියන්න—එතැන මැනේජර් මහත්මයාම විශාල මුදල් වංචාවක් කර තිබෙන බවත්, මතු වන්නට ඉඩ තිබුණා. මා මෙතන කියා සිටියේ උන්නැහේ තමන්ගේ ප්‍රශ්නය බේරා ගැනීමට ගත් පියවර ගැනයි. එක දවසක් රෑ ගෙවල් බිඳිමක් ඇති වුණා. ඇත්තෙන්ම එවැන්නක් සිදු වුණා හෝ ඇති වුණා නොවෙයි. ඒ ස්වරූපයේ තත්ත්වයක් ඇති කළ බවයි මට කියන්නට තිබෙන්නේ. පැනපු පල් හොරු ටික කවුරු වේවා, අමුතු තාලයේ හොරු ටිකක් බව නම් අපට පැහැදිලිවම කියන්නට පුළුවනි. ඇයි එහෙම කියන්නේ? මේ ස්ථානයට ආවේ නියම හොරුන්ම නම් ඔවුන්ට ගෙන යෑමට තරම් වටිනා දේවල්ම සෑහෙන ප්‍රමාණයක් එතන තිබුණා‍ය කියන්නට පුළුවනි. රෙදිපිළි තොගයක් එහෙමත් තිබුණා. ඒ කොයි හැටි වෙතත්, හොරකම් කෙළේ පොත් ටික පමණයි.

දැන් ඉතින් මෙතන පාලනය ප්‍රතිසංවිධානය කිරීමට පියවර ගන්නා අතර මෙවැනි මැනේජර් කෙනෙක් තව දුරටත් තබාගෙන වැඩ කරනවා නම්, නැවතත් සිද්ධ වන්නේ එවැනි දේ බවයි මට කියන්නට තිබෙන්නේ. ඒවා නවත්වන්ට නම් අඩු ගණනේ එයාගේ වැඩ නවත්වා පරීක්ෂණයක් පවත්වා විධිමත් වැඩ පිළිවෙළක් අනුගමනය කළ යුතුව තිබෙනවා. මා කියන කරුණ ඇත්ත නම්, තීරණයක් ගැනීම පහසුයි. මා කියනවා ඕනෑම සාධාරණ කෙනෙකුට සාධාරණවත් යුක්තිසහගතවත් පිළිගත හැකි එක ප්‍රශ්නයක්—කාගේ වාසියටද මේ සිද්ධිය වෙලා තියෙන්නේ කියන ප්‍රශ්නය—ඇසිය යුතුය කියා. මෙය සිදු වී ඇත්තේ මැනේජර් මහත්මයාට වාසි වන ආකාරයට නම්, මේ හොරකම ඔහු විසින්ම හැඩ ගැස්සුවාය කියන අනුමානය උඩ ඔහු අයින් කරන්නට සම්පූර්ණයෙන්ම බලය තිබෙනවා. මා නම් කියන්නේ එසේ කරන්නට සම්පූර්ණ බලය තිබෙන බවයි. සාමාන්‍ය නීතියේ හැටියටත් එසේ කරන්නට පුළුවනි. එහෙත් ලියමනකින් කියනවා, අපි මෙතන පරීක්ෂණයට ගියාම එය පැවැත්වීමට තිබිය යුතු පොත්පත් නැති නිසා මැනේජර් මහත්මයාට විරුද්ධව කිසිම දෙයක් කරන්නට බැරිය කියලා. ඉතින් මේවා කාට කියන්නද? මම නම් එකක් කියනවා. ගරු ඇමතිතුමනි, මා සමුපකාර කටයුතු භාර ඇමතිවරයා නම්—එවැනි තත්ත්වයක් මට නම් කවදාවත් ලැබේ දෝයි කියන්නට මා දන්නේ නැහැ—මට විරුද්ධව ඕනෑම කෙනෙක් මොනවා මතු කළත්, මම ඇමති කාර්යාලයෙන්ම නියෝගයක් යවිනවා, ඔය මිනිහා අස්කරන්නය කියලා. ඒ සඳහා වැය වන ඕනෑම මුදලක් දෙපාර්තමේන්තුවෙන් වැය කරන්නය කියලත් නියෝග කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඩැනියෙල් මයා.
(திரு. டனியல்)
(Mr. Daniel)

ඊට පස්සේ ඔය ගරු මන්ත්‍රීතුමාම උසාවියට ගිහිල්ල ඒ මිනිහා බේරා ගැනීමට ඉදිරිපත් වේවි.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(டொக்டர் கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

මම කොයි විධියේ අංශවල වැඩ කරන වාද කියන එක හේවාහැට ගරු මන්ත්‍රීතුමා දන්නේ නැහැ. ඒ නිසා ඔය තමන් නොදන්න දේවලට කට ගහන්න එන්න එපා. නොදන්න දේට කට ගහන්නෙ නැතිව නිකම් ඉන්න එක වඩා හොඳයි. සමුපකාර හොරකමක් පිළිබඳ නඩුවකට වත් ඔය මන්ත්‍රීතුමා වෙනුවෙන් මම ඉදිරිපත් වෙලා නියෙනවාද? බඩගින්නේ අපි මෙතන ඉදගෙන වැදගත් දේ ගැන කථා කරන විට ඒ විධියට කථා කරන්න එපායැ.

ඩැනියෙල් මයා.
(திரு. டனியல்)
(Mr. Daniel)

අපිත් බඩගින්නේ තමයි ඉන්නේ.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(டொக்டர் கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

බඩගින්නෙ ඉන්න බොහෝ දෙනා සමහර විට කන්ට කට අරිනවා මිස වෙන දේට කට අරින්නේ නැහැ. මේ වාගේ දේට කට අරින්ට ඇවිත් නිකම් මෝඩ වෙන්ට එපා. මොනවටද නිකම් මේවා ගැන වචන කියන්නේ?

කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා
(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Do not take notice of interruptions.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(டொக்டர் கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

Thank you. එතකොට, මම කියනවා, මේ විධියට මේ වැඩ කරගෙන යන්න බැහැ කියලා. මෙතනදී මම මතු කරන්නේ වෙනත් ප්‍රශ්නයක්. අපේ රටේ සමුපකාර නීති තිබෙනවා. මේ නීතිවල නොයෙක් පැතිවලින් දුර්වලකම් තිබෙන බව නොයෙක් වතාවල මා පෙන්වා දී තිබෙනවා. එහෙම නැත්නම් නිසි අවස්ථාවල, නිසි අන්දමට, නිලධාරීන්ගේත් ආරක්ෂාව ඇති වන ආකාරයට, සමුපකාර නීතිය යටතේ ලැබෙන බලය පාවිච්චි කරමින් අණක් දෙන්නට පුළුවන්කමක් මේ දෙපාර්තමේන්තුවට තිබෙන්නට ඕනෑ. සමුපකාර සමිතිවලට භාරයි කියා ඔය දෙක ටම මැද්දේ වැඩ කරන්නට ගියාමයි කාටත් අමාරුව ඇති වන්නේ. මේ නීතියේ පුදුම දේවල් තිබෙනවා. ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේට ලැබුණාය කියන වාර්තාවේ අවශ්‍ය වැඩි විස්තර සියල්ලම අඩංගු කර ඇතැයි මම නම් හිතන්නේ නැහැ. උසාවියේ දී තමයි මේවා ගැන එක්තරා විධියකට විවේචනයකට සම්බන්ධ වන්නට අවස්ථාවක් ලැබෙන්නේ.

මම එකක් මතක් කරන්නම්. සමුපකාර දෙපාර්තමේන්තුවේ කොමසාරිස්තුමාට හෝ සහකාර කොමසාරිස්වරුන්ට බලය තිබෙනවා සමිතිවල ලියා පදිංචිය අවලංගු කිරීමට. එසේ අවලංගු කිරීමක් කරන්නට නම් ඊට කලින් ඔවුන් යම් යම් ක්‍රියා පිළිවෙළවල්හි යෙදීමේ යුතුකම නීතියේ සඳහන් කර තිබෙනවා. ඒ කියන්නේ ලියාපදිංචිය අවලංගු කරන්නට කලින් යම්කිසි පරීක්ෂණයක් පවත්වන්නට ඕනෑ. ඒ පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව නියෝගයක් පිට කරන්නට කොමසාරිස්තුමාට බලය තිබෙනවා, සමිතියේ ලියාපදිංචිය අවලංගුයි කියා. එහෙත් ඒ නීතියේ එක්තරා අඩුවක් තිබෙනවා. ඒ අඩුව මෙයයි: පරීක්ෂණය මොන විධියේ පරීක්ෂණයක් විය යුතුද කියන එකයි. අර රෙගුලාසි මාලාවේ වත් එය නැහැ. පරීක්ෂණයක නාමයෙන් පරීක්ෂණයක් තැබිය යුතුද? එසේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නැතිව නිසි විධියට සමිතියේ අය කැඳවමින් ඉදිරිපත් වන ප්‍රශ්න ඔවුන් ඉදිරියේ තබමින් එම ප්‍රශ්න විසඳා ඒවා කොතැනක හෝ සටහන් කර ගැනීමේ පිළිවෙළක් අනුව ඇත්තටම සටහනක් ඇති ආකාරයේ පරීක්ෂණයක් තැබිය යුතුද? නීතිය දෙස කොපමණ බැලුවත් ඒ ගැන සඳහනක් නැහැ. මෙතැන අමාරුව මෙයයි; ඒ පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව නියෝගයක් පිට කළාම එසේ පිට කරන නියෝගයත් සමග එසේ තීන්දු කිරීමට හේතූන් මොනවාද යන්නත් සංක්ෂේප වශයෙන්, කෙටියෙන්වත්, සඳහන් කරන්නට ඕනෑය කියා නීතියේ නියමයක් නැහැ. එවැනි නියමයක් නැතිකමේ අමාරුව අවසානයේදී ගරු ඇමතිතුමාටත් බලපාන බව දැන් පෙන්වන්නම්.

ඒ නියෝගයට විරුද්ධව ගරු ඇමතිතුමාට අභියාචනයක් කරන්නට සමිතියේ ඕනෑම සාමාජිකයෙකුට පුළුවන්. එහෙත් නියෝගයකට විරුද්ධව අභියාචනයක් කරන්න යමෙකුට ඕනෑ නම් මොන හේතූන් උඩ ඒ නියෝගය පිට කළාද කියා නොදැන සාධාරණ අභියාචනයක් ඉදිරිපත් කරන්නට පුළුවන්කමක් නැහැ. හේතූන් නොදැන මේ මේ කාරණා නිසා මේ තීන්දුව වැරදියි කියන්නේ කොහොමද? ඒ නිසා ඉතා කෙටියෙන්වත් එය සඳහන් විය යුතු විධියට නීතිය වෙනස් කළ යුතුයි. දෙවනුව අවසාන තීන්දුව දෙන්නේ ගරු ඇමතිතුමා නිසා එහිදී ඇත්තටම ගරු ඇමතිතුමා දෙන අභියාචනා තීන්දුවට හේතූන් කියන්නටත් ඇමතිතුමාට ඉඩ නැති නිසා අභියාචන කරුවන් වෙත කරුණු ඉදිරිපත් කරන්නට ඉඩකුත් නැහැ. අර නියමය තිබෙනවා නම් ඇමතිතුමා තීන්දුවක් ගත් විට අභියාචනාකරුවන්ට ඇමතිතුමාගේ හිත යොමු කරවන්නට වුවමනාව තිබුණු කරුණුවලට ඇමතිතුමා හිත දුන්නා කියන ප්‍රශ්නයට නිකම්ම උත්තර ලැබෙනවා. එය ඇමතිතුමාටත් ආරක්ෂාවක්.

තව පැත්තකින් හිතන්න. එක්තරා විධියක තිබිය යුතු බලයක් මේ නීතියෙන් අරගෙන තිබෙනවා; නැත්නම් දීලා තිබෙනවා. එනම්, යම් අවස්ථාවලදී මේ සමිතිවල ගැටළු රණ්ඩු දබර ආදිය නිරවුල් කිරීම පිණිස සමිතියේ සාමාජික රැස්වීමක් දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු ඉදිරිපිට, ඔහුගේ සභාපතිත්වය යටතේ, කැඳවා එම රැස්වීමේදී ප්‍රශ්නය විසඳීමට කටයුතු කරන්නය කියන එකයි. එය බොහොම හොඳ දෙයක්. එහෙත් පානදුරේ ගරු මන්ත්‍රීතුමා (ලෙස්ලි ගුණවර්ධන මයා.) මතක් කළාක් මෙන් එක වරම මතු වන ප්‍රශ්නයක් තමයි මේ රැස්වීමේදී ඡන්දය දෙන්නට අයිතිය තිබෙන්නේ කාටද කියන එක. ඒ වැඩ අවුල් තත්ත්වයකට පත් කළ අයම හැදූ ලැයිස්තුවක් අනුව එන් රැස් කරන්නාවූ සාමාජිකයන්ගෙන් ඇසුවොත් මේකට කරන්නේ මොකක්ද කියා කෙරෙන දෙයක් නැහැනේ. ඒ අයම තෝරා ගත් මිනිස්සුනේ ඒ නිසා යම් සමිතියක් විසින් මේ සාමාජික ලැයිස්තුව හරියාකාරව හා ක්‍රමානුකූලව පවත්වා ගෙන යනු ලබනවාද යන්න සම්බන්ධයෙන් පරීක්ෂක මහතුන් ක්‍රමානුකූලව සොයා බලන්නට ඕනෑ. සාමාජික ලැයිස්තුව හරියාකාරව හා ක්‍රමානුකූලව පවත්වාගෙන යන්නේ නැත්නම් ඒ ගැන ක්‍රියා කරන්නට දෙපාර්තමේන්තුවට බලයක් ගන්නවාද, එසේ නැත්නම් එය වෙනත් විධියකට කරනවාද යන්න ගැනමා මෙහිදී කිසිවක් කියන්නට යන්නේ නැහැ. කෙසේ වුණත් මේ සාමාජික ලැයිස්තු ප්‍රශ්නය ප්‍රධානයි.

ගරු ඇමතිතුමාට කෘෂිකර්ම අංශයත් භාර වී තිබෙන නිසා මම මේකට ඒ පැත්තෙන් උදාහරණයක් දෙන්නම්. දැන් ගොවි මණ්ඩල තිබෙනවා. මා දන්න හැටියට එහි හැමදුම රණ්ඩුව තිබෙන්නේ ඡන්දය දීමට අයිතිය ඇති ගොවියන්ගේයි. මේක ඡන්දදායක ලැයිස්තුවේ ප්‍රශ්නයක්. පාර්ලිමේන්තු මැතිවරණ සඳහා ඡන්ද ලැයිස්තු සෑදීම හා පළාත් පාලන ආයතනවල මැතිවරණ සඳහා ඡන්ද ලැයිස්තු සෑදීම පිළිබඳව මේ ස්ථානයේ කොතෙකුත් සාකච්ඡා ඇති වී තිබෙනවා. යම් යම් අඩුපාඩු තිබෙන බව දෙපැත්තම විසින් යම් යම් අවස්ථාවල පිළිගන්නට යෙදුණා. ඒ නිසා මේ පාර්ලිමේන්තු වාරයේ මෑදී මා මෙම ගරු සභාවට අගලවන්නේ මන්ත්‍රීවරයා වශයෙන් පැමිණි අවස්ථාවේදී මටත් ඒ පිළිබඳව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]

කරුණු කීපයක් කියන්නට සිදු වුණා. මගේ කථාව අවසාන වන විටම ගරු කෘෂි කර්ම ඇමතිතුමා නැගිට, "අනේ අම්මේ මටත් මේක අපේ පළාතෙත් තිබෙනවා" යනුවෙන් කී බව මට අද වගේ මතකයි. ඉතින් අප කාටත් එකඟවන්නට කරුණු එතැන තිබුණා. සාධාරණ විධියට, යුක්ති සහගත විධියට, ඡන්ද ලැයිස්තු සකස් කිරීම ප්‍රජාතන්ත්‍රවාදී පාර්ලිමේන්තු ක්‍රම යක් ගෙන යෑමට නම් අත්‍යවශ්‍යයි. එතැ නදීම පක්ෂපාතිත්වය යොදන්නට පටන් ගත්තොත් ඇති වන්නේ වෙනත් එකක් මිස 'ප්‍රජාතන්ත්‍රවාදයක්' නොවෙයි. මෙතැන තත්ත්වයත් ඒකයි. ඒ නිසා ඒ පිළිබඳව නීති දීනි සකස් කිරී මට තමුන්නාන්සේලා ගේ හිත යොමු කිරීම අවශ්‍ය බවට මගේ නම් කිසිම අනු මානයක් නැහැ. අපේ පැත්තේ සිටින නොයෙකුත් මන්ත්‍රීවරුන් ඒ සඳහා ආධාර වන්නට පුළුවනි. කාටත් එකතු වී ඒ නීති සකස් කරන්නට පුළුවනි.

තවත් එකක් තිබෙනවා. මෑතදී ලේඩි ලෝ මහතාගේ සභාපතිත්වයෙන් අපේ සමුපකාර ප්‍රශ්නය ගැන පරීක්ෂා කර බැලී මට කොමිෂන් සභාවක් පත් කරන්නට යෙදුණා. ඒ කොමිෂන් සභාව ස්වකීය වාර්තාව ඉදිරිපත් කර තිබෙන බව දැන ගන්නට තිබෙනවා. කවදා හෝ ඒ කොමි ෂන් සභා වාර්තාව අපටත් දෙනවාදැයි මා දැනගන්නට කැමතියි. එය අපටත් දෙනවා ඇතැයි මා විශ්වාස කරනවා. දේශ පාලනඥයන් සමුපකාරයේ සිටීම තහනම් කළ යුතු බවට ඒ කොමිෂම නිර්දේශයක් කර තිබෙන බව පත්තර මාර්ගයෙන් මා දැක්කා.

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)
නිලධාරීන් වශයෙන්.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

ඒ වාර්තාවේ එහෙම නිර්දේශයක් තිබුණත් මා ඒ ගැන පුදුම වන්නේ නැහැ. අද මෙම ගරු සභාවේ සිටින, මා දන්න එක් ගරු මන්ත්‍රීවරයකු මා නියෝජනය කරන කොට්ඨාශය අසල ඇති දිස්ත්‍රික්ක යක සමුපකාර සමිති සංගමයේ ලේකම් වශයෙන් කටයුතු කරනවා. මා එහි හරි වැරදිකම ගැන කථා කරන්නට යන්නේ නැහැ. එංගලන්තයේ නම් සමුපකාර සමිති ව්‍යාපාරය මගින්ම ඉදිරිපත් කරනු ලබන මන්ත්‍රීවරුන් සිටිනවා. මට එකක් කල් පනා වෙනවා. එවැනි තත්ත්වයක් දරන මන්ත්‍රීවරයකුටවත් ඒ තත්ත්වයෙන් දැන ගන්න දේවල් මේ ගරු සභාවේ ප්‍රයෝජ නය සඳහා ඉදිරිපත් කරන්නට අමාරුයි. ඒ නිසා ඒ අතින් බැලුවත් ඒකේ නුසුදුස්සු කමක් තිබෙන්නට පුළුවන් හෙයින් නීතිය වෙනස් කරන්නට වටිනවා යයි කියන්නට පුළුවනි. එහෙත් මෙහි ඇත්ත මෙයයි. අප කවුරුනුත් දන්නාවූ දෙයක් මම කියන්නම්. මේ සමුපකාර සමිති ක්‍රමය අපේ රටේ මතු වුණේ අද තිබෙන ප්‍රමාණ යට සමුපකාර සමිති ක්‍රමයක් වශයෙන නොවෙයි; මහජන ස්වේච්ඡා ක්‍රමයෙන්ම ඇති වූ ක්‍රමයක් වශයෙන් නොවෙයි. පෞද්ගලික අංශයෙන් තොරව, ඒ වාගේ ම රජයේත් පාලන බලය ඇති වන ආකාර යට හිඟ බඩු බෙදා හැරීමේ මාර්ගයක් වශ යෙන්, ස්ථාන වශයෙන් පසුගිය මහා යුද්ධ කාලයේදී නොයෙක් සමුපකාර සමිති ඇති වුණා. මුලෙන් හැදුණු ගහ නොකපා මුල වෙනස් කරන්නේ කොහොම දැයි සෙවීමයි, එදා සිට අද වන තෙක් සිටි මේ හැම ඇමතිවරයකුම කළේ. එය ලෙහෙසි වැඩක් නොවෙයි. එවැනි ඉතිහාස යක් ඇති ව්‍යාපාරයකට සමුපකාර ව්‍යාපාර යයි අප කීවත්, ඇත්ත වශයෙන්ම එය නියම සමුපකාර ව්‍යාපාරයක් නොවෙයි. එක පැත්තකින් බලන විට එය ආණ්ඩුවේ බඩු බෙදා හැරීමේ මාර්ගයක් පමණයි. තව පැත්තකින් ඉඩ තිබෙනවා, එය ජනතා ව්‍යාපාරයකට පරිවර්තනය කරමින් ජන තාව විසින් ජනතාවගේම වුවමනා එපා කම් පිරිමැසීම සඳහා ගෙන යන්නා වූ සමිති හෝ සංවිධාන ක්‍රමයක් වශයෙන් පවත්වාගෙන යන්නට. මේ දෙක එකි නෙකට ගැටෙන අවස්ථාවේදී තමයි, දෙපාර්තමේන්තුවට දියයුතු තැන මොකක් දැයි තීන්දු කිරීම ඇත්ත වශයෙන්ම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අමාරු වන්නේ. මේ අවස්ථාවේදී සමූපකාර දෙපාර්තමේන්තුවට පහර ගහන්නට මා උත්සාහ නොකරන බව පළමුවෙන්ම කියන්නට ඕනෑ. එහෙත් මෙවැනි ප්‍රශ්න යකුත් තිබෙනවා.

දැන් කාලයේ සමූපකාර සමිති කඩ සමිති ක්‍රමයට පමණක් සීමා වී නැති බව අප තමුන්නාන්සේලා කවුරුනුත් දන්නවා. දැන් අපට තිබෙනවා, නිෂ්පාදක සමිතිත්.

වී. ධර්මලිංගම් මයා. (උඩුවිල්)
(திரு. வீ. தர்மலிங்கம்—உடுவில்)
(Mr. V. Dharmalingam—Uduvil)
There is no Quorum, Sir.

මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට ගණපූරණයක් නොතිබියෙන්, බෙදුම් සිනු ශබ්ද කිරීමට නියෝග කරන ලදි.

පසුව ගණපූරණයක් තුබූයෙන්—

சபை எண்ணப்பட்டு நிறைவெண் இல்லாததால் பிரிவு மணி அடிக்கப்பட வேண்டுமென ஆணையிடப்பட்டது.

பிறகு, நிறைவெண் இருந்ததனால்—

House counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.

Later, a Quorum being present—

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வன் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)
මා මතක් කරන්නට හැදුවේ—

ඩී. ෂෙල්ටන් ජයසිංහ මයා. (කර්මාන්ත හා ධීවර ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)
(திரு. டீ. ஷெல்ற்றன் ஜயசிங்க—கைத் தொழில், கடற்றொழில் அமைச்சரின் பாராளு மன்றக் காரியதரிசி)
(Mr. D. Shelton Jayasinghe—Parliamentary Secretary to the Minister of Industries and Fisheries)
මොන වදයක්ද?

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வன் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)
ඉදහිට වද දෙන්නටත්, වද විඳින්නටත් ඕනෑ. වද විඳීම වද දීමට වඩා හොඳයි. දැන් මේ ගරු සභාවට ඇතුළු වුණු මන්ත්‍රීවරුන්ට, මෙතෙක් මේ ගරු සභාවේ වාඩි ගෙන සිටි මන්ත්‍රීවරුන්ට මෙන් බඩගින්නක් නැති නිසා, ඉතිරි වැඩ කටයුතු සාම දානයෙන් කරගෙන යන්නට පුළුවන් වේ යයි මා විශ්වාස කරනවා.

ෂෙල්ටන් ජයසිංහ මයා.
(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)
They are after high tea.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)
But what is worrying me is that some are high with something other than tea.

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මයා. (මීගමුව)
(திரு. என். டென்சில் பெர்ணாண்டோ—நீர்கொழும்பு)
(Mr. N. Denzil Fernando—Negombo)
High spirits!

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வன் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)
Yes, Sir, very high spirits—a very appropriate remark. The stress is on the spirits and not on the height.

මා කලින් කියන්නට අදහස් කළේ මෙයයි: දැන් අපට නිෂ්පාදක සමූපකාර සමිති තිබෙනවා. දැන් නොයෙක් විධියේ කෘෂිකාර්මික නිෂ්පාදක සමිතිත් තිබෙනවා. එහෙත් ඉස්සර නම් තිබුණේ අරක්කු නිෂ්පාදක සමිති පමණයි. තව පැත්තකින් තිබෙනවා ණය දෙන සමිති. මේ අතුමින් නොයෙකුත් අංශවල සමූපකාර සමිති දැන් අපට තිබෙනවා. මේ නොයෙක් ආකාරයේ සමූපකාර සමිතිවලින් කෙරෙන්නාවූ කාර්යයන් දැන් විවිධ වී, බහුල වී තිබෙන නිසා, එක් ආකාරයේම දෙපාර්තමේන්තුවක් කේන්ද්‍රස්ථානය කරගෙන ඒ හැම සමූපකාර සමිතියක්ම පාලනය කිරීම අමාරු තැනට, ඇත්ත වශයෙන් බැරි තැනට අප පැමිණ තිබෙනවා නොවේදැයි කල්පනා කර බැලිය යුතු බවයි, මා කියන්නේ. මා කියන්නේ, මගේ විශ්වාසයක්. මගේ ඒ විශ්වාසය මා අපේ සමඟි පෙරමුණ තුළත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]

ප්‍රකාශ කර තිබෙනවා. බහුල කර්තව්‍යයන් ඇති විවිධ සමිති, නොයෙක් ආකාරයේ සමිති, එක් දෙපාර්තමේන්තුවක් මගින් එක කේන්ද්‍රස්ථානයකින් පාලනය කිරීම දැන් ශූනයට හුරු ක්‍රමයක් නොවෙයි. එක් එක් කාර්යාංශ හැදීමත් දෙපාර්තමේන්තු "ෂේක්" කිරීමත් සඳහා නම් එය පහසු ක්‍රමයක් වෙනවා ඇති. එහෙත්, මෙවැනි වියදමක් දරා එක්තරා යන්ත්‍රයක් සාදා ගෙන සමුපකාර සමිති ක්‍රමය දියුණු කිරීම සඳහා අප විසින් ගනු ලබන්නාවූ උත්සාහය ඇත්තටම හොඳ ප්‍රතිඵල ඇති එකක් වීම සඳහා මේ පාලන ක්‍රමය සුදුසුද, හොඳද, සාධාරණද, යන වග සොයා බැලිය යුතුයි. දැන් මගේ විශ්වාසය නම් වෙනත් එකක්. කෘෂිකර්ම අංශයේ නොයෙක් විධියේ නිෂ්පාදනයන් පිළිබඳ වූ සමිති තිබෙනවා. එලවලු නිෂ්පාදනය පිළිබඳ වූ සමිති තිබෙනවා. වී ගොවිතැන් සම්බන්ධ යෙන් තිබෙන්නාවූ වැඩත් මේ රටේ එන්න එන්නම වැඩි වන්නට පුළුවනි. අද තිබෙන සමුපකාර නීතියටත්, අද තිබෙන ආකාරයේ සමුපකාර දෙපාර්තමේන්තුවක් වත්, එවැනි සමිති ක්‍රමයක් දියුණු කිරීමට කිසිසේත් අදාළ වේයයි මා නම් කොහෙත්ම විශ්වාස කරන්නේ නැහැ. කඩ සමිති ක්‍රමය ගෙන යාමට බෝවුණු, ඇතිවුණු, හැඩ ගැසුණු මේ සමුපකාර දෙපාර්තමේන්තු පාලන ක්‍රමය, නිෂ්පාදන සමිති පාලනය කිරීමට සුදුසු නැතැයි, යෝග්‍ය නැතැයි, මා හිතනවා. එය ඒ සඳහා හරි ක්‍රමයක් වන්නට බැරියයි මා විශ්වාස කරනවා.

ලේඩ්ලෝ කොමිෂන් සභාව ඉදිරියට යාමට මට අවස්ථාවක් නොලැබීම ගැන මා කණගාටු වෙනවා. එය කොමිසමේ වරද නොව මගේ වරදයි. මේ සම්බන්ධව මගේ තවත් විශ්වාසයක් තිබෙනවා. කොමිෂන් සභා වාර්තාවලින් ඉදිරිපත් කෙරෙන ක්‍රියා පිළිවෙළවල් ගැන අවසානයේදී තීන්දු කරන්නට මන්ත්‍රීවරුන්ට සිදු වන නිසා එවැනි කොමිෂන් සභා ඉදිරිපිට සාක්ෂි දීමට මන්ත්‍රීවරුන් යාම යෝග්‍යයයි මා විශ්වාස කරන්නේ නැහැ. එම නිසා එවැනි කටයුතු ගැන මගේ ලොකු කම්මැළිකමක් තිබෙනවා. ඒ ගැන මා මෙතැන කියා ඇතත් නැතත්, මෙම දෙපාර්තමේන්තුව සකස් කිරීමේදී ගරු ඇමතිතුමාගේ සැලකිල්ලට ගත යුතු කරුණක්, රෑ බෝවුණත්, මේ ගැන විස්තරයක් කිරීමට ඉඩක් ලැබී තිබෙන මේ අවස්ථාවේදී, මා පෙන්වා දෙන්න කැමතියි. සමුපකාර ක්‍රමය ඒ විධියට යොදමින් දියුණු කිරීමේදී එක් එක් ඇමති අංශයට බාර ඒ ඒ සමිති පාලනය කිරීම සඳහා නිසි දෙපාර්තමේන්තු අංශයක් නැද්ද යන්න මෙහිදී කල්පනා කළ යුතුයි. මෙය කල්පනාවට ගත යුතු අදහසක් බව ප්‍රකාශ කරනවා මිස, මා එය දීර්ඝ වශයෙන් මේ අවස්ථාවේදී විස්තර කරන්නට මහන්සිවන්නේ නැහැ. මිට වැඩි විස්තර යක් කිරීමට මේ අවස්ථාවේදී කාලය ගැනීම යෝග්‍ය නොවන නිසා, මා ඉදිරිපත් කළ, මතු කළ, කරුණු ගැන තමන්ගේ සිත දී, දෙපාර්මේන්තුවේ නිලධාරීන්ටත් ඒ සම්බන්ධව අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන ලෙස මා ඉල්ලනවා. මෙතෙක් මේවා ගැන ලබා ඇති පළපුරුදු කම් හා අත්දැකීම්ද පාවිච්චි කරමින් කොමිෂන් වාර්තාවේ යම් යම් යෝජනා තිබෙනවා නම් ඒවාත් සැලකිල්ලට ගෙන, සෑදීමට බලාපොරොත්තු වන නීති රීති පුළුවන් තරම් ඉක්මනින් මේ ස්ථානයට ගෙන එන ලෙස මා මතක් කරනවා.

ඒ නීති රීති ගෙන ඒමේදී එක් කරුණක් සැලකිල්ලට ගන්න ලෙස මා ඉල්ලා සිටිනවා. එම නීති නිකම් අතුරු නීති හැටියට නොව, අලුත් සමුපකාර සමිති ව්‍යවස්ථාවක් හැටියට ගෙනාවොත්, එහි එක් කොටසක් අනෙක් කොටස හා අන්‍යොන්‍ය වශයෙන් සම්බන්ධ වන්නේ කෙසේද යන්න කල්පනාවට ගනිමින් ඊට වඩා හොඳ තත්ත්වයක් ඇති කර ගැනීම සම්බන්ධයෙන් අප කාගේත් අදහස් ඉදිරිපත් කරන්නට ඉඩක් ලැබෙනවා. එසේ ගෙනෙන විට ඒ ගැන සාකච්ඡා කරන්නට සෑහෙන කාලයක් වෙන් කරන මෙන් මා ඉතා ඕනෑකමින් ඉල්ලීමක් කරනවා. මුළු සභාවේම විමර්ශනයට භාජන වන විට ඇමතිතුමා ඉදිරිපත් කරන පනතට වඩා සෑම් අතින්ම හොඳ පනතක් අවසාන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යේදී සකස් වෙනවා ඇති. කියමනෙන් නොව ක්‍රියාවෙන්ද එය ඔප්පු කරන්නට අප සූදානම් බවත් ඒ සමගම මා කියන්නට සතුටුයි.

තමාගේ ප්‍රදේශයේ සමුපකාර සමිතිවල දූෂණ තිබෙනවා නම්, දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හරියාකාර වැඩ කරන්නේ නැත්නම්, අවසානයේදී ඒ ගැන ප්‍රසිද්ධියේ කථා කිරීමට තිබෙන එකම තැන මෙතැනයි. ඉතින් අවසානයේදී ඇමතිතුමාට බෙදීම පුදුමයක් නොවෙයි. ඇමතිතුමාට බෙදන විට මනුෂ්‍යයකු වශයෙන්, දේශපාලනඥයකු වශයෙන්, ඇමතිතුමාත් පහරට පහර නොගැසුවොත් පුදුමයි. නමුත් එයින් ඇති වන ප්‍රතිඵලයක් නම් නැහැ. ප්‍රශ්නය තවතවත් මුළු ගැසෙනවා. එම නිසා මේ තත්ත්වය නැති වන විධියට අළුත් නීතියක් ගෙනෙනවා නම්, මගේ විශ්වාසය, සෑම අතින්ම සතුටුදායක පනතක් අපට පිළියෙළ කරගත හැකි බවයි. මේ ගරු සභාවේ දෙපාර්ශ්වයේම ගරු මන්ත්‍රීවරුන් විසින් වර කරන ලද කථාවල සත්‍ය කොටස ගැන සාධාරණව සහ අපක්ෂපාතව කල්පනා කර බලන විට ඇත්ත වශයෙන්ම සමුපකාර ක්‍රමය ගැන ලොකු අත්දැකීමක් මේ ගරු මන්ත්‍රීවරුන්ට තිබෙන බව පැහැදිලිවම පෙනෙනවා. එම නිසා අළුත් නීතියක් ඉදිරිපත් කරනවා නම් එය හරියාකාර සකස් කර ගැනීම සඳහා මේ ගරු සභාවට ලොකු ඥාන ශක්තියක් මෙහෙයවීමට ඉඩ ප්‍රස්තාව ලැබෙන බවත්, අවස්ථාවක් සැලැස්වුවහොත් එම ඥාන ශක්තිය යොදවන බවත් ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

අ. භා. 8.48

කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා
(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please ! Mr. Deputy Speaker will now take the Chair.

අනතුරුව කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, குழு உப அக்கிராசனர் அவர்கள் அவைக்காசனத்தினின்று நீக்கவே, உப சபாநாயகர் அவர்கள் தலைமை தாங்கினார்கள்.

Whereupon MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* MR. DEPUTY SPEAKER *took the Chair.*

ජෝර්ජ් කොතලාවල මයා.
(திரு. ஜோஜ் கொத்தலாவல)
(Mr. George Kotelawala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමුපකාර ව්‍යාපාරය ගැන විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් කළ කථාවලට සවන්දී සිටි මාද වචන ස්වල්පයක් ප්‍රකාශ කළ යුතුව තිබෙනවා. විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් තුළ පමණක් නොව අප තුළ ද සමුපකාර ව්‍යාපාරය ගැන කැක්කුමක් තිබෙන බව මා පළමුවෙන්ම මතක් කරන්නට සතුටුයි. අයහපත් ලෙස පාලනය වන සමුපකාර සමිති දෙපාර්තමේන්තුව මහින් සංගම්වලට භාර දී පාලනය කරන බව අප හොඳාකාර දන්නවා. මගේ කොට්ඨාශයේත් එවැනි සමුපකාර සමිතියක් දෙකක් තිබෙනවා. ඒවායේ පාලනය භාර ගෙන දැන් අවුරුදු හතරක් පහක් ගත වී තිබෙනවා. නමුත් තවමත් ආපසු දී නැහැ. ඒක අසතුටුදායකයි. සමුපකාර සමිති තිබෙන්නේ ගමේ දියුණුවටයි. එම නිසා සමුපකාර සමිතියක් දියුණු කර ගැනීම හෝ විනාශ කිරීම ගමේ උදවිය සතු වගකීමක්. ඒවා දියුණු කර ගන්නට ගමේ උදවිය දැනගන්නට ඕනෑ. එම නිසා තවත් ප්‍රමාද නොකර මේ සමුපකාර සමිති ඒ උදවියටම ගෙන යන්ට ඉඩ හැරිය යුතු බව මා මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට සෑමදාම කථා කරන්නට අවස්ථාව ලැබෙන්නේ අගලවත්තේ ගරු මන්ත්‍රීතුමාට (ආචාර්‍ය කොල්වින් ආර්. ද සිල්වා) පසුවයි. මටත් කෙදිනක හෝ අගලවත්තේ ගරු මන්ත්‍රීතුමාට මෙන් කථාවක් කරන්නට පුළුවන්කම ලැබේවායි මා ප්‍රාර්ථනා කරනවා. එතුමාගේ කථාවේදී එතුමා ගරු ඇමතිතුමා ගැන යම් දෙයක් සඳහන් කළා. නමුත් අපේ ගරු ඇමතිතුමා සමුපකාර ව්‍යාපාරය ගැනත් මේ රටේ මහජනතාව ගැනත් හොඳාකාර දන්නාවූ කෙනෙකු බව මා ප්‍රකාශ කරන්නට සතුටුයි. සමුපකාර ව්‍යාපාරය මේ රටේ මහජනතාවගේ යහපතට හේතුවන ව්‍යාපාරයක් බවට පත් කරන්නට එතුමාට ශක්තියක් තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජෝර්ජ් කොතලාවල මයා.]

සමුපකාර ව්‍යාපාරය තුළ අද දූෂණ පවතින්නේ ක්‍රමානුකූලව ගණන් පරීක්ෂණ නොකෙරෙන නිසයි. විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රිවරුත් එය පිළිගන්නවා ඇති. මමත් එක්තරා කාලයක සමුපකාර සමිතියක් ගෙන ගියා. ලාභයක් ඇතිව එය පවත්වාගෙන ගියා. ඉතාම සතුටුදායක අන්දමින් අප එය ගෙන ගියා. නමුත් ඒ සෑම අවස්ථාවකදීම මට පෙනී ගියේ හරියාකාර ගණන් පරීක්ෂණ නොකෙරෙන බවයි. ගණන් පරීක්ෂණ කෙරෙනවා මදි. ඊට හේතුව නිලධාරීන්ගේ සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීමයි. සමහර සමිතිවල අවුරුදු දෙකක් තුනක් තිස්සේ ගණන් පරීක්ෂණයක් කර නැහැ. බොහෝ විට අවසාන ගණන් පරීක්ෂණය කර තිබෙන්නේ අවුරුදු දෙක තුනකට කලිනුයි. සමුපකාර දෙපාර්තමේන්තුව මගින් කෙරෙන පරීක්ෂණ කටයුතු මදි බවයි කියන්නට තිබෙන්නේ. ගම්බද ජනතාව එකතු වී සමුපකාර සමිති පවත්වාගෙන යනවා. ඒ වායේ වැඩි වශයෙන් සේවය කරන්නේ ලොකු ලොකු විභාග සමත් කළ උදවිය නොවෙයි; හයවැන්න හත්වැන්න වැනි විභාග සමත් කළ උදවියයි. එවැනි උදවිය කටයුතු කරගෙන යද්දී සමහර විට ගණන් හිලව් පවා වරදින්නට පුළුවනි. ඇතැම් විට මේවායේ හොරුත් සිටිනවා. ගම්බද ජනතාව එතරම් උගතුන් නොවන නිසා, ඔවුන් ළඟ එතරම් කපටි කම් නොමැති නිසා, ඔවුන්ගේ එම තත්ත්වය ප්‍රයෝජනයට ගනිමින් ඇතැම් දෙනා හොරකම්වල යෙදෙන බව පෙනෙනවා. එම නිසා සමුපකාර දෙපාර්තමේන්තුව මගින් මහජනතාවගේ සුබ සිද්ධිය පතා තවදුරටත් පරීක්ෂණ කටයුතු තර කළ යුතුව තිබෙන බව මතක් කළ යුතුයි.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
ආපසු දෙන්න කියනවාද?

ජෝර්ජ් කොතලාවල මයා.
(திரு. ஜோஜ் கொத்தலாவல)
(Mr. George Kotelawala)
සමුපකාරිකයෝ කොම්පැණි කළාම හරි යනවාද? අවුරුදු හතරෙන් පහෙන් දහ දොළොස් දෙනා එකතු වෙලා ලොරි ව්‍යාපාර පවා පවත්වාගෙන යනවා. එම නිසා මහජනතාවගේ මතය දන්නා ගරු ඇමතිතුමා මේවායේ සිදුවන අක්‍රමිකතා වැළැක්වීම පිණිස සුදුසු පරිදි කටයුතු කරනු ඇතැයි විශ්වාස කරමින්, අපේ විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රිවරුන් විසින් පවත්වන ලද කථා වලට එකඟ වෙමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

අ. හා. 8.53

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)
සමුපකාර කටයුතු සඳහා මුදල් වෙන් කර ගැනීම පිණිස ඉදිරිපත් කරනු ලැබූ පරිපූරක ඇස්තමේන්තුවක් ගැන සාකච්ඡා පවත්වන මෙම අවස්ථාවෙහිදී බොහෝ මන්ත්‍රිවරුන් විසින් නොයෙකුත් සමුපකාර කටයුතු ගැන කරුණු ඉදිරිපත් කර තිබෙනවා. සමුපකාර ව්‍යාපාර යෙන් කොතෙක් ප්‍රයෝජන ලබා ගන්නට පුළුවන්ද යන කාරණය ගැන කිසිම මත භේදයක් ඇත්තේ නැහැ. රටේ ආර්ථික තත්ත්වය නංවා ගැනීමට සමුපකාර ව්‍යාපාරයෙන් ඉමහත් ප්‍රයෝජන ලැබෙන බව හැමෝම පිළිගන්නවා. ආණ්ඩු පක්ෂය මෙන්ම විරුද්ධ පාර්ශ්වයද එම අදහස අනුමත කරනවා.

දැන් ඉදිරිපත් වී තිබෙන ප්‍රශ්නවලින් වැදගත්ම ප්‍රශ්නය වන්නේ කුමක්ද? මීට අවුරුද්දකට පමණ ප්‍රථම පත් කරනු ලැබූ ලේඩ්ලෝ කොමිසම මගින් ඉදිරිපත් කර තිබෙන වාර්තාව මහජනතාවටත් මන්ත්‍රිවරුන්ටත් කවදා ලැබෙන්නට සලස්වන්නේද? යන්නයි වැදගත්ම ප්‍රශ්නය වී තිබෙන්නේ. එම වාර්තාව ලැබුණු විට එය ප්‍රසිද්ධියට පත් කරන්නට රජය තීරණය කළා. දැන් එම වාර්තාව මුද්‍රණය පිණිස යවා තිබෙනවා. මුද්‍රණය කළ විගසම එහි පිටපත් ලබා ගන්නට පුළුවනි. ඒ අතරතුරේම එය අනිකුත් භාෂාවන්ට පරිවර්තනය කරන්නටද කටයුතු යොදා තිබෙනවා. මුල් වාර්තාව ඉදිරිපත් කර තිබුණේ ඉංග්‍රීසියෙනුයි. අප්‍රමාදව එය පරිවර්තනය කරනවා ඇති, සිංහල සහ දෙමළ භාෂාවන්ට. ඒ අතරතුරේ පත්‍රවලට එම වාර්තාවෙහි අඩංගු කරුණු ලබා ගැනීම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පිණිස ඇමති කාර්යාලය මගින් අවස්ථාවක් සලසා දී තිබෙනවා. පරිවර්තන කටයුතුවලට සහ මුද්‍රණ කටයුතුවලට ගතවන කාල සීමාව තුළදී එම වාර්තාවෙහි අඩංගු කරුණු යම් යම් අන්දමින් ලබා ගන්නට යාම පත්‍ර වාර්තාකරුවන්ගේ සිරිතයි. සමහරවිට එහි අඩංගු කරුණු එහාට මෙහාට බර කොට සත්‍ය ප්‍රකාශ නොවන අයුරින් පළ කරන්නට ඒ අනුව ඉඩ තිබෙනවා. එම නිසා ඇමති කාර්යාලයෙහි තබා තිබෙන පිටපත් දෙක තුන බලා ගෙන වාර්තා කරන්නට අපි ඒ උදවියට ඉඩකඩ සලසා දී තිබෙනවා. එසේ නොකළා නම් මෙම වාර්තාව නිකුත් වන්නට කල් ගත වන විට එහි අඩංගු ඇතැම් කරුණු වැරදි අන්දමට පත්‍රවල පළවූවායින් පසු ඒවා කියවන බොහෝ දෙනා නොමග යන්නට ඉඩ තිබෙනවා. ඒ නිසා සත්‍ය වාර්තා පළ කරන්නට ඒ විධියට අවස්ථාව සලසා තිබෙනවා. සම්පූර්ණ වාර්තාව දෙමාසයකින් පමණ අපට ලැබෙන්නට පුළුවන් බව මුද්‍රණාලයෙන් දන්වා තිබෙනවා. ගරු මන්ත්‍රීවරුන් සඳහන් කළ සෑම කරුණක් ගැනම පාහේ නිර්දේශ කරන්නය කියා අප දන්වා තිබුණා. නීතියේ දුර්වලකම පිළිබඳව, කෘෂිකර්මය සහ කර්මාන්ත නිෂ්පාදන සඳහා සමුපකාර සමිති යෙදවීමට තිබෙන පහසුව හෝ අපහසුව පිළිබඳව, මුදල් ලබා ගැනීම පිළිබඳව, පාලන ක්‍රම පිළිබඳව, සේවක වැටුප් පිළිබඳව, ආදි වශයෙන් කරුණු රාශියක් පිළිබඳව නිර්දේශ කරන ලෙස දන්වා තිබුනා. ඒ කොමිෂන් සභාව එම කටයුත්ත ඉතා හොඳින් කළ බව විශ්වාස කරන්නට පුළුවන්.

අපට දැනගන්නට ලැබී තිබෙන පිළිවෙළට, සමුපකාර සමිති හෝ වේවා, සමුපකාර සංගම් හෝ වේවා, කරදරයට පත් වන්නේ ඒවායේ කටයුතු කරන නිලධාරීන්ගේ වංචනික ක්‍රියා නිසා හෝ ඒ සමිතිවල කටයුතු නිසි පරිදි කරන්නට තිබෙන නොදැනුවත්කම නිසයි. කලට වේලාවට ඒ සමිතිවල ගණන් පරීක්ෂා කරන්නට පුළුවන් නම් ඔය කරුණු දෙක නිසාම සමිතිවලට තිබෙන කරදර හුගක් මග හරවා ගන්නට පුළුවන් වෙනවා. දැනට සමිතිවල ගණන් පරීක්ෂණ කෙරෙන්නේ අවුරුදු 3 ක් 4 ක් ප්‍රමාද වෙලයි. පළාත් එකක හෝ දෙකක හැර අනික් සෑම පළාතකම, ගණන් තැබීම පරීක්ෂා කිරීම පිණිස වෙනම අංශයක් බැහින් පිහිටුවා තිබෙනවා. අවුරුද්ද සම්පූර්ණ වී මාස 3 ක් ඇතුළත, ඒ අංශය මගින් ගණන් පරීක්ෂණ කළ යුතු බවයි, නියම කර තිබෙන්නේ. ඒ කාල සීමාව ඇතුළතදී ගණන් පරීක්ෂණ කිරීම පිණිස නිලධාරී සංඛ්‍යාවත් වැඩි කර තිබෙනවා. දැනට ඒ අංශ පිහිටුවා නැති පළාත්වලත් ඒ අංශ පිහිටුවීමට අප බලාපොරොත්තු වෙනවා. එසේ පිහිටුවූ පසු සෑම තැනම ගණන් පරීක්ෂණ අවුරුද්ද අවසාන වී මාස 3 ක් ඇතුළත කෙරේය කියා අප බලාපොරොත්තු වෙනවා.

සමුපකාර සමිතිවල සහ සමුපකාර සංගම්වල නොයෙක් ප්‍රමාද දෝෂ තිබෙනවා. සමහරවිට නීතියේ බලය පාවිච්චි කිරීම සුදුසු නැත, වැරදි අන්දමට නීතියේ බලය පාවිච්චි කර තිබෙනවාය කියා චෝදනා ලැබී තිබෙනවා. පානදුරේ විවිධ සේවා සමුපකාර සංගමය සම්බන්ධයෙන් ගත් ක්‍රියා මාර්ගය ගැන පානදුරේ මන්ත්‍රීතුමා (ලෙස්ලි ගුණවර්ධන මයා.) අවුරුදු 2 ක් තිස්සේ මා සමග එරෙහි වී සිටිනවා. කිසිම හේතුවක් නැතිව කාගේ හෝ බලපෑමට එසේ කළාය කියා එතුමා කල්පනා කරනවා. ප්‍රසිද්ධ පරීක්ෂණයක් පැවැත්තුවේ නැත, චෝදනාවලට පිළිතුරු සැපයීමට අවස්ථාවක් ඒ අයට දුන්නෙ නැත, කියා ඒ මන්ත්‍රීතුමා කරුණු ඉදිරිපත් කළ පළමු වැනි අවස්ථාවෙම කොමසාරිස්තුමාගේ වාර්තාවෙන් කරුණු උපුටාගෙන මා එතුමාට කියෙව්වා. එතකොට එතුමා පුදුම වුණා. කොමසාරිස්තුමාද මේ වාර්තාව එව්වේ කියා අසමින්, එතුමා වාඩි වී සිටි ආසනයෙන් උඩ පැන, මේක වෙන්නට බැරිය කියා මේ සභා ගර්භයෙන් පිට වී ගියා. ඒ සමුපකාර සංගමය සම්බන්ධයෙන් එම ක්‍රියා මාර්ගය ගැනීමට හේතු මා විස්තර කළා. මා එතුමාට උත්තරයක් නුදුන්නා නොවෙයි.

අද එතුමා විවිධ සේවා සමුපකාර සමිතියක් ගැන තවත් ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. පිංවල රාළහාමි තමයි, මේ ඔක්කොම කරන්නේ කියා එතුමා මේ නම හැමදාම මතක් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
මේකට සම්බන්ධ නැහැ.

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)
පිංවල රාළහාමිගේ මොන මොන සම්බන්ධකම් තිබෙනවාදැයි මා දන්නෙ නැහැ. එහෙත් පිංවල රාළහාමිගේ හෝ වෙන කෙනෙකුගේ බලපෑමක් මෙතැන සිදු වී නැති බව මා කියන්නට කැමතියි.

මේ මැතක දී සිදු වූ කාරණය මා පත්‍ර මාර්ගයෙන් දැක්කා. ගරු මන්ත්‍රීතුමා සහභාගි වුණු නිලධාරීන් පත් කිරීමේ සමුපකාර සමිති රැස්වීමකදී මොකක්ද ප්‍රශ්නයක් ඉදිරිපත් වී ගරු මන්ත්‍රීතුමාත් තවත් පිරිසකුත් නැඟිට යන්නට ගිය බව පත්‍රයක වාර්තා වී තිබුණා. මේ සිදුවීමේ ආදීනව කුමක්ද කියා මට දැනගන්නට ලැබුණේ අද තමයි. ඒ රැස්වීම පැවැත්වුනේ නීත්‍යනුකූලව නොවෙයි නම් මා ඒ ගැන ක්‍රියා කරන්නට කැමතියි. එහෙත් ඒ රැස්වීම පවත්වා තිබෙන්නේ නීත්‍යනුකූලව නම්, ඒ රැස්වීම පවත්වා තිබෙන්නේ ගණපූරණයක් ඇතිව නම්, ඒ රැස්වීම පවත්වා තිබෙන්නේ—මහා සභා රැස්වීමක් කැඳවන්නට දිය යුතු දින ගණනක් ඇති—නියමිත දින ගණන දීල නම්, ඊට සහභාගි වුණු සාමාජිකයන් තම කොටස් මුදල් ආදිය නිසියාකාර ගෙවා තිබෙන සාමාජිකයන් නම්, ඡන්දය දීමට අවස්ථාව ලැබුණේ ඡන්ද බලය තිබෙන උදවියට නම් —මේ ආදි අංග දිහා බලන විට එය අංග සම්පූර්ණ රැස්වීමක් නම්—ඒක නීත්‍යනුකූල නොවේය කියා අපට තීරණය කරන්නට පුළුවන්කමක් නැහැ. යම් පිරිසක් රැස්වීමෙන් පිටව ගියත්, අංග සම්පූර්ණ සාමාජිකයන්ගෙන් යුක්තව ගණපූරණයක් ඇතිව ඉන් පසුව රැස්වීමේ කටයුතු කර ගෙන ගියා නම්, ඒ රැස්වීම නීත්‍යනුකූල රැස්වීමක් වෙනවා.

පරිපූරක මුදල්

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
බලය තිබෙන සාමාජිකයන්ට සහභාගි වෙන්නට ඉඩ නුදුන්නා නම්?

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)
කොටස් මුදල් ආදිය ගෙවූ, ලියාපදිංචි වූ සාමාජිකයන් හැටියට බලය තිබුණු උදවිය ට ඊට සහභාගි වන්නට ඉඩ නුදුන්නා නම් ඒක ප්‍රශ්නයක් වෙනවා.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
ඇතුල් වෙන්න ඉඩ නුදුන්නා නම්?

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)
ඇයි තමුන්නාන්සේලා ඇතුළෙ ඉඳල පිටටනෙ ගියේ?

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
නැහැ, නැහැ. සමහර සාමාජිකයන්ට ඇතුල් වෙන්න ඉඩ දුන්නෙ නැහැ.

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)
මම හිතුවෙ, තමුන්නාන්සෙලා සියලු දෙනාම ඇතුළෙ ඉඳල පිටට ගියා කියලයි.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
සමහරුන් ඇතුළෙ ඉඳල පිටව ගියා. සමහරුන්ට ඇතුල් වෙන්න ඉඩ දුන්නෙ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)

ඒ ප්‍රශ්න ගැන බලන්න පුළුවන්. එහෙත් ඒ රැස්වීම නීත්‍යානුකූලව පවත්වා තිබෙන බව ඒ රිපෝර්තු අනුව වැටහෙනවා නම්, මට ඒ ගැන පියවරක් ගන්නට පුළුවන්කමක් නැහැ.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

මම ඒක පිළිගන්නවා.

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)

වුවමනා නම් ගරු මන්ත්‍රීතුමාට ඒ කාරණය අධිකරණයට ගෙන යන්න පුළුවන්. මම ඒක නවත්වන්නට හදනවා නොවෙයි. ඒ රැස්වීම නීත්‍යානුකූලද නැද්ද කියා සොයා බලා, එය නීත්‍යානුකූල රැස්වීමක් නොවන බව පෙනී යනවා නම්, මට දෙපාර්තමේන්තුව මගින් යම් ක්‍රියාමාර්ගයක් ගන්නට පුළුවන් වේයි. එහෙත් නීත්‍යානුකූල බව පෙනී ගියොත් අපට ඒ ගැන කරන්නට දෙයක් නැහැ. මන්ත්‍රීතුමාට නිතිඥ උපදෙස් තිබෙනවා නම් ඒ ප්‍රශ්නය විනිශ්චය මණ්ඩලයකට ඉදිරිපත් කරන්නට පුළුවන් වෙයි.

සමුපකාර නීති සම්බන්ධයෙන් හා ඉදිරියේදී අපට කල්පනා කරන්නට සිදු වන කරුණු ගැන, අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා) වැදගත් අදහස් කීපයක් ප්‍රකාශ කළා. ඒ කරුණු සහ වෙන වෙන කරුණු සම්බන්ධයෙනුත් ඇමති කාර්යාංශයේ සහ මගේ අවධානය යොමු වන බව ප්‍රකාශ කරන්නට කැමතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.
விஞ. விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පරිපූරක මුදල්

පරිපූරක මුදල: සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව: දහම් පාසැල් පොත් සැපයීම ආදි කටයුතු

குறைநிரப்புத் தொகை : கலாசார அலுவல்கள் திணைக்களம் : தம்ம பாடசாலை நூல்கள் ஆதியன பிரசுரம்

SUPPLEMENTARY SUPPLY—DEPARTMENT OF CULTURAL AFFAIRS : PUBLICATION OF DHAMMA SCHOOL BOOKS, ETC.

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)

I move,

"That a supplementary sum not exceeding Rupees Two hundred and fifty thousand (Rs. 250,000) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon, or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year beginning on October 1, 1968, and ending on September 30, 1969, and that the said sum may be expended as specified in the Schedule hereto :

Schedule

	Rs.
Head 150—Department of Cultural Affairs.	
Vote No. 4—Services provided by the Department—Recurrent Expenditure ..	250,000"

This is a sum of money which is being moved by way of a Supplementary Estimate for Dhamma schools. As Dhamma schools are becoming popular, an increasing number of books has to be supplied to them.

It has become necessary to obtain additional funds through a Supplementary Estimate as the amount voted for the Department of Cultural Affairs for expenditure during the financial year 1968-69 is hardly sufficient to meet the extensive programme contemplated for the promotion of religious activities.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. ඩී. බණ්ඩා]

Also, additional money is required to give grants to Dhamma schools and other similar institutions giving religious instruction.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි.

විනු එදුත්තියම්පප්පෙට්‍රතු.

Question proposed.

ධර්මලිංගම් මයා.

(திரு. தர்மலிங்கம்)

(Mr. Dharmalingam)

கௌரவ உப சபாநாயகரவர்களே, கலாசார அலுவல்கள் திணைக்களத்தின் உப மானியம் பற்றி விவாதிக்கப்படுகின்ற இந்த நேரத்திலே கௌரவ கல்வி அமைச்சரோ அல்லது அவரது பாராளுமன்றக் காரியதரிசியோ இந்தச் சபையிலே இல்லாமலிருப்பது மிகவும் கண்டிக்கக் கூடிய ஒரு விஷயமாகும். கௌரவ அமைச்சரவர்கள் நுவரெலியாவுக்கு ஓய்வெடுப்பதற்காகப் போயிருப்பதாக அறிகிறோம். இப்படியான ஒரு உப மானியத்தை நாங்கள் விவாதிக்கின்ற நேரத்திலே கௌரவ அமைச்சரவர்கள் இங்கே இல்லாமல் நுவரெலியாவிலே ஓய்வு எடுத்துக் கொண்டிருப்பது எந்தவித சம்பிரதாயத்திற்கும் ஏற்காது.

இந்த விதமாக அமைச்சர்கள் உப மானியங்களைப் பற்றி விவாதிக்கும் நேரங்களிலும் வரவு செலவுத் திட்டத்தை விவாதிக்கும் நேரங்களிலும் நாங்கள் பேசுவதைக் கவனியாமல், நாங்கள் பேசுவதைத் தொடர்ந்து நடவடிக்கைகளை எடுக்காமல் இருப்பதனாலே தான் கோடிக்கணக்கான ரூபாவுக்கு உப மானியப் பிரேரணைகளைக் கொண்டுவரவேண்டிய நிலை ஏற்படுகின்றது. வரவு செலவுத் திட்டத்தை விவாதிக்கும் பொழுது நாங்கள் எத்தனையோ கேள்விகளைக் கேட்கிறோம் எத்தனையோ பிரச்சினைகளை எழுப்புகிறோம். ஆனால், வரவு செலவுத் திட்டம் நிறைவேறியதும் கோடிக் கணக்கான ரூபாக்களுக்கு உப மானியங்கள் கொண்டு வரப்படுகின்றன ஒவ்வொரு ஆண்டும். அரசாங்கத்திடம் எந்தவிதமான திட்டமும் இல்லாதிருப்பதே இதற்குக் காரணமாகும். அரசாங்கத்திடம் ஒரு திட்டம் இருக்குமேயானால் இப்படியாக அடிக்கடி உப மானியங்களைக் கொண்டுவர வேண்டிய தேவை ஏற்படாது.

පරිපූරක මුදල්

Advisory Committe on Hinduism என்ற குழுவுக்கு நாற்பத்தையாயிரம் ரூபாவைக் கொடுப்பதுதான் இந்த உப மானியப் பிரேரணையின் முக்கிய நோக்கம். இந்த நாற்பத்தையாயிரம் ரூபாவும் அவர்கள் செய்யும் சேவைகளுக்கு, அவர்கள் செய்யும் தொண்டுகளுக்கு ஒரு மூலைக்குக் காணாது என்று சொல்லிவைக்க விரும்புகிறேன். எத்தனையோ விதத்தில் அவர்கள் சிறந்த தொண்டுகளை யாற்றி வருகிறார்கள். இப்படிப்பட்ட ஒரு விஷயத்துக்கு இந்தப் பணம் சென்ற ஆண்டு கொடுக்கப்பட்டிருக்க வேண்டியதாகும். இந்தப் பணத்தைச் சென்ற ஆண்டு கொடுக்காமல் இன்று ஏதோ அரை மனத்துடன் செய்வது போல இந்த உப மானியத்தைக் கொண்டு வந்திருக்கிறார்கள். சென்ற ஆண்டு கொடுக்காது இப்பொழுதாவது கொடுக்க வேண்டும் என்று கௌரவ அமைச்சர் அவர்கள் நினைத்ததையிட்டு மகிழ்ச்சியடைகிறோம். இந்த Advisory Committe on Hinduism என்ற குழுவினர் பல துறைகளிலே தொண்டாற்றி வருகிறார்கள். அரசாங்கம் வேண்டிய பொருளுதவியையும் உற்சாகத்தையும் அளித்தால் அவர்களால் இன்னும் எத்தனையோ துறைகளில் நல்ல விதத்தில் தொண்டாற்ற முடியும். இப்படி அரைகுறையாக, அரை மனத்துடன் நிதி உதவிலை, அந்தக் குழு சிறந்த முறையில் கடமையாற்ற முடியாமல் போய்விடும். உதாரணமாக, Dhamma school books என்ற விஷயத்துக்காக—பௌத்த சமயத்தை வளர்ப்பதற்காக—154 ஆயிரம் ரூபா ஒதுக்கப்பட்டு செலவு செய்யப்பட்டது. இப்படியான புத்தகங்கள் ஒரு சமயத்தை வளர்ப்பதற்கு இன்றியமையாதன என்பதை நாங்கள் ஏற்றுக் கொள்கிறோம்.

சைவ சமயத்தை வளர்ப்பதற்கு இந்த அரசாங்கம் இவ்வித புத்தகங்களை அச்சடிக்க ஏதாவது பணம் செலவழித்திருக்கின்றதா எனக் கேட்க ஆசைப்படுகிறேன். 1,54,000 ரூபாவை பௌத்த சமயத்துக்காகச் செலவழிப்பதை நான் குறை கூறவில்லை. செலவழிக்கத்தான் வேண்டும். அதேபோல, சைவ சமயத்தை வளர்க்க அரசாங்கம் போதிய நிதி உதவி செய்ய ஏன் முன்வரவில்லையென்று கேட்க விரும்புகிறேன். Dhamma school books அச்சடிப்பதைப் போல, எங்கள் பாட

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

சாலைகளிலும் எங்கள் மாணவர்கள் சைவத் தைப் படிக்க இவ்வித புத்தகங்களை அரசாங் கம் ஏன் அச்சடிக்கக் கூடாது என்று கேட்க விரும்புகிறேன்.

Advisory Committee on Hinduism எத்தனையோ விஷயங்களில் ஈடுபட்டு எமது சமயத்தின் வளர்ச்சிக்காக உழைக்க முடியும். இந்த Advisory Committee க்கு அரசாங்கம் உதவி கொடுப்பதன் மூலம் வெளிநாடுகளி லிருந்து, முக்கியமாகத் தென்னிந்தியாவி லிருந்து சைவப் பெரியார்களை இங்கு வரவ ழைத்து அவர்கள் மூலம் பிரசங்கங்களும் பிர சாரங்களும் செய்வித்து இன்று எமது சம யத்திலுள்ள சிக்கல்களைப் போக்க உதவி புரிய முடியும். இன்று தென்னிந்தியாவிலேயிருந்து பெரியார்களை வரவழைப்பதென்றால் மிகவும் கஷ்டமாக இருக்கின்றது. ஒன்றில் விசா கிடைக்காது. விசா கிடைத்தாலும் போதிய பணம் கிடைக்காது. இன்னும் எத்தனையோ கஷ்டங்கள் இருக்கின்றன. இவ்வித கஷ்டங் களைக் கொடுக்காது பெரியார்களை இங்கு வர வழைக்க வேண்டிய உதவியை அரசாங்கம் இந்த Advisory Committee க்குக் கொடுக்க வேண்டும்.

இன்று குன்றக்குடி அடிகள் இங்கு வந்தி ருக்கிறார்கள். அப்படிப்பட்ட பெரியார்கள் அடிக்கடி எமது நாட்டுக்கு வரவேண்டும். குன்றக்குடி அடிகள் சமயத் தலைவர் மட்டு மல்ல; பல்வேறு துறைகளிலே சேர்ந்து தொண்டாற்றும் பெரியார் அவர். தென்னிந்தி யாவில் சமூகத் துறையிலும் சமயத் துறையி லும் அவர்கள் அரும்பெரும் தொண்டாற்றி யிருக்கிறார்கள். அப்படிப்பட்ட பெரியார்களை இங்கு வரவழைப்பதினால் எங்கள் சமய வளர்ச்சிக்கு அது மிகவும் பெரிய உதவியாக இருக்கும்.

குன்றக்குடி அடிகள் சமூகத் துறையைப் பொறுத்தவரையில் சேரி ஒழிப்புக்காக எத் தனையோ அரும்பெரும் தொண்டுகளை ஆற்றி யிருக்கிறார்கள். எல்லாவற்றிலும் முக்கியமாக சாதி வேற்றுமைகளை ஒழிக்க, ஆலயப் பிர வேசத்தை நடத்த அவர்கள் ஆற்றிவரும் தொண்டுகள், செய்து வரும் பிரசாரங்கள் இன்றியமையாதவை. இன்று யாழ்ப்பாணத் திலே ஆலயப் பிரவேசம் மிகவும் பெரிய ஒரு பிரச்சினையாக இருக்கும் நேரத்தில் குன்றக் குடி அடிகள் போன்றவர்களை அழைத்து அவர்கள் மூலம் உண்மையான நிலையை எடுத்து விளக்கி, ஆலயப் பிரவேசத்தை அனு மதிக்க உதவி செய்ய வேண்டும். அதற்காக இந்த அரசாங்கம் போதிய நிதியைக் கொடுக்க வேண்டும்.

நான் அதிகமாகப் பேச விரும்பவில்லை. இப் போதாவது இந்த 45,000 ரூபாவைக் கொடுக்க அரசாங்கம் முன்வந்ததையிட்டுச் சந்தோஷம் அடைகின்றேன். ஆனால், இந்த நிதி உதவி போதாது. எத்தனையோ விஷயங் களை நடத்த இந்த Advisory Committee க் குப் பணம் தேவையாக இருக்கும். ஆகையால் போதிய பணத்தைக் கொடுத்து உதவ வேண் டும் என்று கேட்டு எனது பேச்சை முடித்துக் கொள்ளுகிறேன்.

අ. භා. 9.16

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පරි පූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කර තිබෙන්නේ අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිතුමා නමිනුයි. එහෙත් මෙය ඉදිරිපත් කරන්නටවත්, එයින් මතු වන ප්‍රශ්නවලට පිළිතුරු දෙන්නටවත් එතුමා මේ ගරු සභාව තුළ නොසිටීම ගැන ප්‍රථමයෙන්ම මගේ විරුද්ධත්වය ප්‍රකාශ කරන්නට ඕනෑ. ගරු ඇමති තුමා පමණක් නොව එතුමාගේ පාර්ලිමේන්තු ලේකම්වරයා වන උප ඇමති තුමාවත් මේ අවස්ථාවේ මෙතන නොසිටීම කනගාටුවට කාරණයක් බව කියන්නට ඕනෑ.

විශේෂයෙන්ම මා ඒ ආකාරයට කියන්නේ, පසුගිය දා අයවැය විවාදය පවතිද්දී ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ වැය ශීර්ෂය සාකච්ඡා කරන විට මා ඉදිරිපත් කළ ප්‍රශ්නයට මෙතෙක් පිළිතුරක් නොලැබුණු නිසයි. මොකක් ද ඒ ප්‍රශ්නය? සංස්කෘතික දෙපාර්තමේන්තුව තිබෙන්නේත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේයි. ගරු අධ්‍යාපන ඇමතිතුමා භාරයේ පවතින සංස්කෘතික දෙපාර්තමේන්තුව මගින් මීට පෙර වර්ෂයක් පාසා සාහිත්‍ය මාසය තුළ පොත්පත් ප්‍රදර්ශනයක් පවත්වන්නට යෙදුණු බව තමුන්නාන්සේ දන්නවා. පොත්පත් ප්‍රදර්ශනයෙන් පසු, වර්ෂයක් පාසා, තෝරා ගනු ලැබූ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

පොත්වලට තෑගි ප්‍රදානයකුත් කළා. 1969 වර්ෂයේදීත් පෙර පරිදි පොත්පත් ප්‍රදර්ශනයක් පැවැත්වෙතියි මහජනයා බලාපොරොත්තු වුණා. අපට දැනගන්නට ලැබී තිබෙන්නේ ඒ පොත්පත් ප්‍රදර්ශනයත්, තෑගි දීමත් කල් දමා තිබෙන බවයි. සාමාන්‍යයෙන් 1969 දී පොත්පත් ප්‍රදර්ශනයත් තෑගි තරඟයත් පවත්වන්නට නියමිතව තිබෙන්නේ 1968 වර්ෂයේදී ප්‍රසිද්ධ කරන්නට යෙදුණු පොත්පත් පිළිබඳවයි. එහෙත්, මා හිතනවා, සියවස ප්‍රදර්ශනයක් පවත්වන්නට තිබුණු නිසා **දෝ ඒ ප්‍රදර්ශනය කල් දමා තිබෙනවා**ය කියලා, කලකට පෙර, 1969 දී පොත්පත් තරඟයක් පවත්වන්නේ නැතැයි දැන්වීමක් නිකුත් කරන්නට යෙදුණු බවත් මට දැනගන්නට ලැබුණා. එම ප්‍රදර්ශනය 1969 දී නොපවත්වා ඒ වෙනුවට 1970 දී තබනවායයි කියනවා මට ඇහුණා. 1968දී පොත් ප්‍රසිද්ධ කළ උදවියට 1970 දී තමන්ගේ පොත් එම තරඟයට ඉදිරිපත් කරන්නට ඉඩ දෙන්නට යන බවත් මට දැනගන්නට ලැබුණා. ඒ කොයි හැටි වෙතත් නැවත මේ ළඟදී මට දැනගන්නට ලැබුණා, පොත් ප්‍රදර්ශනයක් 1969 ඔක්තෝබර් මාසයේදී පවත්වන්නට යනවාය කියා. ඒ පොත් ප්‍රදර්ශනයත්, තරඟයත් දෙකම මේ අවුරුද්දේ තබන්නට යනවා යයි මට මේ නොබෝදා දැනගන්නට ලැබුණා.

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)

1968 දී ලියාපු ඒවාද?

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

එහෙම වෙන්න ඕනෑ. මේ කාරණය පැහැදිලි කර ගැනීමට මම ප්‍රශ්නයක් ඇහුවා, අයවැය විවාදයේදී. ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ වැය ශීර්ෂය සාකච්ඡා කරන අවස්ථාවේ තමයි මා ඒ ප්‍රශ්නය ඉදිරිපත් කෙළේ. එහෙත් තවමත් පිළිතුරක් ලැබුණේ නැහැ. අයවැය විවාදය හා සම්බන්ධ **හැන්සාඩ්** වාර්තාවකුත් ගෙන්වා බැලුවා. එහෙත්, පිළිතුරක් ලැබී නැහැ. ඊට පස්සෙත්, මේ වනතුරු, පිළිතුරු ලැබී නැහැ. 1969 ඔක්තෝබර් මාසයේදී ප්‍රදර්ශනයක් සහ තරඟයක් ඇති කරන්නට යනවා නම් කල් ඇතිව දැන්වීම් පළ කරන්නට ඕනෑ නේද? 1968 දී පොත් පළ කළ ග්‍රන්ථ කතෘවරුන්ට ඒ සඳහා ඉදිරිපත් වන්නට කල් ඇතිව දැනුම් දීම අවශ්‍යයි. එහෙත් එවැනි දැනුම් දීමක් මේ වනතුරු කළ බවක් අපට නම් දැනගන්නට ලැබී නැහැ. ප්‍රසිද්ධ දැන්වීමක් මගින් නිසි අන්දමට දැනුම් දීමක් කෙරෙන්නේ නැත්නම්, නිලධාරීන් පෞද්ගලිකව දන්වනවා පමණක් නම්, නිලධාරීන් පෞද්ගලිකව දන්නා අයට පමණයි ඉදිරිපත් වන්නට පුළුවන් වන්නේ. එවැනි වැඩ පිළිවෙළක් අනුව ත්‍යාග ප්‍රදානය කරන්නට යන්නවා නම් එය නුසුදුසු බව මම තරයේ ප්‍රකාශ කරනවා. පුවත්පත්වල මේ ගැන සඳහන් වී තිබෙනවා.

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)

පත්‍රවල තිබුණේ ඇමතිවරයාගේ නිවේදනයක් හැටියටද?

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

ප්‍රවෘත්තියක් හැටියටයි, මා දන්නා තරමින් නම් එය පළ වී තිබුණේ. ගරු ඇමතිතුමාගේ නිවේදනයක් වශයෙන් පළ වී තිබුණු වගක් මට දැනගන්නට ලැබුණේ නැහැ. සමහර විට ගරු ඇමතිතුමාගේ නිල දැන්වීමක් පළ කර තිබුණා වන්නටත් පුළුවනි. එවැන්නක් තිබුණාදැයි මා දන්නේ නැහැ. මා ගරු ඇමතිතුමාගෙන් මීට පෙර ඇසූ ප්‍රශ්නයට මෙතෙක් පිළිතුරක් නොලැබුණු නිසා සමහර විට අද න්‍යායපත්‍රයේ අඩංගු වී තිබුණු මේ පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කරන අවස්ථාවේදීවත් මට ඒ ප්‍රශ්නයට ගරු ඇමතිතුමාගෙන් පිළිතුරක් ලබා ගන්නට පුළුවන් වෙතැයි මා සිතුවා. ඒ නිසා තමයි මා නිදි මරාගෙන ඉතාමත් අමාරුවෙන් නතර වුණේ. එහෙත් මට කනගාටුවට කාරණයක් වී තිබෙන්නේ මේ පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කරන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නියමිත අවස්ථාව එළඹෙන විට ගරු ඇමතිතුමාවත් එතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමාවත් මෙහි නොසිටීමයි. නැවත, අද වැඩ කටයුතු අවසන් වීමෙන් පසු, පාර්ලිමේන්තුව රැස් වන්නේ ඔක්තෝබර් මාසයේ 21 වැනිදාසි. එතකොට තරඟය තබා ඉවරයි.

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)
මම හිතන්නේ නැහැ, ඒ තරම් ඉක්මණින් ඒක සිද්ධ වෙයි කියලා.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
ඒක මම දන්නේ නැහැ. මට තවම පිළිතුරක් ලැබී නැහැ. අද නම් මට පිළිතුරක් ලැබෙන එකක් නැහැ. අද පිළිතුරක් දෙන්නට බැරි වුණත් ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ අවධානය මෙයට යොමු කරනු ඇතැයි මා විශ්වාසයෙන් බලාපොරොත්තු වෙනවා. 1968දී පොත් පත් ප්‍රසිද්ධ කළ ග්‍රන්ථ කර්තෘවරුන්ටත් මෙයට සහභාගි වන්නට කල් ඇතිව දැනුම් දෙන්නට ඕනෑ. එසේ නොකළොත් ඒ උදවියට බලවත් අයුක්තියක් තමයි සිද්ධ වන්නේ. මේ ප්‍රශ්න ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කර ඒ ගැන සුදුසු ආකාරයකට ක්‍රියා කරන හැටියට මා ඉල්ලා සිටිනවා.

අ. භා. 9.21

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මේ ප්‍රශ්නය ගැන දීර්ඝ ලෙස කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. සංස්කෘතික දෙපාර්තමේන්තුවට රු. 2,50,000 ක් ඉල්ලා තිබෙනවා. එයින් රු. 45,000 ක් හින්දු ආගමික උපදේශක මණ්ඩලයට දෙන අතර, රු. 2,05,000 ක් දහම් පොත්පත් මුද්‍රණය කිරීම සඳහා යොදවනවා. මේ කාරණය ගැන අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. ලංකාවේ දහම් පාසැල් 4,000 ක් පමණ තිබෙනවා කියා ඇමතිතුමාගේ වාර්තාවේ තිබෙනවා. ඒ දහම් පාසැල් 4,000 හේ

සිටින ශිෂ්‍යයින්ට ධර්මය ගැන අවබෝධයක් ලබා දෙන්නටයි මේ පොත් මුද්‍රණය කරන්නේ. එය හොඳ වැඩක්. එහෙත් ඒ පාසැල් 4,000 හේ ගුරුවරුන් කොපමණ සිටිනවාද? ඇත්ත වශයෙන්ම ගුරුවරුන් 25,000 ක් වත් ඇති. ඒ ගුරුවරුන්ට සංස්කෘතික දෙපාර්තමේන්තුව කරන සේවය කුමක්ද?

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
ආගම උගන්වනවාට පඩි ගෙවනවායැ.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
පඩි ගෙවන්නය කියා මා කියන්නේ නැහැ. මේ ගුරුවරුන් උනන්දු කරවීමට කරන්නේ කුමක්ද? මෙය සේවයක් නොවෙයි, ආගමික කටයුත්තක්. ඒ ගුරුවරුන් මහන්සි වී වෙන වැඩකට යොදවන්නට තිබෙන තමන්ගේ කාලයත් ශ්‍රමයත් මෙයට යොදවනවා. ඒ නිසා ඔවුන් උනන්දු කරවීමට මොකක් හෝ තිබෙන්න එපායැ.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
ඇයි පිං ලැබෙනවානේ.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
එය පරලොවටනේ. මා කියන්නේ මෙලොවට.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
මාක්ස්වාදීන්ට තේරෙන්නේ නැහැ.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
මාක්ස්වාදීන්ට තමයි මිනිහාගේ දුක ගැන, මිනිසුන්ගේ ශ්‍රමයේ තිබෙන වටිනාකම ගැන තේරෙන්නේ. තමුන්නාන්සේලාට නම් තේරෙන්නේ නැහැ. තමුන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

නාන්සේලාට තේරෙන්නේ මිනිසුන්ගේ ශ්‍රමය සූරා කන්නයි. එයයි තමුන්නාන්සේලාගේ ධර්මය. ආගමේ මුවාවෙන් ජනතාව සූරා කෑමයි තමුන්නාන්සේලාගේ ධනපති ක්‍රමය. අපි තමයි නියම විධියට මනුෂ්‍යයාගේ විමුක්තිය සඳහා සටන් කරන්නේ. තමුන්නාන්සේලා දෙන්න හදන්නෙ පරලොවදී. අපි සටන් කරන්නේ මෙලොවදී සැප ලබා දෙන්නයි.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
නිවන් ලබා ගන්නේ මෙලොවදීනේ.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
කන්න නැත්නම්, අඳින්න නැත්නම්, කරන සේවයට සුදුසු වැටුපක් නැත්නම්, වාසයට නුසුදුසු ගෙවල ඉන්න සිදුවී තිබෙනවා නම්, කොහොමද නිවන් දකින්නේ ?

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
බෞද්ධයෝ දන්නවා.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
නිවන් දකින්න හිතේ සැනසිල්ල තිබෙන්නට ඕනෑ; හිත නිවන්නට ඕනෑ.

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)
තමුන්නාන්සේලා අවුස්සන විට නිවන්නෙ කොහොමද ?

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
මේ සමාජ ක්‍රමය ඇතුලේ ඇවිස්සෙනවා. අපි ඇවිස්සුවේ නැතත් ඇවිස්සෙන එක නවත්වන්න අමාරුයි. තමුන්නාන්සේලා නම් බඩපුරා කනවා. එහෙත් කන්න නැති අය සිටිනවා. තමුන්නාන්සේලා හොඳට අඳිනවා. අඳින්න නැති අයත් සිටිනවා. තමුන්නාන්සේලා හොඳ මන්දිරවල ජීවත් වෙනවා. සමහර අය පැල්පත්වල ජීවත් වෙනවා. ඉතින් ඒ අයගේ හිත නිවන්නේ කොහොමද ? හිත හදාගන්නට නම් කාටත් එක වගේ කන්න බොන්න, අඳින්න පළඳින්න, ඉන්න හිටින්න තිබෙන්නට ඕනෑ. එතකොට නේද හිත හැදෙන්නේ ? එතකොට නේද ඊර්ෂ්‍යාව නැති වන්නේ ? එතකොට නේද අධ්‍යාත්මික වශයෙන් මිනිහා දියුණු වන්නේ ? ඒ නිසා ඔය බණ හරි යන්නේ නැහැ. ඕවා ධනපති බණ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා කියාගෙන ගියේ දහම් පාසැල් දියුණු කිරීම සඳහා ඒවායේ උගන්වන ගුරුවරුන්ට යම්කිසි දීමනාවක් දෙන්නය කියන එකයි. ඔවුන්ගේ සේවය උසස් කරන විට නැත්නම් ඔවුන්ට උසස්වීම් දෙන විට, අඩු වශයෙන් ඔවුන් කරන ඒ සේවය සලකුණු කිරීමක්වත් කරන්න. එතකොටයි මේ ගුරුවරුන් ඒ ගැන උනන්දු වන්නේ. අඩු වශයෙන් තමුන්නාන්සේලාගේ තේ ප්‍රචාරක මණ්ඩලය මගින් තේ කෝප්පයක්වත් දෙන්න. ඔවුන්ට එවැනි කිසිවක් නැහැ. තමුන්නාන්සේලා බලාපොරොත්තු වන්නේ නොමිලේම සේවයක් කරවා ගැනීමයි. මගේ අදහසේ හැටියට එය වැරදියි. ඔවුන් උනන්දු කිරීමට පාරිතෝෂිකයක්, අඩු වශයෙන් අවුරුද්දකට රුපියලක් දෙන්න. මුදල් නොවෙයි ප්‍රශ්නය. කරන සේවය අගයීමයි. කෙසේ හෝ ඔවුන් කරන ඒ සේවය අගයන්න යමක් කරන්න. එච්චරයි මා කියන්නේ. සල්ලි වියදම් කරන්නට බැරි නම් අඩු ගානේ සේවා සටහනක්වත් කරන්න.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
අගමැතිතුමාගේ පිංතූරයක් දෙන්න.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
ඒක නම් වටින්නේ නැහැ. අගමැතිතුමාගේ හෝ රාජ්‍ය ඇමතිතුමාගේ හෝ පිංතූරයකින් වැඩක් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)
පානදුරේ මන්ත්‍රීතුමාගේ යෝජනාව පිළි ගන්නා.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
පිංතූර්යෙන් වැඩක් නැහැ.

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)
සේවා සටහනක් කරන එක හොඳයි.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
පසුගිය ආණ්ඩු කාලයේදී දුප්පත් පන්සල් දියුණු කිරීම සඳහා ආධාර මුදල් ගෙවීමේ ක්‍රමයක් තිබුණා. ආගම දියුණු කිරීමට කථා කරන තමුන්නාන්සේලා ඒ දුප්පත් පන්සල්වලට ආධාර මුදල් නොදෙන්නේ ඇයි?

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)
නොදෙන්නේ නෑ.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
මා නියෝජනය කරන කොට්ඨාශයේ පන්සල් බොහොම තිබෙනවා. මහජනයා දුප්පත් නිසා ඒ පන්සල් දියුණු කරන්නට බැරිව තිබෙනවා.

බෙලිගම්මන මයා.
(திரு. பெலிகம்மன)
(Mr. Beligammana)
කෞතුකාගාර වගේ.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
ඒක පන්සල්වලට අගෞරව කිරීමක්. පන්සල් කෞතුකාගාර වගේ යයි ස්ව දේශ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමා කියනවා. පන්සල්වලට කටු ගෙවල් යයි කියනවා.

බෙලිගම්මන මයා.
(திரு. பெலிகம்மன)
(Mr. Beligammana)
මා කිවේ මාක්ස්වාදී රටවල.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
තමුන්නාන්සේ හරියට ඉගෙන ගෙන නැහැ. ඒ රටවලට ගොස් බලන්නැයි මා එතුමාට ආරාධනා කරනවා. ඒ රටවල මිනිසුන් ආගම අදහන්නේ නැද්දැයි සොයා බලන්න. හැබැයි, ජාවාරම් කරන්නට නම් ඉඩ දෙන්නේ නැහැ. මහජනයා සූරා කන්නට ඉඩ දෙන්නේ නැහැ.

ගරු ඊ. එල්. බී. හුරුල්ලේ (ප්‍රවාහන ඇමති)
(கௌரவ ஈ. எல். பி. ஹுரூல்ல—போக்கு வரத்து அமைச்சர்)
(The Hon. E. L. B. Hurulle—Minister of Communications)
පාර්ලිමේන්තු ලේකම්තුමාට විකට් එකක් දෙන්න. එතකොට ගිහින් බලාගෙන එනවා ඇති.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
මා ළඟ විකට්ස් නැහැ. එතුමා ඒ අදාළ උදවියගෙන් ඉල්ලීමක් කළොත් ඒ රට වල කටයුතු ගැන සොයා බලා ආපසු ඒම සඳහා විකට් එකක් දෙනවාට කිසිම සැකයක් නැහැ.

දකුණු ඉන්දියාවේ හින්දු පූජකයන්ට ලංකාවට එන්නට ඉඩ දෙන්නේ නැතැයි උඩුවිල්හි ගරු මන්ත්‍රීතුමා (වී. ධර්මලිංගම් මයා.) ප්‍රකාශ කළා. වීසා බල පත්‍ර ප්‍රමාද කිරීමෙන් අවහිර ඇති වන බව එතුමා සඳහන් කළා. මේ තත්ත්වය නිසා උතුරේ පංචම ජනයාට තිබෙන හිරිහැරය සම්බන්ධයෙන් අනෙක් උදවියට සැහෙන ආගමික අවබෝධයක් ලබා දෙන්නට බැරි වී තිබෙන බවද එතුමාගෙන් කියවුණා. උතුරේ කුල හීන යයි සම්මත ජනයාට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

දේවාලවලට ඇතුළු වන්නට පූළුවන් කමක් නැහැ. මෙය ඉතාමත්ම අසතුටුදායක තත්ත්වයක්. මෙය කිසිම ආගමකට ගැළපෙන එකක් නොවෙයි. මේ තත්ත්වය හින්දු ආගමටද නොගැළපෙන බව උඩුවිල්හි ගරු මන්ත්‍රීතුමා විසින් පෙන්වා දෙන්නට යෙදුණා. මේක ලොකු වරදක්. කුල හීන ජනයාට කෝවිල්වලට ඇතුළු වන්නට ඉඩ නොදීම ආගමට විරුද්ධයි. මේ නිසා මා එක යෝජනාවක් ඉදිරිපත් කරන්නට කැමතියි. හින්දු ආගමික නායකයන්ට මේ රටට එන්නට ඉඩ දී, පංචම ජනයාට සිදු වී තිබෙන අයුක්තෙන් ඔවුන් මුදවා ගන්නට සලස්වා ඒ පලාතේ සාමය ආරක්ෂා කිරීමට රජය කටයුතු නොකරන නිසා, හින්දු ධර්මයේ කුල වාදයට විරුද්ධව තිබෙන කොටස් එකතු කරගෙන, කුල හීනයන් හැටියට එක් කොටසක් හදුන්වමින් ඔවුන්ට හිරිහැර කිරීම හා ඔවුන්ගේ ආගමික නිදහසට අවහිර කිරීම වැරදි බව පෙන්වා දෙන හින්දු ආගමික ලියවිලි එකතු කරගෙන, දෙමළ භාෂාවෙන් කුඩා පොතක් මුද්‍රණය කොට දෙමළ ප්‍රදේශවල ප්‍රචාරය කිරීම ලොකුම පිංකමක් හෙයින් ඒ පිංකම කරන ලෙස මා රජයට යෝජනා කරනවා. ඒ තරම් පිංකමක් තවත් නෑ. එය ලොකුම පිංකමක්. රාජ්‍ය ඇමතිතුමාත් එය අනුමත කරනවාට කිසිම සැකයක් නැහැ.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
ඔව්, ඔව්.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

උතුරේ කුලහීනයයි සම්මත ජනතාවට විඳින්නට සිදු වී තිබෙන හිරිහැර ඉතා කණගාටුදායකයි. උතුරේ කුලහීනයයි සම්මත ජනතාව පිළිගෙන තිබෙනවා, තමන්ට සහනයක් ලැබිය හැක්කේ බුද්ධ ධර්මයෙන් පමණක්ය කියා. එසේම ඔවුන් ඉල්ලා සිටිනවා, තමන්ට බුද්ධ ධර්මය උගන්වන්නය කියා. ඒ අනුව දැන් ඔවුන්ට බුද්ධ ධර්මය උගන්වාගෙන යනවාදැයි මා දන්නේ නැහැ. මොන කරම් විරුද්ධකම් මතුවුනත් බුද්ධ ධර්මය උගන්වන්නැයි ඉල්ලන්නන්ට බුද්ධ ධර්මය ඉගැන්වීම සංස්කෘතික දෙපාර්තමේන්තුවේ යුතුකමක්. හින්දු කෝවිල්වලට ඇතුළු වන්නටවත් ඔවුන්ට ඉඩ නොදෙනවා නම්, මිනිසුන් වශයෙන් ඔළුව ඉස්සිමටවත් ඉඩ නොදෙනවා නම්, නිදහස සලසා දෙන ධර්මයක් පිළිගැනීමට ඔවුන්ට තිබෙන අයිතිය තහවුරු කිරීමට ආධාර කිරීම සංස්කෘතික දෙපාර්තමේන්තුවේ වැදගත් යුතුකමක්. එසේම, උතුරේ කුලවාදීන් පංචම ජනයාට විරුද්ධව කරන ක්‍රියා හින්දු ධර්මයට පටහැනි බව පිළිබිඹු කෙරෙන හින්දු ධර්ම පාඨ උපුටාගෙන ඒවා දෙමළ භාෂාවෙන් මුද්‍රණය කොට කුඩා පොතක් වශයෙන් නිකුත් කොට, කුලහීනයයි සම්මත ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ව්‍යාපාරය, දියත් කරන ලෙසත් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. ආගමික කටයුතු පිළිබඳ උපදෙස් දෙන හින්දු සභාවේ සහයෝගයක් ඊට ලැබේයයි මා විශ්වාස කරනවා.

එසේම, දහම් පොත් මුද්‍රණය ගැනත් යමක් කිව යුතුව තිබෙනවා. සමහර පොත්වල ඇතුළත් වී තිබෙනවා, විශ්වාස කරන්නට බැරි කථා පවා. ඒවා බුද්ධ ධර්මයට අදාළ ඒවා නොවේයි, ඒ ඒ පුද්ගලයන් විසින් ඇතුළත් කරනු ලැබූ ඒවායි. එවැනි කථා පවා අඩංගු කොට පරණ තාලයට දහම් පොත් පිළියෙළ නොකොට, බෞද්ධ දර්ශනය පිළිබඳ හැඟීම් ළමයින් තුළ කාවැදී යන අන්දමට, තර්කානුකූල පදනමක් මත පිළියෙළ වුණු නව පන්නයේ දහම් පොත් සකස් කරන ලෙසත්, විශ්වාස කරන්නට අපහසු හිතලු කථා ඇතුළත් දහම් පොත් සංශෝධනය කරන ලෙසත් මා ඉල්ලා සිටිනවා.

සංස්කෘතික දෙපාර්තමේන්තුවේ චිත්‍රපට අංශය උපයෝගී කරගෙන, දහම් පාසල්වල සහයෝගය ඇතිව චිත්‍රපට සංදර්ශන පැවැත්වීමටත් කටයුතු යොදන ලෙස සංස්කෘතික දෙපාර්තමේන්තුවෙන් මා ඉල්ලා සිටිනවා.

බෙලිගම්මන මයා.
(திரு. பெலிகம்மன)
(Mr. Beligammana)
තමුන්නාන්සේ බෞද්ධයෙක්ද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

තමුන්නාන්සේට වඩා හොඳ බෞද්ධයෙක්.

අ. භා. 9.35

කාරියවසම් මයා.
(திரு. காரியவசம்)
(Mr. Kariyawasam)

ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්තුමා හිටනවා, කොමියුනිස්ට්කාරයකුට හොඳ බෞද්ධයෙක් වන්න බැරිය කියා.

බෙලිගම්මන මයා.
(திரு. பெலிகம்மன)
(Mr. Beligammana)

මා කීවේ, කොමියුනිස්ට් ප්‍රකාශනයේ තිබෙන දෙයක්.

කාරියවසම් මයා.
(திரு. காரியவசம்)
(Mr. Kariyawasam)

මාතර ගරු මන්ත්‍රීතුමා (තුඩාවේ මයා.) තමුන්නාන්සේට වඩා හොඳ බෞද්ධයෙක්. ආගමේ මුවාවෙන් රැකෙන්නට හදන අයට වඩා හොඳ බෞද්ධයන් වන්නට කොමියුනිස්ට්කාරයන්ට පුළුවනි.

මේ අවස්ථාවේදී මා නැඟී සිටියේ අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති මේ පරිපූරක ඇස්තමේන්තුව ගැන වචන ස්වල්පයක් කථා කරන්නටයි.

එක් එක් අමාත්‍යාංශය මගින් අතිරේක ඇස්තමේන්තු ගණනාවක් අද ඉදිරිපත් කරන්නට යෙදුණා. එයින් ඉතාම අඩු මුදලක් අඩංගු වන ඇස්තමේන්තුව මේකයි. මෙහි සඳහන් මුදල රු. 2,50,000 යි. ආගම ධර්මය ඉලිළිබඳ කටයුතු සඳහා ඉතාම අඩු මුදලක් වෙන් කර තිබීමෙන් අපට පෙනී යන්නේ, මේ රජය ඒ අංශය ගැන වැඩි වෙහෙස මහන්සියක් හෝ වියදමක් හෝ දැරීමට කැමති නැති බවයි; ඒ අංශය සඳහා වැඩිපුර වියදම් කිරීමට මේ රජය බලා පොරොත්තු නොවන බවයි. සමහර මන්ත්‍රීවරුන් කියන්නාක් මෙන් මේ රජය රුසියාවේ කොමියුනිස්ට් රජයටත් වඩා ආගම් පිළිබඳව විශේෂ සැලකිල්ලක් දක්වනවා නම් එවැනි කටයුතු සඳහා මේ තරම් අඩු මුදලක් වෙන් කරන්නේ ඇයි? අද මේ රටේ ආගමික හැඟීම් හා අධ්‍යාත්මික ගුණ වගාව බොහෝ දුරට පිරිහී ගිය කාලයක්. අපරාධ සංඛ්‍යාව දිනෙන් දිනම වැඩි වේගත යනවා. උසස් සංස්කෘතියක් ඇති සදාචාර සම්පන්න හික්මුණු ජාතියක් වශයෙන් අප ලෝකයා හමුවෙහි පෙනී සිටියේ අපගේ ආගම කොටගත් අධ්‍යාත්මික ගුණ වගාව අනුවයි. බටහිර බලපෑම් නිසා එය නැති වී ගියා. ආගමික හැඟීම් ප්‍රබෝධමත් කොට ජාතිය නැවත නගාසිටුවීමට හැකි වන්නේ දහම් පාසල් ඇති කිරීමෙන් හා ආගම ධර්මය පුහුණු කිරීමේ වෙනත් නොයෙක් මාර්ග යෙදීමෙනුයි. පොත් කට පාඩම් කරවීම පමණක් ඒ සඳහා සෑහෙන්නේ නැහැ. අවංක හැඟීමකින් යුක්තව ගුණධර්ම පිළිපැදීමේ ක්‍රියා මාර්ග ඇති කිරීම ඉතාම අවශ්‍යයි. ජනනායකයන් වශයෙන් මේ අතින් ජනතාවට ආදර්ශයක් දීමට මැති ඇමතිවරුන් ඉදිරිපත් වෙනවා නම් එය ඉතා වැදගත්. බුරුමයේ මෙන් මේ රටේත් මැති ඇමතිවරුන් හය මාස යක්වත් මහණ වී ගුණදහම් පිරීමේ යෙදෙතොත් මේ රටේ ජනතාව තුළ ආධ්‍යාත්මික ගුණවගාවක් ඇති කිරීමට එය ප්‍රධාන මගක් වෙනවා ඇති.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවැනි වැඩ පිළිවෙළක් සඳහා වෙන් කර තිබෙන මේ මුදල මදි බවයි මට කියන්නට ඕනෑ කෙළේ. ආගමික සංස්ථාවන් ගොඩ නැගීමට වැඩිපුර මුදල් වියදම් කළ යුතුයි. බෞද්ධ, හින්දු, මුස්ලිම් ආදී වූ හැම ආගමකම සංස්ථාවන් ගොඩ නැගීම සඳහා දිය හැකි හැම ආධාරයක්ම රජය විසින් දිය යුතුයි. මාතර මන්ත්‍රීතුමා කීවාක් මෙන්ම, අද මේ රටේ බෞද්ධාගම පවත්වාගෙන යන පන්සල් සඳහා රජයෙන් දෙන ආධාර මුදල් ක්‍රමයෙන් අඩු වී ගොස් තිබෙනවා. බෞද්ධ සංස්කෘතියේ මූලස්ථානය වශයෙන් පවත්නා පන්සල් ගොඩනැගීම හා ඒවාට හැකි තරම් ආධාර දීම ජාතික ගුණ වගාව දියුණු කිරීමට ප්‍රධාන වශයෙන්ම හේතු වෙනවා. කොමියුනිස්ට් වාදය ආගම ධර්මයට විරුද්ධ වසක් විසක් වශයෙන් තමුන්නාන්සේලා කල්පනා කරනවා නම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කාරියවසම් මයා.]

තමුන්නාන්සේලාගේ ප්‍රධානම යුතුකම වන්නේ ආගම නඟාසිටුවීමයි. අද රටේ අස්සක් මුල්ලක් නැර නොයෙක් විධියේ අපරාධ හා දූෂණයන් පැතිරී තිබෙනවා. එන්න එන්නම ආගම ධර්මය පහළට වැටෙනවා. ජනගහනය වැඩි වන නිසා රටේ අපරාධ වැඩිවනවායයි සමහරුන් තර්ක කරතත් හොඳ මිනිසුන් කොපමණ වැඩි වුණත් අපරාධ වැඩි වන්නේ නැහැ. රටේ නරක මිනිසුන් වැඩි වන විට තමයි අපරාධ වැඩි වෙන්නෙ. රටේ හොඳ මිනිසුන් වැඩි කිරීමට කටයුතු යෙදීම අපේ යුතුකමයි. එම නිසා ආගමික අංශයට රජයෙන් වැඩි සැලකිල්ලක් ලැබිය යුතු බව මා ප්‍රකාශ කරනවා.

දහම් පාසැල්වල ගුරුවරුන් ගැනත් වචනයක් කිවයුතුව තිබෙනවා. අද දහම් පාසැල්වලට ගුරුවරුන් සොයා ගැනීම බොහොම අමාරුයි. පාඨශාලා ගුරුවරුන් දහම් පාසැල්වලත් සේවය කළ කාලයක් තිබුණා. එමගින් ගමේ දරුවන් තුළ හොඳ ගුණ වගාවක් ඇති කිරීමේ වැඩ පිළිවෙළක් තිබුණා. නමුත් අද ඒ තත්ත්වය සම්පූර්ණයෙන්ම වෙනස් වී තිබෙනවා. දහම් පාසැල්වලට ගුරුවරුන් සොයා ගැනීමත් අද අමාරු වී තිබෙනවා. මේ තත්ත්වය සම්බන්ධයෙන් යම් පියවරක් ගත යුතුව තිබෙනවා. දහම් පාසැල්වල උගන්වන ගුරුවරුන් ගැන සොයා බලා ඔවුන් ගැන විශේෂ සැලකිල්ලක් දක්වා ක්‍රියා කළොත් මේ තත්ත්වය නරමක් දුරටවත් සතුටුදායක කරගත හැකි බව මා විශේෂයෙන්ම සංස්කෘතික දෙපාර්තමේන්තුවේ වගකිව යුත්තන්ට පෙන්වා දෙන්නට සතුටුයි.

අ. භා. 9.42

ලීලාරත්න විජේසිංහ මයා.
(திரு. லீலாரத்ன விஜேசிங்க)
(Mr. Leelaratne Wijesinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ දෙපාර්තමේන්තුව මගින් කරන සංස්කෘතික සහ ආගමික කටයුතු අප අනුමත කරන අතරම බෞද්ධ හෝ වේවා වෙනත් ආගමික හෝ වේවා අපේ මුතුන් මිත්තන් විසින් ඉදි කරන ලද යම් පූජ්‍යස්ථාන තිබෙනවා නම් ඒවා ආරක්ෂා කර ගැනීමත් අපේ යුතුකමක් බව මා කියන්නට සතුටුයි. අපේ පෞරාණික පුරා වස්තූන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් අද ඉතාම අසතුටුදායක තත්ත්වයක් තිබෙනවා. සීගිරි බිතු සිතුවම් විනාශ කිරීමෙන්ම ඒ බව හොඳහැටි පෙනෙනවා.

කලා අංශයෙන් බැලුවත් ආගමික අංශයෙන් බැලුවත් පොලොන්නරුවේ ගල් විහාරයට විශේෂ තැනක් තිබෙන බව ඕනෑම කෙනෙකු පිළිගන්නවා. ඇත්ත වශයෙන්ම පොලොන්නරුව ලෝකයේම තිබෙන එවැනි කෘතීන් අතරින් ප්‍රමුඛස්ථානයක් ගන්නවා. ගල් විහාරයේ බිත්තියක මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ දිඹුලාගල දී කළ ධර්ම කතිකාවේ සටහන් තිබෙනවා. නමුත් මේ තරම් වැදගත් ගල් විහාරය ආරක්ෂා කිරීමට අද දක්වා කිසිම පියවරක් ගෙන නැහැ. එහි සැතපෙන බුදු පිළිමයක් තිබෙනවා. හිපි පිළිමයක් තිබෙනවා. රනින් කළ පිළිමයක් තිබෙනවා. හිපි පිළිමයත් සැතපෙන පිළිමයත් අවිවට වේළෙනවා. වැස්සට තෙමෙනවා. ධාරානිපාත වර්ෂාවට නොසෑහෙන අන්දමින් තෙමෙනවා වාගේම කවිට අවිවට රත් වෙමින් වේළෙනවා. එම නිසා දැන් ඒ වායේ පතුරු ගැලවී ගොස් තිබෙනවා. අද වනතෙක් ඒ වාට කිසිම ආවරණයක් සවි කර නැහැ. ආලේපයක්වත් කර නැහැ. කිසිම විධියකින්වත් ආරක්ෂාවක් නැහැ.

1948 දී තමුන්නාන්සේලා සමසමාජගින්නෙන් බුද්ධ ශාසනය ආරක්ෂා කරන්නය කියමින් බිත්තිවලත් තාප්පවලත් වැසිකිළිවලත් පෝස්ටර් ඇලවූ කාලය මට මතකයි. ඒ ආකාරයට බුද්ධාගම ආරක්ෂා කරන බවට ප්‍රතිඥා දුන් තමුන්නාන්සේලා අපේ පෞරාණික බෞද්ධ සිද්ධස්ථාන ආරක්ෂා කරන්නට කුමන පියවරක් ගෙන තිබෙන්නද කියා මා ප්‍රශ්න කරනවා. තමුන්නාන්සේලා දැන් නවීන පැරකුම්බා යුගයක් උදා කරවීම ගැන කථා කරනවා. අපේ මුතුන් මිත්තන්ගේ ඇට කටුවත් අද සොයා ගන්නට බැරි වුණත් නවීන යන්ත්‍රෝපකරණ තිබිව ඒ අයගේ අතේ මහන්සියෙන් කළ ඒ ස්ථාන ආරක්ෂා කර ගැනීම පරම යුතුකමක්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒවාගේම පරාක්‍රම බාහු ප්‍රතිමාව හැටියට පිළිගන්නා පොලොන්නරුවේ පොත්ගුල් විහාරය ඉදිරිපිට තිබෙන ගලේ තෙළෑ ප්‍රතිමාවේත් ශිෂ්‍රීය දෙදරාගොස් තිබෙනවා. එතැන දැන් සිමෙන්ති වගයක් ගා තිබෙනවා. ඒක හැරියට වෙළුම් පටියක් දමා තිබෙනවා වගෙයි. නමුත් හරියාකාරව පිළියෙළ කළ මිශ්‍රණයකින් මේක හරිගස්සන්නට පුළුවන්කම තිබෙනවා. අද තිබෙන හැටියට ඒක හරියට තුවාලයකට දැමූ වෙළුම් පටියක් වගෙයි. ඒ ප්‍රතිමාව සම්පූර්ණයෙන්ම අවලක්ෂණ කර තිබෙනවා. මෙම කටයුතු අයිති සංස්කෘතික අංශයටයි.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
පුරාවිද්‍යා අංශයට.

ලීලාරත්න විජේසිංහ මයා.
(திரு. லீலாரத்ன விஜேசிங்ஹ)
(Mr. Leelaratne Wijesinghe)
මේවා සංස්කෘතික අංශයට අයිති නැද්ද? ගරු රාජ්‍ය ඇමතිතුමාවත් මේවාට පිළිතුරු දෙනවාද?

ගරු ජේ. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
දැන් පරාක්‍රමබාහු රජතුමා ගැන කථා කරන්නට පුළුවනි. පුරා විද්‍යාව ගැන කතා කරන්න බැහැ.

ලීලාරත්න විජේසිංහ මයා.
(திரு. லீலாரத்ன விஜேசிங்ஹ)
(Mr. Leelaratne Wijesinghe)
මේවා අපේ සංස්කෘතියට අයිති කලා කෘතීන් නොවෙයිද?

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)
මුළු මනුෂ්‍ය සංහතියම යම්කිසි සංස්කෘතියක් උඩයි සිටින්නේ. ඒ අනුව නම් කෘෂිකර්මය ගැනත් කර්මාන්ත ගැනත්, කන බොන දෑ ගැනත්, නිදන අන්දම ගැනත් කතා කරන්නට පුළුවනි.

ලීලාරත්න විජේසිංහ මයා.
(திரு. லீலாரத்ன விஜேசிங்ஹ)
(Mr. Leelaratne Wijesinghe)
අපේ ගල් කැටයම් සංස්කෘතික අංශයට අයිති නැද්ද? තමුන්නාන්සේලාට මේවා ගැන කථා කරන්නට බැරිනම් නිකන් ඉන්න. මාක්ස්වාදී ගින්නෙන් එහෙම බුද්ධාගම ආරක්ෂා කරන්නට තමුන්නාන්සේලා දිවුරා පොරොන්දු වී සිටිනවා. ඒ අනුව තමුන්නාන්සේලා අපේ පෞරාණික වස්තූන් ආරක්ෂා කරන්නට ඕනෑ.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.
விடை விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)
Is there any objection to taking up items 21, 22 and 23 together?

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
No, Sir. But before I raise any questions I want to register my strong protest—

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
ගරු සභාපතිතුමනි, 21, 22, සහ 23 වන ඒවායින් බලාපොරොත්තු වන්නේ පාරවල් යනාදිය සඳහා වැඩිපුර මුදල් ලබා ගැනීමටයි. 24 වැන්නෙන් තැපැල් කාර්යාල සඳහා වැඩිපුර මුදල් ඉල්ලනවා.

පරිපූරක මුදල: රජයේ වැඩ දෙපාර්තමේන්තුව – ගොඩනැගිලි වැඩි දියුණු කිරීම

குறைநிரப்புத் தொகை: அரசாங்கக் கட்டடவேலைத் திணைக்களம்: கட்டடத் திருத்தம்

SUPPLEMENTARY SUPPLY: PUBLIC WORKS DEPARTMENT—IMPROVEMENTS TO BUILDINGS

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
මෙම යෝජනාව මා ඉදිරිපත් කරනවා.:

1968 ඔක්තෝබර් 1 වැනිදායින් ආරම්භව 1969 සැප්තැම්බර් 30 වන දායින් අවසන් වන මුදල්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

[ගරු ජේ. ආර්. ජයවර්ධන]

වර්ෂය තුල සේවය සඳහා ලංකාවේ ඒකාබද්ධ අර මුදලෙන් හෝ ලංකාණ්ඩුවේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල් වලින් හෝ ලංකාණ්ඩුවට සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ලංකාණ්ඩුව විසින් ණයට ලබා ගන්නා මුදලකින් හෝ රුපියල් එක් කෝටි පණස් ලක්ෂයකට (රු. 1,50,00,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත පෙනෙන උප ලේඛනයේ නියමිත පරිදි වැය කළ යුතුය:—

උපලේඛනය

ශීර්ෂය: 164—රජයේ වැඩ දෙපාර්තමේන්තුව.
සම්මතයේ අංකය: 3—පාලන ගෙස්තු—

		රු.
මූලධන වියදම	...	50,00,000
සම්මතයේ අංකය: 5—දෙපාර්තමේන්තුව විසින් සැපයෙන සේවා—		
මූලධන වියදම ...	...	1,00,00,000
එකතුව	...	1,50,00,000

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි.

විෂය එදිත්තියම්පප්පෙට්ටුව.

Question proposed.

අ. භා. 9.50

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

අප මෙතරම් රෑ බෝවීගෙනත් මෙම විවාදවලට සහභාගි වන්නේ නිකම් කාලය මරන්නට නොවෙයි. යම් යම් ප්‍රශ්න ඉදිරිපත්කොට නිරාකරණය කර ගන්නටයි. මෙම අවස්ථාවෙහිදී ඉදිරිපත් කරන්නට තිබෙන ප්‍රශ්න නිරාකරණය කර ගැනීම සඳහා වුවමනා කරන ඇමතිතුමා දැන් මෙතන නැහැ.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

මම නිරාකරණය කර දෙන්නම්.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

තමුන්නාන්සේට සර්වඥතාඥානයක් නැහැනෙ.

පරිපූරක මුදල්

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

මේක සුළු වැඩක්නෙ.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr Leslie Goonewardene)

තමුන්නාන්සේට උසස් දැනුමක් තිබෙන බව ඇත්ත. එහෙත් තමුන්නාන්සේට සර්වඥතාඥානයක් නැහැ.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

සර්වඥතාඥානයක් වුවමනා වන්නේ නිවන් දකින්නටයි. මෙවැනි දේකට වුවමනා නැහැ.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

අප අසන සේරම ප්‍රශ්නවලට උත්තර දෙන්නට ඥානයක් තමුන්නාන්සේට නැති බවයි මා කියන්නේ. වඟ කිව යුතු ඇමතිතුමා මෙතන නැතිවීම ගැන මා විරෝධය ප්‍රකාශ කරනවා.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

එතුමා ඊයෙ සිටියා. අද වැලිගම වුවමනා වකට යාමට තිබුණා. අද හදිසියෙ සභාව කැදෙව්වා.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

අපි ඒකට පළි නැහැ.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

තමුන්නාන්සේලා තමයි පළි. ඊයේ රෑ නිස්සේම නැවති සිටින්නට එතුමා සූදානම් සිටියා. තමුන්නාන්සේලා කිව්වා, අද රැස් වන්නට වුවමනා බව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
මා සූදානමින් සිටියා.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
අනික් අය සූදානම්ව සිටියේ නැහැ.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Gunawardene)
තමුන්නාන්සේලා යම්කිසි එකඟවීමක් කඩා දමා තිබෙනවා. තමුන්නාන්සේලා අපගේ මතයට විරුද්ධ වෙමින් කටයුතු කර තිබෙනවා.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
ප්‍රශ්නය මොකක්ද?

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Gunawardene)
ප්‍රශ්නය ඉදිරිපත් කරන්නට පෙර මා නැවත වරක් විරෝධය ප්‍රකාශ කරනව, ගරු ඇමතිතුමා මෙතන නොසිටීම ගැන. එතුමාට ඉන්නට බැරි නම් එතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමාවත් සිටින්නට තිබුණා. එතුමා හෝ සිටියා නම් තරමක් දුරටවත් පිළිතුරු දෙන්නට තිබුණා.

රජයේ වැඩ දෙපාර්තමේන්තුව සඳහා රුපියල් ලක්ෂ 10 ක් ඉල්ලා ඉදිරිපත් කර ඇති අංක 37 දරණ පරිපූරක ඇස්තමේන්තුවට හේතු වශයෙන් යම්කිසි ප්‍රකාශයකට අත් සන් කර තිබෙනවා. එහි සඳහන් වෙනවා මෙම මුදල් වර්ෂය සඳහා අයවැය ලේඛන යෙන් වෙන් කර තිබෙන මුදල් එම වැඩ වලට කිසිසේත් ප්‍රමාණවත් නොවන බව, නමුත් කිසිසේත් ප්‍රමාණවත් නොවූයේ කුමක් නිසාද කියා අපට විස්තර කර නැහැ. මේ වැය ශීර්ෂය විස්තර කර තිබෙන ලේඛන කියවාගෙන යන විට මට එක හේතුවක් පැහැදිලි වෙනවා. පැහැදිලි වී තිබෙන්නේ විවිධිස ක්‍රමය ඇතිකිරීම හේතුකොටගෙන වියදම් වැඩි වී තිබෙන බවයි. සෞඛ්‍ය

පරිපූරක මුදල්

දෙපාර්තමේන්තුව සඳහා සාදන ගොඩ නැගිලි පිළිබඳවයි, මෙහි සඳහන් වී තිබෙන්නෙ. ඒ හැම ගොඩනැගිල්ලකම වියදම වැඩි වී තිබෙනවා. බොහොමයකම එසේ වැඩි වීමට හේතු වී තිබෙන්නේ මුලින් සකස් කරන ලද ඇස්තමේන්තු, විවිධිස ක්‍රමය හේතුකොටගෙන නැවත සංශෝධනය කිරීමට සිදු වීමයි. එය එසේ වුණත් සමහර තැන්වල ඇස්තමේන්තුව හත් අට ගුණයකින්, දහ ගුණයකින් වැඩි වෙලා තියෙනවා. එසේ වුණේ කොහොමද කියා මා දැනගන්නට සතුටුයි.

කළුතර අළුත් තැපැල් කාර්යාලයක් තැනීම සඳහා මුලින් ඇති කළ ඇස්තමේන්තුව රුපියල් 3,000 යි. නමුත් සංශෝධනය කරන ලද ඇස්තමේන්තුව රුපියල් 3,50,000 යි. මේ තරම් ලොකු වෙනසක් සිදු වුණේ කොහොමද කියා මා ඇමතිතුමාගෙන් අහනන්ටයි, සිටියේ.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
මේක මුද්‍රණ දෝෂයක්.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
එහෙම නම් මේ ඔක්කොම වැරදියි.

"Original estimate Rs. 3,000. Revised estimate 350,000. Sub-head 161—Temporary Hall for Sorting Mail, McCallum Road, Colombo: Original Estimate Rs. 2,000; Revised estimate Rs. 365,000."

මේක තමයි මට තේරුම් ගන්න බැරි. කෑමට යන්නෙත් නැතිව බඩගින්නෙ හිටියේ ඇමතිතුමාගෙන් මේ කාරණය නිරාකරණය කර ගන්නයි. රාජ්‍ය ඇමතිතුමාට සර්වඥතාඥානයක් නොතිබුනත් එතුමා හැම කාරණයක් ගැනම දන්න නිසා එතුමාට පිළිතුරක් දෙන්න පුළුවන්.

"Sub-head 69—Construction of a kitchen, Panadura Hospital; Original estimate Rs. 5,000; revised estimate Rs. 40,000."

මුලින් රු. 5,000 කට ඇස්තමේන්තුවක් සකස් කළේ කොහොමද කියා මට තේරෙන්නෙ නැහැ. කුස්සිය කඩා අලුතු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

වෙන් එකක් හදන්නට තියෙනවා. රු. 5,000 ක් එක කාමරයක්වත් හදන්න බැහැ. රජයේ වැඩ දෙපාර්තමේන්තුව මේ විධියේ වැරදි ඇස්තමේන්තු සකස් කරන්නේ කොහොමද කියා මා රාජ්‍ය ඇමතිතුමාගෙන් අහන්නට කැමතියි. ඒ ප්‍රශ්නයට නිවැරදි පිළිතුරක් දෙන ලෙස මා එතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඊට වඩා ප්‍රශ්න අසා ඇති වැඩක් නැහැ.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

සර්වඥතාඥානයක් තිබුනත් කාටවත් මේවට උත්තර දෙන්න බැහැ. නාවල පිටියේ ප්‍රථම ඇස්තමේන්තුව රු. 1,000 යි; අළුත් ඇස්තමේන්තුව ලක්ෂයයි. කිසි කෙනකුට මේක විස්තර කරන්න බැහැ.

කාරියවසම් මයා.
(திரு. காரியவசம்)
(Mr. Kariyawasam)

මේක පසුවට සාකච්ඡා කරන්න තබා ඉල්ලා අස් කරගන්න.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

ඉල්ලා අස් කරගන්න බැහැ.

අ. භා. 9.56

කාරියවසම් මයා.
(திரு. காரியவசம்)
(Mr. Kariyawasam)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රසිද්ධ වැඩ ඇමතිතුමාගේ අප්‍රසිද්ධ වැඩක් වශයෙනුයි මේක පෙනෙන්නේ. මිහින්තලේ ගරු මන්ත්‍රීතුමා (පී. එම්. කේ. තෙන්නකෝන් මයා.) කියනවා, මුළු කැබිනට් මණ්ඩලයේම මොළය තිබෙන ඇමතිවරයා රාජ්‍ය ඇමතිවරයාය කියා. ඉතින් ඒ ඇමතිතුමාටත් තේරුම් ගන්නට බැරි අන්දමින් ඇස්තමේන්තුවක් පිළියෙළ කර ප්‍රසිද්ධ වැඩ ඇමතිතුමා කර තිබෙන වැඩේ ඒ තරම් ප්‍රසිද්ධ වීම හොඳ නැහැ කියායි මා කල්පනා කරන්නේ.

මේ ඇස්තමේන්තුව ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේදී නැවත වරක් මා මේ සභා ගර්භයේ මතක් කරන්නට ඕනෑ, ගාලු දිස්ත්‍රික්කයේ මංමාවත් හෙවත් පාරවල් කොහෙත ම වාහනයක් යාමට සුදුසු තත්ත්වයක නැහැ කියා. කොළඹ-ගාල්ල පාර පමණක් විශාල වියදමක් දරාගෙන තනාගෙන යනවා. එහෙත් අනික් හැම පාරකම වගේ වැඩ පැහැර හැර තිබෙනවා. මේ වගේ ඇස්තමේන්තු සකස් කරන නිසාදැයි මා දන්නෙ නැහැ. දැන් අවුරුදු හත-අටකට පෙර ගම්කාර්ය සභාවලින් දෙපාර්තමේන්තුවට පවරා ගත් පාරවල විශාල වෙනසක් අද ඇති වී තිබෙනවා. එදා ගම්කායී සභාවලට අයිතිව තිබෙද්දී ඒ වායේ වාහනයක් යන්නට පුළුවන්කම තිබුණ. අද වාහනයක තබා පයින්වත් යන්නට බැරි අන්දමට ඒවා මඩගොහොරු බවට පත් වී තිබෙනවා. මුල සිටම දෙපාර්තමේන්තුවට අයිතිව තිබුණු මාර්ග සම්බන්ධයෙනුත් කියන්නට තිබෙන්නේ ඒ එකම මාගීයකවත් දියුණුවක් ඇති වී නැති බවයි. මගේ කොට්ඨාශයේ පාරවල් තවමත් වන්නි හත්පත්තුවේ, නැත්නම් ඇත පිටිසර කැලෑබද කොට්ඨාශයක තිබෙන පාරවල් වගෙයි. සමහර ප්‍රදේශවලට ජීප් රථය කින්වත් යන්නට බැරි තත්ත්වයක් තිබෙනවා. මගේ කොට්ඨාශයේ උඟරගහ ප්‍රදේශයට ජීප් රථයකින්වත් යන්නට බැහැ. මේ කරුණු මේ ගරු සභාවේ හැමදාම සඳහන් කළත් ගරු ඇමතිතුමා නොවෙයි ඒවා ගැන සලකා බලන්නේ.

අවුරුදු තිහ-හතලිහක් පැරණි ලී පාලම් තිබෙන කොට්ඨාශයක් ගාලු දිස්ත්‍රික්කයේ තිබෙනවා නම්, ඒ බෙන්තර-ඇල්පිටිය කොට්ඨාශය බව කියන්නට ඕනෑ. මේ ප්‍රදේශයේ මාර්ග ඒ තරම්ම නොසලකා හැර තිබෙනවා. තවමත් ඒ ලී පාලම් උඩින් බස් රථ ගමන් කරන විට ඒ හරහා දමා තිබෙන ලී කැඩෙන අවස්ථා තිබෙනවා. වැවිලිකරුවන් විශාල සංඛ්‍යාවක් සිටින මේ ප්‍රදේශයේ, ගොවීන් විශාල සංඛ්‍යාවක් සිටින මේ ප්‍රදේශයේ, කම්කරුවන් විශාල සංඛ්‍යාවක් සිටින මේ ප්‍රදේශයේ, පාරවල දුර්වල තත්ත්වය නිසාම, 1959 දී පමණ ඇල්පිටියේ විධායක ඉන්ජිනේරු කායර්ාලයක් විවෘත කළා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ කායර්ාලය ඇති කළා කියා අමුතු දියුණුවක් සිදු වුණේ නැහැ. මේ ප්‍රදේශය දියුණු කිරීමට එහි යන නිලධාරී මහත්වරුන් එතරම් උනන්දු වෙන්නේ නැහැ. මේ ප්‍රදේශයේ මාර්ගවලට දෙවෙනි වතාවට දමන තාර—Second coat—කවදාවත් දමන්නෙ නැහැ. මේ විධියේ වංචනික ක්‍රියා නිසා සමහර විට ඒ නිලධාරීන් පොහොසතුන් බවට පත් වෙනවා ඇති. එහෙත් මේ මංමාවත් මිනිසුන්ට යන්නට පුළුවන් තත්ත්වයක නොවෙයි තිබෙන්නේ. ඇමතිතුමා මේ ස්ථානයේ නැති නිසා මා ඒ ගැන මීට වඩා යමක් කියන්නට යන්නේ නැහැ.

තැපැල් දෙපාර්තමේන්තුව ගැනත් මේ අවස්ථාවේ වචනයක් කිය යුතුව තිබෙනවා. තැපැල් අපහසුකම් ගැන, උදාහරණයක් වශයෙන් මා මෙන්න මේ කාරණය තමුන්නාන්සේට ඉදිරිපත් කරන්නට කැමතියි. මගේ කොට්ඨාශයේ මගේ ගමට අල්ලපු ගමේ, හොරන්ගල්ල කියන ගමේ දරුවකු අසනීප වී ගාල්ලේ මහා රෝහලට ඇතුළත් කළා. මේ දරුවගෙ අසනීපය තදබල වෙලා, හුහක් අමාරු වෙලා, ලේ දෙන්නට වුවමනා කළා. ගාල්ලේ ලේ බැංකුවේ ලේ තිබුණේ නැහැ. ඒ නිසා දරුවගෙ දීමව්පියන්ට විදුලි පණිවුඩයක් යැව්වා, වහාම ලේ දෙන්ට එන්න කියලා. මේක නම් කියන්නත් කනගාටුයි. විදුලි පණිවුඩ සේවය කොයි තරම් දුර්වලද, කොයි තරම් නකරද කිව්වොත් ඇත්ත වශයෙන් මේ විදුලිය පණිවුඩය අර දරුවාගේ ගෙදරට ලැබුණේ එය යැවූ වෙලාවේ සිට පැය 48 ක් හෙවත් දවස් දෙකක් ගත වුණාටත් පස්සේයි. ඒ වෙලාව වන විට අර අසරණ ළමයා මැරිලා. ළමයා මළාටත් පස්සේ තමයි, ඊට දවස් දෙකකට කලින් ගාල්ලෙන් යවන ලද විදුලි පණිවුඩය ළමයගෙ මව්පියන් වෙත භාර දී තිබෙන්නේ. ගාල්ලේ ආරෝග්‍යශාලාවෙන් එවන ලද විදුලි පණිවුඩය, වැඩි දුරක් නොවෙයි හැතැප්ම 24 ක දුරක් යැවීමට දෙදවසක් ගත වුණා. තැපැල් සේවයේ දුර්වලකම එයින් පෙනී යනවා. තැපැල් සේවයේ—විදුලි පණිවුඩ සේවයේ—වරද නිසා තමයි මේ ළමයා මේ තරම් දරුණු වූ මරණයකට ගොදුරු වන්නට සිදු වුණේ. ගරු තැපැල් ඇමතිතුමා ඉදිරියේ මේ පුවත කියන්නට මම කැමතියි.

ලැබුණා නම් ඇත්තෙන්ම එතුමාගේ හැඩි දැඩි හදවත වුවත්, හිත වුවත්, අනුකම්පා සහගත තත්ත්වයකට පත් වෙනවා ඇතැයි මා කල්පනා කරනවා.

දුරකථන සේවය ගැනත් කල්පනා කර බලන්න. මොන තත්ත්වයකද එය පවතින්නේ? හදට යන මෙවැනි කාලයක අපේ විදුලි පණිවුඩ සේවය, දුරකථන සේවය, මෙවැනි තත්ත්වයක පවතින්නවාය කියන්නට සිදු වීම ඇත්තෙන්ම ලැජ්ජාසහගතයි. හැතැප්ම හතේ අවේ දුර තැපැල්කාරයාට ලියුම් බෙදන්නට සිදු වෙලා තිබෙනවා. ඒ මන්ද? නියම ප්‍රමාණයට තැපැල් කාර්යාල පිහිටුවා නැහැ. සමහර තැන්වල තැපැල් කාර්යාල පිහිටුවන්නට ඕනෑ බව දෙපාර්තමේන්තුව පිළිගෙන අවසානයි. ඒ සඳහා නිලධාරීන් තෝරා ගැනීමට ඉල්ලුම්පත්‍ර කැඳවා මූලික පරීක්ෂණයත් පවත්වා හමාරයි. එක් කෙනෙකුට දුන්නොත් හුඟ දෙනෙක් තරහවනු ඇතැයි බියෙන්, පත් නොකර ඉන්නවා. මේ ඡන්දය පහු වුණාට පස්සේ ආණ්ඩුවට වැඩ කළ කෙනෙකු බලා පත් කරන්නට ඉඩ තිබෙනවායයි හැඟීමක් ප්‍රදේශයේ ජනතාව දැනටමත් ඇති කරගෙන සිටිනවා. මෙයින් සිදු වන්නේ කුමක්ද? රටේ ජනතාවට ලැබෙන්නට තිබෙන, රජයෙන් පොදු ජනතාවගේ යහපත සඳහා සැලැස්සිය යුතු, පහසුකම් පවා කලට වේලාවට නොලැබී යාමයි, මෙයින් සිදු වන්නේ. ඒ නිසා මේ කාරණය මතක් කරන්නට කැමතියි.

ගරු රාජ්‍ය ඇමතිතුමා දන්නවා මස්සින්න ප්‍රදේශය. එතුමාත් එහාට ගිහින් තිබෙනවා. එහි පාරවල් සතුටුදායක නැහැ. ඒ වගේම තැපැල් සේවයත් බොහොම කනගාටුදායක තත්ත්වයකයි තිබෙන්නේ. ඒ නිසා අනෙක් ප්‍රදේශවලට වඩා ඒ ප්‍රදේශයට තැපැල් සේවයක් අවශ්‍යයි. ඒ බව ගරු රාජ්‍ය ඇමතිතුමා හොඳාකාර දන්නා නිසා එතුමා මේ පිළිබඳව කටයුතු කරනු ඇතැයි මා විශ්වාස කරනවා. ළඟදී මැතිවරණයකුත් බලාපොරොත්තු වන නිසා ඒ ප්‍රදේශය දියුණු කරන්නට ගරු තැපැල් ඇමතිතුමාට මතක් කරන මෙන් ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. ඉක්මනින්

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[කාරියවසම් මයා.]

මේ ප්‍රදේශය දියුණු නොකළොත් ළඟදී එන මැතිවරණයේදී තමුන්නාන්සේලාට එහාට ගිහිල්ලා කියන්නටවත් දෙයක් නැති වෙයි. රජයේ වැඩ ඇමතිතුමාට පසුගිය අතුරු මැතිවරණ කාලයේදී හොඳ අත්දැකීමක් ලැබුණා. උඟරගහ පාර දිගේ යන විට එතුමාගේ කාර් රථය එරුණා. එය තල්ලු කරන්නට පුංචි ළමයෙක්වත් ඉදිරිපත් වුණේ නැහැ. එතුමාට මේ පාරේ ඇති වටිනාකම පෙන්වා දෙන්නට හිතා ගෙන ඒ උදවිය නිකම් බලගෙන සිටියා. අන්තිමේදී අලුත්ගමින් ජීප් රථයක් එවන්නට සිදු වුණා. ගරු ඇමතිතුමා මෙය සියැසින් දුටු පාරක් නිසා විශේෂ උනන්දුවක් දක්වා ක්‍රියාකරනු ඇතැයි අපි විශ්වාස කරනවා.

ගරු රාජ්‍ය ඇමතිතුමා සිටින නිසා විශේෂයෙන් කියන්නට දෙයක් මට තිබෙනවා. බෙන්තර හෝටල් සංස්ථාවෙන් තනා විවෘත කරන විට එහි හදන්නට යන තැපැල් කාර්යාලය මහජනයාටත් ප්‍රයෝජන ගන්නට පුළුවන් විධියට, මහජනයාටත් පරිහරණය කරන්නට පුළුවන් විධියට හරිගස්සනවා නම් සුදුසුයි.

අ. භා. 10.06

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයේ වැඩ දෙපාර්තමේන්තුව ගැන කතා කරන විට පාරවල් ගැන කථා කරන්නට ගියොත් හුඟ වේලාවක් යනවා. මේ රටේ මනුෂ්‍ය ශිෂ්ටාචාරයට බලපෑ දෙයක් තමයි මහා මාර්ග. මහා මාර්ග ගැන සඳහන් කරන විට මනුෂ්‍ය ඉතිහාසයත් සම්පූර්ණයෙන්ම අළලා කථා කරන්නට සිදු වෙනවා. එසේ කථා කරන්නට ගියොත් එළිවන තුරුත් කථා කරන්නට සිදු වන නිසා මං ඒ ගැන කථා කරන්නට බලා පොරොත්තු වන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඇමතිතුමාගේ වාර්තාවේ සඳහන් වෙනවා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වැදගත් ඉල්ලීම් රාශියක් තිබෙනවාය කියා. එවා ක්‍රියාත්මක කිරීමට මේ මුදල් අවශ්‍ය වී තිබෙනවාය කියා. ඒ මුදල දීම ගැන අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. එහෙත් ඇල්ල-වැල්ලවාය පාර වැනි පාරවලට දුන් මුදල දෙතුන් ගුණයකින් වැඩි වී තිබෙනවා. ඒ පාර පටන්ගත්තේ ලක්ෂ 30 න්. එහෙත් දැන් ලක්ෂ 96 ක් වී තිබෙනවා. වැලිගම අතුරු පාරත් පටන් ගත්තේ ලක්ෂ 30 කින් කරන්නයි. එයටත් දැන් ලක්ෂ 55 ක් ඕනෑවලු. කොපමණ විශාල ධනස්කන්ධයක් වියදම් කරන්න යනවාද කියා මා දන්නේ නැහැ. ඒ වියදම් ටිකත් අඩු කර ආණ්ඩු පක්ෂයේත් විරුද්ධ පාර්ශ්වයේත් මන්ත්‍රීවරුන්ගේ පාර්ලිමේන්තු කොට්ඨාශ වෙනුවෙන් කරන ඉල්ලීම් ඉක්මණින් සපුරා ලීමට කටයුතු කරනවා නම් වඩා සුදුසුයි කියා මා හිතනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා විශේෂ කරුණක් සඳහන් කරන්නට ඕනෑ. ඒ විදුලි පණිවුඩ දෙපාර්තමේන්තුව ගැනයි. විදුලි පණිවුඩ දෙපාර්තමේන්තුව අද තිබෙන තත්ත්වය නිසා විදුලි පණිවුඩ රාශියක් නොයෙකුත් පළාත්වලට යන්නේ තැපෑලෙන්. පසුගිය සතියේ මට විදුලි පණිවුඩයක් තැපෑලෙන් ලැබුණා. තැපෑලෙන් යැවිනි කියා සිල් එකකුත් ගසා ලියුමක් වගේ තැපෑලෙන් ඒනවා. යමෙක් විදුලි පණිවුඩයක් යවන්නේ හදිසි වුවමනාවකටයි. එවැන්නක් එය ලැබිය යුත්තාට යන්නේ පසුවදා තැපෑලෙන් නම් විදුලි පණිවුඩ දෙපාර්තමේන්තුවක් මොකටද? රුපියලක් හෝ 1.50ක් ගෙවා විදුලි පණිවුඩයක් යැව්වාම එය ලැබිය යුත්තාට ලැබෙන්නේ තැපෑලෙන් නම් ඒ විදුලි පණිවුඩය සඳහා ගෙවූ මුදල ආපසු දෙන්නට ඕනෑ. එය ආණ්ඩුවේ යුතුකමක්. 1.50 ක් ගෙවා විදුලි පණිවුඩයක් ගැසුවාම එය යන්නේ තැපෑලෙන් නම්, එය තැපෑලෙන් යවන්නට යන්නේ සත 10 ක් පමණයි නිසා ඉතිරි මුදල ආපසු දෙන්නට ඕනෑ. සත 10 කින් කරන්නට පුළුවන් වැඩේට ආණ්ඩුව 1.50ක් ගන්නවා. නියම විධියට නම් 1.40 ක් ආපසු දෙන්න ඕනෑ නේද?

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
පරණ ආණ්ඩුවත් ගත්තා.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
කොයි ආණ්ඩුවකින් ගත්තත් වැඩේ වැරදියි. යම්කිසි විදුලි පණිවුඩයක් නැපැලෙන් යවනවා නම් ඒ සඳහා අය කළ මුදල ආපසු ගෙවන්නට ඕනෑ. ආණ්ඩුවේ දුර්වලකම නිසා, දෙපාර්තමේන්තුවේ දුර්වලකම නිසා—

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
නෑ, කම්බිවල දුර්වලකම නිසා.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
කොහොම හරි. විදුලි පණිවුඩ දෙපාර්තමේන්තුව විදුලි පණිවුඩ යැවීම භාර ගන්නවා. ඒ සඳහා වැඩිපුර මුදලක් අය කරනවා. වැඩිපුර මුදලක් අය කරන්නේ ඉක්මනින් පණිවුඩය දෙන නිසායි. ඉනින් ඉක්මනින් ඒ කටයුත්ත ඉෂ්ට කරන්නට බැරි නම් ඒ වැඩිපුර අය කරන මුදල් ආපසු දෙන්නට ඕනෑ. අවුරුදුපතා විදුලි පණිවුඩ දහස් ගණනක් නැපැලෙන් යනවා. පසුගිය මාස කීපය තුළ මාතර පමණක් විදුලි පණිවුඩ 450 ක් නැපැලෙන් යවා තිබෙනවා. මේ සම්බන්ධයෙන් සෑහෙන පියවරක් ගන්නේ නැත්නම් විදුලි පණිවුඩ දෙපාර්තමේන්තුවට වැය කරන මුදල් වලින් පලක් නෑ.

තවත් එකක් කියන්නට ඕනෑ. ජාතිවාදියකු වන්නම් මා කැමති නැහැ. කිසිම ජාතියකට අගෞරව කිරීමට හෝ ජාතිවාදය අවුස්සන්නට හෝ මා කැමති නැහැ. ඒ නිසාම යම් පුද්ගලයකුගේ වරදක් ගැන කියන්නට භය නැතිකමක් මට තිබෙනවා. අද විදුලි පණිවුඩ දෙපාර්තමේන්තුවේ සිංහල විරෝධී ව්‍යාපාරයක් තිබෙනවා. සිංහල විදුලි පණිවුඩ ඉක්මනින් යැවීමට ඒ දෙපාර්තමේන්තුවට කටයුතු කරන්නට

පරිපූරක මුදල්

බැරි වී තිබෙන්නේ ඒ දෙපාර්තමේන්තුවේ නායකත්වයේ සිංහල විරෝධීන් සිටින නිසයි. අවාසනාවකට මෙන් ද්‍රවිඩ ජාතිකයන් කීප දෙනකුගේ සම්බන්ධකම් තිබෙනවා. ඔවුන්ගේ ජාතිය ගැන කල්පනා කර නොවෙයි, මා මේ කරුණු ඉදිරිපත් කරන්නේ.

සිංහල ටෙලිප්‍රින්ටර්ස් නියම විධියට පාවිච්චි කරන්නට තවමත් කටයුතු සකස් කර නැහැ. ඒක අවශ්‍ය වැඩක් හැටියට විදුලි පණිවුඩ දෙපාර්තමේන්තුව සලකන්නේ නැහැ. ඒ අංශයෙන් අවශ්‍ය පුහුණුව ලබා දෙන්නට එසේ නැත්නම් සේවකයන් පුහුණු කිරීම පිණිස කටයුතු සංවිධානය කරන්නට මේ දෙපාර්තමේන්තුව ක්‍රියා කරන්නේ නැහැ. මේ තත්ත්වය ගැන අප ඉතාමත්ම කනගාටුයි. මේ රටේ රාජ්‍යභාෂාව සිංහලයි. සිංහලය රාජ්‍යභාෂාව වුණත් සිංහලෙන් යවන විදුලි පණිවුඩ ගැන ඒ දෙපාර්තමේන්තුව සැලකිල්ලක් දක්වන්නේ නැහැ. සිංහල විදුලි පණිවුඩ නියම විධියට ටෙලිප්‍රින්ටර්ස් මාර්ගයෙන් යැවීමට කටයුතු කරන්නේ නැත්නම් කොතරම් ජාතිවාදය ඇවිස්සුණත්, ජාතිවාදියා යනුවෙන් කොතරම් හංවඩු ගැසුණත්, ඒ උදාසීන නිලධාරීන්ට විරුද්ධව තදින් ක්‍රියා කිරීම ආණ්ඩුවේ පරම යුතුකම බව මතක් කරන්නට කැමතියි. සිංහලයන් හෝ වේවා, ද්‍රවිඩයන් හෝ වේවා, කවුරුන් හෝ වේවා රජය පිළිගත් ඒ භාෂා ප්‍රතිපත්තිය කඩාකප්පල් කරන්නට යනවා නම් ඒකට ඉඩ දීම ආණ්ඩුවට මදිකමක්. ඒ නිසා නැපැල් දෙපාර්තමේන්තුවේ තිබෙන සිංහල විරෝධී ව්‍යාපාරය මැඩ පැවැත්වීමට කටයුතු කරන ලෙස අදාල ඇමතිතුමාට කියන්නැයි මා ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තව එක කාරණයක් මතක් කරන්නට කැමතියි. මා කීප වරක්ම මේ ගැන මතක් කර තිබෙනවා. කොළඹින් බැහැර ප්‍රදේශවල විදුලි පණිවුඩ කටයුතු සංවර්ධනය කිරීම පිළිබඳව වුවමනා කරන උපකරණ ලබා ගැනීමට ටෙන්ඩර් කැඳවීමෙන් පසුව ඉදිරිපත් වුණු ටෙන්ඩර් පත්‍රයක් ගැන මා පසුගියදා ප්‍රශ්නයක් ඇසුවා. 1968 ඔක්තෝබර් මස 8 වැනිදා "සිලෝන් ඔබ්සර්වර්" පත්‍රයේ පිටපතක් මා ළඟ තිබෙනවා. මෙහි ලොකු රහසිගත පාඨයක් තිබෙනවා.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

"French bidders protest to Premier unfair—Concessions ignored. Give us a chance to prove claim"

මේ උපකරණ ප්‍රංශ සමාගමකින් ඉතා මත්ම අඩු මිලකට ලබා ගන්නට පුළුවන් කම තිබෙද්දී ජපන් සමාගමකින් ලබා ගන්නට යෑම පිළිබඳවයි, මා එදා ප්‍රශ්න කළේ. මේ ප්‍රශ්නය දෙවරක්ම මෙම ගරු සභාවේදී ඉදිරිපත් කළත් පිළිතුරක් ලැබුණේ නැහැ. කල් තැබීමේ යෝජනාවකදී පළමුවෙන්ම මේ ප්‍රශ්නය මා ඉදිරිපත් කළා. පසුව, මේ ගැන කිසිවක් කර නැතැයි දන්වමින් මට පණිවුඩයක් එවා තිබුණා. පසුගිය දවසක ජපන් සමාගමක් සමඟ කොන්ත්‍රාත්තුව අත්සන් කළායයි දැන ගන්නට ලැබී තිබෙනවා. එහෙත් ප්‍රංශ සමාගමේ ටෙන්ඩරය පිළිගත්තා නම්, විශේෂයෙන් ප්‍රංකුව අවප්‍රමාණය කර තිබෙන නිසා අපට ලොකු වාසියක් ලබා ගන්නට පුළුවන්කම තිබුණා. එවැනි තත්ත්වයක් තිබියදීත් ජපන් සමාගමේ ටෙන්ඩරය පිළිගත්තේ මොන හේතුවක් නිසාදැයි මා දන්නේ නැහැ. එහෙත් කීප දෙනෙකු එකතු වී ජපන් සමාගමේ ටෙන්ඩරය පිළිගන්නා ලෙස බල කර සිටි බවට නම් අපට ආරංචි ලැබී තිබෙනවා. එසේ ජපන් සමාගමට ඒ කොන්ත්‍රාත්තුව භාර දීමට කටයුතු යෙදීමෙන් අර පුද්ගලයන් විශාල කොමිස් මුදලක් ලබා ගත් බවත් ආරංචියි. ඒ කොමිස් මුදල් යන්නේ ස්විස් බැංකුවලටයි. "ලේක් හවුස්" ආයතනය කර ඇති දේවල් දිහා බලන විට නම් මෙය සුළු දෙයක් ලෙස පෙනෙන්නට බැරි නැහැ. එහෙත් ඇත්ත වශයෙන්ම මෙය සුළු දෙයක් නොවෙයි. මෙය රාජ්‍ය ඇමතිතුමාට භාර කටයුත්තක් නොවන නිසා මේ පිළිබඳව වගකිව යුතු ඇමතිතුමාගේ අවධානය මේ කාරණය කෙරෙහි යොමු කර වන මෙන් මා එතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ සම්බන්ධයෙන් දෙවරක්ම මා මතක් කර තිබෙනවා. එහෙත් එය ගණනකටවත් ගත්තේ නැහැ. එහෙත් තමුන්නාන්සේලාගේම පත්තරවල—"ලේක්හවුස්" පත්තරවල—පවා මේ ගැන ලොකු අකුරෙන් පළ කළ තිබුණා.

ලක්ෂ්මන් ද සිල්වා මයා. (බලපිටිය)
(திரு. லக்ஷ்மன் டி சில்வா—பலப்பிட்டிய)
(Mr. Lakshman de Silva—Balapitiya)

ඒවා යූ. එන්. පී. පත්තර නොවෙයි, බේරේගෙදර පත්තර.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

දැන්ද, ඒ පත්තර නරක් වුණේ? හොරකම් කර අහු වුණාට පස්සේ තේරී තිබෙන හැඩයි. හැබැයි, මෙතෙක් කල් "අපේ පත්තර" කියමින් බදාගෙන හිටියා.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

ජපන් සමාගමේ ටෙන්ඩරය භාර ගැනීමට කටයුතු සැලැස්වීමෙන් කොමිස් ලබා ගැනීමේ වැඩ පිළිවෙළක් තිබුණු බවට ආරංචි ලැබී තිබෙන නිසා, ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන ලෙස මා ඉල්ලා සිටිනවා. අඩු මුදලකින් කර ගත හැකි දේවල් සඳහා වැඩිපුර මුදල් ගෙවන්නට කටයුතු සලස්වා ඒ ඒ අය තමන්ගේ සාක්කුවලට කොමිස් මුදල් වැටෙන්නට කරුණු සලස්වා ගෙන තිබෙනවා. ඒවා මහජන මුදල්. එම නිසා ඒ මුදල් කොමිස් වශයෙන් යම් යම් පුද්ගලයන්ගේ සාක්කුවලට වැටෙන්නට ඉඩ නොතබා රජයට ලබා ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා. පිං පඩි වැඩි කරන්න කීවාම, නියං හා ගංවතුර සහනාධාර මුදල් වැඩි කරන්නට කීවාම රජය කියනවා, ඒ සඳහා මුදල් නැත කියා. එහෙත් රුපියල් ලක්ෂ ගණනින් යම් යම් පුද්ගලයන්ගේ සාක්කුවලට වැටෙන්නට ඉඩ හැර රජය නිකම් බලා ගෙන ඉන්නවා. එම නිසා එවැනි අක්‍රමිකතාවලට ඉඩ නොතබා, දුප්පත් මිනිසුන්ගේ සහනාධාර මුදල් වැඩි කිරීමට කටයුතු කරන්නට තම ශක්තිය යොදවන ලෙස සමාජ සේවා ඇමතිතුමාගෙන් මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

වෙනත් පාරවලට සම්බන්ධවීම සඳහා මාතර නිල්වලා ගඟ හරහා ඔරු පාරුවලින් යන්නට මගේ ඡන්දදායකයන්ට සිදු වී තිබෙනවා. මාතර නගරය අසල වෙහෙරගම්පිට

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

පාරත්, නාවිමන පාරත් සම්බන්ධ කරන්නේ පාරක් නොවෙයි. පාරුවක්. ඒ එක පාරකින් අනෙක් පාරට යා යුතුව තිබෙන්නේ පාරුවකිනුයි. මිනිසුන් හඳට යන යුගයේ, එක පාරකින් පාරකට යාම සඳහා පාරුවකින් ගමන් කරන්නට සිදු වීම කොයි තරම් ලජ්ජාවක්ද? ඒ පාරවල් දෙක සම්බන්ධ කිරීම සඳහා නිල්වලා ගඟ හරහා එතැන පාලමක් දමන්නැයි රජයේ වැඩ ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටි විට එතුමා කීවේ, විශාල වියදමක් දරන්නට සිදු වන නිසා එතැන පාලමක් දමන්නට බැරි බවයි. ඒ අවස්ථාවේදී මා කීවා, එහෙම නම් නිල්වලා ගඟ හරහා මාතර අළුතින් පාලමක් දමා තිබෙන නිසා තවම එතැන තිබෙන පරණ පාලම ගෙනැවිත් අතන සවි කරන්නය කියා.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
කොයි තරම් දුරද?

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
ගඟ දිගේ සැතැපුම් 1 1/2 කට වඩා නැහැ.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
නැගෙනහිර සිට බස්නාහිරට නේද, යන්නේ? ඒකයි, අමාරුව.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
අමාරුව එය නොවෙයි. මේ පාලම කිප දෙනෙකුටම දෙන බවට ගරු ඇමතිතුමා පොරොන්දු වී තිබෙනවා. දිවුලපිටියේ මන්ත්‍රීතුමාටත් දීමට පොරොන්දු වී තිබෙනවා. ඒ පොරොන්දු ඉෂ්ට කරන්නට ඇමතිතුමාට බැරි නිසා එතුමා පාලම කාට වත්ම නොදී එහිම තිබෙන්නට හරිනවා. වරක් මෙම පාලම උඩින් ගමන් කළ තරුණයෙක් එහි කොන්ක්‍රීට් ලැල්ලක් කඩාගෙන ගඟට වැටී මිය ගියා. ඒ විපත සිදු වුණේ මෙම පරණ පාලම ඉවත් නොකර තිබීම නිසයි. මේ පාලම නගරයේ අලංකාරයටත් බාධකයක්. එක්කෝ මෙය ගළවාගෙන ගොස් වෙනත් තැනක සවි කොට ප්‍රයෝජන ගන්නට ඕනෑ. එසේ නැත්නම්, වේරගම්පිට-නාවිමන තොටු පොළේ මෙය සවි කරන්නට ඕනෑ. මේ ඉල්ලීම් දෙකම ඉෂ්ට කරන්නට බැරිය කිව්වාට පසු, අලුත් පාලමක් මෙම තොටු පොළට යොදන ලෙස අප ඉල්ලා සිටියා. ඇමතිතුමා ඒ ඉල්ලීම ඉෂ්ට කිරීමට එකඟ වුණු නමුත් තවම නම් එය ඉටු වුණේ නැහැ. එතුමාගේ කාර්යාලයට ගොස් මේ ගැන මතක් කළා. මේ සම්බන්ධව වාතීා වක් ලබා ගැනීමට එතුමා ඒ අවස්ථාවේදී පොරොන්දු වුණා. මට ඉදිරිපත් කරන්නට තිබෙන ඉතාම වැදගත් ප්‍රශ්නය මෙයයි. වැඩ ඇමතිතුමාට දන්වා මෙම පාලම අපට ලබා දෙන ලෙස මා ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. දෙසැම්බර් මාසය අවසාන වන්නට පෙර මේ ඉල්ලීම ඉෂ්ට කරනවා ඇතැයි මා විශ්වාස කරනවා.

අ. භා. 10.22

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රම්සිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නොයෙක් කොට්ඨාශවල හදිසි කටයුතු සම්බන්ධව මන්ත්‍රීවරුන් කීපදෙනෙකුටම මතක් කළා. මගේ ආසනයේත් එවැනි කටයුතු සඳහා එක් ලක්ෂ පනස් දාහක් පමණ අවශ්‍යව තිබුණු නමුත් එයින් තුනෙන් එකකට වඩා අනුමත කර නැ. ඉතාමත් අවශ්‍ය හදිසි වැඩ වශයෙන් ඇමතිතුමා පවා පිළිගත් කටයුතු සඳහායි, ඒ 50,000 අනුමත වී තිබෙන්නේ. එහෙත් වැඩ කෙරෙන්නේ නැහැ. එතරම් හදිසිසියක් නැති ඇල්ල-වැල්ලවාය පාර හැදීමට නම් විශාල කලබලයක් තිබෙනවා. ඇල්ල-වැල්ලවාය පාර නැතිවාට මෙතෙක් කල් ඌව ප්‍රදේශයේ මිනිසුන් ජීවත් වුණා. ඒ වාගේම, වැලිගම රේල් ගේට්ටුව මහහරවා මුද අද්දරින් පාරක් දැමීමට ලක්ෂ 55ක් වියදම් කිරීමත් ඒ තරම් හදිසි කරුණක් නොවෙයි. දැනට තිබෙන තත්ත්වය ඉවත් කොට එහි වංගුව මගහැරී යන පරිදි පාර පළල් කරන්නට වැඩ පිළිවෙළක් යොදා තිබෙනවා. එවිට එහි තිබෙන අනතුරු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

දායක තත්ත්වය මගහැරෙනවා ඇති. එම නිසා, මේ කරුණු දෙක මදක් පසුවට තබා ගම්වල ඉතාම හදිසි අවශ්‍ය වැඩ සඳහා ඒ මුදල් යොදන ලෙස මා ඉල්ලා සිටිනවා. මේ වැඩ දෙකම මෙතෙක් කර තිබෙන තත්ත්වයෙන් නතර කොට ඒ මුදල් හදිසි වැඩවලට යොදන්නට පුළුවනි. පාරවල් මළකඩ කන්නේ නැහැ. මගේ ඉල්ලීම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් මැතිවරණ කාලයේදී ප්‍රයෝජනවත් වෙනවා. එම නිසා මගේ මේ යෝජනාව පිළිගන්නා හැටියට මා ගරු ඇමතිතුමා ගෙන් ඉතාමත් ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

ගරු මන්ත්‍රීවරුන් ඉතාම වැදගත් අදහස් කිපයක් ප්‍රකාශ කළා. එක් එක් කොට්ඨාශ ගැනත් සඳහන් කළා. ඒ සියලු දේටම උත්තර දෙන්නට නුපුළුවන්වීම ගැන මට කණගාටුයි. පානදුරේ මන්ත්‍රීතුමා (ලෙස්ලි ගුණවර්ධන මයා.) මතක් කළ කාරණය ගැන නම් සොයා බැලුවා. කළුතර අළුත් තැපැල් කාර්යාලයක් සෑදීමට 1968-69 අය වැය ලේඛනයෙන් කළ සම්පූර්ණ ඇස්තමේන්තුව රුපියල් 4,80,000 යි. 1968 සැප්තැම්බර් 30 වන දින වනතෙක් වියදම් කරන්නට බලාපොරොත්තුවූ මුදල රුපියල් 1,000 යි. ඒක සම්පූර්ණ ඇස්තමේන්තුව නොවෙයි; ඒ අවුරුද්දේ වියදම් කළ මුදල පමණයි. 1968-69 ඇස්තමේන්තුවෙන් රුපියල් 3,000 ක් වියදම් කරන්නට බලාපොරොත්තු වී තිබෙනවා. ඒක අවසාන කරන්නට දැන් ඇමතිතුමා රුපියල් 3,47,000 ක් ඉල්ලනවා.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

පානදුරේ ආරෝග්‍යශාලාවේ කුස්සිය සාදා අවසානයි.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

මුලින් කිව්වේ තැපැල් කාර්යාලය ගැන නොවැ.

පානදුරේ මන්ත්‍රීතුමා දෙවනුව සඳහන් කළ විෂය ගැන සම්පූර්ණ ඇස්තමේන්තුව රුපියල් 1,60,000 යි. 1968 සැප්තැම්බර් 30 වන දින වන තෙක් වියදම් කරන්නට බලාපොරොත්තු වුණේ රුපියල් 1,51,000යි. 1968-69 වර්ෂයේදී වියදම් කළේ රුපියල් 5,000 යි. තවත් රුපියල් 35,000 ක් දුන්නාම ඔක්කොම සම්පූර්ණයි. ප්‍රථමයෙන් රුපියල් 3,000 කට ඇස්තමේන්තු කළේ නැහැ. එය ඒ අවුරුද්දේ වියදම් කළ මුදල පමණයි. අනිත් ඒවාත් එහෙමයි. අවුරුද්දක් දෙකක් තුළ බොහොම ටිකයි වියදම් කර තිබෙන්නෙ. පළමුවන ඇස්තමේන්තු අනුව වියදම් කර අවසානයි. දැන් තව ටිකක් වැඩිපුර ඉල්ලනවා. එපමණයි.

ජපන් රට සමග අත්සන් කළ ගිවිසුමක් ගැන මාතර මන්ත්‍රීතුමා (තුඩාවේ මයා.) සඳහන් කළා. ප්‍රංශයේ ඇස්තමේන්තුව ඊට වඩා අඩුය කිව්වා. මා ඒ ගැන දන්නේ නැහැ. නමුත් ජපානයේ ඇස්තමේන්තුව සියලුම ඇස්තමේන්තුවලට වඩා අඩුය කියා ඇමතිතුමා ප්‍රකාශ කළා මට මතකයි. මාතර මන්ත්‍රීතුමා ප්‍රංශයේ ඇස්තමේන්තුව ඊට වඩා අඩුය කියනවානම් ඒ ගැන තවදුරටත් විපරම් කර බලා දන්වන මෙන් මතක් කරනවා.

ඇල්ල-වැල්ලවාය පාර ගැනත් වැලිගම අතුරු පාර ගැනත් මතක් කළා. ඒවා නවත්වන්නට පුළුවන්ය කියා මා සිතන්නේ නැහැ. ඒ වැඩ කටයුතු සඳහා හුඟක් යන්ත්‍රෝපකරණ ගෙනවුත් තිබෙනවා. සේවකයන් බඳවා ගෙන තිබෙනවා. දැන් ඒ වැඩ කටයුතු අවසාන කරන්නට ළඟයි. මේ අවස්ථාවේදී ඒ වැඩ නතර කළොත් වියදම් කළ මුදල සම්පූර්ණයෙන්ම අපතේ යනවා. එය පටන් ගැනීම හොඳද නැද්ද කියන්නට මා දන්නේ නැහැ. එහෙත් පටන් ගෙන අවසාන තැනට පත්ව තිබෙන දෙයක් නතර කිරීම යුතු නැතැයි මා විශ්වාස කරනවා.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

එම මුදල් යොදවා අනික් වැඩ කරන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

ගරු ජේ. ආර්. ජයවර්ධන

(கௌரவ ஜே. ஆர் ஜயவர்தன)

(The Hon. J. R. Jayewardene)

මම ඒකත් ඇමතිතුමාට දන්වන්නම්.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

විනු විடුක්කප්පට්ටු, ඒற්றුක්කොள්ளப්பட්டது.

Question put, and agreed to.

පරිපූරක මුදල: රජයේ වැඩ දෙපාර්තමේන්තුව: ගුවන් තොටුපලවල්, තොටුපලවල් ආදිය නඩත්තු කිරීම

குறைநிரப்புந் தொகை: அரசாங்கக் கட்டு வேலைத் திணைக்களம்: விமானத்தளங்கள், படகுத்துறைகள் முதலியன பேணல்

SUPPLEMENTARY SUPPLY—PUBLIC WORKS DEPARTMENT: MAINTENANCE OF AERODROMES, FERRIES, ETC.

ගරු ජේ. ආර්. ජයවර්ධන

(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)

(The Hon. J. R. Jayewardene)

I move,

"That a supplementary sum not exceeding Rupees One Million (Rs. 1,000,000) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the Financial Year beginning on October 1, 1968, and ending on September 30, 1969, and that the said sum may be expended as specified in the Schedule hereto:

Schedule

		Rs.
Head 164—Public Works Department.		
Vote No. 6—Economic Development—Recurrent Expenditure	..	1,000,000
Sub-heads 67—5 (b)	Maintenance of Aerodromes and Radio Ranges.	
67—13	Maintenance of ferries, ferry boats, iron pontoons and ferry services.	
70	Repairs to damage caused by flood and cyclones."	

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

විනු විடුක්කප්පெற்று ඒற்றுක්කොள්ளப්பட්டது.

Question put, and agreed to.

පරිපූරක මුදල්

පරිපූරක මුදල: රජයේ වැඩ දෙපාර්තමේන්තුව: පාරවල් සහ පාලම් සැදීම

குறைநிரப்புந் தொகை: அரசாங்கக் கட்டு வேலைத் திணைக்களம் வீதிகள், கட்டடங்கள் நிர்மாணம்

SUPPLEMENTARY SUPPLY—PUBLIC WORKS DEPARTMENT: CONSTRUCTION OF ROADS AND BRIDGES

ගරු ජේ. ආර්. ජයවර්ධන

(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)

(The Hon. J. R. Jayewardene)

I move,

"That a supplementary sum not exceeding Rupees Seven million (Rs. 7,000,000) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the Financial Year beginning on October 1, 1968, and ending on September 30, 1969, and that the said sum may be expended as specified in the Schedule hereto:

Schedule

	Rs.
Head 164—Public works Department.	
Vote No. 7—Economic Development—Capital Expenditure ..	7,000,000"

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

විනු විடுක්කප්පெற்று ඒற්றுක්කොள්ளப්பட්டது.

Question put, and agreed to.

පරිපූරක මුදල: තැපැල් හා විදුලි පණිවුඩ දෙපාර්තමේන්තුව: කාර්යාලීය ලී බඩු, ගෙවල් කුලී ආදිය

குறைநிரப்புந் தொகை: தபால் தந்திப் போக்குவரத்துத் திணைக்களம் தளபாடங்கள், வாடகைகள் முதலியன

SUPPLEMENTARY SUPPLY—DEPARTMENT OF POSTS AND TELECOMMUNICATIONS: FURNITURE, RENTS, ETC.

ගරු ජේ. ආර්. ජයවර්ධන

(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)

(The Hon. J. R. Jayewardene)

I move,

"That a supplementary sum not exceeding Rupees Three million two hundred and fifteen thousand

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ජේ. ආර්. ජයවර්ධන]

(Rs. 3,215,000) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year beginning on October 1, 1968, and ending on September 30,1969, and that the said sum may be expended as specified in the Schedule hereto :

Schedule

	Rs.
Head 165—Department of Posts and Telecommunications.	
Vote No. 2—Administration Charges—Recurrent Expenditure ..	3,215,000 "

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

විනු විඩුක්කප්පට්ඩු, ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

පරිපූරක මුදල: ප්‍රවාහණ කටයුතු පිළිබඳ අමාත්‍යවරයා: ගමන් වියදම්, ඉන්ධන ආදිය

குறைநிரப்புந் தொகை : போக்குவரத்து அமைச்சர் பிரயாணம், எரிபொருள் முதலியன

SUPPLEMENTARY SUPPLY—MINISTER OF COMMUNICATIONS : TRAVELLING, FUEL, ETC.

ගරු හුරුල්ලේ

(கௌரவ ஹுரூல்ல)

(The Hon. Hurulle)

I move,

"That a supplementary sum not exceeding Rupees Four thousand (Rs. 4,000) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year beginning on October 1, 1968, and ending on September 30, 1969, and that the said sum may be expended as specified in the Schedule hereto :

Schedule

	Rs.
Head 170—Minister of Communications.	
Vote No. 2—Administration Charges—Recurrent Expenditure ..	4,000 "

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

විනු எடுத்தியம்பப்பெற்றது.

Question proposed.

ලෙස්ලි ගුණවර්ධන මයා.

(திரு. லெஸ்லி குணவர்தன)

(Mr. Leslie Goonewardene)

With regard to this Supplementary Estimate, the Hon. Minister will remember that last November at my request we passed a regulation making it compulsory for buses, lorries and vans to have either mechanical signals or light signals. That regulation was passed last November but it is not being enforced ; buses, lorries and vans do not carry those signals. When I questioned certain officials I was told that the regulation would be enforced from next year, that when these vechicles are licensed for the new year they would be insisting that they carry those signals. I do not know whether that is so. Even if that is so, unless adequate propaganda is done from now, there will be no possibility of this being enforced even next year, because, in the first place, some firm or firms will have to manufacture these things before they can supply them for buses, vans and lorries. I would like to know what the intention of the Hon. Minister is in this regard.

This is a matter I have been pursuing for several years, and I shall be compelled to file a private plaint against the C. T. B. at least to bring the matter to the attention of the authorities. So, I should like to know the views of the Hon. Minister and what his plans are in this regard.

ගරු හුරුල්ලේ

(கௌரவ ஹுரூல்ல)

(The Hon. Hurulle)

I am happy the hon. Member for Panadura has brought this question up. He brought this question up some time ago and I agreed to publish a gazette notice making it compulsory for buses, vans and lorries to carry mechanical or light signals. That has been done with effect from this year, but we are unable to enforce it with effect from that date because it is not fair by the vechicle owners to insist on this with immediate effect as they have already licensed their vechicles

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

for 1969. So, when we license these vechicles for 1970 we shall be insisting that they carry these signals.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

விஞ விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

පරිපූරක මුදල: සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව: ගුවන් යාතා පැදවීමේ අභ්‍යාසායතනයට දෙන ලද අත්තිකාරම් මුදල

குறைநிரப்புந் தொகை: சிவில் விமானப் போக்குவரத்துத் திணைக்களம்: விமான ஓட்டப் பயிற்சிப் பாடசாலைக்குக் கொடுக்கப் பட்ட பணம்

SUPPLEMENTARY SUPPLY—DEPARTMENT OF CIVIL AVIATION: AMOUNT ADVANCED TO FLYING TRAINING SCHOOL

ගරු හුරුල්ලේ

(கௌரவ ஹுருல்ல)

(The Hon. Hurulle)

I move,

"That a supplementary sum not exceeding Rupees Eighty thousand four hundred and sixty-four (Rs. 80,464) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon, or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the services of the Financial Year beginning on October 1, 1968, and ending on September 30, 1969, and that the said sum may be expended as specified in the Schedule hereto:

Schedule

	Rs.
Head 172—Civil Aviation.	
Vote No. 2—Administration Charges—Recurrent Expenditure ..	80,464"

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

விஞ விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

පරිපූරක මුදල: දුම්රිය දෙපාර්තමේන්තුව: ඉන්ධන, බඩු බාහිර, ආදිය

குறைநிரப்புந் தொகை: புகைவண்டித் திணைக்களம்: எரிபொருள், பண்டகசாலைகள் முதலியன

SUPPLEMENTARY SUPPLY—RAILWAY: FUEL, STORES, ETC.

ගරු හුරුල්ලේ

(கௌரவ ஹுருல்ல)

(The Hon. Hurulle)

I move,

"That a supplementary sum not exceeding Rupees Six million nine hundred and sixty-four thousand five hundred (Rs. 6,964,500) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon, or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year beginning on October 1, 1968, and ending on September 30, 1969, and that the said sum only be expended as specified in the Schedule hereto:

Schedule

	Rs.
Head 171—Railway.	
Vote No. 2—Administration Charges—Recurrent Expenditure ..	6,964,500"

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි.

விஞ எடுத்தியம்பப்பெற்றது.

Question proposed.

අ. භා. 10.35

පී. එම්. කේ. තෙන්නකෝන් මයා.

(திரு. பீ. எம். கே. தென்னகூன்)

(Mr. P. M. K. Tennekoon)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දුම්රිය දෙපාර්තමේන්තුව පිළිබඳව සාකච්ඡා කරන මෙම අවස්ථාවේදී ප්‍රවාහණ ඇමතිතුමාගේ අවධානයට යොමු කිරීම පිණිස කරුණු දෙක තුනක් ඉදිරිපත් කරන්නට තිබෙනවා. ඉන් පළමුවැන්න නම් ගෙයක් හිනි ගැනීම නිසා සිදු වූ අලාබයක් පිළිබඳ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. එම්. කේ. තෙන්නකෝන් මයා.]

ටයි. සාලියපුර නොම්මර 30 දරණ ස්ථාන යෙහි ඩී. එම්. ටිකිරිබණ්ඩා මහතා මෙම කාරණය පිළිබඳව ගරු ඇමතිතුමාට ලිපි යක් එවා ඇති. 1969.8.1 වන දින පෙර වරු 10ට මැදවච්චියේ සිට පැමිණි දුම්රිය කින් පිට වූ ගිනි අඟුරු නිසා එම මහතා ගේ ගෙය ගිනිගෙන තිබෙනවා. ඒ කාරණ යයි ඔහු විසින් දන්වා එවා තිබෙන්නේ. ඇමතිතුමා එම කාරණය පිළිබඳව තම සැලකිල්ල යොමු කර තිබෙන බව දන්වා යවා තිබෙනවා. එහෙත් එම කාරණය පිළි බඳව නැවත වරක් තමුන්නාන්සේට මතක් කරන්නැයි මගෙන් ඉල්ලා තිබෙන හෙයිනුයි මෙහිලා ඒ ගැන සඳ හන් කරන්නට කල්පනා කළේ.

ටිකිරි බණ්ඩා මහතා අහිංසක ගොවි යෙක්. ඔහු ජීවත් වන්නේ ඉතා දුකසේයි. එදින ඔහු ගෙය වසා දමා රැකියාවට ගොස් සිටි අවස්ථාවේදීයි එම දුම්රියෙන් පිට වුණු ගිනි අඟුරු හේතුකොටගෙන මෙම නිවස ගිනි ගෙන තිබෙන්නේ. රුපියල් 1,750ක් පමණ වටිනා ඔහුගේ ගෙය සහ ඔහුට අයිති දේපොළ සම්පූර්ණයෙන්ම වාගේ විනාශ වී ගොස් තිබෙනවා. අද ඔහු සිටින්නේ ඉතා අසරණ තත්ත්වයක බව කිව යුතුයි. අපේ කුණ්ඩසාලේ ගරු මන්ත්‍රී තුමාට (විජේසිරි මයා.) එහෙම මේවා විහිළු වන්නට පුළුවනි. අපේ ඡන්දදායක කොට්ඨාශයේ දුප්පත් අහිංසක ගොවිය කුට සිදු වී තිබෙන මෙම විපත ගැන මෙවැනි අවස්ථාවක ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කිරීම ඉතා වැදගත් දෙයක් හැටියට මා සලකනවා. මෙම අහිංසක ගොවියාගේ ගෙය සහ අනිකුත් දේපොළ අද පිච්චී විනාශ වී ගොස් තිබෙනවා. මේ හේතුවෙන් අද ඔහු අනාථ වී සිටිනා බව මා නැවතත් කියනවා. මා කියන්නේ නැහැ මෙහි වගකීම තමුන්නාන්සේම භාර ගත යුතුය කියා. සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් ඔහුට පිළි සරණ විය යුතුද, දුම්රිය දෙපාර්තමේන්තු වෙන් ඔහුට පිළිසරණ විය යුතුද, කියා මා දන්නේ නැහැ. කෙසේ වෙතත්, මෙම අසරණ ගොවි මහතා ගැන කල්පනා කර බලා මෙම කනගාටුදායක තත්ත්වයෙන් ඔහු මුදවාලීම සඳහා තමුන්නාන්සේගේ අවධානය යොමු කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

ගිය වර අයවැය විවාදයේදී පැහැදිලි වුණා දුම්රිය දෙපාර්තමේන්තුවේ කැන් ටීම හොඳ ලාබයක් ඇතුව පවත්වාගෙන යන බව. ඊයේ පෙරේදා ඒ දුම්රියේ එන විට කෙනෙක් බියර් බෝතලයක් ගන්නවා මා දුටුවා. නමුත් බියර් බොන්න වීදුරුවක් නැහැ. ඒ නිසා පිදුරු බටයකින් බෝතලෙන් බියර් උරනවා. මා මේක කියන්නෙ චෝදනාවක් වශයෙන් නොවෙයි. පොදු ව්‍යාපාරයක අඩුපාඩු තියෙනවා නම් ඒවා ගැන සාකච්ඡා කර අපම ඒවා හරිගස්සා ගන්නා ඕනෑ. එසේ වීමට හේතුව කුමක්ද කියා සේවකයන් ගෙන් ඇහුවම කිව්වා, සේවකයන්ට දෙන්නේ වීදුරු දෙක තුනය; ඒ වීදුරු දෙක තුන දෙතුන් දෙනෙකුට දුන්නම ඉතිරි අයට පිදුරු බට දෙන්නා වෙනවාය කියා. කෙනෙක් ජින් වීදුරුවක් ඉල්ලූ වාම කෝප්පයටයි, ජින් දුන්නේ. මේ අඩුපාඩු හරිගස්සාගන්නට වුවමනා නිසයි, මා මේවා ගැන සඳහන් කරන්නේ. මගීන් සතුටට පත් වන ආකාරයට මේවා යේ කටයුතු කරන්නට පුළුවන් නම් තමයි, මේවා ලාභ ඇතිව පවත්වාගෙන යන්න පුළුවන් වන්නේ. අපේ බණ්ඩාර ගම ගරු මන්ත්‍රීතුමා (ජෝර්ජ් කොතලා වල මයා.) දුම්රියේ යන විට බියර් බෝතලයක් ඉල්ලුවම, බියර් බෝතල යක් සමග පිදුරු බටයක් දුන්නොත්, ජින් වීදුරුව කෝප්පයකට දුන්නොත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒවා පොළොවෙ ගසයි. උන්නැහෙලා වගේ උදවිය දුම්රියේ නොයන නිසයි, මෙහෙම දේවල් සිදු වන්නේ.

සමහර විට විදේශිකයනුත් ඔය දුම්රිය වල යනවා. මා ඒ ගිය දුම්රියේ සුදු මහත්මයකුත්, නෝනා කෙනෙකුත් වාඩිවෙලා සිටියා. විදේශ විනිමය එකතු කර ගැනීමට රාජ්‍ය ඇමතිතුමා මහන්සි වීම ගැන මා සතුටු වෙනවා. ඒ සුදු මහත්මයාත්, නෝනා මහත්මයත් බියර් බෝතල දෙකක් අරගෙන පිදුරු බටයෙන් උර උරා යනවා. ඒ අය මොන විධියේ සිතුවිලිලක් ඇතිව ඒ බීර බෝතල් දෙක බිව්වාද දන්නෙ නැහැ. ඒ ආපන ශාලාවට අවශ්‍ය උපකරණ සපයන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

එහි වැඩ කරන සේවකයන් පාන්දර 5.45 ට යාපනයට යන දුම්රියේ සේවය කරන්නට පටන්ගත්තම සවස එක, දෙක වී දුම්රිය යාපනයට යන තුරු ඔවුන්ට තේ එකක්වත් බොන්න බැහැ. දැනට තියෙන නීති අනුව ඔවුන් ඒ කැන්ටිමෙන් තේ එකක් බීම හෝ කෑම වේලක් කෑම නීති විරෝධියි. ඒ අයත් මනුෂ්‍යයන්. ඔවුන් සතුටු කළොත් තමයි, මහජනයාටත් ඔවුන්ගේ සේවය හොඳින් ලබාගන්නට පුළුවන් වන්නේ. කලින් ඔවුන්ට පෞද්ගලික ආධාර කිරීමේ ක්‍රමයක් තිබුනා. දැන් එය සම්පූර්ණයෙන් තහනම් කර තිබෙනවා. ඒ උදවිය ජීවත් වන්නේ ලොකු අසහනයකින්. රුපියල් 100ක පඩියක් පමණයි, ඔවුන්ට ලැබෙන්නේ. ඔවුන්ට විවේක කාලයක් ලැබුනත් විවේකය භුක්ති විඳින්නට පුළුවන් අන්දමට නොවෙයි, ඒක ලැබෙන්නේ. ඒ නිසා ඒ සේවකයන්ගේ අයිති වාසිකම් ගැන සහ දුක්ගැනවිලි ගැන කල්පනා කර ඔවුන්ට සහනයක් සලසන්න ඕනෑ. ඔවුන් සතුටු වන තරමට තමයි, අපේ අරමුණු ඉටු කර ගැනීමට පුළුවන් වන්නේ.

දුම්රිය වැසිකිළි පිළිබඳවත් මා සඳහන් කරන්න ඕනෑ. නිතර දුම්රියේ යන නිසා මා ඒ ගැන හොඳට දන්නවා. fප්ලෂ් එක වැඩ කරන්න වතුර ලැබෙන්නෙ නැහැ. බොහොම උදවිය වැසිකිළිය පාවිච්චි කර බේසමට වතුර පුරවාගෙන අත පය සෝදනවා මා දැක තිබෙනවා. මේ බව නොදන්න උදවිය ගිහින් බේසමට වතුර පුරවා මුහුණ සෝදන අවස්ථා තිබෙනවා. මේක කනගාටුදායක සිද්ධියක්. වැඩි වශයෙන් දුම්රියේ ගමන් කරන මන්ත්‍රීවරුන් වශයෙන් අපි මේ කාරණා අත්දැකීමෙන් දන්නවා. ඒ නිසා දොට්ට පිළට ගොස් සෝදා ගැනීමට යම්කිසි භාජනයක් ඒ මැදිරිවල තබන ලෙස මා ඉල්ලා සිටිනවා. ඒ දුම්රියවල ඇටෙන්ඩන්ට් කෙනෙකු සිටින බව අපි දන්නවා. ඒ නිසා දුම්රිය මැදිරිවල ඇති සෑම වැසිකිළියක් තුළම එක් එක් භාජනය බැගින් තබනවා නම්, මුහුණ සෝදන්නට පාවිච්චි කරන බේසම් අපවිත්‍ර වෙන්නෙ නැහැ. මේ වාගේ සුළු දේවල් බොහොම පහසුවෙන් විසඳන්නට පුළුවනි. එහෙත් මේ විධියේ වැසිකිළි ප්‍රශ්න පවා අපට මේ වගේ වැදගත් සභාවක් තුළට ගෙනෙන්නට සිදුවීම ගැන මා කනගාටු වෙනවා. මා මේ ඇමතිතුමාට චෝදනා කරනවා නොවෙයි. තමුන්නාන්සේ දුම්රියේ නිතර ගමන් කරන්නේ නැහැ. දුම්රිය මගින් වශයෙන් දුම්රියේ නිතර ගමන් කරන අපි මේ අමාරුකම් හොඳින් දන්නවා. ඒ නිසා මේ කාරණා දෙක තුන ගැන විශේෂයෙන් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

விஞ விடுக்கப்பெற்று, ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

පරිපූරක මුදල: සමාජසේවා දෙපාර්තමේන්තුව: ආපදා සහන

குறைநிரப்புந் தொகை: சமூக சேவைகள் திணைக்களம்: கஷ்ட நிவாரணம்

SUPPLEMENTARY SUPPLY—DEPARTMENT OF SOCIAL SERVICES: DISTRESS RELIEF

ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න (සමාජ සේවා ඇමති)

(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன— சமூக சேவைகள் அமைச்சர்)

(The Hon. N. H. A. M. Karunaratne—Minister of Social Services)

මෙම යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"1968 ඔක්තෝබර් 1 වැනිදායින් ආරම්භ වී 1969 සැප්තැම්බර් 30 වැනිදායින් අවසන් වන මූදල් වර්ෂය තුළ සේවය සඳහා ලංකාවේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ ලංකාණ්ඩුවේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ලංකාණ්ඩුවට සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ලංකාණ්ඩුව විසින් ණයට ලබාගන්නා මූදලකින් හෝ රුපියල් හාර ලක්ෂ පනස්දහසකට (රු. 4,50,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මූදල මෙහි පහත පෙනෙන උප ලේඛනයේ නියමිත පරිදි වැය කළ යුතුය:—

උපලේඛනය

ශීර්ෂය: 181—සමාජ සේවා දෙපාර්තමේන්තුව	රු.
සම්මතයේ අංකය: 4—දෙපාර්තමේන්තුව විසින් සැපයෙන සේවා—පුනරාවර්තන වියදම්	4,50,000"

කල් තැබීම

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பெற்று, ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

කල්තැබීම

ஒத்திவைப்பு

ADJOURNMENT

එවිට නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා මන්ත්‍රී මණ්ඩලය කල් තබන ලදී.

මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 10.40 ට අද දින සභාසම්මතිය අනුව, 1969 ඔක්තෝබර් 21 වන අඟහරුවාදා අ. භා. 2 වන තෙක් කල් තියේය.

அதன் பின் உபசபாநாயகர் அவர்கள் விஞ்ஞாபனப்படி சபையை ஒத்திவைத்தார்கள்.

இதன்படி பி. ப. 10.40 மணிக்கு சபை அதனது இன்றைய தீர்மானத்திற் கிணங்க, 1969 ஒக்ரோபர் 21, செவ்வாய்க் கிழமை பி. ப. 2 மணிவரை ஒத்திவைக்கப்பெற்றது.

Thereupon MR. DEPUTY SPEAKER *adjourned the House without Question put.*

Adjourned accordingly at 10.40 P.M. *until* 2 P.M. *on Tuesday, 21st October 1969, pursuant to the Resolution of the House this Day.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දයක මුදල්: මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. (අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි.) මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදෙර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කලින් එවිය යුතුය.

சந்தா: பணம் கொடுத்த தேதியையடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00) 6 மாதத்துக்கு அரைக்கட்டணம். தனிப்பிரதி சதம் 30, தபால் மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த.பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions: 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org